
# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් | www.budusarana.lk | Email:budusarana@lakehouse.lk


ශ්‍රී බුද්ධ වර්ෂ 2565 ක් වූ පොසොන් පුර පසළොස්වක පෝය දින රාජ්‍ය වර්ෂ 2021 ජූනි 24 බ්‍රහස්පතින්දා BUDUSARANA THURSDAY JUNE 24, 2021

ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. 56 වන කාණ්ඩය, 01 වන පත්‍රය , ආරම්භය 1965 - 06 - 13 මිල රු. 40.00




CBL
Munchee
නිව්
බ්‍රෑන්
ක්‍රැකර්
CBL
Munchee
NEW
Bran
Cracker
HIGH IN
DIETARY FIBER
SUGAR FREE
NO ADDED
FLAVOURS & COLOURS
Sugar
<0.1g/100g
Salt
1.20g/100g
Fat
13.7g/100g
240 g. NET Cracker | ක්‍රැකර්
Fit එකේ ඉන්න!
සීනි අඩංගු නැත
රසකාරක සහ වර්ණක
අඩංගු නැත
ආහාරමය
තන්තුවලින් අනූනයි
මිල රු.110/- සිට ඉහළට





# මේ බුද්ධානුස්සතියට කාලය යි

**කරුණාවන්ත පියතුමකු තම දයාබර දරුවන් අමතා අනුකම්පාවෙන් අවවාද කරන්නාක් මෙන් බුදුරජාණන් වහන්සේ ද තම ශ්‍රාවකයන් කෙරෙහි මහත් අනුකම්පාවෙන් මෙසේ අවවාද කරති.**

**මහණෙනි, ශ්‍රාවකයන් කෙරෙහි හිතවත් වූ අනුකම්පා සහගත වූ ශාස්තෘවරයකු විසින් අනුකම්පාවෙන් යමක් කළ යුතු ද එය මා විසින් ඔබට කරන ලද්දේ ය. මහණෙනි, මෙන්න ගස්මුල්. මෙන්න හිස් වාසස්ථාන. මහණෙනි, ධ්‍යාන වඩන්න. ප්‍රමාද නොවන්න. පසුව විපිළිසර නොවන්න. මේ නුඹලාට අපගේ අනුශාසනාවයි.**

බුදුරජාණන් වහන්සේ භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන සිව්වණක් පිරිසටම අවවාද කළේ “ඣායථ භික්ඛවෙ මා පමාදත්ථ” මහණෙනි, ධ්‍යාන වඩන්න ප්‍රමාද නොවන්න කියායි. මෙහිදී “ධ්‍යාන වඩන්න” යන්නෙන් අදහස් වෙන්නේ භාවනා කිරීමයි. භාවනාව යනු සිත වැඩීමයි. එසේ වැඩිය යුත්තේ කුසල් දහම් ය. සිත තුළ කුසල් දහම් වැඩෙන මූලිකම කාරණාව බුදුගුණ සිහි කිරීමයි. බුද්ධානුස්සතිය යනුවෙන් දක්වන්නේ එසේ බුදුගුණ සිහි කරමින් වැඩීමයි.

බුද්ධානුස්සතිය වැඩීමෙන් උපචාර සමාධියකට ඉතා ඉක්මණින් පැමිණිය හැකි ය. බුද්ධානුස්සතිය වඩන විට ධ්‍යාන සිත් සමීපයෙහි හැසිරෙන සිතුවිලි පහළ වේ.

“බුද්ධානුස්සති” යන වචනය සැදෙන්නේ “බුද්ධ” හා “අනුස්සති” පද දෙක එකතු වීමෙන් ය. මෙහිදී “බුද්ධ” යන්නෙන් බුදුරජාණන් වහන්සේගේ අපිරිමිත ගුණස්ඛන්ධය අර්ථවත් වේ.

“අනුස්සති” යනු නැවත නැවත සිහි කිරීමයි. මේ අනුව අපරිමිත බුදුගුණ නැවත නැවත සිහි කිරීම බුද්ධානුස්සතිය යි. බුදුගුණ සිහි කරමින් ඒ අනුව සිත වැඩීම බුද්ධානුස්සති භාවනාවයි. අනන්ත අපරිමිත වූ බුදුගුණ සාමාන්‍ය ලෝක සත්වයාට යම් තරමකටවත් අවබෝධ කර ගනු පිණිස සියලු බුදුගුණ කැටි කොට ගුණ නවයකට බෙදා දක්වා තිබේ. නවඅරහාදී බුදුගුණ යනුවෙන් ව්‍යවහාර කරන්නේ ඒ බෙදා දැක්වීමයි.

ඒ මෙසේ ය.

“ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො, විජ්ජාචරණ සම්පණ්ණො, සුගතො, ලොකවිදූ, අනුත්තරො පුරිසදම්මසාරථී, සත්ථා දේවමනුස්සානං, බුද්ධො භගවා” මෙම බුදුගුණ පාඨය බුදුරජාණන් වහන්සේ විසින්ම දේශනා කරන ලද්දක් ම ය.

බුද්ධානුස්සතිය වඩන්නට පෙර මල් පහන් සුවඳදුම් ආදී පූජාවන්ගෙන් ත්‍රිවිධ චෛත්‍ය පූජා වත්පිළිවෙත් දක්වා වන්දනා කළ යුතු ය. දෙවනුව දර්ශන මාත්‍රයෙන් සිතේ පැහැදීම ඇති කරලීමට සමත් බුද්ධ ප්‍රතිමාවක් වෙතොත් ඒ ඉදිරියේ තැන්පත් ව සිල් ආවර්ජනා කිරීමෙන් පසුව තෙරුවන් කමා කර ගත යුතු ය.

තුන්වෙනුව තෙරුවන් කෙරෙහි තම ජීවිතය පූදා පින්පෙත් අනුමෝදන් කිරීමෙන් පසුව කමටහන් නැමැති මහා නිධානය දිවිහිමියෙන් රැක ගන්නෙමි'යි අධිෂ්ඨාන කළ යුතු ය.

හතරවෙනුව සුදුසු විවේකස්ථානයක පහසු පරිදි තැන්පත් ව (වාඩි වී) වමත උඩ දකුණත සිටින සේ උකුළ මත අත්දෙක තබා ගෙන දෑස් මදක් අඩවන් කරගෙන කමටහන වැඩිය යුතු ය.



බලපිටියල ශ්‍රී ලංකා ප්‍රාචීන භික්ෂු විද්‍යාලයේ මහෝපාධ්‍යාය
අමරපුර සිරි සද්ධම්මවංස මහා නිකායේ මහා ලේඛකාධිකාරී
රාජකීය පණ්ඩිත, දර්ශනපති

**බලපිටියේ සිරිසීවලි හිමි**

## අරහං බුදුගුණය

මාගේ බුදුපියාණන් වහන්සේ රහසින්වත් පව් නොකෙළ සේක. කෙලෙස් සතුරන් නැති කළ සේක.

සියලු පුද පූජාවන්ට සුදුසු වන සේක. මේ කාරණා නිසා මාගේ බුදුපියාණන් වහන්සේ අරහං නම් වන සේක. අරහං නම් වන සේක. අරහං නම් වන සේක.

## සම්මා සම්බුද්ධ බුදුගුණය

මාගේ බුදුපියාණන් වහන්සේ අතීතයේ සිදු වූ, අනාගතයේ සිදු වන, වර්තමානයේ සිදුවෙමින් පවතින සියලු දේ අතට ගත් නෙල්ලි ගෙඩියක් සේ දැන දැක අවබෝධ කළ සේක. මේ කාරණා නිසා මාගේ බුදුපියාණන් වහන්සේ සම්මා සම්බුද්ධ වන සේක. සම්මා සම්බුද්ධ වන සේක.

සම්මා සම්බුද්ධ වන සේක.

## විජ්ජාචරණ සම්පන්න බුදුගුණය

මාගේ බුදුපියාණන් වහන්සේ විද්‍යා ඥාන අටකින් ද, පසළොස් චරණ ධර්මයන්ගෙන් ද යුක්ත වන සේක. මේ කාරණා නිසා මාගේ බුදුපියාණන් වහන්සේ විජ්ජාචරණ සම්පන්න වන සේක.

විජ්ජාචරණ සම්පන්න වන සේක. විජ්ජාචරණ සම්පන්න වන සේක.

## සුගත බුදුගුණය

මාගේ බුදුපියාණන් වහන්සේ යහපත් ගමන් ඇති සේක. සුන්දර තැනට සැපතක් වන සේක. සොඳුරු බස් කියන සේක. මේ කාරණා නිසා මාගේ බුදුපියාණන් වහන්සේ සුගත නම් වන සේක. සුගත නම් වන සේක. සුගත නම් වන සේක.

## ලෝකවිදූ බුදුගුණය

මාගේ බුදුපියාණන් වහන්සේ කාම රූප අරූප යන තුන් ලෝකයේ සියලු තතු දැනගෙන නොදත් ලෝකයාට කියා දුන් සේක. එසේම සත්ව, අවකාශ සංස්කාර යන තුන් ලෝකයේ සියලු තතු, දැනගෙන නොදත් ලෝකයාට කියා දුන් සේක. මේ කාරණා නිසා මාගේ බුදුපියාණන් වහන්සේ ලෝකවිදූ නම් වන සේක. ලෝකවිදූ නම් වන සේක. ලෝකවිදූ නම් වන සේක.

## අනුත්තරො පුරිසදම්මසාරථී බුදුගුණය

'මාගේ බුදුපියාණන් වහන්සේ සියලු සත්වයන් කෙරෙන් උතුම් වූ සේක. බඹ සුර යකුන් හැම දමනය කළ සේක. මේ කාරණා නිසා මාගේ බුදුපියාණන් වහන්සේ අනුත්තරො පුරිසදම්මසාරථී නම් වන සේක. අනුත්තරො පුරිසදම්ම සාරථී නම් වන සේක. අනුත්තරො පුරිසදම්ම සාරථී නම් වන සේක.

## සත්ථා දේවමනුස්සානං බුදුගුණය

මාගේ බුදුපියාණන් වහන්සේ සියලු සත්වයන් හැම භව කතරින් එතර කරනු පිණිස මග පෙන්වූ සේක. මිනිසුන්ට පමණක් නොව දිව්‍ය බ්‍රහ්මාදීන්ට ද මග පෙන්වූ සේක. මේ කාරණා නිසා මාගේ බුදුපියාණන් වහන්සේ සත්ථා දේවමනුස්සානං වන සේක. සත්ථා දේවමනුස්සානං වන සේක.

සත්ථාදේවමනුස්සානං වන සේක.

## බුද්ධො බුදුගුණය

මාගේ බුදුපියාණන් වහන්සේ චතුරාර්ය සත්‍ය ධර්මය ස්වකීය ඥානයෙන් අවබෝධ කළ සේක. මහා කරුණාවෙන් යුතුව විනේය ජනයාට කියා දුන් සේක.

මේ කාරණා නිසා මාගේ බුදුපියාණන් වහන්සේ බුද්ධ නම් වන සේක. බුද්ධ නම් වන සේක. බුද්ධ නම් වන සේක.

## භගවා බුදුගුණය

මාගේ බුදුපියාණන් වහන්සේ සුවාසූ දහසක් ධර්මස්ඛන්ධය නියමාකාරයෙන් බෙදා දැක්වූ සේක. සියලු ගුණයන් භජනය කළ සේක. භාග්‍යාදී ඓශ්වර්යයන්ගෙන් යුක්ත වන සේක. මේ කාරණා නිසා මාගේ බුදුපියාණන් වහන්සේ භගවා නම් වන සේක. භගවා නම් වන සේක. භගවා නම් වන සේක.

බුද්ධානුස්සතිය දීර්ඝ කාලයක් තිස්සේ වඩන විට සාන්දෘෂ්ටිකව ම ලබා ගත හැකි ආනිසංස රාශියක් ඇත.

බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගෞරව අධිකවීම.

ශ්‍රද්ධාදී ඉන්ද්‍රිය ධර්මයන් දියුණුවට පත්වීම.

වහා වැටහීමේ ශක්තිය ඇතිවීම.

ස්මෘති ශක්තිය දියුණු වීම.

පාපයට ලජ්ජා බිය ඇති වීම.


දෙවියන්ට ප්‍රිය වීම. බුද්ධත්වයට සිත යොමු වීම. මරණින් මතු සුගතියෙහි ඉපදීම ඉන් කිහිපයකි.

එහෙයින් බුද්ධානුස්සතිය වඩන්නට පුරුදු පුහුණු කරන්නට අභ්‍යාස කරන්නට මේ හොඳම කාලයයි.





# බුදු දහමේ නිර්මල පණිවිඩය ලද පොසොන් පෝදා



ඌරුගමුවේ
අස්සජී හිමි

**ශ්‍රී බුද්ධ වර්ෂ 236 පොසොන් පුර පසළොස්වක පොහෝද අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ ලක්දිවට ථෙරවාදී බුදුදහම හඳුන්වා දුන්හ. ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල යන රහතන් වහන්සේලා සතර නමත්, ෂඩ් අභිඥලාභී සුමන සාමණේරයන් වහන්සේත්, භණ්ඩුක නම් අනාගාමී උපාසකතුමාත් යන රාජකීය ධර්ම දූත පිරිස මිහිඳු මහරහතන් වහන්සේ සමඟ මෙහි සැපත් වූහ.**

## තෙවැනි ධර්ම සංගායනාව

ශ්‍රී සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර 218කට පසුව පැළලුප් නුවර අශෝකාරාමයේ දී තෙවැනි ධර්ම සංගායනාව පැවැත්වුණි. මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ මෙහි ප්‍රධානත්වය දැරූ අතර මහරහතන් වහන්සේලා දහස් නමක් සහභාගි වූහ. ධර්මාශෝක අධිරාජයා ප්‍රධාන දායකත්වය දැරීය. මෙම තෙවැනි ධර්ම සංගායනාවෙන් සිදු වූ මාහැඟි ප්‍රතිඵලය නම් එතෙක් දඹදිව සීමිත ප්‍රදේශයක පමණක් පැවැති බුදුදහම, එවකට දැන සිටි රටවල් නවයකට ධර්ම දූතයන් මාර්ගයෙන් ප්‍රචාරය කොට හැරීමයි. ස්වකීය පුත්‍ර වූ මිහිඳු මහ රහතන් වහන්සේ ප්‍රමුඛ රාජකීය දූත පිරිසක් ම මෙරටට පිටත්කොට හැරීමෙන් පැහැදිලි වනුයේ ධර්මාශෝක අධිරාජයා ලක්දිව කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කළ බවයි.

## දූත පිරිස සැපත් වීම

දඹදිව වේදිසගිරි නුවරින් ලක්දිව අනුරාධපුරයේ මිහින්තලයට සැපත් දූත පිරිසට එහිදී දේවානම්පියතිස්ස මහ රජු මුණ ගැසිණි. මිහිඳු මහරහතන් වහන්සේ මහ රජුට ස්වකීය දූත පිරිස මෙසේ හඳුන්වා දුන්හ.

**සමණාමයං මහාරාජ**
**ධම්මරාජස්ස සාවකා**
**තමෙව අනුකම්පාය**
**ජම්බුදීපා ඉධාගතා**

මහරජතුමනි, ශ්‍රමණයන් වන අපි ධර්ම රාජයාණන් වූ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයෝ වෙමු. නුඹලාට අනුකම්පා පිණිස දඹදිව සිට මෙහි පැමිණියෙමු.

## බුද්ධි පරීක්ෂණයක්

දඹදිව සිට කෙසේ පැමිණියාහු දැයි, මහ රජු ඇසූ ප්‍රශ්නයට මිහිඳු මහරහතන් වහන්සේගේ ලිහිල් පිළිතුර වූයේ "දියෙන් හෝ ගොඩින් හෝ නො ආම්හ" යන්නයි. එම පිළිතුර මහරජු තේරුම් ගත් බැව් දත් මිහිඳු මහරහතන් වහන්සේ මහ රජුගේ බුද්ධි මට්ටම පරීක්ෂා කිරීමට ප්‍රශ්න කිහිපයක් ඇසූහ. ළඟම තිබූ අඹ ගසක් මහ රජුට පෙන් වූ මිහිඳු මා හිමි "මේ කිනම් ගසක් ද" යි ඇසීය. එවිට මහ රජු මේ අඹ ගසකැයි පිළිතුරු දුන්නේ ය.

මිහිඳු මා හිමි – මේ ගස හැර තවත් අඹ ගස් තිබේද?

මහරජු – එසේය, බොහෝ ගඹ ගස් තිබේ.

මිහිඳු මාහිමි – මේ අඹ ගසත්, අනෙක් අඹ ගසුත් හැරෙන්නට තවත් ගස් තිබේද?

මහරජු – එසේය, තවත් බොහෝ ගස් තිබේ.

මිහිඳු මා හිමි – ඒ අඹ ගසුත්, අඹ නොවන ගසුත් හැරෙන්නට තවත් ගස් තිබේද?

මහරජු – එසේය, ඒ මේ අඹ ගස ය.

බාහිර ලෝකයේ දක්නට ඇති උදාහරණයක් මුල් කරගෙන සිදු කළ මෙම සාකච්ඡාවෙන් මහ රජුගේ තර්ක බුද්ධිය පිළිබඳ සෑහීමකට පත් මිහිඳු මාහිමි ඉක්බිතිව විමසූයේ මහරජු කේන්ද්‍රකරගත් ප්‍රශ්නයකි.

මිහිඳු මාහිමි – නුඹට නෑයෝ සිටිත්ද?

මහරජු – එසේය, බොහෝ නෑයෝ සිටිති,

මිහිඳු මාහිමි – නොනෑයෝත් සිටිත් ද?

මහරජු – නොනෑයෝ ද බොහෝ වෙති.

මිහිඳු මා හිමි – නෑයෝත් නොනෑයෝත් හැර තවත් අය සිටිත් ද?

මහරජු – ස්වාමීනි, ඒ මම වෙමි.

## බණ ඇසුමට දහස් ගණනින්

මෙසේ සිදු කළ විධිමත් බුද්ධි පරීක්ෂණයෙන් පසු දේවානම්පියතිස්ස මහ රජු මනා බුද්ධිමතකු බව මිහිඳු මාහිමියනට අවබෝධ විය. අනතුරුව පිරිස් සහිත මහරජුට තෙරුවන් පිළිබඳවත්, බෞද්ධ චින්තනය පිළිබඳවත් හඳුන්වාදීමට චූල්ලහත්ථිපදෝපම සූත්‍රය දේශනා කළහ. දේශනාවසානයෙහි මහරජු ප්‍රමුඛ හතළිස් දහසක් පිරිස තෙරුවන් සරණ ගියහ. මහින්දාගමනයෙන් දෙවැනි දිනයේ දී රජ මැදුරේ දී පේතවත්ථු, විමානවත්ථු, සච්චසංයුත්තාදිය මුල් කරගෙන ධර්ම දේශනා පැවැත්වීය. මුල් දිනයෙහි ධර්ම දූතයන් වහන්සේලා දුටු මිනිසුන් සිය අසල්වැසියනට ඒ ගැන දන් වූ හෙයින් මෙම දෙවන දින බණ ඇසුමට දහස් ගණනින් ජනයා රජ මැදුරට එක්රැස් වූ හ. ඒ සියලු දෙනාට රජමැදුර ඉඩ මද වූයෙන් මහරජු මඟුල් ඇත්හල සරසා එහි අසුන් පැනවීය.

ඉක්බිතිව මිහිඳු මහරහතන් වහන්සේ පිළිවෙලින් දේවදූත, බාල පණ්ඩිත, ආසීවිසෝපම, අනමතග්ගිය, ධම්මචක්කප්පවත්තන යනාදී සූත්‍ර දේශනාවන් පවත්වා දහස් ගණනින් ජනයා මාර්ගඵලාවබෝධයට පත් කරවූහ. ධර්ම දූතයන් වහන්සේලාගේ වාසස්ථානය සඳහා මහමෙවුනා උයන පූජා කළ මහ රජු මිහිඳු මාහිමි සමඟ එම උයන වටා ඇවිද සීමා මාලකාදිය පිහිටවිය යුතු තැන් නියම කරවා ගත්හ. දූත පිරිස අතර වූ භණ්ඩුක කුමරු පැවිදි උපසම්පදා කිරීමෙන් ලක්දිව මුල් පැවිදි උපසම්පදාව ද ඇරඹිණි.

## සංස්කෘතික නවෝදය

මෙසේ අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ ථෙරවාදී බුදුසමය මෙරටට හඳුන්වාදීමත් සමඟම එතෙක් මෙරට පැවැති සංස්කෘතිය බෞද්ධ සංස්කෘතිය බවට පරිවර්තනය වූ බව මේ අනුව පැහැදිලි ය. මෙකී සංස්කෘතිය නිසා මෙරට ජනතාව ගේ බුද්ධිය, ක්‍රියාකාරීත්වය හා අන්තර්පුද්ගල සබඳතාව ඉතා ඉහළම මට්ටමකින් පෝෂණය විය. මහින්දාගමනය ලක්වැසි ජනතාවට නව ජීවන දර්ශනයක් හඳුන්වා දුන් වැදගත්ම ඓතිහාසික සිදුවීම බව අමුතුවෙන් අවධාරණය කළ යුතු නොවේ. මිහිඳු මහරහතන් වහන්සේ ලංකාවාසීන්ගේ සිතුම් පැතුම්, ආකල්ප, විශ්වාස හා අදහස් උදහස් පිළිබඳ මනෝවිද්‍යාත්මක අංශයෙන් අවධානය යොමුකොට සිදුකළ අත්‍යුදාර වූ ධර්ම දූත සේවාව සෙසු අන් එක ද රටකටවත් සිදුකළ ධර්ම දූත සේවාවට නොදෙවෙනි විශිෂ්ටත්වයක් ප්‍රකට කළ බව ඉතා පැහැදිලි ය.

රටක අනාදිමත් කාලයක පටන් පවත්නා සංස්කෘතියට නව සංස්කෘතියක් ආදේශ කරවීම කිසිසේත්ම පහසු කටයුත්තක් නොවේ. එය ඉතා විචාරශීලී බුද්ධිමය පදනමක පිහිටා රටේ පවත්නා සංස්කෘතියට ද හානියක් නොවන ලෙස සිදුකළ යුත්තකි.

මෙහිදී මිහිඳු මාහිමි සිදු කළේ ප්‍රාග් බෞද්ධ යුගයේ ලංකාවේ පැවැති සංස්කෘතිය වටහාගෙන එහිම හරවත් පරිවර්තනයක් සිදු කිරීමයි. පැවැති සංස්කෘතිය හෙළා දැක විවේචනය කිරීමවත්, එය සහමුලින් ම ප්‍රතික්ෂේප කිරීමවත්, මෙහි දී සිදු නොවුණි.

මිහිඳු මාහිමියන්ගේ මෙකී දූරදර්ශී වැඩ පිළිවෙළ නිසාම එකල වෘක්ෂ දේවතාවුන් ඇදහූවෝ බෝධි වන්දනාව හා බෝධි පූජා සිදු කිරීමට පෙළඹුණහ.

ගිනි දෙවියන් පිදූවෝ බුදුරදුන් පිදූහ. මළ වුන් ඇදහූ අය මළවුන්ට පින් අනුමෝදන් කරවීමෙන් එම යුතුකම සිදු කළහ.

ගල් පර්වතවලට වන්දනාමාන සිදු කළ අය චෛත්‍ය හා බුදු පිළිමවලට වන්දනා කිරීමෙන් ස්වකීය ආධ්‍යාත්මික පාරිශුද්ධත්වය සලසා ගත්හ. දෙවියන් ඇදහූ අය දෙවියන්ට පින්දීමට හුරුපුරුදු වූහ. මේ අනුව පැහැදිලි වන්නේ අනවබෝධය නිසා යම් යම් නිරර්ථක ආගමික සංස්කාර විධීන් හුරු පුරුදු වූ ජනතාව බුද්ධියේ නිම්වළලු පුළුල්වීමත් සමඟම හරවත් ආමිස හා ප්‍රතිපත්ති පූජාදිය කෙරෙහි කෙමෙන් කෙමෙන් නැඹුරු වූ බවයි.

## දායාද රැසක්

අප ශ්‍රී ලංකාද්වීපයේ භාෂා සාහිත්‍ය, චිත්‍ර, මූර්ති, කැටයම්, ගෘහ නිර්මාණ ශිල්පය යනාදියෙහි පදනම මහින්දාගමන ය යි. අප සිංහල අක්ෂර සම්ප්‍රදාය ද අද තත්ත්වයට හැඩගැසුණේ ද එහි ප්‍රතිඵලයක් ලෙසයි. මහින්දාගමනයෙන් පසුව සංඝමිත්තා මහරහත් තෙරණිය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාවත් සමඟ සිරිලකට වැඩමවීම නිසාද අපට උරුම වූ සංස්කෘතික දායාද රැසකි.

තවත් අතකින් බැලූ කල මහින්දාගමනයත් සමඟම අපට උරුම වූයේ එවකට ලෝකයේ පැවැති විශිෂ්ටතම කලා සම්ප්‍රදාය වූ මෞර්ය කලාවයි. බෞද්ධ කලාවේ පෝෂණයට ඉන් ලැබුණේ සුවිශේෂී දායකත්වයකි.

සඳකඩපහණ, වාහල්කඩ වැනි කලා නිර්මාණ සේ ම මහා කළුගල්වලට පණ පෙවූ සමාධි පිළිමය අවුකන පිළිමය වැනි විශ්ව කලාවේ සමතැන් ගන්නා අග්‍රගණ්‍ය කලා කෘති නිමවූයේ මහින්දාගමනයේ ප්‍රතිඵලයක් ලෙසයි.

මහින්දාගමනයත් සමඟ වැවයි දාගැබයි, කෙතයි, යන සංස්කෘතික සබැඳියාවත්, ථෙරවාදී බුදුසමයේ කේන්ද්‍රස්ථානය ලංකාව බවට පත්වීමත් අපගේ අනන්‍යතා ලක්ෂණ මනාව මූර්තිමත් වන අවස්ථාවන් ලෙස නම් කළ හැකි ය.

# චූලහත්ථිපදෝපම සූත්‍රය

**සූත්‍ර පිටකය, මජ්ඣිම නිකාය මූල පණ්ණාසකය, තුන්වැනි ඔපම්ම වර්ගයේ 7 වැනි සූත්‍රයයි.**

අප භාග්‍යවත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ සැවැත් නුවර දෙව්රම් වෙහෙරේ වැඩ වසන කල්හි විශේෂ දිනයක් උදා විය. ඒ කොසොල් මහ රජතුමන්ගේ අතිශය සම්භාවනාවට ලක් වූ "ජාණුස්සෝණි" නම් බ්‍රාහ්මණයා නගර ප්‍රදක්ෂිණා කරන දිනයයි.

### ජාණුස්සෝණි බ්‍රාහ්මණයාගේ වීථි සංචාරය

එදින අලුයම ස්නානය කොට, පෙරබත්කිස නිමවා, සුදු වස්ත්‍රයක් හැඳ සුදු, උතුරු සළුවක් පොරවා, සුදු පැහැති මල් පැළ ද, සුවඳ විලවුන් ගල්වා, සුදු ආභරණ පැළඳ එසේම සුදු වෙළඹුන් යෙදූ, සුදු පැහැයෙන් සරසන ලද අලංකාර රථයකට නැඟී සුදුවතින් සැරසුණු දස දහසක් බ්‍රාහ්මණයන් පිරිවරා විශේෂයෙන් සරසන ලද නගරයෙහි වීථි සංචාරය කරනු පිණිස සැවැත්නුවර දක්ෂිණ ද්වාරය අභිමුඛ ව ප්‍රදක්ෂිණා කරයි. මේ අසිරිය බලනු පිණිස මහජනයා ද එක්රොක් වූහ.

### පිලෝතික පිරිවැජියා හමුවීම

එදින සැවැත්නුවර වැසි වාත්ස්‍යයන ගෝත්‍රයට අයත් 'පිලෝතික' නම් තරුණ පරිබ්‍රාජකයා අලුයම දෙව්රම් වෙහෙරට පිවිසියේ ය. බුද්ධ ප්‍රමුඛ මහා සංඝයා වහන්සේට උපස්ථාන කොට නිමවා පරිබ්‍රාජක පිරිකර ද රැගෙන ජේතවනයෙන් නික්ම ඉදිරියට එන්නා වූ පිලෝතික පිරිවැජියා ජාණුස්සෝණි බ්‍රාහ්මණයා විසින් ඈතදීම හඳුනා ගන්නා ලදී. එවිට දෙදෙනා අතර මෙබඳු සංවාදයක් ඇති විය.

**ජාණුස්සෝණි –** පින්වත, මේ මධ්‍යහන කාලයෙහි කොහි සිට එන්නේද?

**පිලෝතික –** පින්වත, මම ගෞතම බුදුරජාණන් වහන්සේ සමීපයේ සිට එන්නෙමි.

**ජාණුස්සෝණි –** පින්වත, ඔබ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ප්‍රඥාවන්තයෙක් පණ්ඩිතයෙක් යැයි සිතන්නේ ද?

**පිලෝතික –** ශ්‍රමණ ගෞතමයාණන් වහන්සේගේ නුවණ හා වියත්බව මම නොදනිමි. එය කියන්නට සමර්ථ නොවෙමි. උන්වහන්සෙගේ නුවණ හා වියත් බව දැනගත හැක්කේ එබඳු බුදුවරයකුට පමණයි.

**ජාණුස්සෝණි –** පින්වත, ඔබ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ඉහළින්ම වර්ණනා කරන්නේද ?

**පිලෝතික –** පින්වත, රාජ රාජ මහාමාත්‍යාදීන් විසින් ද බොහෝ බ්‍රාහ්මණ ගෘහපතීන් විසින් ද, බොහෝ පරිබ්‍රාජක ආදීන් විසින් ද වර්ණනා කළ, ප්‍රශංසා කරන ලද උන්වහන්සේ දේව බ්‍රහ්මාදීන් විසින් ද වර්ණනා කරන ලදී. එනිසා මම කෙසේ නම් උන්වහන්සේ වර්ණනා කිරීමට සමර්ථයෙක් වෙම්ද?

**ජාණුස්සෝණි –** පිලෝතික, ඔබ උන්වහන්සේ කෙරෙහි මෙතරම් පැහැදුණේ කුමන කරුණක් නිසා ද?

පිලෝතික පිරිවැජියා ජාණුස්සෝණි බ්‍රාහ්මණයාගේ මේ ප්‍රශ්නයට දීර්ඝ පිළිතුරක් සැපයීය. එය මෙසේ ය.

### හස්තිපදෝපමාව

පින්වත, ඇතුන් වාසය කරන මහා වනයට දක්ෂ හස්ති ශිල්පියෙක් ඇතුළු වූ විටෙක දික් වූ ද, පළල් වූ ද විශාල ඇත් පා සටහනක් දැක එය මහ ඇතාගේ යැයි තීරණය කරන්නාක් මෙන්, මම ද භාග්‍යවතුන් වහන්සේගේ ඤාණ පද සතරක් දුටුවෙමි. ඒ අනුව උන්වහන්සේ සම්මා සම්බුද්ධ යැයි නිගමනය කළෙමි. උන්වහන්සේ දෙසූ ධර්මය ස්වාක්ඛාත යැයි ද ශ්‍රාවක සංඝයා සුප්‍රතිපන්න යැයි ද නිගමනය කළෙමි.

### පළමුවන ඤාණ පදය

මේ ලෝකයෙහි සියුම් වූ නුවණ ඇති අනුන් හා වාද කොට ජය ගැනීමට සමත්, ප්‍රසිද්ධ ක්ෂත්‍රිය පණ්ඩිතයන් බුදුරදුන් වෙත යම් යම් ප්‍රශ්න ගොතා ගෙන වාද කරනු පිණිස එළඹෙනු මම දුටිමි.

බුදුරජාණන් වහන්සේ යම් ගමකට හෝ නියම් ගමකට වැඩිවිට වාද කිරීමේ අදහසින් බුදුරදුන් හමුවට එන මේ ක්ෂත්‍රිය පණ්ඩිතයන් සමඟ උන්වහන්සේ දැහැමි කතාවෙන් කරුණු දක්වති. එවිට ඔවුන් ගෙන ආ ප්‍රශ්න සදෙස් බව තේරුම් ගෙන ඒවා ඉදිරිපත් නොකරති. උන්වහන්සේ කෙරෙහි පැහැදී බුද්ධ ශ්‍රාවකයන් බවට පත් වෙති. මේ මා දුටු පළමු ඤාණ පදයයි.

### දෙවන ඤාණ පදය

පින්වත, එසේම ක්ෂත්‍රිය පණ්ඩිතයා මෙන්ම වාදයෙහි සමත් බ්‍රාහ්මණ පණ්ඩිතයෝ ද බුදු රදුන්ගේ දැහැමි කතාවෙන් පැහැදී තමන් ගෙනා ප්‍රශ්න සදෙස් බව දැන ඒවා පසෙකලා බුද්ධ ශ්‍රාවකයන් බවට පත් වන අයුරු මම දුටුවෙමි. මේ දෙවන ඤාණ පදයයි.

### තෙවන ඤාණ පදය

පින්වත, ක්ෂත්‍රිය හා බ්‍රාහ්මණ පණ්ඩිතයන් මෙන්ම වාද කරනු පිණිස බුදුන් වෙත ආ ගෘහපති පණ්ඩිතයෝ ද තමන් ගෙනා ප්‍රශ්න සදෙස් බව දැන ඉවත දමා බුද්ධ ශ්‍රාවකයන් බවට පත්වනවා දුටුවෙමි. මේ තෙවන ඤාණ පදයයි.

### සිව්වන ඤාණ පදය

පින්වත, වාද කිරීම් සමත් ඇතැම් ශ්‍රමණ පණ්ඩිතයෝ බුදුරදුන් වෙත පැමිණුන ද උන්වහන්සේගේ දැහැමි කතාවෙන් සතුටු ව තම ප්‍රශ්න නිසරුබව දැන ඉවත දමා බුදු සසුනට ඇතුළත් වන අයුරු දුටුවෙමි. එම නිසාම බුදුරජාණන් වහන්සේ සම්මා සම්බුද්ධ වෙති. ධර්මය ස්වාක්ඛාතය, සංඝයා සුප්‍රතිපන්නය යි නිගමනය කෙළෙමි යි පිලෝතික තම දීර්ඝ පිළිතුර මෙසේ අවසන් කළේ ය.

මෙබස් ඇසූ ජාණුස්සෝණි බ්‍රාහ්මයා, රථයෙන් බිමට බැස උතුරු සළුව සකස් කොට දෙව්රම දෙසට හැරී දෑත් හිස්මුදුනේ තබා වැඳ

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස' යි

තෙවරක් ප්‍රීතියෙන් ප්‍රකාශ කළේ ය. මම ද උන්වහන්සේ හමුවී පිළිසඳරක යෙදිය යුතු යැයි ද වැඩිදුරටත් ප්‍රකාශ කළේ ය.

**"හස්තිපදෝපමාව සම්පූර්ණ කිරීම"**

ඉක්බිති ජාණුස්සෝණි බ්‍රාහ්මණ තෙමේ දෙව්රම් වෙහෙරට ගොස් බුදුරජාණන් වහන්සේ වෙත එළඹ පිළිසඳර කතාවෙන් පසු ඉහත සඳහන් වූ තමා හා පිලෝතික පිරිවැජියා අතර වූ සංවාදය සැළ කෙළේ ය. එවිට උන්වහන්සේ,

"බ්‍රාහ්මණය, මෙපමණකින් හස්ති පද උපමාව විස්තර වශයෙන් සම්පූර්ණ නොවේ යැයි වදාරා එය මෙසේ පැහැදිලි කළ සේක.



කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රිධර්ම මහා සංඝ සභාවේ අධිකරණ ලේඛකාධිකාරී රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති

**පත්බේරියේ ශ්‍රී විමලඤාණ නා හිමි**

### වාමනිකා

බ්‍රාහ්මණය, දක්ෂ වූ හස්ති ශිල්පියා ඇත් වනයේ දී දිග පළල මහ ඇත් පා සටහන දුටු පමණින් එය මහ ඇතාගේ පා සටහන යැයි නිගමනය නොකරයි. මක්නිසාද මේ ඇත් වනයෙහි වාමනිකා නම් වූ මිටි වූ බඩ මහත ඇතින්නියෝ සිටිත්. මේ පා සටහන ඔවුන්ගේ විය හැකි යැයි සිතා තවදුරටත් වනය තුළට ගමන් කරයි.

### උච්චා කාළාරිකා

ඔහු ඇත් වනයෙහි දිග හා පළල මහා පාසටහන් නැවත දකී. ගස්වල හත් අටරියනක් උසින් පිට ඉලූ තැන් ද දකියි. දක්ෂ වූ හස්ති ශිල්පියා මේ පා සටහන මහ ඇතාගේ යැයි නිගමනය නොකරයි. මේ වනයේ මහත් පාද ඇති, උස් වූ, එක් දළක් උස් වූ අනෙක් දළ පහත් වූ ද උච්චාකාළාරිකා නම් ඇතින්නියකගේ පා සටහන විය හැකි යැයි සිතා වනය තුළට යයි.

### උච්චා කණේරුකා

දක්ෂ හස්ති ශිල්පියා තවදුරටත් වනයතුළට යන්නේ නැවත ද දිග පළල ඇත් පා සටහන් දකී. එසේම ගස්වල පිට ඉලූ තැන් ද දලින් සිඳි තැන් ද දකී. නමුත් මේ පා සටහන මහා ඇතාගේ යැයි නිශ්චයට නොපැමිණේ. මහ වනයේ වෙසෙන උස් වූ ද මහත් වූ පාද ඇති "උච්චා කණේරුකා" නමැති ඇතින්නියකගේ පා සටහනක් විය හැකි යැයි සිතා ඉදිරියට ම යයි.

### මහ ඇතා හමුවේ

බ්‍රාහ්මණය, මෙසේ ඉදිරියට යන දක්ෂ හස්ති ශිල්පියා තවත් ඇත් පා සටහනක් දකී. එය දිගින් දික් වූ, සරසින් පුළුල් වූ මහ ඇත් පා සටහනකි.

එසේම ගස්වල උස් තැන්හි පිට ඉලූ තැන් ද, දළ පහරින් සිඳලූ තැන් ද දකී. ඒ සමඟ ඔහු මහ ඇතා ගසක් මුල සිටින අයුරු, ඇවිදින අයුරු, හිඳගෙන සිටින අයුරු හෝ වැතිර සිටින අයුරු සියැසින් දැක "ඒ මහ ඇතා" යැයි නිගමනයට පැමිණෙයි.

මේ දක්ෂ හස්ති ශිල්පියා පිට ඉලූ තැන්, දළ සිඳිතැන් දුටු පමණින් මුලින් දුටු පා සටහන් මහ ඇතාගේ යැයි තීරණයට නොපැමිණ ඉදිරියට ගමන් කිරීමෙන් ම ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයෙන්ම නිවැරැදි නිගමනයට පැමිණියේ ය.

### වඩා නිවැරදි ඇත් පද උපමාව

ජාණුස්සෝණි බමුණාට පැහැදිලි කර දුන් බුදුරජාණන් වහන්සේ උපමා උපමේය සන්සන්දනය කරමින් ධර්මය දේශනා කළහ.

**උපමාව –** ඇත්වනය, දක්ෂ හස්ති ශිල්පියා, මහා හස්තියා, මහා ඇත් පාසටහන්, හස්ති ශිල්පියා ඒ ඒ තැන ඇත් පා සටහන් දැක වාමනිකා, කාළාරිකා, කණේරුකාදි ඇතින්නියන්ගේ පියවර විය හැකි යයි නිෂ්ඨා රහිත වීම, හස්ති ශිල්පියා, ඒ ඒ තැන්වල දුටු පා සටහන් මේ මහ ඇතාගේ යැයි අනෙකකුගේ නොවේ යැයි මහ ඇතා දැකීමෙන් තීරණය කිරීම.

**උපමේය –** නීවරණ නසන ධර්ම දේශනාව, යෝගාවචර භික්ෂු නම, සම්මා සම්බුදුරජාණන් වහන්සේ, ධ්‍යාන අභිඥා ධර්මයන්, යෝගාවචරයා, මේ ධ්‍යාන අභිඥාවෝ බුදු සසුනෙන් බාහිර පරිබ්‍රාජකයන්ට ද ඇතැයි නිෂ්ඨාරහිත වීම, ආර්ය ශ්‍රාවකයා සව් කෙලෙසුන් නසා රහත් බවට පැමිණීමෙන් නිගමනය කිරීමයි.

අනතුරුව බුදුරජාණන් වහන්සේ ඇත් පිය උපමාව සම්පූර්ණ කරමින් යෝගාවචරයා නිර්වාණාවබෝධය ලබන්නේ කෙසේදැයි ජාණුස්සෝණි බමුණා අමතා මෙසේ දේශනා කළ සේක.

බ්‍රාහ්මණය, තථාගතයන් වහන්සේ දේශනා කළ ධර්මය අසා ගිහි ගෙය සම්බාධ සහිත ය, රාගාදී රජස් උපදින තැනකි. පැවිද්ද අහස මෙන් නිදහස් යැයි සිතා ගිහිගෙන් නික්ම පැවිදිවෙයි.

මේ පැවිද්ද කාය වාග් සංවරයෙන් යුක්ත වෙයි. ආර්ය ශීලය සමාදන් ව පරපණ නැසීමාදී විසිහය වැදෑරුම් කරුණින් වෙන්වූයේ වෙයි. කය පරිහරණය කිරීමට ප්‍රමාණවත් සිවුරෙන් ද, කුස පරිහරණය කිරීමට ප්‍රමාණවත් පිණ්ඩපාතයෙන් ද ආදී වශයෙන් සිවුපසයෙහි ලද පමණින් සතුටු වෙයි.

49 පිටුවට...



# බාලයාගේ දුක හා පණ්ඩිතයාගේ සතුට

## බාල පණ්ඩිත සූත්‍රය





බළංගොඩ ශ්‍රී ධර්මානන්ද පිරිවෙන් විහාරාධිපති
**කරගොඩ උයන්ගොඩ මෛත්‍රීමූර්ති මහා නා හිමි**

**පොසොන් පොහොය යනු මේ රටේ ජනතාව ආලෝකවත් වූ දිනයයි. අපේ රටට ඇති ලොකුම සම්පත බුදුදහමයි. මේ උතුම් ධර්මය අපට ලැබුණේ අපගේ භාග්‍යයකටයි. මේ උතුම් ධර්මයේ වටිනාකම තේරුම්ගත් අපේ මුතුන් මිත්තෝ ඒ ධර්මය අනුගමනය කළහ. එය තම ජීවන මාර්ගය කරගත්හ. ඒ නිසාම අපේ පැරැන්නෝ පුදුම එළවන සුළු හපන්කම් කළහ. ඒ අතර අභීත වීරවරයන්, දක්ෂ විශ්මිත නිර්මාණශීලීන්, ත්‍රිපිටක පඬිවරුන් මෙන්ම ගද්‍ය පද්‍ය නිර්මාණකරණයෙහි අති සමත් ලේඛකයින් ද දැක ගන්නට පුළුවන.**

ශ්‍රී ලංකා ඉතිහාසයේ මේ ශ්‍රේෂ්ඨතම ඓතිහාසික සිද්ධීන්ට පදනම වූයේ අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේගේ වැඩමවීමයි.

දේවානම් පියතිස්ස රජු මුණ ගැසුණු. පළමුවැනි අවස්ථාවේ දීම මිහිඳු හිමි කළේ තමන් දේශනා කරන ධර්මය තේරුම් ගැනීමේ ශක්තිය රජුට ඇත්ද යන්න විමසීම සඳහා ප්‍රශ්න කිහිපයක් රජුගෙන් ඇසීමයි. එම ප්‍රශ්නවලට රජතුමාගෙන් ලැබුණු පිළිතුරු අනුව එතුමා බුදුදහම වටහා ගැනීමට තරම් මුහුකුරා ගිය නුවණක් හා තැන්පත් මනසක් ඇත්තකු බව මිහිඳු හිමියන්ට වැටහිණි.

ඉන්පසුව රජතුමා ඇතුළු පිරිසට චූල්ල හත්ථි පදෝපම සූත්‍රය දේශනා කළහ. පළමුවැනි දිනය මිස්සක පර්වතයේ වැඩ සිටි මිහිඳු හිමියෝ රජතුමාගේ ආරාධනය අනුව අනුරාධපුරයට වැඩම කළහ. පෙර මඟට ගොස් මිහිඳු හිමි ඇතුලු පිරිස ගෞරවයෙන් පිළිගෙන රාජ මාලිගාවට වැඩමවාගෙන ගියහ. මෙහිදී තමන් වහන්සේ ඇතුලු පිරිස පිළිගත් මිත්‍රලීලාව දැක පැහැදුණු මිහිඳු හිමියෝ බුදු සසුන මෙරටෙහි ස්ථිර ලෙසම පිහිටන බව නිසැකව ම දැන ගත්හ. රජගෙදර දී දන් වළඳා අවසානයේ දී රැස්ව සිටි පිරිසට ගැළපෙන පරිදි විමානවත්ථුවෙන් හා ප්‍රේත වත්ථුවෙන් ධර්ම දේශනා කළහ.

රාජමාලිගයට පමණක් සීමා නොකොට අපටත් ධර්මය අසන්නට අවස්ථාව සලසා දෙන ලෙස රටවැසියන් කරන ලද ඉල්ලීමකට අනුව ඇත්හල සූදනම් කර එහි රැස් වූ විශාල පිරිසකට මිහිඳු හිමියෝ කුසල් අකුසල් කර්මයන්හි ඵල විපාක පෙන්නුම් කරන දේවදූත සූත්‍රයෙන් ධර්ම දේශනා කළහ. ඉන්පසු නන්දන නම් රාජකීය උද්‍යානයෙහි දී බාල පණ්ඩිත සූත්‍රය දේශනා කළ අතර එය ඇසීමට දහස් ගණනක් ජනතාව රැස් වූහ.

එහි දී කාන්තාවන් දහසක් පමණ සෝවාන් ඵලයට පත් වූ බව වංශකතා අපට පෙන්වා දෙයි.

එදා මේ ලක්දිව පැවැති විවිධ ආගමික විශ්වාසයන් හා එදා සිටි ජනතාවගේ සිතුම් පැතුම් විනිවිද දුටු මිහිඳු හිමියෝ ඔවුන්ගේ සිතට, හදවතට දැනෙන පහසුවෙන් අවබෝධ වන ධර්මයක් දේශනා කළ බව බාල පණ්ඩිත සූත්‍රය තෝරාගැනීමෙන් පැහැදිලි වනු ඇත.

මෙම සූත්‍රයෙන් කියැවෙන්නේ බාලයා හා පණ්ඩිතයා යන දෙදෙනාගේ ලක්ෂණයන් ය. බාලයා යනු අර්ථය හා අනර්ථය නොදන්නෙකි. මොහු අසත්පුරුෂයෙකි. දුර්ජනයෙකි.

බාලයා හඳුනා ගැනීමට ඔහු හා බැඳුණු ගතිලක්ෂණ තුනක් මෙහි දක්වා ඇත. එනම් නපුරු සිතිවිලි සිතීම, නරක වචන ප්‍රකාශ කිරීම, හා වැරැදි ක්‍රියාකාරකම්වල යෙදීමයි. සිත, කය, වචනය යන තුන්දෙරින් සිදුවන අකුසල් හෙවත් දස අකුසල් කිරීම බාලයාගේ මූලික ලක්ෂණය ලෙස පෙන්නුම් කර ඇත.

දස අකුසල් යනු මොනවාද? දැඩි ලෝභය, වෛරය හා මිථ්‍යා දෘෂ්ටි යන කරුණු තුන සිතින් කරන අකුසලයන් ය.

බොරු කීම, කේලාම් කීම, පරුෂ වචන කීම, ප්‍රයෝජනයක් නැති ප්‍රලාප හිස් වචන ප්‍රකාශ කිරීම, වචනයෙන් සිදුවන අකුසලයන් ය.

සතුන් මැරීම, සොරකම් කිරීම, කාමය වරදවා හැසිරීම, සුරාපානය කයින් සිදුවන අකුසලයන් ය.

යම් කිසිවකු මේ තුන් වැදෑරුම් වැරැදි කරන්නේ නම් ඔහු මෙලොවදීම තුන් ආකාරයක දුක් වේදනාවන්ට ලක්වන බව මේ සූත්‍රය තුළින් පෙන්වා දී ඇත.

මේ අයුරන් බාලයා මෙලොව දීම තුන් ආකාරයක දුකක් දෙම්නසක් විඳියි. බාල අසත්පුරුෂයා සභාවක හෝ පාරක හෝ හතරමං හන්දියක හෝ සිටින්නේ නම්, එහි රැස්වන අය ඒ බාලයාගේ අගුණ කතා කරති. මෙයින් අදහස් වන්නේ ඔහු සමාජය තුළ නින්දාවට අපහාසයට, අපකීර්තියට පත්වන බවයි.

මේ අයුරින් මහජනයා කතා කරන්නේ පාපී ක්‍රියා එනම් අන්‍යන්ට, සමාජයට, වද වේදනා ගෙන දෙන ක්‍රියා ඔහු අතින් සිදුවන නිසයි. මෙය බාලයා මෙලොවදීම ලබන පළමුවන දුක්ඛ දෝමනස්සයයි.

රජවරු අපරාධකරන පුද්ගලයින් අල්ලා ඔවුනට නොයෙකුත් වධ හිංසා පමුණුවති. කසයෙන්, වේවැල්වලින්, දෙපලුකළ ලීයෙන් තලති. අත්පා කන් නාසාදිය කපා දමති. රත් වූ කල ශරීරයට ඉසිති. සුනඛයන් ලවා හපා කවති. හුලෙහි හිඳුවති. කඩුවෙන් ගසා හිස සිඳ දමති. මේ ආදී වශයෙන් වධ හිංසා රාසියක් පමුණුවති.

බාලයා මේවා දැක මමත් මෙවැනි වැරැදි වැඩ කළ අයෙක්මි. කවදා හෝ රජවරු දැන ගතහොත් මටත් මේ වද වේදනා විඳින්නට සිදුවනු ඇත. මේ අයුරින් බාලයා දුකට, දෙම්නසට, වේදනාවට පත්වෙයි. මෙය බාලයා මෙලොව දී විඳින දෙවන දුක් දෙම්නස් වේදනාවයි.

මහා පර්වතයක සෙවණැල්ල පොළොවට වැටී පැතිරෙන්නාක් මෙන් පුටුවක හෝ ඇඳක වාඩි වී සිටින බාලයාට තමා කරන ලද පාප කර්මත්, වැරදිවැඩත් සිහිපත් වේ. මා විසින් යහපත් දේ හොඳ දේ කර නැත. කරන ලද්දේ වැරැදි වැඩමයි. වැරැදි වැඩ කළ අයට අනිවාර්යයෙන් ම මත්තෙහි දුක් විපාක විඳින්නට සිදුවනු ඇත. මේ අයුරින් සිතමින් සෝක කරයි. ක්ලාන්ත වෙයි, වැළපෙයි, අත් දෙකින් පපුවට ගසා ගනියි, සිහි මුළාවට පත්වෙයි. මේ දුක් වේදනා බාලයා මෙලොව දීම ලබන තුන්වන දුක්ඛ දෝමනස්සයයි.

පාපකාරී ක්‍රියා සිදුකොට අපායෙහි උපත ලබන කෙනකුට විඳින්නට වන දුක් වේදනා ඉතාම භයානක බව මේ සූත්‍රයෙන් පෙන්වා දී ඇත. පාපකාරී ක්‍රියා කළ කෙනකුට රජුගේ නියමයෙන් පෙවරවරුයෙහි තියුණු ආයුධවලින් පහරදීම් සිදුකරයි. මධ්‍යහ්නයේත් සවසත් මේ අයුරින් ම සියක් වාරය බැගින් ආයුධවලින් පහර දෙති. අවසානයේ දී රජුගේ නියමයෙන් මරණයට පත්කරයි. මේ වේදනාව ඉතාම දරුණු ය. බරපතළ ය. පාපකාරී පුද්ගලයා මේ විඳින වේදනාව බුදුරදුහු උපමා කළේ ගල්කැටයකට ය.

මෙවැනි පුද්ගලයකුට නිරයෙහි දී විඳින්නට සිදුවන්නේ හිමාල පර්වතය වැනි විශාල දුක් කන්දරාවක් බව බුදුරදුහු පෙන්වා දුන්හ. මෙයින් පෙනී යන්නේ වැරැදි වැඩ කළ පුද්ගලයා නිරයෙහි විඳින දුක විස්තර කිරීම අතිශය දුෂ්කර බවයි.

තම ඉන්ද්‍රියයන් පිනවීමට විවිධ පාප ක්‍රියාවල යෙදෙන බාලයා මරණින් පසු සමහර විට තිරිසන් ආත්මයක උපත ලබනු ඇත. මෙසේ විවිධ භවවල ඉපදී තියුණු වධ වේදනා විඳ පෙර කරන ලද සුළු පිනක ප්‍රතිඵලයක් වශයෙන් මනුෂ්‍යයකු වී උපත ලබන්නටත් පුළුවන.

මෙම සූත්‍රයෙහි සඳහන් කර ඇත්තේ මිනිසකු වීම කණ කැස්බෑවා විය දණ්ඩේ සිදුරෙන් ආලෝකය බලන්නා සේ අතිශය දුෂ්කර සිදුවීමක් බවයි. මේ මිනිසත් බවින් ප්‍රයෝජනයක් නොගෙන බාලයකු වී කටයුතු කිරීම තුළින් මොනතරම් අවාසනාවන්ත දුක්ඛ දායක ප්‍රතිඵල අත්වේදැයි අප සිතා බැලිය යුතුව ඇත.

මේ සූත්‍රයෙහි සඳහන් වන ආකාරයට පණ්ඩිතයා යනු නුවණැත්තා ය. කුසල්, අකුසල් හඳුනාගෙන කුසල ක්‍රියාවල යෙදෙන්නා ය. ඔහුගේ සිතිවිලි යහපත් ය. යහපත් වචන කතා කරයි. කරන්නේ ද යහපත් ක්‍රියාවන් ය. මේ නුවණැත්තාගේ චරිත ලක්ෂණයන් ය. මේ තුළින් නුවණැත්තා තුන් ආකාරයකින් සතුට භුක්ති විඳියි.

මහජනතාව රැස්වෙන තැන්වලදී තමාගේ ගුණ ගැන කතා කරන බව පණ්ඩිතයාට දැන ගන්නට ලැබෙයි.

ගුණවත් ජීවිතයක් ගත කරන නිසා මේ අයුරින් ප්‍රශංසා ලබන බව සිතන නුවණැත්තා ඒ තුළින් මහත් සතුටක් විඳියි. මෙය පණ්ඩිතයා මෙලොව දී ලබන පළමුවන සොම්නසයි. රජු විසින් වැරැදි කරන අයට පමුණුවන දඬුවම් නුවණැත්තා දකියි.

දඬුවම් ලබන එබඳු වරදක් මා සිදුකර නැත. ඒ තුළින් නුවණැත්තා ලබන සතුට දෙවන සොම්නසයි. අකුසල් කළ අය ඒකාන්තයෙන් ම දුගතිගාමී වෙති. මා අකුසල් කර නැත. කරන්නේ ද නැත. ඒ නිසා කිසිදු තැවීමක් මට නැත. මේ නිසා හැඬීම් වැළපීම්වලින් තොරව මට සුගතිගාමී වන්නට පුළුවන්. මෙය නුවණැත්තා ලබන තුන්වන සොම්නසයි. මේ අයුරින් ලබන දිව්‍ය සම්පත්වල ප්‍රමාණය කියා නිම කළ නොහැකි බව බුදුරදුහු පෙන්වා දුන්හ.

සත් රුවනින් හා චතුර් විධ රත්නයන්ගෙන් යුත් සක්විතිරාජ සම්පත්වලට වඩා උතුම් සැපයක් දිව්‍ය සම්පත්වලින් ලබන බව පෙන්වා දුන්හ. සසර කරන ලද පුණ්‍යවන්ත ක්‍රියාවල බල මහිමයෙන් සැප සම්පතින් පිරි මනුෂ්‍ය ආත්මයක් ලබා ඉතාම ඉක්මණින් නිවන් අවබෝධ කරගන්නා බව මේ සූත්‍රය තුළින් පෙන්නුම් කර ඇත.


වෛරසය දුරලමු
යහපත් සිතුවිලි වලින් පිරි සිතක් සහ රෝග දුරලන අනාගතයක් උදෙසා
මේ උතුම් පොසොන් පුර පසළොස්වක පෝදා
චිත්ත සමාධියෙන් සමාදාන වෙමු.
www.peoplesbank.lk
1961 PEOPLE'S BANK CALL CENTRE
PEOPLE'S BANK
The Bank of the People



බුදුසරණ

35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.

ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

පොසොන් පුර පසළොස්වක 2021.06.24

## අභිමානයට අවමන් නොකිරීම

ලංකා ධරණීතලය ම ආධ්‍යාත්මික, සමාජයීය හා සංස්කෘතික වශයෙන් නවමු මාවතකට යොමු කරමින් අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ ප්‍රමුඛ ධර්මදූතයන් වහන්සේ දඹදිව් තලයේ සිට මිහින්තලාවට වැඩමකොට වදළේ අදවන් පින්බර පොසොන් පෝ දක ය. එදා ධර්මාලෝකයෙන් ආලෝකවත් ව මේ දේශයට උරුම වූ ඒ වටිනාකම් සිහිපත් කරමින් අද ද අපි ආඩම්බර වෙමු.

ප්‍රෞඪ ඉතිහාසයක් තිබීම ජාතියකට අභිමානයකි. සිංහල ජාතියට ඒ අභිමානය ලැබුණේ සම්බුදු දහම හඳුන්වාදීමත් සමග සිතුම් පැතුම්, ඇවතුම් පැවතුම් ආදී මුළු මහත් ජීවන ක්‍රමයම වෙනස්කර ගැනීම නිසා ය. බුද්ධ රත්නය, ධර්ම රත්නය, සංඝ රත්නය, සරණ ගිය පන්සිල් සුරකින පිරිසක් බවට පත් වූ නිසා ය. ධර්මාලෝකයෙන් ආලෝකවත් කරගත් ආධ්‍යාත්මික සිතිවිලිවලින් නිර්මිත වූ සමාජය තුළ සභ්‍යත්වයෙන් යුතු සංස්කෘතියක් බිහි වූ නිසා ය. ඒ තුළ ලොවක් මවිත කරන මහා වෙහෙර විහාර, සයුරු පරදන මහා වැව් ඇතුළු අනේකවිධ විස්කම් කළ නිසා ය.

ඓතිහාසික ව උරුම වූ ඒ අභිමානය රැක ගන්නට නොහැකි වේ නම් ජාතියටම අවමානයක් වන බව අමුතුවෙන් කිව යුත්තක් නොවේ.

එමෙන්ම සාඩම්බර අතීතයක් තිබූ පමණින් වර්තමානය හෝ අනාගතය සුවදායී වේ යැයි කිව නොහැකි ය. අතීතයෙන් පාඩම් ඉගෙන වර්තමානය තව දුරටත් යහපත් ව ගොඩනැංවීම තුළය, සමාජයක දියුණුවට, යහ පැවැත්මට මං පෙත් විවර වනුයේ.

අතීතයේ අපේ මුතුන් මිත්තෝ පවට බිය වූහ. ලජ්ජා වූහ. සිත, කය, වචනය සංවර කරගත් ඔවුහු අවිහිංසාවාදී වූහ. ආත්මාර්ථයට නොව පරාර්ථයට මුල්තැන දුන්හ. සරල ජීවිතයක් ගත කළහ. විනය ගරුක වූහ.

සූසැට බරණින් සැරසුණු කුල කාන්තාවක දෙවුන්දර තුඩුවේ සිට පේදුරු තුඩුව දක්වා මහා රැයක වුව ද තනි මඟ ගිය ද නිරුපද්‍රිත ව ගමන අවසන් කරන්නට තරම් එකල රැකවරණයක් සැලසුණ බව නොදන්නා කෙනෙක් නොවනු ඇත. ඒ අපේ අතීතයේ වූ විනයගරුක බව නිසා ය. ඒ ගැන අභිමානයෙන් කියනු විනා අද ඒ විනය, ශික්ෂණය ඇත්තේ සමාජයේ කොපමණ පිරිසකට ද යන්න පවා ගැටලුවකි.

බෞද්ධ නාමයෙන් පෙනී සිටිය ද කෙනකුට පින පව ගැන අවබෝධයක් ඇති බව නොපෙනේ. මව්පිය, දූ දරු ආදී කොට ඇති සමාජ කණ්ඩායම් අතර ඔවුනොවුන් කෙරෙහි යුතුකම් වගකීම් නිසියාකාර ව ඉටු කරනවා ද යන්න බොහෝ විට ගැටලුවකි. පංච ශීලය ගිහියාගේ නිත්‍ය ශීලය වුව ද, සිල් රකින්නෝ අවම බව ය, සමාජය තුළ දෘෂ්‍යමාන වන්නේ.

එදා අපේ මුතුන් මිත්තෝ ජීවිකාව සරි කොට ගත්තේ දහදිය මහන්සියෙනි. ඔවුහු අලස නොවූහ. ජීවන වෘත්තිය ධාර්මික වූ අතර වංචනික නොවූහ. එදා සහ අද වෙනස ගැළපීම තුළ අප කොපමණ අගතියට ගොස් සිටිනවා ද යන්න අවබෝධ කර ගත හැකි ය. කෘෂි කර්මය ධාර්මික වුවද බොහෝ දෙනෙක් වැඩි අස්වනු ලැබීම සඳහා පමණ ඉක්මවා රසායන ද්‍රව්‍ය යෙදීම තුළ ඒවා පරිබෝජනය කරන පිරිස් බෝ නොවන රෝග රැසකට මුහුණ දෙමින් මියයමින් සිටින බව නොදන්නා කෙනෙක් නැත. මේ එක් උදාහරණක් පමණි.


මිහිඳු හිමි හඳුන්වා දුන් අවිහිංසාවාදී බව අගය කරන සමාජයකට අප නැවත පා නැඟිය යුතුව තිබේ. සිත්තුළ මෙත්තා, කරුණා, මුදිතා දී ගුණ වර්ධනය කළ යුතුව තිබේ. දැහැමි ජීවිතයක් තුළින් දැහැමි සමාජයකට දායකත්වය දෙන්නට කැපවිය යුතුව තිබේ. අපට උරුම ප්‍රෞඪ ඉතිහාසයට අවමන් නොකළා වන්නේ එවිට ය.

# ලක් දෙරණට පෑයූ සදහම් පුන්සඳ

**අනුබුදු මිහිඳු මාහිමියන් එදා ලක් රජුගේ බුද්ධි මහිමය ගැන විමසූ, අඹ පැනය හා ඥාති පැනයෙන් අතිශය ප්‍රසාදයට පත්ව ලක්දිව රජුත්, ඔහුට යටත් වැසියනුත් මෙම ගම්බීරාර්ථ ධර්මය තේරුම් ගැනීමට තරම් බුද්ධි මහිමයෙන් හෙබි වැසියන් බව වටහාගෙන ඒ අනුව උන්වහන්සේ තම ධර්මස්වාමි වූ බුදුරජාණන් වහන්සේගේ නිර්මල ධර්ම දායාදය කරුණාවෙන් බෙදා වදාළහ.**

එයින් සුපෝෂිත වූ ජනී ජනයා ලොවක් මවිත කළ විස්කම් නිර්මාණ මෙන්ම තම ආධ්‍යාත්මය ද මනාව සංවර්ධනය කර ගත්හ.

චුල්ල හත්ථිපදෝපම සූත්‍රය, පේත වත්ථු , විමාන වත්ථු යන මෙයින් කළ ධර්ම දේශනා මේ සඳහා බොහෝ සෙයින් ඉවහල් විය. මෙසේ සත්‍ය ධර්මයෙන් ආශිර්වාදය ලත් සිංහලයෝ ක්‍රමයෙන් ප්‍රබුද්ධ පිරිසක් බවට පත්වූහ.



අලි, කොටි, වග වළසුන්ගෙන් ගැවසීගත් මහා වනාන්තර රමණීය වන සෙනසුන් බවටත්, මහා ගල්පර්වත හෙළ කලා කරුවාගේ වෑයමෙන් ලොවුතුරු මිහිරි කැටි වූ ලෙන් විහාර බවටත් පත්විය. හිස් අහස් කුස සිප ගන්නා සුළු, සුදෝ සුදුවන් කිරි බුබුළු වැනි මහ දාගැබ් ද නිසලව ගලා බසිනා දිය දහරා තැනිතලා, මහා වාපි බවටත් පත්විය.

අනුරාධපුරයත්, පොළොන්නරුවත්, කතරගම කිරිවෙහෙරත්, සිතුල්පව්වත්, සිගිරිය හා දඹුලු විහාරය යන සිද්ධස්ථාන අපට ඇතිවූයේත් බුදු සමය නිසා ය. හෙළයේ මහා රජවරු වන දුටුගැමුණු, මහා පරාක්‍රමබාහු වැනි දෑ හිතකාමී වීරෝදාර පුණ්‍යවන්ත රජවරුත් සිරිසඟබෝ, බුද්ධදාස වැනි බෝධිසත්ව ගුණෝපේත රජ දරුවන් සීගිරි කාශ්‍යප වැනි කලා කාමී නර විරුවන්,අරිට්ඨ , මලියදේව වැනි සිංහල රහත් හිමිවරුන්, අනුලාවන් වැනි රහත් මෙහෙණින් වහන්සේලා, විහාරමහා දේවි, සෝමා දේවි වැනි වීරෝධාර හෙළ මව් වරුන් මේ රටේ පහළ වූයේ බුදු සමය නිසා ය.

මසේ ලක් බිමේත්, සිහල මිනිසාගේත් එක් එක් අංශය ගෙන බලන කල්හි, මහින්දා ගමනයත් සමඟ ඇතිවූ බෞද්ධ ප්‍රබෝධයෙන් ආලෝක නොවුණ එකදු අංශයක් හෝ ඇතැයි නොසිතෙන තරම්ය.

මේ අති උදාර පොසොන් පෝය දිනය ගැන විමසා බලන කළ දීප ප්‍රසාදක මහාමහින්ද අනුබුදුන් වහන්සේ පිළිබඳවත්, දඹදිව අශෝක අධිරාජයා පිළිබඳවත්, අති විශිෂ්ට අනුස්මරණයන් එකිනෙක පෙරට ගෙන එන අතිශයින්ම වැදගත් අති පාරිශුද්ධ දිනයකි.

එදා අශෝක මහ රජුගේ කාරුණික බැල්ම මෙන්ම, අනුග්‍රහය රාජතාන්ත්‍රික ව නොලැබුවේ නම් යම් විටෙක අද අපි කතා කරන ලංකාවේ තත්වය මීට බෙහෝ සෙයින් වෙනස් වන්නට ඉඩකඩ වැඩි තරම් ය. මේ නයින් බලන කල කී නොකී සෑම අංශයක්ම යම් මධ්‍යස්ථ සමතුලිත සෞම්‍ය ගුණයන්ගෙන් රට තුළ පවත්වාගෙන යන්නට අතිශයින් ම බලපෑ කරුණ වනුයේ බුදු රජාණන් වහන්සේගේ දහම් පණිවිඩය රැගෙන මේ දිවයිනට වැඩිය අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේගේ ලංකා ගමනය බව නම් කෘත ගුණපූර්වක ව සිහිපත් කළ යුතු ම ය.

එම කරුණ සිංහල බෞද්ධයා තුළ ආත්මයෙන් ආත්මයට සන්තාන ගතව පවතින නිසා දෝ මේ තරම් හෙළ බොඳු පිරිසක් සෑම වසරක ම පොසොන් උදාවත් සමඟ ලංකාවේ සිවු කොණින්ම මේ අතිපාරි ශුද්ධ වූ අටමස්ථාන හා මිහින්තලය, ඉසුරුමුණිය ආදි සිද්ධස්ථානයන්ගේ ගැවසීගති.

කෙසේ වෙතත් ලංකා සංස්කෘතියේ තිඹිරි ගෙය නම් අනුරාධපුරයයි. එම උදාරතර සංස්කෘතියකට උරුමකම් ඉගැන්වූ මහා මහින්ද මහරහතන් වහන්සේට ගෞරව දක්වන්නට සෑම පොසොන් පෝය දිනක ම ලක් බොදුණුවෝ අමතක නොකරති.

මෙවන් ලෝක ව්‍යසන අවස්ථාවක වුවද ලක්වැසි අප මෙම උදාර කළ ගුණ සැලකීමේ පින්කම මෙවර ද පවතින සෞඛ්‍යය නිතී රීති සිත්හි දරා ගතින් නොව සිතින් තම තමන්ගේ ගේ දොර හිඳ හෝ ළඟම සිද්ධස්ථානය මුල්කරගෙන පිළිවෙත් පුරනවා නම් මැනවියැයි අප ඉතා කරුණාවෙන් සහිපත් කර සිටිමු. ඒ තුළින් එදා මිහිඳු මහරහත් උතුමාණන් වහන්සේ අපගෙන් අපෙක්ෂා කළ සැබෑ බෞද්ධයා අපි අප තුළින්ම ලොවට පසක් කරමු. ඒ සඳහා සෑම දෙනාමට තෙරුවනේ ආශිර්වාදය ලැබේවා. පින්බර පොසොන් පුණ්‍ය මහෝත්සවයක් වේවා!



අනුරාධපුර සම්බුද්ධ ජයන්ති විහාරාධිපති
ආචාර්ය
**නුගේතැන්නේ පඤ්ඤානන්ද නා හිමි**


පින්බර පොසොන්
මංගල්‍යයකට ආසිරි...
සබ්බීතියෝ විවජ්ජන්තු
සබ්බ රෝගෝ විනස්සතු
මාතේ භවත්වන්තරායෝ
සුඛී දීඝායුකෝ භව
සියලු උවදුරු දුරුවේවා!
සියලු රෝග නැසේවා!
සියලු අන්තරා දුරුවේවා!
සුවපත් වේවා!
දීර්ඝායුෂ ලැබේවා!
නෙත් වසඟ කරන රන්වන් පෙනුමකට...
GOLDEN
TOUCH
වෙතින්
ජ්‍යේෂ්ඨ රූපලාවණ්‍ය ශිල්පිනී
ජාත්‍යන්තර රූපලාවණ්‍ය උපාධිධාරිනී
ජීවනී ජයතිලක
ඇතුළු ගෝල්ඩන් ටච් කාර්ය මණ්ඩලය
JA Beauty Care (Pvt) Ltd | 418, කොළඹ පාර, බොරලැස්ගමුව
ja
Beauty Care



**මිහිඳු මහරහතන් වහන්සේගේ ශ්‍රී ලංකා ගමනය ශ්‍රී ලංකාවාසි අප හැමදෙනාගේ ම ගත සිත සුවයට මහත් අස්වැසිල්ලක් ලෙස අද ත් අපට දැනෙනවා. එදා මේ රටේ විසූ බොහෝ ජන කොටස්වලට ද එය එසේ ම වන්නට ඇති.**
**එහෙම කියන්නේ උන්වහන්සේ දේශනා කළ නවතම දහම ඕනෑ ම ජන සමාජයක නිවීම සැනසීම පිණිස හේතු වූ දයාව, කරුණාව, මෛත්‍රිය, කළගුණ සැලකීම වැනි මානුෂික ගුණාංග මිනිස් හදවත් තුළ තහවුරු වන ආකාරයේ දහමක් වූ බව එම දේශනා ගැන සිතෙන විට අද ත් අපට දැනෙන නිස යි.**




අස්ගිරි මහාවිහාරයෙහි
මහෝපාධ්‍යාය, කාරක සංඝ සභික,
වයඹ පළාතේ ප්‍රධාන සංඝ නායක
මහාචාර්ය
**තුඹුල්ලේ**
**ශ්‍රී සීලක්ඛන්ධ නාහිමි**


# දන්නා දෙය තුළින් නොදන්නා දෙය ගැන දුන් ගැඹුරු අවබෝධය

ඔබ අප කවුරුත් හොඳින් දන්නා පරිදි එදා පොසොන්පුර පසළොස්වක පොහෝ දා මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රමුඛ ධර්මදූත පිරිස එදා නැකත් කෙළියෙහි යෙදී සිටි දෙවනපෑතිස් රජතුමා ඇතුළු ශ්‍රී ලාංකික පිරිසට මුල්වරට දේශනා කළේ චූලහත්ථිපදෙපම සූත්‍රය මාතෘකා කර ගැනුණු දේශනාවක්.

කොහොම වුණත් පසුදින අනුරාධපුර මහමෙවුනා උයනේ පිහිටි රජවාසලට වැඩම කරවීම පිණිස ආරාධනාව ලැබුණු මිහිඳු මාහිමිපාණන් වහන්සේ ප්‍රමුඛ මෙම ධර්මදූත පිරිස පසුදින රාජ මාළිගාවේ දී දන් වළඳා අවසන මාහානාග යුවරජුගේ බිසව ඇතුළු පිරිසට ධර්මය දේශනා කළේ පේතවත්ථු, හා විමානවත්ථු සූත්‍ර දේශනා මාතෘකා වශයෙන් තබාගෙන යි.

මෙසේ එදා මිහිඳු මහරහතන් වහන්සේ රාජ මාළිගාවට වැඩම වූ පසු ප්‍රථම වරට එවැනි දේශනාවක් කරන්නට හේතු වූයේ මක්නිසා ද?

මෙයට බොහෝ දැන උගත් අපේ වියත් මහ තෙරවරුන් හා වියතුන් පෙන්වා දෙන්නේ මෙහි ලොකු අරුතක් තිබුණු බව. එනම් මිහිඳු මහරහතන් වහන්සේ ලංකාවට වැඩමවන ලද කාලය වනවිටත් ලංකාවේ විවිධ මිත්‍යා ඇදහිලි පැවැති ආගමික වටපිටාවක් තමයි තිබුණේ. ඒ අතර ප්‍රසිද්ධ විශ්වාසයක් වුණේ මළවුන් ඇදහීම යි. ඒ හැරුණහම වෙනත් මිත්‍යා ඇදහිලි රාශියක් ම තිබුණා.

ඉතින් එවැනි වටපිටාවක් තුළ මිනිසාගේ මරණින් පසු ලබන නව භවය කුමන එකක් විය හැකි ද?. ඒ ලබන නව භවය තවත් කෙනකුට පිහිට විය හැකි භවයක් විය හැකි ද? තමන් අදහන අයට පිහිට වීමට තරම් සරුසාර පින්සරු භවයක් ලබා තිබෙන්නේ ද? කෙනකුගේ මරණින් පසු ලබන භවය සතුටුදායක වන්නට නම් මේ ගත කරන ජීවිතය කෙතරම් අරපරිස්සමෙන් අප විසින් හසුරුවා ගත යුතු ද?

මෙන්න මෙවැනි කාරණාවලට පිළිතුරක් ලැබෙන ආකාරයේ දෙසුමක් ලෙස මේ කියන පේතවත්ථු හා විමානවත්ථු දේශනාව හඳුන්වා දෙන්නට හැකියාව තිබෙනවා. ඉතින් මළවුන්ගෙන් පිහිටක් අපේක්ෂාවෙන් සිටින පිරිසකට පිහිටක් විය හැකි ආකාරයෙන් අවම වශයෙන් මේ භවය තුළ දී වත් මිය යන්නට පෙර අපෙන් පිහිට බලා පොරොත්තු වන අයට පිහිට වීමට අප ගෙවූ ජීවිත සඵල කර ගත යුතු ය කියන මේ සරල අර්ථය ප්‍රකට කිරීම පිණිස මෙසේ දෙවන දවස්හි ම මේ දේශනා සිදු කරන්නට ඇති.

මිහිඳු මහරහතන් වහන්සේ මේ නවතම දහමේ ගැඹුරට එක්වර ම නො ගොසින් අද අපි කථාකරන විදිහට නම් දන්නා දේ තුළින් නො දන්නා දේ පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා දී සැනසීම උදා කර දෙන්නට යි, එනම් මෙලාව පින් පව් පිළිබඳ වැටහීමෙන්දිවි ගෙවීමේ වැදගත්කම පහදා දෙන්නට යි මෙම දේශනා ඉදිරිපත් කරන්නට ඇත්තේ.

## පේතවත්ථු හා විමානවත්ථු

ඉතින් මේ පේතවත්ථු හා විමානවත්ථු දේශනා පිළිබඳ පුළුල් විස්තරයක් කිරීමට දැන් කිසිසේත් කළ නොහැකි වුණත් යම්තරම් දුරකට එදා මිහිඳු මාහිමියන් වහන්සේ විසින් රාජ මාළිගාවේ දන් වළඳා අවසන දේශනා කළ මෙයට අදාළ කරුණු කීපයක් පිළිබඳ ව පහදා දෙන්නට කැමති යි.

සෙට්ඨිපුත්ත පේතවත්ථු ආදී වශයෙන් ආරම්භ කෙරෙන මෙම පේතවත්ථු දේශනාවන්හි ප්‍රකාශ වන්නේ ඒ ආකාරයෙන් එක් එක් කථාවස්තුන්හි දී කියැවෙන ප්‍රේතාත්මභාව ලද අය මෙලොව රිසි සේ ජීවත් වෙලා මිය ගිය පසුව ප්‍රේතයන් බවට පත්වෙලා අප්‍රමාණ දුක් විඳින ආකාරය යි.

බුදුරජාණන් වහන්සේ පළමු වැනි දම්සක් පැවතුම් සූත්‍ර දේශනාව එදා බරණැස ඉසිපතනාරාමයේ දී පස්වග භික්ෂූන් ප්‍රධාන දිව්‍ය බ්‍රහ්ම පිරිසට දේශනා කළ පසුව උන්වහන්සේගේ බුද්ධ ජීවන කාලය තුළ යම් යම් අවස්ථාවන්හි දී මෙම පේතවත්ථු දේශනාවන් වරින් වර සිදු කරලා තිබෙනවා.

ඒ අනුව උන්වහන්සේ එක් එක් අවස්ථාවල යම් යම් පුද්ගලයන් දුකට පත් ව එසේ දුක් විඳින ආකාරය පිළිබඳ ව උන්වහන්සේ වෙත කරුණු ඉදිරිපත් වූ විට උන්වහන්සේ ඊට හේතු ගෙනහැර පාමින් මෙවැනි ප්‍රේත භවයන් ලබන්නට හේතු වූ, පෙර ඔහු විසින් කරන ලද පාප කර්ම මෙම පුවත්වලින් පැහැදිලි කරනවා.

මේ පේතවත්ථු, අට්ඨුප්පත්ති හා පුච්ඡාවිස්සජ්ජන වශයෙන් කොටස් දෙකක් වෙනවා. යම් කිසි කරුණක් පැනනැගුණ කල්හි ඒ හේතුව විමසමින් කරන දේශනාව අට්ඨුප්පත්ති දේශනා නම් වෙනවා. පුච්ඡාවසික දේශනා කියලා කියන්නේ එදා වැඩ විසූ නාරද වැනි හාමුදුරුවරුන් විසින් යම් කරුණකට අදාළ ව ප්‍රශ්නයක් ඉදිරිපත් කර ඒ පිළිබඳ ව බුදුරජාණන් වහන්සේගෙන් විමසන විට ඒ කරුණට අදාළ ව බුදුරජාණන් වහන්සේ කරන දේශනා යි.

ඉතින් මේ පේතවත්ථු දේශනා ඒ ආකාරයෙන් බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද අට්ඨුප්පත්තික දේශනා ලෙස යි සැලකෙන්නේ.

දැන් අපි මෙහි ඇතුළත් දේශනා ගැන යමක් සොයා බලන්නට සුදුසු වෙනවා. මෙහි පණස් එකක් වූ පේතවත්ථු කථා අතරෙන් පළමුවෙන් ම එන සෙට්ඨිපුත්ත පේතවත්ථුව ගෙන බලමු. මෙහි එන කථාව වන්නේ අපේ බුදුරජාණන් වහන්සේ රජගහනුවර වේළුවනාරාමයෙහි වැඩවාසය කරන කාලයේ මහ ධනවත්, බලවත් සිටුවරයෙක් සිටියා. මහධන සිටුවරයා කියලා නමකුත් තිබුණා.

මොහුට පුතෙක් හිටියා. ඔවුන්ගේ ධනය විශාල නිසා ඔහුගෙන් පසුව එය පරිභෝග කිරීමට සුදුසු වැඩ පිළිවෙළ ගැන සිතා තම පුතුට කිසිදු අධ්‍යාපනයක් නො දී සියලු ධනය පුතුට පවරා කම්සැපයට ගිජු වූ රූමත් තරුණියක් සරණ පාවා දුන්නා. මේ නූගත් දෙපළ කිසිදු දානාදි පින්කමක් හෝ නො කර ඇති තරම් කම් සැප විඳ අවසන ධන විනාශයට පත් ව මහමඟට ඇද වැටුණා.

අන්තිමට මේ සිටු පුත්‍රයා ප්‍රසිද්ධ හොර දෙටුවෙක් බවට ත් පත් වුණා. නීතියේ රැහැණටත් හසු වී මරණයට පත් කරන්නට වධකස්ථානයට නගරය මැදින් රැගෙන යන විට සුලසා නම් නගර සෝභිනියක් ඔහු දැක සිත ඇදී ගොස් කරුණාව උපදවා අග්ගලා සහිත ආහාරයක් ඔහු වෙත යැවුවා.

ඒ අවස්ථාවේ බඩසයින් අධික ව පෙළෙමින් සිටි මේ තරුණ සොර දෙටුවා තමන් අතට පත් අග්ගලා කෑමට සූදානම් වෙත් ම ඔහු ඉදිරියේ මුගලන් මහරහතන් වහන්සේ පෙනී සිටියා. ඒ වෙලාවේ තව මොහොතකින් මරණයට නියම වී සිටින තමන්ගේ ආහාරය පිණිස මේ අග්ගලා ගැනීමට වඩා පින් සිදු වීම පිණිස මුගලන් මහ රහතන් වහන්සේට පිදීම පරලොව ගමනට උපකාර වේ යැයි සිතා උන්වහන්සේට එය පිදුවා.

ඒ පිනෙන් උසස් දිව්‍ය භවයක් ලබා ගැනීමේ හැකියාව තිබුණත් ඔහුගේ මරණාසන්න අවස්ථාවේ චුති සිතෙහි සුලසාව ගැන කාමරාගී සිතිවිල්ලක් පහළ වූ නිසා මහ නුග රුකෙක රුක් දෙවියෙක් වී උපන්නා.

***මෙම ලිපියේ ඉතිරි කොටස***
***මීළඟ බුදුසරණ කලාපයේ පළවේ.***



එක් සිත්ව,
එක් තැනක හිඳ
කුසලයෙහි
හැසිරෙන්න...
සියල්ලන්ම ආරක්ෂා වී නිවසේම සිට පොසොන් මංගල්‍යය සමරන්න.
පින් කැමති ඔබගේ පුණ්‍යාධාර පහත විහාරස්ථානයන් වෙත SOLO මගින් පුද දෙන්න.
විහාරස්ථානයට අදාළ Lanka QR කේතය Solo App එක මගින් Scan කර ඔබේ පඬුරු පූජා කරන්න.
Solo Direct Pay හරහා ද දායක විය හැකිය.
මිහින්තලා රජ මහා විහාරය
26905700
මිහින්තලේ
ශ්‍රී දළදා මාළිගාව
24682700
මහනුවර
සිතුල්පව්ව රජ මහා විහාරය
26926700
කතරගම
විහාරාධිපති - තිස්සමහාරාම
සඳගිරි උභය රජ මහා විහාරය
26689700
තිස්සමහාරාම
විමලක්‍ෂණ විහාරය
26659700
හෝමාගම
සංඝාවාස සංවර්ධන
භික්ෂු ගිලන් දායකත්ව අරමුදල
26659700
ග්‍රෑන්ඩ්පාස්
ශ්‍රී සම්බුද්ධාලෝක විහාරය
26683700
කොටුව
Solo App එක Download කර ගෙන නොමැති නම් මෙම
QR කේතය Scan කිරීම මගින් Download කර ඔබගේ පුණ්‍යාධාර පිරිනමන්න.
www.getsolo.lk
LANKAQR
SOLO
by HNB >>>
*කොන්දේසි සහිතයි. ෆිච් රේටිං AA- (lka) හැටන් නැෂනල් බැංකුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධීක්ෂණයට ලක් කරනු ලබන වාණිජ බැංකුවකි / Hatton National Bank PLC - PQ 82
justpay
mastercard
VISA



# විසකුරු සතුන් උපමා කොට දෙසූ දහම



බත්තරමුල්ල
සිරි සුදස්සනාරාම
සදහම් සෙනසුනෙහි
ප්‍රධාන අනුශාසක ආචාර්ය
**මිරිස්සේ ධම්මික නා හිමි**

**භාග්‍යවතුන් වහන්සේ විසින් සැවත්නුවර දෙව්රම් වෙහෙරේ දී දෙසූ දහම ස්කන්ධ පඤ්චකයෙහි නිසරු බව වටහාගෙන ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කොට චතුරාර්ය සත්‍ය අවබෝධයෙන් නිවනින් සැනසීමට මගෙකි.**
**විසකුරු සතුන් උපමා කොට සය ආකාර වූ ඇස, කන ආදී ආයතනයන් වරදවා හැසිරවීමෙන් සිදුවන මහා විපතත්, ඒවා නිවරැදිව අවබෝධ කොටගෙන කාම ඕඝ, භව ඕඝ, දිට්ඨි ඕඝ, අවිජ්ජා ඕඝ නම් සැඩ පහර තරණය කොට නිවන් මඟෙහි සියලු දුකෙන් නිදහස්වන ආකාරය පැහැදිලිවෙයි.**


භාග්‍යවතුන් වහන්සේ මෙසේ දේශනා කරති. මහණෙනි, බලවත් තෙද ඇති, දරුණු විෂ ඇති සර්පයෝ සතර දෙනෙක් වෙති. සැපට කැමති, දුකට අකමැති, ජීවත් වෙන්නට කැමති, මරණයට අකමැති පුරුෂයෙක් එහි පැමිණෙයි. ඔහුට මෙසේ කියන්නේ ය. එනම්, මේ බලවත් සර්පයෝ සතර දෙන නුඹ විසින් කලින් කල නැඟිට විය යුතු ය. නැහැවිය යුතු ය. කැවිය යුතු ය. නිදිකරවිය යුතු ය. මේ සතුන්ගෙන් එක් අයෙක් හෝ කිපෙන්නේ නම්, නුඹට මරණය හෝ මරණීය දුකකට පැමිණිය හැක්කේ ය. නුඹ විසින් යමක් කළ යුතු නම් කරන්න.

එය ඇසූ පුරුෂයා එම සතුන්ට බිය වී වෙනත් තැනකට පලායන්නේ ය. එහි දී මෙවැනි යමක් අසන්නට ලැබෙන්නේ ය. සතුරු වූ වධකයෝ පස් දෙනෙක් යම් තැනක දී දකින්නේ නම්, ඔවුහු එහිදී ම නුඹව මරන්නෙමු' යි නුඹ පිටුපස ලුහුබඳින්නෝ ය. මේ නිසා යමක් කළ හැකි නම් කරන්න. මෙහි දී ඒ පුරුෂයා දරුණු විෂ ඇති විසකුරු සර්පයන් සතර දෙනාට බිය වූයේ සතුරු වූ වධකයන් පස් දෙනාට බිය වූයේ තවත් තැනකට පලා යන්නේ ය. එහි දී මොහුට මෙසේ අසන්නට ලැබෙන්නේ ය. ඇතුළත හැසිරෙන මේ සවැනි වධකයෙක් යම් තැනක දී නුඹ දකින්නේ නම් එහි දී ම සිඳින්නෙමි'යි කඩුවක් ඔසවා ගෙන නුඹ පසු පස ලුහු බඳින්නේ ය. නුඹට කළ හැකි යමක් වේ නම් එය කරන්න. එවිට මේ පුරුෂයා එතැනින් ද බිය වී පලායන්නේ ය.

මෙසේ පලායන මේ පුද්ගලයා හිස් ගමක් දකින්නේ ය. යම් ගෙයකට පිවිසෙන්නේ නම් කිසිවක් නැති ගෙයකට ම පිවිසෙන්නේ ය. හිස්, ශූන්‍ය ගෙයකට ම පිවිසෙන්නේ ය. යම් බඳුනක් අල්ලන්නේ නම්, කිසිවක් නැති හිස් වූවක් ම අල්ලන්නේ ය. මොහුට මෙසේ කියන්නේ ය. එනම් ඇසෙන්නේ ය. ගම් පහරන හොරු දැන් මේ ගම නසන්නාහු ය. නුඹ විසින් යමක් කළ හැකි නම් එය කරන්න.

මෙහි දී මේ පුරුෂා විසින් බලවත් තෙද ඇති විසකුරු සතර සතුන්ට බිය වූයේ, සතුරු වූ පස් වධකයන්ට බිය වූයේ, ගම් පහරන සොරුන්ට බිය වූයේ තවත් තැනකට පලා යන්නේ ය.

එහි දී මහත් ජලාශයක් දක්නේ ය. මෙතෙර සැක සහිත ය. බිය සහිත ය. එතෙර උවදුරු රහිත ය. බිය රහිතය. එහි එතෙර මෙතෙර යාමට නැවක් හෝ පාලමක් හෝ නැත.



මහණෙනි මෙහි දී මේ පුද්ගලයාට මෙසේ සිතෙන්නේ ය. මෙය මහා ජලාශයකි. මෙතෙර සැක සහිත ය. බිය සහිත ය. එතෙර උවදුරු රහිත ය. බිය රහිත ය. එතෙර මෙතෙර කරන නැවක් හෝ පාලමක් නැත. මම තෘණ දර අතුකොළ රැස් කොට පහුරක් බැඳ ඒ පහුර මතින් අතින් ද පයින් ද වෑයම් කරමින් සුව සේ එතෙරට යාගත හැකි නම් හොඳ ය.

එසේ සිතා පහුරක් බැඳ එමඟින් සුව සේ පරතෙරට යන්නේ ය. තරණය කළ මේ පුරුෂයා නිවන සංකේතවත් කරන ගොඩබිම සිටී.

භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කළ ඒ උපමා මෙසේ පරමාර්ථ ධර්ම වශයෙන් විවරණය කෙරේ. 'මහණෙනි, බලවත් තෙද ඇති දරුණු විෂ ඇති සතර සර්පයෝ යනු පඨවි (තදබව) ආපෝ (වැගිරෙන බව) තේජෝ (උෂ්ණය) වායෝ (වායුව) නම් වූ සතර මහා භූතයන්ට නමෙකි."

"මහණෙනි, සතුරු පස් වධකයෝ යනු උපාදානස්කන්ධ පහයි. රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ නම් වූ පඤ්ච ස්කන්ධයන්ට නමෙකි. මහණෙනි, ඇතුළත හැසිරෙන ඔසවා ගත් කඩු ඇති සවන වධකයා යනු නන්දි රාගයට නමෙකි.

මහණෙනි, හිස් ගම යනු ආධ්‍යාත්මික ෂඩ් ආයතනයන්ට නමෙකි. මහණෙනි, ව්‍යක්ත වූ නුවණැති පණ්ඩිත පුද්ගලයා විසින් ඇසින් පරීක්ෂා කොට බලන විට කිසිවක් නැති බව වටහා ගනී. හිස් වූවක් ම බව වටහා ගනී. ශූන්‍ය වූවක් ම බව වටහා ගනී. මේ ලෙසිනි. කතිනුත්, නාසයෙනුත්, දිවෙනුත්, කයෙනුත්, සිතෙනුත් පරීක්ෂා කරන්නේ කිසිවක් නැති බව වටහා ගනී. හිස් වූවක් ම බව වටහා ගනී. ශූන්‍ය වූවක් ම බව වටහා ගනී.

ගම් පහරන සොරුන් නම් බාහිර ෂඩ් ආයතනයන්ට නමෙකි. ඇස කැමති අකමැති රූපයෙහි ගැටෙයි. කන කැමති අකමැති ශබ්දයෙහි ගැටෙයි. නාසය කැමති අකමැති ගන්ධයෙහි ගැටෙයි. දිව කැමති අකමැති රසයෙහි ගැටෙයි.

## ආසිවිසෝපම සූත්‍රය

කය කැමති අකමැති ස්පර්ශයෙහි ගැටෙයි. සිත කැමති අකමැති අරමුණුවල ගැටෙයි. මහණෙනි, මහා ජලාශය යනු කාම, භව, දිට්ඨි, අවිජ්ජා නම් වූ සතර ඕඝයට නමෙකි.

සැක සහිත වූයේ, බිය සහිත වූයේ මෙතෙර යනු සක්කාය හෙවත් ස්කන්ධ පඤ්චකයට නමෙකි. මහණෙනි, උවදුරු රහිත, බිය රහිත පරතෙර යනු නිවනට නමෙකි. මහණෙනි, පහුර යනු අරිඅටඟි මගයි. මහණෙනි, අතින් ද පයින් ද වෑයම් කරන්නේ ය යනු විරියාරම්භයට නමෙකි. මහණෙනි, තරණය කළ පරතෙරට පැමිණි "බමුණු තෙමේ ගොඩබිම සිටී" යනු රහතුන් වහන්සේ ට නමෙකි.

මෙම උපමා පෙළ සංක්ෂිප්තයෙන් විවරණය කර ගනිමු. විස සහිත, බිය සහිත සර්පයන් සතර දෙනා නම් පඨවි ආදී ධාතූන් රකින්නට මනුෂ්‍යයා මහත් සේ වෙහෙසෙයි. මේ ධාතූන්ගේ එකතුව කය හෙවත් රූපය ලෙස මෙහි ගනිමු. මේ කය වෙනුවෙන් කවා, පොවා, නහවා, සතප්පවා කුමක් කළ ද එක් ධාතුවක් හෝ ගිලන් වූයේ, විසිරී යන්නේ මහත් වූ ම දුකකි. මරණයට ද යම් විටෙක හේතුවකි. මෙකල පවත්නා "කොරෝනා" පටන් පිළිකා ආදී සියලු ම බලවත් ලෙස ගිලන් වන රෝගයන්ට හේතුවන්නේ මේ ධාතූන්ගේ කිපීම යි. එනම් අඩුවැඩි වශයෙන් නැඟී සිටීමයි.

එසේ නැඟී සිටින විට, විසිරෙන විට ප්‍රතිකාර කරන්නේ ය. යනුවෙන් නැවතත් රැක බලා ගන්නට කොපමණ වෙහෙසක් දැරිය යුත්තේ ද? මම, මගේ ය නම් වූ දැඩි දෘෂ්ඨියෙන් සිතින් උපාදානය කරගනිමින්, මේ සතර මහා ධාතූන්ගෙන් සමන්නාගත අස්ථිර, කය වෙනුවෙන් යම් අය පස්පව් දස අකුසල් කරති. ඔවුහු මෙලොවත් පිරිහී පරලොවත් දුගතියට ම වැටෙති.

මෙම ස්කන්ධ පඤ්චකය, මගේ ය, මම වෙමි, මගේ ආත්මයයි සිතින් දැඩිව ගැනීම නිසා සක්කාය දිට්ඨිය පෝෂණය වන්නේ ය. අස්මි මානය නැගී සිටින්නේ ය.


ලෝභ, දෝස, මෝහ, මද, මාන, දිට්ඨි වශයෙන් සුගති මඟ වළ කාලන, ආධ්‍යාත්මික සත්සුන් බව නසන්නා වූ බවට ස්කන්ධයෝ සමත් වන්නාහ. සවන වධකයා වූ නන්දිරාගය ඒ ඒ අරමුණ ඇලීම් බවට පත් කරන්නේ ය. ඇස, රූපය, චක්ඛු විඤ්ඤාණය, ස්පර්ශය, සැප, දුක්, මධ්‍ය ස්ථ විඳීම්, සඤ්ඤා, සඤ්චේතනා, තණ්හා, විතක්ක විචාර ඔස්සේ නන්දිරාගය මතුවෙයි. නැඟී සිටියි.

හිස්ගම යනු ආධ්‍යාත්මික ෂඩ් ආයතනයි. භාවිත සිත් ඇත්තා දහම් ඇසින් පිරික්සන්නේ නිත්‍ය, සුබ, ආත්ම ලෙස කිසිවක් නැති බවත් හේතුඵල ක්‍රියාවලියක් පමණක් වටහා ගනී.


'මම' යැයි ආධ්‍යාත්මයට ඇතුළත් කරගත් සම්මුතිය, පරමාර්ථ වශයෙන් හිස් බව ශූන්‍ය බව වටහා ගනී. මේ ලෙසින් කතින්, නැහැයෙන්, දිවෙන්, ශරීරයෙන් සිතින් පිරික්සන්නේ උපාදානයට යමක් හෝ යමෙක් නැති බව වටහා ගනී.

ගම් පහරන සොරු නම් වූ බාහිර ෂඩ් ආයතනයන් ද නුවණින් දකී. ඇස ආදී ආයතන කැමති අකමැති අරමුණුවල ගැටෙමින් ලෝභ, දෝස, මෝහ වඩා, කුසල් සිත් පැහැර ගනී. සිතේ සන්සුන් බව හෙවත් පස්සද්ධිය නැති වන්නට මේ බාහිර ආයතන හේතුවෙයි.

කාම ආදී සිව් ඕඝ සුළි සහිත ජලාශයයි. මේ සුළියකට හසු වුවොත් ජීවිත විනාශයකි. සසරට බියකරු විනාශයකි. මෙතෙර නම් වූ සක්කාය දිට්ඨිය පවත්වා ගැනීමයි. මේ නිසා ම ජාති, ජරා, ව්‍යාධි, මරණ සහිත අපමණ බියෙන් යුතු ය. පරතෙර නිවනයි. එහි ජාති, ජරා, ව්‍යාධි, මරණ ආදී දුක් නැත. පහුර නම් වූ ආර්ය අෂ්ටාංගික මාර්ගයම නිරෝධ ගාමිනී ප්‍රතිපදාව වන්නේ ය. අන් පිළිවෙත් මඟක් නැත. වෑයම් කිරීම නම් සතියෙන්, සමාධියෙන්, ප්‍රඥාවෙන් යුතුව වීර්යයි. මෙසේ තරණය කොට සැනසුන තැනැත්තේ නම් රහතුන් වහන්සේ ම ය. මෙතෙරින් එතෙරට අපට ද උතුම් වූ බුද්ධානුශාසනයකි.


පින් කෙත පුරා ඇසෙන,
ප්‍රඥාවේ දම් සිහ නදින් සැනසෙන
පොසොන් වන්දනාවට සැදැහැ සිතින් එක්වෙමු.
CDB
ඔබේ හිතවතා





# ඓතිහාසික මිහින්තලා - ලේක්හවුස් ආලෝක පූජා පුණ්‍ය මහෝත්සවය

**ශ්‍රී ලංකාවට නිර්මල බුදු දහමේ සම්බුද්ධාලෝකය බෙදා දුන් මිහින්තලේ පුණ්‍ය භූමිය ආලෝකවත් කරන ලේක්හවුස් මිහින්තලා ආලෝක පූජාව මෙවරත් 59 වැනි වරට පැවැත්වීමට දැන් සියලු කටයුතු යොදා ඇත.**

මිහින්තලා රාජමහා විහාරාධිපති භාරකාර ආචාර්ය වළවාහැංගුණවැවේ ධම්මරතන හිමිපාණන්ගේ අනුශාසනා පරිදි මෙවරත් අලෝක පූජාව සිදුකරන්නේ ලේක්හවුස් ආයතනයේ සභාපති කළමනාකාර අධ්‍යක්ෂ ජනාධිපති නීතිඥ ඩබ්ලිව්. දයාරත්න මහතා ප්‍රමුඛ අප අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ණ සංවිධානය හා උපදෙස් මත ය.

ලේක්හවුස් මිහින්තලා ආලෝක පූජාව ආරම්භ වූයේ 1963 දී ලේක්හවුස් නිර්මාතෘ ඩී. ආර්. විජයවර්ධන ශ්‍රීමතාණන්ගේ අදහසක් පරිදි ය. මෙරට ආයතන දැන් පවත්වන ආලෝක පූජා සියල්ලට ම පරමාදර්ශය වූයේ ලේක්හවුස් මිහින්තලා ආලෝක පූජාවයි. එදා සිටම අද දක්වාම ලේක්හවුස් ආලෝක පූජාවට සම අනුග්‍රහය දක්වන්නේ විදුලිබල මණ්ඩලයයි.

රටේ අන් සියලු ආලෝක පූජාවලට පරමාදර්ශ ආලෝක පූජාව වෙමින් ලේක්හවුස් ආලෝක පූජාව 1963 පොසොන් පසළොස්වක දින එවකට ලේක්හවුස්හි අධ්‍යක්ෂවරුන් ලෙස කටයුතු කළ රංජිත් විජයවර්ධන හා ජී.බී.එස්. ගෝමස් යන මහත්වරු මෙම මුල්ම ආලෝක පූජාව සංවිධානය කළහ. එදා ආලෝක පූජාව විවෘත වූ මොහොතේ මිහින්තලයේ සිටි පෙහෙවස් සමාදන් වූ හා වන්දනා කළ බැතිමතුන් මේ පූජාව ඇරඹූ අයට පින් දෙමින් සාධු නාද දුන් බව එකල ආලෝක පූජාවට එක්වූ අප පැරණි නිලධාරිහු පවසති.

මුලින්ම ආලෝක පූජාව සිදු කර ඇත්තේ අගනුවර සිට විශාල ලොරිරථවල මහා විදුලි ජනක යන්ත්‍ර රැගෙන විත් ඒවාට ඉන්ධන දමා ඇන්ජින් පණ ගැන්වීමෙනි.

මේ අයුරින් ආලෝක පූජාව ආරම්භ කළ බව රටපුරා ලේක්හවුස් පුවත්පත් වලින් ප්‍රචාරය වීමත් සමගම මිහින්තලාවේ දන්සැල් පැවැත්වීම ද වැඩිවිය. ජල පහසුකම් හා සෞඛ්‍ය පහසුකම් ද වැඩි විය. එය ගිහි ජනතාවට පමණක් නොව මිහින්තලා විහාරස්ථානයේ වැඩවසන හා මිහින්තලාවට පොසොන් පසළොස්වක දින වැඩමවන මහා සංඝ රත්නයට ද ඉමහත් සත්කාරයක් විය.

මිහින්තලා පුද බිමට 1978 දි ස්ථිර විදුලි ආලෝකය ලැබිණි. ලේක්හවුස් ආයතනයේ එවකට සිටි සභාපති රණපාල බෝධිනාගොඩ මහතාගේ ඉල්ලීම් අනුව හා ලේක්හවුස් ආලෝක පූජාවේ වියදම් සඳහා මිහින්තලා ආලෝක භාරය පිහිටවිය. මිහින්තලේ ප්‍රදේශයේ දහම්පාසල් හා පාසල් සිසු සිසුවියන් සිල් සමාදන් කර ඔවුන්ට සිල්රෙදි ලබාදීම චිත්‍ර හා කථික දහම් තරග පැවැත්වීම ආරම්භ විය. ඊට අමතරව ආලෝක පූජාවට සමගාමීව ලේක්හවුස් ආයතනය මඟින් මිහින්තලා ප්‍රදේශයට ජාතික ආගමික සාමාජීක සේවාවන් ද සැලසී ය.

මිහින්තලා ලේක්හවුස් ආලෝක පූජාවට ලොකුම තර්ජනය එල්ල වූයේ 1985 දීය. ඊට හේතුව පොසොන් පසළොස්වක දිනයට දින 16 ක් තිබියදී 1985 මැයි 14 වැනිදා අනුරාධපුරය ශ්‍රී මහ බෝධි පරිශ්‍රයට එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදීන් දරුණු ප්‍රහාරයක් එල්ල කිරීමයි.

ඒ නිසා එහි සිටි උවැසි උවැසියෝ 140 දෙනෙක් ජීවිතක්ෂයට පත්වූහ. ඒ ප්‍රහාරය නිසා මුළු රජරටම පමණක් නොව මුළු ලංකාවේම බෞද්ධ ජනතාව තැති ගත්හ.

කෙසේ වුවත් ලේක්හවුස් එවකට සිටි පාලනාධිකාරිය, තීරණය කළේ අනුරාධපුරයට මිහින්තලාව අවට ගම්වලට කොටි ප්‍රහාර එල්ල කළත් ලේක්හවුස් මිහින්තලා ආලෝක පූජාව කෙසේ හෝ සිදු කළ යුතු බවයි.

ඒ අනුව පාලනාධිකාරිය එවකට බුදුසරණ පත්‍රයේ කර්තෘ ලෙස සේවය කළ ප්‍රේමසිරි අබේසිංහ මහතාටත් පිරිස් කළමනාකාර ටිරල් ප්‍රනාන්දු මහතාටත් උපදෙස් දී ඇත්තේ මිහින්තලාවට ගොස් ආලෝක පූජාව සංවිධානය කරන ලෙසයි.

ඒ අනුව බුදුදහම අපේ රටට පැතිරූ සුවිශේෂ ස්ථානය පොසොන් පසළොස්වක දිනයේම කළුවරේ තැබීමට නොහැකි නිසාත්, ලේක්හවුස් ආලෝක පූජාව නොකඩවා පැවැත්විය යුතු නිසාත්, ලේක්හවුස් හි මේ රාජකාරිය දේවකාරියක් ලෙස කළ යුතු නිසාත් ඉහත නිලධාරිහු තවත් සේවක පිරිසක් සමඟ ගොස් 1985 මිහින්තලා ලේක්හවුස් අලෝක පූජාව සාර්ථක ලෙස දින තුනක් තිස්සේ සිදු කළහ.

ආලෝක පූජාවට සමගාමීව ලේක්හවුස් ආයතනය විසින් මිහින්තලා ආසන්නයේ පාසල් තුනක් සඳහා විද්‍යාගාර, දන්ත ශල්‍යාගාරයක් හා පුස්තකාලයක් ලබාදෙන ලදි. ඊට පසු කුරුන්දන්කුලම විදුහලට වඩු කාර්මික පුහුණු මධ්‍යස්ථානයක් ද මිහින්තලා මහ විද්‍යාලයට පරිගණක පුහුණු මධ්‍යස්ථානයක් ද ලබාදී ඇත.

විදුලිබල මණ්ඩලය විසින් 2002 වසරේදී මිහින්තලේ තිබූ පැරැණි විදුලිබල පද්ධතිය ඉවත් කොට භූගත විදුලිබල පද්ධතියක් සවි කළේ ය. ඒ නිසා ආලෝක පූජාවට තවත් උදව්වක් පහසුවක් ලැබී ඇත.

ඉහත දැක්වූ තර්ජන ගර්ජන මධ්‍යයේ වුවද අප ආයතනයේ සේවකයන්ගේ කැපවීම නිසා මිහින්තලා ආලෝක පූජාව නොකඩවා වසර 58 ක් පවත්වාගෙන ආ අයුරින් මෙවරත් කොරෝනා තර්ජන මධ්‍යයේ වුවද ලේක්හවුස් මිහින්තලා ආලෝක පූජාව මිහින්තලා විහාරාධිපති වළවාහැංගුණවැවේ ධම්මරතන හිමිපාණන්ගේ අනුශාසනා පරිදි පැවැත්වීමට ලේක්හවුස් සභාපති ජනාධිපති නීතිඥ ඩබ්ලිව්. දයාරත්න මහතා ප්‍රමුඛ අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කිරීම ලේක්හවුස් හි පැරණි සේවකයන් ලෙස අපි අගය කරමු.

රෝග පීඩාදිය මධ්‍යයේ වුව ද මෙවරත් පොසොන් පසළොස්වක දින දහස් ගණන් විදුලි බුබුළු වලින් ඒකාලෝක වන මිහින්තලය පූජා භූමිය රටටම කියා පාන්නේ ලේක්හවුස් ආයතනයේ බොදු මෙහෙවරේ ප්‍රෞඪත්වයයි. එමෙන්ම ජනමාධ්‍ය ඇමැති කෙහෙළිය රඹුක්වැල්ල, විදුලිබල ඇමැති ඩලස් අලහප්පෙරුම යන මහත්වරුන් මේ උතුම් ආලෝක පූජාවේ සියලුම කටයුතුවලට පූර්ණ සහයෝගය දක්වන බව කෘතවේදී ව මතක් කළ යුතුය.

**නිහාල් පී. අබේසිංහ**


## රාජ්‍ය පොසොන් උත්සවය සහ මිහින්තලා ආලෝක පූජාව ජූනි 23,24 සහ 25 දිනවලදී

මෙවර රාජ්‍ය පොසොන් උත්සවය සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට යටත්ව මිහින්තලා රාජමහා විහාරස්ථානය කේන්ද්‍ර කර ගනිමින් අද පොසොන් පුර පසළොස්වක පෝදා පැවැත්වේ. මිහින්තලා රාජමහා විහාරාධිපති හා භාරකාර ආචාර්ය වළවාහැංගුණවැවේ ධම්මරතන නා හිමියන්ගේ අනුශාසනා පරිදි ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ හා අගමැති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්

මිහින්තලා ලේක්හවුස් ආලෝක පූජාව මෙවරද 59 වන වරට ජූනි 23 සිට 25 දක්වා තෙදිනක් තුළ පැවැත්වේ. 1963 වසරේදී ආරම්භ කරන ලද මෙහි සංවිධායකත්වය ලේක්හවුස් ආයතනය මඟිනි. බැතිබර දායකත්වය සපයනු ලබන්නේ ඩයලොග් ආයතනයයි. සම අනුග්‍රහය ලංකා විදුලිබල මණ්ඩලය විසිනි.

24 වැනිදා පස්වරු 6 ට මිහින්තලා ලේක්හවුස් ආලෝක පූජාව විවෘත කරනු ලබන්නේ ජනාධිපතිතුමා විසිනි. මීට සමගාමීව ජාතික රූපවාහිනිය මඟින් පොහෝ දින සජීවී වැඩසටහන් ද මෙහිදී විකාශය කෙරේ.

එම අවස්ථාවට ඇමැතිවරුන් වන ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල, ඩලස් අලහප්පෙරුම, එස්.එම්. චන්ද්‍රසේන යන මහත්වරු ද ලේක්හවුස් සභාපති ජනාධිපති නීතිඥ ඩබ්ලිව්. දයාරත්න මහතා ඇතුළු ලේක්හවුස් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් ඇතුළු ආරාධිතයන්ද සහභාගිවීමට නියමිත ය.


මෙත් කරුණා සිත සැම තුළ ඉපදී
නිදුක් නිරෝගය දසතම පැතිරී
දහම් මගට මේ පින්බිම පිවිසී
පැතුම පොසොන් දින වේවා ඉත සිතිනී
පින්බර පොසොන් පොහොය දිනයක් වේවා!
COMMERCIAL BANK
ඔබේ ජය අපේ පැතුමයි



# අනුබුදු මිහිඳු මාහිමියන් සිහිපත් කරමින්

# පොසොන් පෝදා සෑම නිවෙසකම බෞද්ධ කොඩියක් ඔසවන්න

**වළවාහැංගුණවැවේ ධම්මරතන නා හිමි**

**සමස්ත ලෝකයටම බලපා ඇති කොවිඩ් 19 වසංගත තත්ත්වය යටතේ මෙවර මිහින්තලා ලේක්හවුස් ආලෝක පූජාව සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද යටතේ ජූනි 23, 24 හා 25 තෙදින සංවරණ සීමා යටතේ පැවැත්වීමට කටයුතු යොදා තිබේ. විදුලිබල මණ්ඩලයේ සම අනුග්‍රාහකත්වයෙන් හා ඩයලොග් සමාගමේ බැතිබර දායකත්වයෙන් පැවැත්වෙන මේ පින්කමට පසුගිය වසරටත් වඩා සංවරණ සීමා බලපැවැත්වෙන හෙයින් මේ වසරේ ආලෝක පූජාව හා අනුබුදු මිහිඳු මා හිමියන් උදෙසා පින්කම් මාලාව සිදු කරන ආකාරය පිළිබඳව මිහින්තලා රාජමහා විහාරාධිපති හා භාරකාර ආචාර්ය වළවාහැංගුණවැවේ ධම්මරතන නා හිමියන් සමඟ කළ සාකච්ඡාවකි.**

**මිහින්තලා ලේක්හවුස් ආලෝක පූජා පුණ්‍ය මහෝත්සවයට ඇත්තේ අඩ සියවසකටත් වැඩි ඉතිහාසයක්. මෙවර කොවිඩ් 19 වසංගතය හමුවේ වුවද එම පින්බර කටයුත්ත සිදු කෙරෙන ආකාරය පිළිබඳව යම් පැහැදිලි කිරීමක් කළ හැකි ද අපේ හාමුදුරුවනේ?**

පෙර කවදාටත් වඩා සෞඛ්‍යාරක්ෂිත ව අපට මෙවර ආලෝක පූජාව පවත්වන්නට සිදු වී තිබෙනවා. විශේෂයෙන්ම අප මෙහිදී පැවසිය යුතුයි මේ සියලු කටයුතු නිරෝධායන නීතිවලට අනුකූලව පවත්වන බව. කිසිදු ලෙසකින් එහි අඩුවක් වන්නට අප ඉඩ තබා නැහැ.

නිරෝධායන නීතිවලට අනුවයි අප කටයුතු කරන්නේ. ජනතා සහභාගිත්වයෙන් තොරව මේ කටයුතු කිරීමේ සීමාවකට පමණයි අප යටත්ව ඇත්තේ.

**ඒ කියන්නෙ අපේ හාමුදුරුවනේ ආලෝක පූජාවේ සියලු විවෘත කිරීම් ඇතුළු පින්කම් සිදු කෙරෙනවා ද?**

ඔව් ඒ සියලු කටයුතු සිදු කෙරෙනවා.

**ඒ ගැන පැහැදිලි කිරීමක් කළොත්.....**

ලේක්හවුස් ආයතනයේ සහ විදුලි බල මණ්ඩලයේ අනුග්‍රාහක දායකත්වයෙන් ආලෝක පූජාව සිදු කෙරෙනවා. එහි විවෘත කිරීම් ද පෙර පරිදිම සිදු කෙරෙනවා. එහෙත් පින්කම සිදු කෙරෙන්නේ අනිවාර්යයෙන්ම නිරෝධායන නීතිවලට අනුකූලව හා සියලු සෞඛ්‍ය මාර්ගෝපදේශවලට අනුකූලව බව මෙහිදී යළිත් සඳහන් කළ යුතුයි.

**ආලෝක පූජාවට සමගාමීව සිදු කෙරෙන අනෙකුත් චාරිත්‍ර, පූජා විධීන් ඒ ආකාරයෙන්ම සිදු කෙරෙනවාද?**

ඒ කිසිදු චාරිත්‍ර වාරිත්‍රයක අඩුවක් වන්නේ නැහැ. සියල්ල ඒ ලෙසින්ම සිදු කෙරෙනවා. ධාතූන් වහන්සේ වැඩම කරනවා. ඒ වගේම තේවාවන් පවත්වා කිරි ආහාර පූජා කිරීම් ඒ ලෙසින්ම සිදු කෙරෙනවා.

විශාලා මහනුවර තුන්බිය දුරුකිරීමට බුදුරජාණන් වහන්සේ විසින් රතන සූත්‍රය දේශනා කළා සේ වර්තමානයේ ශ්‍රී ලංකාව ඇතුළු ලෝකයටම බලපා ඇති කොවිඩ් 19 වසංගතය ඉක්මනින් දුරු වී ශ්‍රී ලංකාවාසීන් ඇතුළු සමස්ත ලෝකවාසී ජනතාවට සෙත් පතා අපි රතන සූත්‍ර දේශනාවක් පවත්වනවා.

මෙහිදී විශේෂයෙන්ම පැවසිය යුතු කරුණ වන්නේ මේ පිරිත් සජ්ඣායනාවට සහභාගි වන්නේ විහාරස්ථානයේ නේවාසික භික්ෂූන් වහන්සේ පමණක් බවයි. එමෙන්ම රතන සූත්‍ර දේශනාවට පෙර මහ පිරිත් පිරීමෙන් අනතුරුවයි ඒ කටයුතු සිදු කෙරෙන්නේ.

පිරිත් පින්කම සතියක් පුරා එනම්, ජූනි 20 වැනිදා සිට 27 දක්වා පවත්වනවා. එහි ආශිර්වාදය ලක්වාසී සැමට ලැබේවි.

**වෙනදට පොසොන් පෝ ද මිහින්තලා පුදබිම සැදැහැවතුන්ගෙන් පිරී ඉතිරී යනවා. මෙවර ජනතා සහභාගිත්වයක් සිදු වන්නේ නෑ. ශ්‍රද්ධාවත් බොදු ජනතාවට මේ මොහොතේ ඔබ වහන්සේ ලබා දෙන පණිවිඩය කුමක්ද?**

රටේ පවත්නා වසංගත තත්ත්වය යටතේ නිවසේ සිට පොසොන් සැමරීම කරන ලෙස ඉල්ලා සිටිනවා. එමෙන්ම මේ අවස්ථාවේදී සියලු ලක් වාසීන්ගෙන් විශේෂයෙන්ම ඉල්ලා සිටින්නේ අනුබුදු මිහිඳු මා හිමියන් සිහිපත් කරමින් සෑම නිවසක ම බෞද්ධ කොඩියක් ඔසවන ලෙසයි.

එහිදී නිසි ප්‍රමිතියෙන් යුතු බෞද්ධ කොඩියක් භාවිත කරන මෙන්ද බෞද්ධ කොඩිය නිසි ලෙසින් ම ඔසවන ලෙසින් ද ඉල්ලා සිටිනවා. මා දැක තිබෙනවා ඇතැම් බෞද්ධ කොඩි අනෙක් පැත්තට ඔසවා තිබෙනවා. අපි බෞද්ධ කොඩියට නිසි පරිදි සැලකිල්ලක් ගෞරවයක් දැක්විය යුතු වෙනවා.

එමෙන්ම ප්‍රතිපත්ති පූජාවෙන් බුදු හිමියන් පුදන්නට, අනුබුදු මිහිඳු මා හිමියන් වහන්සේට ගෞරව කරන්නට කටයුතු කරනවා නම් එය සැබෑ පොසොන් සැමරුමක් බවට පත්වෙනු ඇති.

**රාජ්‍ය පොසොන් උත්සවයක් ලෙසින් පවත්වන උත්සවයේ මෙවර ප්‍රභූ සහභාගීත්වය සිදු වෙනවා ද?**

ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් බුද්ධශාසන අමාත්‍යාංශයේ ලේකම්, බෞද්ධ කටයුතු කොමසාරිස් ජෙනරාල් ඇතුළු විශේෂ ප්‍රභූවරුන් රැසක් ඒ පින්කම සඳහා සහභාගි වනවා.

**වෙනත් වසරවලදී ආලෝක පූජාවට පූර්වයෙන් මිහින්තලා පුදබිමේ සිට විශාල කාර්යයන් රැසක් සිදු කෙරෙනවා. සුද්ධ පවිත්‍ර කිරීම්, වර්ණ ආලේප කිරීම් ආදිය, මෙවරත් ඒ කටයුතු සිදු කෙරුණාද?**

අවශ්‍ය කරන සුද්ධ පවිත්‍ර කිරීම් නිසි ලෙසින් සිදු කළා. ඒ වෙනුවෙන් යුද, නාවික හා ගුවන් හමුදාවත් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සැලකිය යුතු පිරිසක් කටයුතු කළා. ඒ වගේම ආරක්ෂක කටයුතුවලට පොලිසියත් සහභාගි වෙනවා.

**ඔබ වහන්සේගේ උපදේශකත්වයෙන් පසුගිය වසරවල මිහින්තලා පුදබිමේ සිදු කෙරුණු විශේෂ සේවාවන් ගැන සඳහන් කළොත්**


මිහින්තලය ජාතික උරුමයක් ලෙස නම් කිරීමටත්, රාජ්‍ය පොසොන් උත්සවය ගැසට් කර මිහින්තලයේ පැවැත්වීමටත් අප කටයුතු කළා.

එමෙන්ම පසුගිය වසරේ නොවැම්බර් මාසයේදී ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මිහිඳු මහ රහතන් වහන්සේගේ 2280 වැනි අනුබුදු මිහිඳු මාහිමි පරිනිර්වාණ සැමරුම් රාජ්‍ය උත්සවය පැවැත්වූවා. එවැනි උත්සවයක් රාජ්‍ය නායකයකුගේ ප්‍රධානත්වය ඇතිව මෙරට පැවැත්වුණේ වසර 1700 කට පසුවයි.

එම උත්සවයට සමගාමී ව මිහින්තලා පුද බිමේ පිහිටි ඓතිහාසික මිහිඳු මහ සෑය, මිහිඳු ලෙන් සෙනසුන, ධාතු මන්දිරය, පියගැට පෙළ ඇතුළු සුවිශේෂී ස්ථාන රැසක් ප්‍රතිසංස්කරණය කිරීමත් ආරම්භ කළා. ඒ වගේම සංවර්ධන කටයුතු ඇණ හිට තිබූ ධර්මශාලාවත් යළි ඉදිකිරීමට පියවර ගත්තා. එය දකුණු ආසියාවේ විශාලතම ධර්ම ශාලාව ලෙස නම් කළ හැකියි. එහි වරකට 5000 කට ධර්මය ශ්‍රවණය කිරීමට හැකි අයුරින් ඉදිවන්නේ.

**මිහින්තලා පුදබිමේ අනෙකුත් සංවර්ධන කටයුතු සිදු කෙරෙන්නේ කෙසේද අපේ හාමුදුරුවනේ..**

ඒ සියල්ල සෙමෙන් සිදුවනවා. මේ අවස්ථාවේදී රජයටත් විශාල ප්‍රතිපාදන වෙන් කරන්න බැහැ. ත්‍රිවිධ හමුදාවේ සහායෙන් උපරිම ලෙසින් කටයුතු සිදු වෙනවා. හැකියාවක් ඇති අය හෝ ආයතනවලට පුළුවන් මේ අවස්ථාවේදී මිහින්තලා පින්බිමේ සංවර්ධන කටයුතු සඳහා දායක වන්න.



**විහාරස්ථානයට දාන මාන දුර බැහැරින් සැපයූ අය සිටියා. මේ වනවිට ඒ අයට දානය සැපයීමට හැකියාවක් නොමැති පසුබිමක ඔබ වහන්සේලාට දානමාන කටයුතු බාධාවකින් තොරව සැපයෙනවාද?**

දානය ලැබෙන්නේ නැහැ. අප පන්සලේ දානය සකසා ගන්නවා. අඩුපාඩු රැසක් තියෙනවා.

**දානමාන කටයුතු සඳහා දායකත්වයක් ලබා දීමට කැමැති පින්වතුන් සිටිනවා. මේ අවස්ථාවේ ඒ අයට කළහැකි දේ ගැන පැවසුවහොත්?**

මිහින්තලා රාජමහා විහාරයට ගෙනැවිත් බාර දෙන්න පුළුවන්. එමෙන්ම විහාරවාසී සුරුක්කුලමේ ඉන්ද්‍රරතන හිමියන්ට 0714601781 අංකයෙන් අමතා ඒ සම්බන්ධ ව වැඩි විස්තර දැන ගන්න පුළුවන්. දානය සම්බන්ධව අපට දායකත්වයක් ලබා දෙන්නේ නම් ඒක ලොකු පිනක්.

**මේ වන විට වන්දනාකරුවන් කිසිවකු නැති මිහින්තලා පුදබිම පාලුවට ගිය ස්වභාවයක් පෙනෙනවා නේද අපේ හාමුදුරුවනේ.**

ඔව්, වන්දනාකරුවන් විතරක් නෙමෙයි. මිහින්තලේ විහාරය අවට හිටපු සුනඛයන් ඒ වගේම රිලව් වැනි සතුන් පවා අපෙන් ඈත්වෙලා ගිහින්. කන්න බොන්න තියෙන වෙලාවට එනවා. නැති වුණහම එතැනින් යනවා. ඒක ඉතින් ලෝක ස්වභාවයනෙ.

තාරක වික්‍රමසේකර


උරුමය වෙනුවෙන්
තබන වැදගත්ම පියවරට...
ජීවිතයේ තබන පියවර රැසක් අතරේ,
අපි උරුමය වෙනුවෙන් තබන පියවරක් තියෙනවා.
ඉතිං, ඔබේ ඒ පියවර ශක්තිමත් කරන්න වගේම හැඩකරන්නත්
DSI අපි මග බලන් ඉන්නවා.
DSI
ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම පාවහන්




## සාධු ජන සිත් පහන් කරමින්

# 59 වන වරටත් ඒකාලෝක වූ මිහින්තලා පුදබිම

**"සමණාමයං මහා රාජ ධම්ම රාජස්ස සාවකා තමේව අනුකම්පාය ජම්බුදීපා ඉධා ගතා"**

'අප ධර්මරාජයන් වහන්සේගේ ශ්‍රාවකයන් වෙමු. ඔබ සැම කෙරෙහි අනුකම්පාවෙන් දඹදිව සිට පැමිණියෙමු.'

මහින්දාගමනය යනු ලක්වැසි ජනතාව නව මංපෙතකට යොමුකරන ලද සුවිශේෂී හැරවුම් ලක්ෂයකි. එය ලාංකීය ඉතිහාසයේ ආගමික, දේශපාලනික, සමාජීය හා සංස්කෘතික වශයෙන් විශාල පරිවර්ථනයක් සිදුකරන ලද සුවිශේෂි සංධිස්ථානයකි. එනම් ලක්දිව වැසියන් ශිෂ්ටාචාරගත වීමේ හා බෞද්ධ ජනතාව බිහිවීමේ ඓතිහාසිකමය සිදුවීම මෙම මහින්දාගමනයත් සමඟ සිදුවී ඇති බව පෙන්වා දිය හැකි වේ. එහිදී පොසොන් පොහොය හා මිහින්තලාව කිසිසේත්ම අප හට අමතක කළ නොහැක.

මන්දයත් අනුබුදු මිහිඳු මහා රහතන් වහන්සේ මෙම බුදු දහමේ පණිවිඩය ලාංකේය බෞද්ධ ජනතාවට දායද කරනුයේ පොසොන් පොහෝ දිනක මෙම මිහින්තලා පර්වතය සාක්ෂි දරමින්ය.

එමඟින් මිහින්තලා පුණ්‍ය භූමිය ලක්වාසි සියලු බෞද්ධ ජනතාවට ඓතිහාසිකමය වශයෙන් කෙතරම් වැදගත් වන්නේද යන්න නිර්ණය කළ හැක.

ලක්දිව ධර්මද්වීපයක් බවට පරිවර්ථනය වීමේ ඓතිහාසික සිදුවීම පෙරදැරි කරගෙන අතීතයේ සිටම සියලු බෞද්ධ බැතිමතුන් පොසොන් සමයේ බුද්ධාලම්භන ප්‍රීතියෙන් යුක්තව මෙම පුදබිම වන්දනා මාන කිරීම නොකඩවා සිදු කරනු ලැබේ. එය වන්දනා මාන කිරීම ඔවුන් ඉතා පුණ්‍ය කටයුත්තක් සේ සලකනු ලැබේ.

අතීතයේ නන් දෙසින් පැමිණෙන බෞද්ධ බැතිමතුන් හට විවිධ හේතූන් මත මිහින්තලා පුණ්‍ය භූමිය වන්දනාමාන කිරීම බොහෝ දුෂ්කර කාර්යයක් වුවද වර්තමානය වන විට එය ඉතා පහසු කාර්යයක් බවට පත්ව ඇත. අතීතයේ අන්ධකාරය මධ්‍යයේ වන්දනාවට පාත්‍රවූ මිහින්තලා පුදබිම, වර්තමානය වන විට කිසිදු බාධාවකින් තොරව ආලෝකය මධ්‍යයේ වන්දනාමාන කිරීමට හැකියාව ලැබී ඇත. එහි කූටප්‍රාප්තිය නම් බුබුළු දසදහස් ගණනක් යොදාගනිමින් සමස්ත මිහින්තලා පරිශ්‍රයම ඒකාලෝක කරමින් නොකඩවා පවත්වනු ලබන මිහින්තලා "ආලෝක පූජාව" ය. බුදුන් පිදීමේ මෙම ආමිස පූජාව සීමාසහිත එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගම හා ලංකා විදුලිබල මණ්ඩලයේ සම අනුග්‍රහයෙන් අඛණ්ඩව වසර 58 ක් පුරා පවත්වන ලද්දකි.

සීමාසහිත එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගම, ලංකා විදුලිබල මණ්ඩලයේ සම අනුග්‍රහයෙන් මිහින්තලා පුද බිමෙහි ආලෝක පූජාව පැවැත්වීම ආරම්භ කරනුයේ වර්ෂ 1963 දීය. ඒ ලංකා විදුලිබල මණ්ඩලය රජයේ විදුලි කර්මාන්ත දෙපාර්තමේන්තුව ලෙස පැවැති අවධියේදීය. එදා සිට අද දක්වා ලංකා විදුලිබල මණ්ඩලය මෙම ආලෝක පූජාව සඳහා අනුග්‍රහය දක්වනුයේ එය තවත් එක් ලංකා විදුලිබල මණ්ඩලය මඟින් දියත්








කරනු ලබන සමාජ සත්කාරයක් ලෙසය.

එහිදී සෑම වසරකම පොසොන් සමයේ මෙම අලෝක පූජාවට සමගාමීව, මිහින්තලා පුදබිමෙහි අනන්‍යතා සංකේතය බඳුවූ ගෞතම බුදුරජාණන් වහන්සේගේ ඌර්ණ රෝම ධාතූන්වහන්සේ තැන්පත් කරමින් ඉදිකර ඇති අම්බස්ථල දාගැබ් වහන්සේ මෙන්ම සමස්ත මිහින්තලා පූජා පරිශ්‍රය ආලෝක කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විවිධ පියවර රැසක් ගෙන තිබේ.

එම පියවරයන්ගේ යොදාගැනීම මඟින් ලංවිම අපගේ අරමුණ වූයේ මිහින්තලාව වන්දනාමාන කිරීමට පැමිණෙන සියලු බැතිමතුන් හට තවදුරටත් අන්ධකාරය බාධාවක් කර නොගනිමින් ශ්‍රද්ධාවෙන් හා භක්තියෙන් යුතුව තම වන්දනා කටයුතු කිරීමට අවස්ථාව සලසා දීමය.

පොසොන් සමයට සමගාමීව පමණක් නොව ඊට අමතරවද මෙම ඓතිහාසික පුදබිමෙහි අභිවෘද්ධිය පිණිස කටයුතු කිරීමට අප විසින් අවධානය යොමු කරන ලදී. එහිදී මිහින්තලා පූජා භූමියේ හා දාගැබෙහි විදුලි සැපයුම් කටයුතුවල පැවැති යම් යම් අඩුලුහුඩුකම් පිළිබඳ සොයා බලා ලංවිම අප විසින් එම පූජා භූමියට සහ දාගැබ වෙනුවෙන් ස්ථාවර විදුලිබල පද්ධතියක් ලබාදීමට කටයුතු කිරීම සිදු කරන ලද අතර මෙහිදී අක්‍රමවත් තිබූ විදුලිබල පද්ධතිය මුළුමනින්ම නවීකරණය කිරීමට අප විසින් පියවර ගනු ලැබිණ.

එමඟින් පොසොන් සමයේ පමණක් නොව අනෙකුත් දිනවල මිහින්තලා පුදබිම වන්දනා මාන කිරීමට පැමිණෙන සියලු දෙස් විදෙස් බැතිමතුන්හට එම පූජා භූමිය හා දාගැබ් වහන්සේ බුද්ධාලම්භන ප්‍රීතියෙන් යුක්තව වන්දනා කිරීමට අවකාශය ලැබී ඇත.

කෙසේවුවද, සීමාසහිත එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගම හා ලංකා විදුලිබල මණ්ඩලයේ සම අනුග්‍රහයෙන් අඛණ්ඩව සිදුකරනු ලබන ආලෝක පූජාවේ මෙවර 59 වන අදියර කරා අප පැමිණ ඇත.

සියලු ලෝවැසි සත්වයාහට බෞද්ධ දර්ශනය සත්‍යයක් බැව් පසක් කර දීමට කමටහනක් ලෙස පැමිණි කොරෝනා වසංගත තත්ත්වය හමුවේ මෙවර මිහින්තලාව ආලෝකයෙන් ඒකාලෝක වුවද දහස් ගණන් බැතිමතුන්ගේ මුවින් පිටවන බුදුගුණ එම පුණ්‍ය භූමියෙහි නද නොදෙනු ඇත. නමුත් ඒ සියලු බැතිමතුන්ගේ සිත්සතන්හි බුද්ධාලම්භන ප්‍රීතිය ඇතිකරනු වස් ලංවිම එය අපගේ සමාජ මෙහෙවරක් සේ සලකා කොරෝනා වැලැක්වීමේ සියලු නීති රීති වලට අනුගත වෙමින් මෙවරද මිහින්තලා ආලෝක පූජාව සිදු කිරීමට අප බලාපොරොත්තු වෙමු.

එහිදී අතීතයේ අන්ධකාරය රජවෙමින් පැවති මිහින්තලා පුදබිම මෙම ආලෝක පූජාවෙන් ඒකාලෝක වූයේ යම් සේද, එලෙසම වර්තමානයේ කොරෝනා වසංගත තත්ත්වය මඟින් සියලු ලෝ වැසියන්ට උද්ගත කර ඇති අන්ධකාරය පළවා හැරීමට මෙම ආමිස පූජාව හේතු වාසනා වේවා යැයි ලංවිම අපි බැතිබර සිතින් ප්‍රාර්ථනා කරමු.





ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD

බැතිබර දායකත්වය



# සමාජය දුස්සීල වුණොත් විපත් බහුල වේ

**යම් භික්ෂුවකගේ අවුරුදු සියයක මහණ කම් කාලය තුළ එක් මොහොතක් පමණක් සියලු සතුනට මෙත් වඩා ඇත්ද උන්වහන්සේට දුර සිට ගෙනවුත් දන් පිදීමටත්, දෙපා අල්ලා වන්දනා කිරීමටත්, සුදුසු ය.**



මහා විහාරවංශික ශ්‍යාමෝපාලිමහා නිකායේ ශ්‍රී රෝහණ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායක හා විධායක කාරක සභික අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ඒකකයේ උපදේශක ශාස්ත්‍රපති

**දෙඩම්පහළ ශ්‍රී රාහුල හිමි**

භික්ෂූන් වහන්සේට පිරිපුන් සීලය සහිතව ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් යුතුව වාසය කරන ලෙසත්, ආචාර ගෝචර සම්පන්න වන ලෙසත්, සුළු වූ නමුත් වරදෙහි බිය දක්නා සුලුව ශික්ෂාපදයන්හි හික්මෙන ලෙසත් තථාගතයන් වහන්සේ අනුශාසනා කළහ. භික්ෂු පරමාර්ථ සහ භික්ෂු ආකල්ප සපුරා ගැනීම සඳහා නියත වශයෙන්ම මේ අනුශාසනයෙහි පිහිටා ක්‍රියා කිරීම භික්ෂු විනය පිටකයෙන් අවධාරණය වන්නේ ය. විනයෙහි ප්‍රකාශ වන අන්දමට ප්‍රාතිමෝක්ෂ ය දෙවැදෑරුම්ය. අවවාද ප්‍රාතිමෝක්ෂය සහ ආඥා ප්‍රාතිමෝක්ෂය යනුවෙනි.

ප්‍රථම බෝධි සමයෙහි එනම් බුදු වූ මුල් විසි අවුරුද්දක කාලය තුළ භික්ෂු ජීවිතය හැඩගැස්වීමට මෙන්ම පාලනයට ඕවාද ප්‍රාතිමෝක්ෂය ප්‍රමාණවත් විය.

බුදුරදුන් භික්ෂු සංඝයාට දුන් මේ අවවාදයට ප්‍රාතිමෝක්ෂය වශයෙන් සලකා එහි පිහිටා තදනුරූපව බ්‍රහ්මචරිය වාසයෙහි නිරත වූ අතර එය ජනතාවගේ විවේචනයට දෝෂාරෝපණයට ලක් නොවීය.

කල් යත් යත් ශාසනික පැවිද්ද ලබා ගැනීමට ඉදිරිපත් වූවන්ගේ සංඛ්‍යාව ඉතා විශාල විය. ඔවුන් අතර ධර්මයේ හරය, ගැඹුර තේරුම් ගත්තවුන් මෙන්ම විවිධ ජීවන කම්කටොලු, වධ බන්ධන, අපහසුකම් මග හරවා ගැනීමට බුදු සසුනට ගලා ආ සැප සත්කාර ලබා ගැනීම ආදි පටු පරමාර්ථ ඇතිව පැමිණි පිරිස් නිසා එහි ප්‍රාතිමෝක්ෂයෙන් සංවරව ජනාදර ගෞරවයට පාත්‍රව තිබූ භික්ෂු සමාජය මහජනයාගේ විවේචනයට දෝෂ දර්ශනයට ලක්වන්නට පටන් ගත්තේ ය. ආඥා ප්‍රාතිමෝක්ෂ නමින් හඳුන්වන විනය ශික්ෂා පැනවීමට බුදුරදුන්ට හේතු වූයේ මේ තත්ත්වයයි.

ආඥා ප්‍රාතිමෝක්ෂය පැනවීමට හේතු වූ කරුණු පිළිබඳව සවිස්තර තොරතුරු විනය පිටකයෙහි සඳහන්ව තිබේ. අවවාද ප්‍රාතිමෝක්ෂයෙන් මෙන්ම ආඥා ප්‍රාතිමෝක්ෂයෙන් ද අභිමත වූයේ යතාර්ථවත් භික්ෂු ආකල්ප ඇතිකොට ශීල විපත්ති, ආචාර විපත්තිවලින් තොර භික්ෂු සමාජයක පූජනීයත්වය ස්ථාවර කිරීමයි.

අංගුත්තර නිකායේ සත්තක නිපාතයේ දෙවැනි පණ්ණාසකයේ මහාවග්ගයෙහි එන අග්ගික්ඛන්ධෝපම සූත්‍රය මඟින් බුදුරජාණන් වහන්සේ දුස්සීල වූ භික්ෂුවට ලැබෙන ආදීනව මනාව නිදර්ශන සහිතව පැහැදිලි කළහ. දුස්සීලභාවය සංඝ සමාජයට පමණක් නොව දුස්සීල වූ පුද්ගලයාට ද කවර විපත්තියක් කරනු ලබන්නේ ද යන්න ඉන් මොනවට පැහැදිලි කෙරේ.

බුදුන් වහන්සේ තම මහත් වූ භික්ෂු සංඝ යා සමඟ කොසොල් රට සැරිසරන විට එක්තරා පෙදෙසක දැල්වුණු ගින්නෙන් බබළන මහත් වූ ගිනිකඳක් දැක වඩින ගමන නවත්වා ගසක් මුල පැන වූ අස්නෙහි වැඩ සිටිමින්, භික්ෂූන් සමඟ කරන ලද සාකච්ඡාවක් මෙසේ ය.

බුදුරජාණන් වහන්සේ –

මහණෙනි දැල්වුණ මනාව ගිනිගත් දැල්ලෙන් බබළන මහත් වූ ගිනිකඳ දක්කහුද?

භික්ෂූහු –

එසේය ස්වාමීනි,

බුදුරජාණන් වහන්සේ –

මහණෙනි, ඔබ කුමක් සිතන්නෙහිද? අර දැල්වුණ මනාව ගිනිගත් දැල්ලෙන් බබළන මහත් වූ ගිනිකඳ වැළඳගෙන හිඳගන්නේ නම් හෝ, නිදන්නේ නම් හෝ යම් ඒ මෘදු වූ තරුණ වූ අත්පා ඇති ක්ෂත්‍රිය කන්‍යා හෝ බ්‍රාහ්මණ කන්‍යාවක හෝ ගෘහපති කන්‍යාවක් හෝ වැළඳගෙන හිඳගන්නේ නම් හෝ නිදන්නේ නම් හෝ මේ දෙකින් කුමක් උතුම් වේද?

භික්ෂූහු –

ස්වාමීනි මෘදු වූ, තරුණ අත්පා ඇති, ක්ෂත්‍රිය හෝ බ්‍රාහ්මණ හෝ ගෘහපති කන්‍යාවක හෝ වැළඳගෙන නිදන්නේ නම් හෝ හිඳින්නේ නම් හෝ එයම උතුම්.

ස්වාමීනි, අර මනාව ගිනිගත්, ගින්නෙන් බබළන, මහත් වූ ගිනි කඳක් වැළඳගෙන හිඳින්නේ නම් හෝ නිදන්නේ නම් හෝ ස්වාමීනි එය දුකක් වේමැ'යි පැවසූ භික්ෂූන්ට බුදුන් වහන්සේ පිළිවදන් දුන්නේ මෙසේ ය.

මහණෙනි, දුශ්ශීල වූ, පාපධර්ම ඇති කැතකුණුවලින් පිරි කසළ ගොඩක් සමාන වූ සැඟවී වැරැදි කරන ශ්‍රමණයැයි. අඟවන අශ්‍රමණ වූ, බ්‍රහ්මචාරී යැයි හඟවන බ්‍රහ්මචාරී නොවූ, ඇතුළත කුණු වූ, වැගිරෙන, කසළ හටගත් ඒ දුසිල් මහණහට ඒ ගිනිකඳ වැළඳ ගැනීම මැනවි.

එයට හේතු කවරේද? ඒ කරුණු හේතුකොට ගෙන ඔහුට මරණය හෝ ඒ සමාන දුකක් හෝ වන්නේ ය. ඒ හේතුවෙන් කායයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් තොර වූ අයහපත් ගති ඇති නරකයෙහි නූපදී.

මහණෙනි, යම් හෙයකින් දුස්සීල භික්ෂුව අතර ක්ෂත්‍රිය හෝ බ්‍රාහ්මණ හෝ ගහපති කන්‍යාවක හෝ වැළඳගෙන හිඳ ගත්තේ නම් හෝ නිදන්නේ නම් හෝ ඒ හේතුවෙන් ඔහුට දිගු කලක් අහිත පිණිස දුක් පිණිස වන්නේ ය. කායයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ අයහපත් ගති නපුරු සේ පතිත වන නරකයෙහි උපදින බව සඳහන් කළ සේක.

එසේම බුදුන් වහන්සේ මෙසේ ද සඳහන් කරති.

යම් භික්ෂුවක් දුසිල්වත් ව මහාසාර ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, ගෘහපති කුලයන්ගෙන් වැඳීම ඉවසන්නේ ද ඊට වඩා කෙඳි සහිත කඹයකින් තමන්ගේ කෙණ්ඩා වෙලා ශක්තිමත් පුද්ගලයකු විසින් හම මස් ඇට ගැලවී යන්නට තරම් කරනු ලබන තද කිරීමෙන් ලබන වේදනාව විඳීම හොඳ බවත්,

සැදැහැවත් දායකයන් දෙන සිවුරු දුසිල්වත්ව පරිභෝග කරනවාට වඩා මුවහත් ආයුධයකින් පපුවට පහර කෑමේ වේදනාව විඳීම යහපත් බවත්,

සැදැහැවත් දායකයන් දෙනු ලබන පිණ්ඩපපාත දානය දුසිල්වත්ව වළඳනවාට වඩා රත් වූ ගිනිගත් යකඩ හුලකින් කට අරවා රත්වූ ලෝහ ගුලි බහාලන විට ඇතිවන වේදනාව විඳීම යහපත් බවත්,

ශ්‍රද්ධාවෙන් දායකයන් දෙන ඇඳ පුටු දුසිල්වත්ව පරිභෝග කෙරේ නම් ඊට වඩා යම් බලවත් පුරුෂයෙක් තම හිසින් අල්වා රත්වූ ඇඳක ගිනිගත් පුටුවක වාඩි කරවන විට ඇතිවන වේදනාව විඳීම යහපත් බවත්,

ශ්‍රද්ධාවෙන් දායකයන් පූජා කරන ලද විහාර පරිහරණය දුසිල්වත්ව සිටිමින් කරනවට වඩා බලවත් පුරුෂයකු විසින් තමා අල්වා හිස යටට කොට ගිනිගත් ලෝහ හැළියක බස්සන විට දැනෙන වේදනාව විඳීම යහපත් බවත්,

මක් නිසාද, එම වේදනා විඳ මරණයෙන් මතු අපාගත නොවන බවත්

දුස්සීලයා මරණයෙන් මතු අපාගත වන බවත් නිසා ය.

මේ සූත්‍ර දේශනාව ශ්‍රවණයෙන් පසු දුසිල්වත් භික්ෂූහු හැටනමක් තමන්ගේ මුඛයෙන් උණු ලේ වමනය කළෝ ය. තවත් සැටක් පමණ භික්ෂූහු සිවුරු හැර ගියහ. තවත් සැටක් පමණ භික්ෂූහු රහත් වූහ.

අනතුරුව මේ සූත්‍රය දැන ගත් භික්ෂූහු බොහෝ සෙයින් මහණදම් පිරීම දුෂ්කර යැයි සිතා සිවුරු හැර යන්නටත්, වූ හෙයින් ශාසන විලෝචය දැක බුදුන් වහන්සේ චූල්ල අග්ගික්ඛන්ධෝපම සූත්‍රය දෙසූහ.

එහිදී උන්වහන්සේ දේශනා කොට වදාළේ යම් භික්ෂුවකගේ අවුරුදු සියයක මහණ කම් කාලය තුළ එක් මොහොතක් පමණක් සියලු සතුනට මෙත් වඩා ඇත්ද උන්වහන්සේ දුර සිට ගෙනවුත් දන් පිදීමටත්, දෙපා අල්ලා වන්දනා කිරීමට සුදුසු බවත්, මරණින් මතු සුගතිප්‍රාප්ත වන බවත් ය.


එබැවින් පැවිදි උතුමන් අග්ගික්ඛන්දෝපම සූත්‍රකරණ දැන පැවිදි දම් පිරිය යුතු අතර, දායක කාරකාදීන් චූල්ල අග්ගිඛන්දෝපම සූත්‍ර කාරණා දැන සිවුපසයෙන් උපස්ථාන කිරීමත් වටනේ ය.

**මේ සූත්‍ර දේශනාව ශ්‍රවණයෙන් පසු දුසිල්වත් භික්ෂූහු හැටනමක් තමන්ගේ මුඛයෙන් උණු ලේ වමනය කළෝ ය. තවත් සැටක් පමණ භික්ෂූහු සිවුරු හැර ගියහ. තවත් සැටක් පමණ භික්ෂූහු රහත් වූහ.**



# මිහින්තලාවෙන් නැඟි සදහම් මහිමයෙන්
# මුලු රට සුවපත් වේවා!

අනුබුදු මිහිඳු හිමියන්
අපගේ පුණ්‍යවන්ත ලක් දෙරණට
ශ්‍රී සද්ධර්මය දයාද කළ
උතුම් පොසොන් මංගල්‍යය
සමරන මේ මොහොතේ
සැම සිත් නිවේවා...
සහන් සුව දැනේවා...
රෝ බිය දුරු වේවා...
මුලු රට සුවපත් වේවා!



(011) 4 667 222 | www.pabcbank.com |
පෑන් ඒෂියා බැංකුව
සැබවින්ම ශ්‍රී ලාංකීයයි



# වත් පිළිවෙත් සරු සමාජයක් සඳහා ...

**වසන්න සෘතුවට හට ගත් මල්පල මිස්සක පව්ව වටා දිදුලයි.මහසෑය මතින් වියන්බැඳි සුදු වළාවෝ සෞම්‍ය පරිසරයක් මවති. ආරාධනා ගල පාමුල අඳත් අඹ පොකුරු සුළඟට නැළැවේ. මේ පොසොන් අසිරිය අපට සිහිකරවන්නේ අනුබුදු මිහිඳු මාහිමි ගෙනා සදහම් පණිවිඩයයි.**

එදා අනුබුදු මිහිඳු මාහිමියන් මෙරටට වඩින්නේ
ධර්ම ධූතයාණන් වහන්සේ නමක් ලෙසට ය. උන්
වහන්සේ මෙරටට රැගෙන ආවේ ත්‍රිපිටකයයි. එහි
අන්තර්ගත වන්නේ තථාගත ධර්මයයි.එනම් දස
පාරමී, දස උපපාරමී, දස පරමත්ත පාරමී, දස
උපපරමත්ථ පාරමී ආදී වූ සමතිස් පෙරුම්පුරා
අනන්ත කැපවීම්කර අවබෝධ කරගත් ධර්මයයි.

මේ තෙවලා දහමේ පරමාර්ථය කෙලෙස්වලින්
තැවෙන ලෝකයා ඉන් අත්මුදවා ලෞකික හා
ලෝකෝත්තර සැපත සලසාදීම වේ. අනුබුදු මිහිඳු
මහ රහතන් වහන්සේ ද තෙවලා දහම අවබෝධ
කරගත් රහත් උතුමෙකි. ඒ අනුව
උන්වහන්සේ මෙරටට වැඩම
කරන්නේ තුනුරුවන් අදහන වඳින
පුදන ගරුකරන සාරධර්ම,
ගුණධර්ම පිරි බොදු සිරිත් විරිත් වත්
පිළිවෙත් සරු සමාජයක්
ගොඩනැඟීම උදෙසායි.

"සුබා සද්ධම්ම දේශනා"
යන්නෙන් කියැවෙන පරිදිම ශ්‍රී
සද්ධර්මය දේශනා කිරීම රට
වැසියාට සුවයක් ගෙන දෙන්නක් බව
උන්වහන්සේ දැන සිටි සේක.උන්
වහන්සේ මෙරටට වැඩම කරද්දී
ධර්ම ධූතයාණන් වහන්සේ
කෙනකුට පැවරෙන කාර්ය භාරය
ඉටුකිරීමට නම් තත්කාලීන ව
පවතින සමාජ වටපිටාව
සම්බන්ධයෙන් පැවැතිය යුතු
අවබෝධය උන්වහන්සේට නිසි ලෙස
පැවැතීම අතිශය වැදගත් ය.

**"බහුං වේ සරණං යන්ති**
**පබ්බතානි වනා නිච**
**ආරාම රුක්ඛ චෙත්‍යානි**
**මනුස්සා භය තජ්ජිතා"**

බියෙන් ,සැකයෙන් පෙළුණු මිනිසුන් ගස්,ගල්,
වනාන්තර ආදී දේ අදහමින් පිහිටක් බලාපොරොත්තු
වූ බව කියැවේ. මේ බිය සැක දෙකෙන් තැතිගත්
මිනිසුන්ගේ බිය සැක දුරුකිරීම සඳහා මිහිඳු
මාහිමියෝ ත්‍රිපිටකයේ සඳහන් අගනා සූත්‍ර ධර්ම
උපයෝගී කර ගත්හ.

මුලින්ම උන්වහන්සේ දේශනා කළේ චූල්ලහත්ති
පදෝපම සූත්‍රය යි.අනතුරුව සච්ච
සංයුක්තය,දේවතා සූත්‍ර සහ දම්සක් පැවැතුම් සූත්‍රය ද
දේශනා කරනු ලැබිණි.විශේෂයෙන් ප්‍රේත වස්තු
විමාන වස්තු ආදී දේශනාවන් පවත්වන්නේ එදා
පැවැති සමාජයේ පසුබිම තේරුම් ගැනීමෙනි.එනම්
විවිධ ඇදහිලිවලින් අතරමං වී සිටි ජනයා
මුදවාගැනීමට ය.

ප්‍රේතවස්තු පිළිබඳව දේශනා කිරීමෙන් පව්කළ
පසු විපාක වශයෙන් ප්‍රේත ලෝකවල ඉපදී දුක්විඳින
ආකාරය කියැවේ. විමාන වස්තු මඟින් අර්ථවත්
කරනුයේ පින්කරදිව්‍ය විමානවල උපදින අය
සම්බන්ධයෙනි. මෙයින් මිනිසුන්ට වඩාත් යහපත්
ක්‍රියාවන්ගේ නියැළෙන ආකාරය සිතට තදින් කාවදින
පරිදි දේශනාකිරීමේ හැකියාව උන්වහන්සේ සතුව
පැවැති බව පෙනේ.එය ධර්ම දේශකයාණන්
වහන්සේ නමක් සතු සුවිශේෂී හැකියාවකි.

දේවානම් පියතිස්ස මහ රජු ඇතුළු
හතලිස්දහසක් පිරිසට දේශනා කළේ චූල්ලහත්ථි
පදෝපම සූත්‍රය යි.ඉන් අර්ථවත් කළේ තුනුරුවනේ
වටිනාකම ය. එනිසාම සකල ජනයා තෙරුවන් සරණ
ගිය බෞද්ධයින් බවට පත්වූහ.

දේවදූත සූත්‍රය ද මෙහිලා දේශනා කළ වැදගත්
අංගයකි. ඉන් කියැවෙන්නේ ලෙඩුන් මළමිනී හා
වයෝවෘද්ධ පුද්ගලයින් ආදී සිත කළ
කිරවන දර්ශන දැකීම දිව්‍ය
ලෝකයෙන් එන දේව ධූතයින් ලෙස
භාරගත යුතු බවයි. එනම් අනිත්‍ය
අවබෝධය සඳහා, නැතහොත්
යතාර්ථය තේරුම් ගැනීමට මේවා
වටිනා නිමිති බවයි.



අනුරාධපුර ලංකාරාමාධිකාරී
උතුරු මධ්‍යම දිසාවේ ප්‍රධාන
අධිකරණ සංඝනායක

**රැළපනාවේ**
**ධම්මජෝති හිමි**

මිහිඳු මාහිමියන් දෙසූ බාල
පණ්ඩිත, ලක්ඛණ සූත්‍රය තුළ සමාජය
මිනිස් කොට්ඨාස දෙකකට බෙදා
දක්වයි. බාලයන් යනු ගුණයෙන් බාල
අයයි.පණ්ඩිතයින් යනු
ප්‍රඥාවෙන්,උගත්කමින් ඉහළ අයයි.
එනිසා බාලයන් ඇසුරු නොකර
පණ්ඩිතයින් ඇසුරු කිරීමේ අගය
එයින් පෙන්වයි.

බාලයා සිතීමෙන්,වචනයෙන්
මෙන්ම ක්‍රියාවෙන් නරක දේ ම කරයි.
නැතිනම් අදත්තාදාන ,ව්‍යාපාද
,කාමමිත්‍යාචාර යන සියල්ලේ
පැටලෙයි. ඔහුගේ කය, වචනය සහ මනස සංවර
නැත. සාමාන්‍ය ජනයාට යහපත් ජීවිතයක් සඳහා
උපකාරීවන ධර්ම මාර්ගය මේ ඇසුරින් උන්වහන්සේ
පෙන්වා දුන් සේක.

ඒනිසාම බාලයන් හඳුනාගැනීම පිළිබඳව වැඩි
වශයෙන් අවධාරණය කළ මිහිඳු මාහිමියෝ මංගල
සූත්‍රයේ එන "අසේවනාච බාලානං "ආදී
ධර්මෝපදේශයන් ගෙනහැර දැක්වූහ.

මෙනිසා ජීවිතවලට වටිනාකමක් දෙන්නට, මව
පියා දරුවන් ආදී සමාජ තනතුරු අතර අන්‍යොන්‍ය
බැඳීමට ගරු කරන්නට හැකි සමාජයක් නිර්මාණය
කිරීමෙහිලා මිහිඳු මාහිමියන් වදාරන ලද තථාගත
සද්ධර්මය මහෝපකාරී විය. ඒ ගොඩනැඟුණු
සංස්කෘතිය ආරක්ෂා කරගැනීම මේ උතුම්
පොසොන් පොහෝදින අප අවබෝධ කරගත යුතු
යතාර්ථය වේ.



# Poson Message

Poson poya day is the most significant day for Sri Lankan Buddhists. Arahath Maha Mahinda Thero came to Sri Lanka on a Poson poya day , with the supreme message of the Buddha including, the four noble truth and the profound teachings. King Devanampiyathissa the ruler of Sri Lanka , at that time met this noble seven-member group headed by Arahath Maha Mahinda Thero at Mihinthala Cliff in Anuradhapura for the first time. With the respectful invitation of the King ,this noble group was willing to spread the message of Dhamma .

In this first meeting, after introducing himself and his noble group, the Arahath Maha Mahinda Thero explained to the King , the purpose of their journey to this island. For the benevolence of the Sri Lankans, Arahath Maha Mahinda Thero settled down in this country with the intension of conveying the profound teachings of the Buddha. With immense respect to the Buddha, Dhamma, and Sanga, the King and the people offered the Mahamewuna Park to the Buddha Sasana and built the first Monastery which became the Center of Buddhist propagation.

King Devanampiyathissa, Queen Anula, the ministers and the public sought refuge in the Noble Triple Gem. Arahath Maha Mahinda Thero preached the "Chulla Haththipadopama Sutta" to the devotees . Then the King inquired as to how the Buddha Sasana was to be established in Sri Lanka . Arahath Maha Mahinda Thero then explained that someone born in Sri Lanka should get ordained and disciplined in Dhamma for the proper establishment of the Buddha Sasana in the country.

Minister Arittha and fifty five followers consented to be ordained and that was the inception of a proper Buddha Sasana in Sri Lanka.

Not only the establishment of the Buddha Sasana, but also the positive change to the entire socio-economic culture of Sri Lanka was the most significant result of the arrival of Arahath Maha Mahinda Thero. The Economy, Art, Agriculture, Languages, Irrigation Systems etc. , were developed in Sri Lanka by the guidance of the new traditions and by the diversly skilled individuals and artisans who came to the county later.

Sri Lankans became spiritually well cultured and prosperous as a result of the Dhamma and the Buddhist principals introduced by Arahath Maha Mahinda Thero and his followers.

Arahath Maha Mahinda Thero is thus respected by the Sri Lankans and would only be considered second to the Buddha.

May all of you be well and happy by the blessings of the Buddha, Dhamma and Sangha on this Poson poya day!

Dr. Mirisse
Dhammika Thero


රජු නැවතුණි
වැසියන්ද නැවතුණි
ධර්මය පැතිරුණි
නිවී සැනසුණි
AIA ඉන්ෂුවරන්ස් සමඟින් මේ උතුම් පොසොන් මංගල්‍යය බැතිබරව සමරමු.
HEALTHIER, LONGER, BETTER LIVES
AIA Insurance Lanka Limited (Co.No.PQ 18 PB) විසින් නිකුත් කරන ලදී. 06/24/2021



# බෞද්ධ සදාචාරය රැක ගනිමු



**ශ්‍රී ලාංකික සියලු ජනතාවගේ ප්‍රධාන ජාතිකෝත්සව දිනයක් ලෙස පොසොන් පොහොය අපට ඉතා වැදගත්. සිංහල ජාතිය ප්‍රාණය ලැබුවේ ද රජුගේ පටන් රටවැසියන් දක්වා සියලු දෙනාම බෞද්ධ සිරිත් විරිත් අනුව හැඩ ගැසෙන්නට ආරම්භ වූයේ ද පොසොන් පෝ ද සිදු වූ මහින්දාගමනයත් සමඟයි.**

ගත වූ සියවස්
විසිතුනක
කාලය
මුළුල්ලේ
සිරිලක
ධර්මදූතයන්
වහන්සේලා
මේ උරුමය
සිතින් දරා
ජාතියට බුදු
බණ ඉගැන්වූහ.
සදාචාරය
ගොඩනැගූහ. යහපත්
සිරිත් විරිත් කියා දුන්හ.
පාපයේ බියත්,
කුසලයේ යහපතත්
කියා දුන්හ. දුකෙන් මිදී
සහනශීලී ජීවිතයකට
මං පෙත් විවර කළහ.
පත පොත කියා දුන්හ.
ජීවිතයේ කවරම
අභියෝගයක් වුව
සාර්ථකව විඳ දරා
ගන්නට අවශ්‍ය
මානසික උසස් බව
ගොඩනැංවූහ.

තිසරණය පිහිට කොට ගත් ජාතියක් පංචශීලය සුරකිමින් අවිහිංසාවාදී දිවි පෙවෙතක් ගත කරන ජාතියක් බවට පත් වූයේ බුදුදහම අපේ දායාදය බවට පත්වීමෙන් පසුව ය.

පන්සල කේන්ද්‍ර කරගත් ගමක භික්ෂුව ප්‍රධාන මුර දේවාතවා ද, කුල දේවතාවා ද වෙමින් නව සංඝ සමාජයක සමාරම්භය මේ සමඟ අපට උරුම විය. ලෝකයේ වෙන කවර සමාජයකවත් නොමැති පරිදි දානය, පරිත්‍යාගය, ආගන්තුක සත්කාරය, මව්පිය වැඩිහිටි උපස්ථානය, ත්‍රිවිධ බෝධි වන්දනාව පෙරටු කර ගත් සිංහල ජන ජීවිතය මෛත්‍රිය, කරුණාව වැනි විශිෂ්ට ආධ්‍යාත්මික ගුණාංගයන්ගෙන් පොහොසත් වන්නට වූයේ මෙම විශිෂ්ට මිහිඳු සංස්කෘතියේ දායාද වශයෙනි.

ගමේ පන්සලේ ධර්ම ශාලාව, ප්‍රධාන අධ්‍යාපන කේන්ද්‍රස්ථානය පමණක් නොව සමාජ කටයුතුවල මූලස්ථානය බවට ද පත් විය. පැරණි විහාරස්ථානයන්හි අදත් ශේෂ ව පවතින යෝධ ධර්ම ශාලා අපට කියා පාන්නේ ජනතාවක් හැඩ ගැසූ ශ්‍රේෂ්ඨ අතීතයයි.

සියලු දෙනා බිම වාඩි වී බණ ඇසූ, දහම් කතා පැවැත්වූ, ධර්ම සාකච්ඡා කළ, ජාතක කතා ශ්‍රවණය කළ, ධර්ම ශාලාව ජන දිවියේ තක්සලාව ම විය. පාපයෙන් මිදුණු , කුසලයෙහි යෙදුණු ජාතියක් අපට බිහි වන්නේ මෙම ධර්ම ශාලාවෙන් සිදුවූ ධර්ම සන්නිවේදනය හේතුවෙනි.

විශිෂ්ට සංස්කෘතියත් අපට දායාද වූ පොසොන් ද අප සිහිපත් කළ යුත්තේ අපගේ ශ්‍රේෂ්ඨ ධර්ම සන්නිවේදකයාණන් වූ මහා මහින්ද මහරහතුන් වහන්සේ ය.

බුදුරජාණන් වහන්සේගේ ගාම්භීර දර්ශනය රැගෙන පැමිණි මිහිඳු හිමියන් ප්‍රධාන ධර්මදූත පිරිස ප්‍රථමයෙන් ධර්මය දේශනා කරන්නට රටේ නරපතියා වූ දෙවනපෑතිස් මහරජතුමා ම තෝරා ගැනීම මිහිඳු හිමියන්ගේ දූරදර්ශී බව ප්‍රකට කරවයි. බොහෝ දෙනා තවමත් විශ්වාස කරන්නේ මෙය අහම්බෙන් සිදු වූ හමුවීමක් ලෙසයි. එහෙත් ඓතිහාසික සාක්ෂි අපට ප්‍රත්‍යක්ෂ කරන්නේ මිහිඳු හිමියන් හා දෙවනපෑතිස් හමුව පෙර සැලසුම් කළ වැඩ සටහනක ප්‍රතිඵලයක් ලෙසයි.

මිහිඳු හිමියන් රටේ රජතුමා හමු වී දහම් දෙසීමට මිහින්තලයට වැඩම කළ අතර ඒ බව රජු ද දැන සිටියේ ය. රජු බෞද්ධයකු නොකොට රට වැසියාට බණ කීමෙන් පලක් නොවන බව මිහිඳු හිමියෝ දැන සිටියහ. එබැවින් රජු හමුවීමට සැලසුම් කෙරුණු අතර රජුගේ බස ද මිහිඳු හිමියෝ ඉගෙන පැමිණියහ. රජුගේ ප්‍රඥාව විමසන්නට අඹ පැනය ඉදිරිපත් කළ අතර එය සාර්ථකව විසඳීමෙන් රජුගේ අවබෝධය පසක් කෙරිණි. තෙරුවන් ගුණ මෙම රටවැසියාට අවබෝධ කළ හැකිය යන්න එයින් දැනගත් මිහිඳු හිමියෝ රජුට චුල්ලහත්ථිපදෝපම සූත්‍රය දේශනා කොට වදාළහ. එසේ ඇරඹි ලක්දිව ධර්මදූත මෙහෙවර ඉතා සාර්ථක ව සිරිලක ධර්මද්වීපයක් බවට පත් කෙරිණි.

ගත වූ සියවස් විසිතුනක කාලය මුළුල්ලේ සිරිලක ධර්මදූතයන් වහන්සේලා මේ උරුමය සිතින් දරා ජාතියට බුදු බණ ඉගැන්වූහ. සදාචාරය ගොඩනැගූහ. යහපත් සිරිත් විරිත් කියා දුන්හ. පාපයේ බියත්, කුසලයේ යහපතත් කියා දුන්හ. දුකෙන් මිදී සහනශීලී ජීවිතය–කට මං පෙත් විවර කළහ. පත පොත කියා දුන්හ. ජීවිතයේ කවරම අභියෝගයක් වුව සාර්ථකව විඳ දරා ගන්නට අවශ්‍ය මානසික උසස් බව ගොඩනැංවූහ.

අතීතයේ ධර්ම ශාලාවෙහි කළ මෙම කාර්ය භාරය වර්තමානයේ ජන මාධ්‍ය වෙතට හුවමාරුව තිබෙයි. එහෙත් විද්‍යුත් සන්නිවේදනයේ විසම ජනක දියුණුව හේතුවෙන් වර්තමානයේ තොරක් නැති දේශනා රූපවාහිනී, ගුවන් විදුලි පමණක් නොව සී.ඩී ඔස්සේ පැතිර පවතී.

පොහෝ දිනයෙහි උපෝෂථ ශීලයෙහි ද පිහිටා විහාරස්ථානයට නොගොස් ගෙදර රූපවාහිනියෙන් බණ අසන උපාසක උපාසිකාවෝ ද අද අපට වෙති.

ධර්ම සන්නිවේදනය පිළිබඳ බුදුරජාණන් වහන්සේ දේශනා කළ අවවාද කිසිවක් නොගෙන ඇතැම් දේශකයන් වහන්සේලා නළුවන් විකටයන් බවට පත්ව සිටීම කොයි තරම් ඛේදවාචකයක් දැයි සිතා බලන්න.

ධර්ම දේශනාවක් විනෝද සමයක් බවට දේශකයන් වහන්සේලා පත් කර ගන්නේ නම් අපට බර්ටි ගුණතිලකයන්ගෙන් වැඩක් තිබේද? ටෙනිසන් කුරේලා කරන කාර්ය භාරය කරන්නට බෞද්ධ ධර්ම සන්නිවේදකයන් ඉදිරිපත් වීමත්, නමස්කාරයවත් නොදන්නා බෞද්ධයන් කට ඇර ගෙන තමාටම සිනාසෙන්නටත් පුරුදුව සිටීම නූතනයේ ධර්මයට අත්වූ බරපතළම පහරක් බව කිව යුතු ය.

බුදුහිමියන්ට, මිහිඳු හිමියන්ටත් නිගා දෙන මෙම දේශකයන් වහන්සේලා ශ්‍රේෂ්ඨ බුද්ධ ධර්මය දෙසන්නට සැකසූ ධර්මාසනවලට නැඟ සුපර්ඩාන්ස්ලා වැනි බාල පහත් තත්ත්වයට ඇද වැටීම මිහිඳු උරුමය කාබාසිනියා කර දැමීමකි.

මිනිසුන්ගේ දුර්වලතා අනුකම්පාවෙන් පෙන්වා දී ඒවා ධර්මානුකූල ව සකසා ගැනීමට මඟ පෙන්වනවා වෙනුවට ඒවාට සිනාසීම, හාස්‍යයට ලක් කිරීම ධර්මය අධර්මය කිරීමක් නොවේද?

බුදුරජාණන් වහන්සේ අංගුත්තර නිකායේ උදායි සූත්‍රයෙහි දහම් දෙසීම පහසු නොවන බවත්, දේශකයා තුළ ගුණ 05ක් පිහිටුවා ගෙන දහම් දෙසිය යුතු බවත් වදාළහ.

1. ‘ආනුපුබ්බී කථං කථෙස්සාමීති’ ආකුල බවින් මිදී මුල මැද අග යහපත් වන පරිදි පිළිවෙළක් අනුව දහම් දෙසමි' යි සිතා බණ කිව යුතු ය.

2. “පරියාය කථං කථෙස්සාමීති” ඒ ඒ දෙය එසේ වීමට හේතු දක්වමින් අර්ථය විකෘති නොවන ලෙස සුදුසු වූ කතාවක්ම කියමි’ යි සිතා බණ කිව යුතු ය.

3. “අනුද්දයතං පටිච්චකථං කථෙස්සා මීති”
දුකට පත්වූවන් එයින් මිදවීම පිණිස ශ්‍රාවකයා කෙරෙහි අනුකම්පාවෙන් හා මෛත්‍රී සිතින් ම බණ කිව යුතු ය.

4. “අමිසන්තරො කථං කථෙස්සාමීති”
ලාභාපේක්ෂාවෙන් හෝ කීර්ති ප්‍රශංසාදිය අපේක්ෂාවෙන් හෝ බණ නොදෙසිය යුතු ය.

5. ‘අත්තානං පරං අනුපවාච්ච කථං කථෙස්සාමීති”
තමා හුවා නොදක්වා, අන්‍යයන් හෙළා නොදක අන්‍යයන්ගේ ගුණ නොනසන ලෙස දහම් දෙසිය යුතු ය.


උදායි තෙරුන්ට බුදුරජාණන් වහන්සේ වදාළේ මෙම කරුණු පහ කෙරෙහි අවධානය යොමු නොකොට දහම් දෙසන්නාගේ ධර්මය පිරිසුදු ධර්මය නොවන බවයි. එයින් ශ්‍රාවක දේශක දෙපිරිසට ම අර්ථයක් සිදු නොවන බවයි. එසේ නම් සී.ඩී බණ දෙසන මුදලාලිලා මෙම ප්‍රධාන ධර්ම සන්නිවේදන මූල ධර්ම පවා බිඳ දමා තිබෙයි.

බුදුරජාණන් වහන්සේගේ ධර්මය සාන්දෘෂ්ඨික ය. එනම් ඇස් පනාපිට ම ‘අකාලිකෝ’, කල් නොයවා ප්‍රතිඵල ලැබිය හැකි ධර්මයකි. සී.ඩී. බණවලින් ඒවා ලැබිය හැකිද? බුදුහිමියන් අභය රාජ කුමාරයාට වදාළේ කවර සත්‍යයක් වුව ද එය කීමට අවැඩදායක වේ නම්, ඇසීමට අප්‍රිය වේ නම් ඒ දේ නොකිව යුතු බවයි. මේ මූල ධර්මය සී.ඩී. බණකරුවන් උල්ලංඝනය කර තිබෙයි.

එමෙන්ම සුභාසිතවා සූත්‍රයේ දී වදාළේ, සුදුසු කල්හි, සත්‍යයක්, මෘදු ස්වරයෙන්, ශ්‍රාවකයා කෙරෙහි අනුකම්පාවෙන් මෙත් සිතින් කිවයුතු බවයි. මේ සියල්ල බිඳ දමන ධර්ම සන්නිවේදනය ධර්මයටත්, ජනතාවටත් හානියක් මිස යහපතක් ඇති නොකරනු ඇත. අනුවණ බෞද්ධයිනි, මේවා ධර්මය නොවන බව වටහා ගනිත්වා.




මොරටුව ලුනාව උයන පාරේ
බෝධිරාජාරාමාධිපති
කොළඹ විශ්ව විද්‍යාලයේ
මහාචාර්ය
**අගලකඩ සිරිසුමන හිමි**


ත්‍රිවිධ රත්නයේ ආරක්ෂාව ලැබ
සියළු වසංගත රෝග පීඩාවන්
දුරුවන
පින්බර
පොසොන් මංගල්‍යයක් වේවා!
ජීවිතයේ සිහිනයට - වාසනාවේ ආශිර්වාදය
ජාතික ලොතරැයි මණ්ඩලය



# අනුබුදු මහ මිහිඳු හිමි වත

**බුද්ධ වර්ෂ 237 වැන්නෙහි හෙවත් ක්‍රිස්තු වර්ෂ 307 වැන්නෙහි පොසොන් පුන් පොහෝද මිහින්තලයේ මිස්සක පව්වෙන් මෙරට නව සංස්කෘතියක ශක්තිමත් අත්තිවාරම බිහිවිය.**



ඒ මෙරට මුළු මහත් සංස්කෘතිය, සදාචාරය, සිරිත් විරිත්, භාෂාව, සාහිත්‍ය කලාව, ගෘහ නිර්මාණ ශිල්පය වැනි සියලු අංශයන්හි ආරම්භයයි. මේ සියලු අංශයන් ගැන කතා කරනවිට නිතැතින් ම සිහියට නැගෙන පරමාදර්ශී චරිතයක් ඇත්නම් ඒ මහා මහින්ද මහ රහතන් වහන්සේ ය. මේ ඒ බොදු ජන මනසෙහි දෙවෙනි බුදුන් (අනුබුදු) ලෙස අබිසෙස් ලද පරමාදර්ශී මහ මිහිඳු සිරිතයි.

දඹදිව එක්සේසත් කළ අශෝක අධිරාජයාට අසන්ධිමිත්‍රා, වේදිසා, පද්මාවතී, තිස්සාරක්ඛා, චාර්ව කී යනුවෙන් බිසෝවරු පස් දෙනෙක් වූහ. ඔවුන් අතරින් අග මෙහෙසිය වූ වේදිසා මහා දේවියට දරුවන් දෙදෙනෙක් විය. ඒ මහින්ද නම් පුතු හා සංඝමිත්තා නම් දියණියයි. අශෝක අධිරාජයා කාලිංග දේශය ජය ගැනීමෙන් ඇති වූ මහා මිනිස් සංහාරයට කළකිරී නිග්‍රෝධ නම් සාමණේරයන් කෙරෙහි පැහැදී බුදුසමය වැළඳගත් බව ප්‍රකට ඉතිහාස ගත කරුණකි. මේ ඓතිහාසික සිදුවීමෙහි ප්‍රතිඵලයක් ලෙස රජකමට උරුමකම් කියූ වැඩිමහලු මහින්ද කුමරු පිය රජුගේ ඉල්ලීම මත පැවිදි බව ලැබී ය. ඒ අශෝක රජුගේ රජ පදවියෙන් හයවැනි වර්ෂයේ දී ය.

මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේගේ උපාධ්‍යායත්වයෙන් හා මඛාදේව තෙරුන්ගේ ආචාර්යත්වයෙන් පැවිදි උපසම්පදාව ලබන විට මහින්ද මහ තෙරුන්ගේ වයස විසි වසර සම්පූර්ණ වූවා පමණි. පැවිදිබව ලබා නොබෝ කලකින් ම මහින්ද මහ තෙරුන් සිවුපිළිසිඹියාපත් රහත් බවට පත් වූහ. ඉන් අනතුරුව පිය රජුගේ නව රට ධර්ම ප්‍රචාරක වැඩපිළිවෙළට දායක වෙමින් තම්බපණ්ණි දිවයිනට දූත පිරිසක් සමඟ වැඩම කිරීම සිදුවන්නේ බුද්ධ පරිනිර්වාණයෙන් වසර 237 ට පසුව ය. එවිට මිහිඳු මහරහතන් වහන්සේ තිස් දෙවෙනි වියෙහි පසුවිය.

ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල යන රහතන් වහන්සේලා සතර නමත්, සිය නැඟණිය වූ සංඝමිත්තාවගේ පුතණුවන් වූ සුමන සාමණේරයන් ද, නැන්දණියගේ පුතකු වූ අනාගාමී භණ්ඩුක උපාසකතුමා ද මේ දූත පිරිසට ඇතුලු වූහ. මහා මහින්ද මහ රහතන් වහන්සේ පෙරටුකොට ගත් මේ දූත පිරිස පොසොන් පුර පසළොස්වක දින මිස්සක පව්වට වැඩම කළහ.

එදින මෙරට රජු හා මැති ඇමතීන් මුව දඩ කෙළියට වනගත වූ දිනයකි. මුළු නුවරම සැණකෙළි සිරි ගත්තේ ය. හතළිස් දහසක් මිනිසුන් පිරිවරාගත් ලක් රජු වූ තිස්ස රජතුමා මිස්සක පව්ව මත සිටි ආගන්තුක දූත පිරිස සමඟ පිළිසඳරෙහි යෙදුණහ.

අඹ ගස් හා ඥාතීන් මුල්කොට ගත් ඉතා සියුම් වූ බුද්ධි පරීක්ෂණයකින් පසු රජුගේ ප්‍රඥා මහිමය වටහා ගත් මිහිඳු මහරහතන් වහන්සේ රජු ප්‍රධාන හතළිස් දහසක් ජනයාට දම් දෙසා ධර්මාවබෝධය ලබා දුන්හ. එදිනම රාත්‍රී අනාගාමී භණ්ඩුක උපාසකතුමා පැවිදි උපසම්පදා කළ අතර එකෙනෙහි ම එතුමෝ සව් කෙලෙසුන් නසා රහත් බව ලදහ.

එදින රාත්‍රියෙහි ම මිහිඳු මහ රහතන් වහන්සේගේ ඇරයුමෙන් සුමන සාමණේරයන් ඍද්ධි බලයෙන් බඹලොව දක්වා ධර්ම ශ්‍රවණයට ඝෝෂා කළහ.

තිස්ස රජු නාගචතුෂ්ක නම් ගල් කෙම්පස හිඳගෙන ආහාර අනුභව කරමින් සිටින විට ඒ මහත් වූ ශබ්දය අසා බියට පත් වූ බව මහාවංශය සඳහන් කරයි.

මේ ඝෝෂාවට රැස් වූ දේව බ්‍රහ්මාදීන්ට මිහිඳු මහ රහතන් වහන්සේ 'සමචිත්ත' සූත්‍රය දේශනා කළහ. බොහෝ දේව බ්‍රහ්මාදීන් එයින් ධර්මාවබෝධය ලදහ.

දෙවන දිනයෙහි මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රධාන දූත පිරිස රජ මැඳුරට වැඩම කළහ. එහිදී අනුලා බිසව ප්‍රධාන පන්සියයක් අන්තඃපුර ස්ත්‍රීන්ට පව්කොට අපාගත වූ අය ගැන කියැවෙන පේතවත්ථුවත් පින් කොට දෙව්ලොව ගිය අය ගැන කියැවෙන විමානවත්ථුවත්, සච්චසංයුත්තයත් ඇසුරින් දම් දෙසූහ. එමගින් අනුලා බිසව ඇතුලු පන්සියයක් ස්ත්‍රීහු සෝවාන් වූහ.

පෙර දිනයෙහි දුටු ආගන්තුක දූත පිරිසෙහි නුහුරු නුපුරුදු ඇවතුම් පැවතුම්වලට හා ඇසූ කර්ණරසායනය වන නව දහම පිළිබඳ කුතුහලයකින් ද යුත් දහස් ගණන් ජනයා වාසල් දොරටුව ළඟ රැස්වන්නට වූහ. දහම් පිපාසයෙන් පෙළෙන දස දහස් ගණන් ජනයාට ධර්ම ශ්‍රවණයට රජුගේ අණින් ඇත්හල සූදානම් කරවීය.

මහ මිහිඳු තෙරුන් විසින් එහි වැඩම කොට කුසලාකුසල කර්මයන්හි ඵල විපාක සහ පව් කරන්නාට විඳින්න සිදුවන නිරාදුක් ගැන විස්තර වන දේවදූත සූත්‍රය දෙසන ලදී.

මේ ආගන්තුක දහම කෙරෙහි ජනයාගේ



ප්‍රංශයේ, ජේතවනාරාමාධිපති, ප්‍රංශයේ ප්‍රධාන අධිකරණ සංඝ නායක,

**මුරුංගාගස්යායේ ඤාණිස්සර නා හිමි**

ආකර්ෂණය දිනෙන් දින වැඩිවන්නට විය. එය ඔවුන් මෙතෙක් සිතූ චින්තන ධාරාවට හාත්පසින් වෙනස් වූවක් විය. එය ජන ජීවිතයට ඉතා සමීප විය. එබැවින් දහම් පිපාසයෙන් රොද බැඳෙන පිරිසට ඇත්හල ප්‍රමාණවත් නොවීය.

දකුණු වාසල් දොරටුව අභියස ඇති නන්දන උයන පිළිසකර කළ රජු එහිදී මහජනයාට ධර්ම ශ්‍රවණයට අවස්ථාව ලබා දුන්නේ ය. ලද සෑම අවස්ථාවකින් ම උපරිම අයුරින් සිය ධර්මදූත මෙහෙවර සිදුකළ මහ මිහිඳු තෙරුන් වහන්සේ එහි රැස් වූ පිරිසට අනුවණයා නොදැනීම නිසා දෙලොව දුක් විඳින අයුරුත්, නුවණැත්තා කුසල කර්ම කොට සුවපත් වූ අයුරුත් විස්තර කෙරෙන බාල පණ්ඩිත සූත්‍රයෙන් දම් දෙසූහ.

එදින සවස් වරුවෙහි මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රමුඛ දූත පිරිස මහමෙව්නා උයනෙහි ගත කළහ. රජතුමා භික්ෂූන් වහන්සේ මහමෙව්නා උයනට දැක්වූ අභිරුචිය දැන අතපැන් වඩා උයන සඟසතු කොට පූජා කළේ ය. ඒ මොහොතෙහි මහ පොළොව කම්පා විය. එය ලක්දිව බුදුසමය ස්ථාපිත වූ බවට සාක්ෂි සැපයීමක් විය.

ඒ අසිරිමත් උද්‍යාන පූජාවට රැස් වූ ජනයාට අග්ගික්ඛන්ධෝපම සූත්‍රයෙන් දම් දෙසූ මිහිඳු මහ රහතන් වහන්සේ අනුලා බිසව ඇතුලු පන්සියයක් කාන්තාවන් සකදාගාමී ඵලයට පත් කළහ.

ඉතා දූරදර්ශී ධර්ම දූතයන් වහන්සේ නමක් වූ අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ අනාගතයේ ශ්‍රී මහා බෝධිය, රුවන්වැලි මහ සෑය, ලෝවා මහා ප්‍රාසාදය ආදී මහමෙව්නා උයනේ ස්ථාපනය වන සියලු ස්ථාන රජු ලවා සටහන් කර තැබූහ. එසේම මුළු අනුරාධපුර නගරය ම ආවරණය වන පරිදි රජු ලවා සීමාවක් සම්මත කරන ලදී. එහි සීමාමාලකයක් ද ජන්තාඝර හෙවත් උණුපැන් නාන කාමර සහිත පොකුණු හා දන් පිළියෙළ කිරීමට ලහබත් ගෙයක් ද, දන් වැළඳීමට දන්හලක් ද රජු ලවා ඉදිකරවීය.

මේ වන විටත් සකදාගාමී ඵලයට පත්ව සිටි අනුලා බිසව ප්‍රමුඛ පන්සියයක් කාන්තාවන්ගේ බලවත් ඉල්ලීම පරිදි මිහිඳු මහ තෙරුන්ගේ උපදෙසින් සංඝමිත්තා තෙරණිය ශ්‍රී මහා බෝධිය සමඟින් ලක්දිවට වැඩම කළා ය. එයින් ලක්දිව භික්ෂුණී ශාසනය ඇතිවිය.

එසේම බුදුරදුන්ගේ ධාතු සෑයක අවශ්‍යතාවය රජුට පෙන්වා දුන් මිහිඳු මහ තෙරුන් ඒ සඳහා දඹදිවින් බුදුරදුන්ගේ දකුණු අකු ධාතුව හා පාත්‍රා ධාතුව වැඩම කිරීමට සුමන සාමණේරයන්ට බාර කළහ. මෙලෙසින් අනුරාධපුරයේ පුරා දින විසිහයක්, දස දහස් ගණන් ජනතාවට ධර්මය දේශනා කරමින් ධර්මාභිසමයට දායකත්වය ලබා දුන් අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ විසිහත් වන දිනයෙහි වස් විසීමට මිහින්තලයට වැඩම කළහ.

මෙම ගමනෙහි දී දෙවනපෑතිස් රජුගේ බෑණනුවන් වූ මහා අරිට්ඨ ඇමති ප්‍රධාන පනස් පස් දෙනකු පැවිදි බවට පත් කොට මිහින්තලයෙහි වස් වැසූහ.

ජීවිතයේ විසිවන කඩ ඉමෙහි පැවිදි බව හා උතුම් රහත් බව ලබා තිස් දෙවෙනි වියේදී ලක්දිවට වැඩම කොට පුරා වසර හතළිස් අටක් ධර්මදූත මෙහෙවර පරමාදර්ශීව සිදුකළ අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ උත්තිය රජ සමයෙහි වප්මස පුර අටවක් ද සෑගිරියේ දී පිරිනිවන් පෑහ.

මෙරට බොදුනුවන්ගේ දහම් පිපාසාව සන්සිඳලූ දූරදර්ශී ධර්ම සන්නිවේදනයක් සිදුකරමින්, සුචරිතවාදී සමාජයක් ගොඩනැඟීමට සිය ජීවිතය කැපකළ මේ අසහාය ධර්මදූතායණන් වහන්සේගේ පිරිනිවීම උත්තිය රජුට ද දරාගත නොහැකි විය.

ඒ බව මහාවංශ කතු හිමියෝ මෙසේ සටහන් කරති. ඒ අසා උත්තිය රජ තෙමේ ශෝක නමැති හුලින් පහරණ ලදුයේ සෑගිරියට ගොස් තෙරුන් වැඳ නොයෙක් වර නොයෙක් පරිද්දෙන් සුවඳ තෙල් පුරවන ලද රන් දෙණක මහා ස්ථවිර දේහය යුහුව තබා මොනවට වසන ලදී.

නව සංස්කෘතියක් මෙරට ස්ථාපිත කරමින් ශ්‍රේෂ්ඨ ජාතියක් ලෙස නැඟී සිටින්නට පදනම සැකසූ අනුබුදු මිහිඳු මා හිමි ආගමනය සිදු වී වසර 2328 සපිරෙන අද වැනි දිනක ඒ ශ්‍රේෂ්ඨ ධර්මදූතයාණන් වහන්සේ අපට පෙන්වූ දහම් මඟේ ගමන් කරන්නට අදිටන් කර ගනිමු.









රටට සෞභාග්‍ය, සියලු ජනතාවට නීරෝගී සැපත,සුවය අත් වන
බැතිබර පොසොන් මංගල්‍යයක්ම වේවා !

මේ බැතිබර ප්‍රාර්ථනය
වස විසෙන් තොර
සංස්ථා තේ

ලක් වැසි ජනතාව වෙත බෙදූ හරිමින් රටේ ආර්ථිකයට සැමදු ජවයක් වූ

**ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව,**

නො. 21, මීරානියා පාර, කොළඹ 12. දු.ක. 011-5882494/011-5921464

# සසර බිය ගැන කියන මළගියවුන් පිළිබඳ කතා

**ක්‍රි.පූ. තෙවන සියවසේ දී අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රමුඛ බෞද්ධ ධර්මදූත පිරිස බුදු සසුන පිහිටුවීම සඳහා සිරිලකට වැඩම කළහ. ඒ ඓතිහාසික සිද්ධිය වූයේ පොසොන් පෝය දිනක ය.**

එවකට සිරිලක රජ කළ පෑතිස් නිරිඳුන් උන්වහන්සේට මුණගැසුණේ මිහින්තලේ දී ය. තමා ඇතුලු පිරිස රජුට හඳුන්වා දෙමින්,

යනුවෙන් මිහිඳු මාහිමියන් කළ ප්‍රකාශයේ ඇතුළත් 'තමේව අනුකම්පාය' (ඔබට ම අනුකම්පා පිණිස) යන යෙදුම තුළ උන්වහන්සේගේ ආගමනයෙහි මූලික පරමාර්ථය ගැබ් වී ඇත.

අඹ පැනයෙන් පෑතිස් රජුගේ නුවණ දැන, අනතුරු ව චූල්ලහත්ථිපදෝපම සූත්‍රය ඇසුරින් රජුට බුදු දහම ගැන මූලික දැනීමක් ලබා දී රජුගේ ආරාධනය අනුව පසු දින රජ මැදුරට වැඩම කොට, දහවල් දානය වළඳා භුක්තානුමෝදනා වශයෙන් පේතවත්ථු හා විමානවත්ථු මාතෘකා කරගෙන දහම් දෙසූ සේක. මේ ධර්ම දේශනාව ගැන අද දක්වා ම පොසොන් උත්සව සමයේ පැවැත්වෙන ධර්ම දේශනා හා ධර්ම සාකච්ඡාවල දී ඉතා ගෞරවයෙන් අනුස්මරණය කරනු අසන්නට ලැබේ.

'පේත' යනු මිය ගියවුන් හැඳින්වීම සඳහා යොදන පාලි භාෂාමය වචනයකි. 'වත්ථු' යනු කතා යන්න යි. ඒ අනුව පේතවත්ථු යන්නෙන් අදහස් කරන්නේ මළගියවුන් පිළිබඳ කතා ය. ත්‍රිපිටකයෙහි මළගියවුන් ගැන ම විස්තර අන්තර්ගත ග්‍රන්ථයක් ඇත. ඒ ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථ පසළොස අතර සත්වැන්න සේ සංග්‍රහ කොට ඇති පේතවත්ථු නමින් හැඳින්වෙන ග්‍රන්ථය යි. එහි උරග, උබ්බරී, චූල, මහා යන වර්ග හතරට ඇතුළත් කොට ප්‍රේතයන් පනස් එක් දෙනකු පිළිබඳ ව තොරතුරු ඇතුළත් වෙයි.

උරග වර්ගයේ ඛෙත්තූපම, සූකරමුඛ, පූතිමුඛ, සත්තපුත්ත ඛාදිකා, පඤ්චපුත්ත ඛාදිකා, ගෝන, මහා පේසකාර, ඛල්ලාටිය, නාග, උරග යන පේතවත්ථු ඇතුළත් කර ඇත.

සංසාර මෝචක, සාරිපුත්ත මාතා, මත්තා නන්ද, මට්ටකුණ්ඩලී, කණ්හ, ධනපාල, චූල්ල සෙට්ඨි, අංකුර, උත්තර මාතා, කර්ණ මුණ්ඩ, උබ්බරී යන පේතවත්ථු ඇතුළත් වන්නේ උබ්බරී වග්ගයට ය.

චූල්ල වග්ගයට ඇතුළත් කොට ඇත්තේ අභිජ්ජමාන, සානුවාසි, රථකාර, භූත, කුමාර, සේරිණී පඨම මිගලුද්දක, දුතිය මිගලුද්දක, කූට විනිච්චයික ධාතු විවණ්ණක යන පේතවත්ථු ය.

අම්බ සක්කර, සේරිස්සක, නන්දක, රේවති, උච්ඡු, කුමාර, රාජපුත්ත, ගූථඛාදක, භෝක සංහරණ, සෙට්ඨිපුත්ත, සට්ඨකූට සහස්ස යන පේතවත්ථු ඇතුළත් කොට ඇත්තේ මහා වග්ගයට ය.

ඉහත නම් සඳහන් පේතවත්ථු පිළිබඳ වැඩිදුර විස්තර ඇතුළත් අට්ඨ කතාව 'පරමත්ථ දීපනී' නමින් හැඳින්වේ. එය අට්ඨකථාචාර්ය ධම්මපාල හිමියන් විසින් ලියන ලද්දකි. මෙම පේතවත්ථු පනස් එකේ ම ඇතුළත් ප්‍රධාන චරිත අතර ගිහි පැවිදි දෙපක්ෂයේ මළගිය ඇත්තෝ සිටිති. පේතවත්ථුවලත්, විමානවත්ථුවලත් ඇතුළත් වන්නේ මළගිය ඇත්තන්ගේ චරිත කතා ය. මනුෂ්‍යාත්මභාවය ලැබගෙන සිට, දුගති මගේ ගමන් කොට මියගියවුන්ගේ විස්තර පේතවත්ථුවලත්, සුගති මගේ ගමන් කොට මියගියවුන්ගේ විස්තර විමාන වත්ථුවලත් ඇතුළත් කොට ඇත. ඔවුන්ගේ හැඩරුව, ජීවන යාත්‍රාව, වාසදේස, කෑම බීම ආදී තොරතුරු ඒවායේ දැක්වේ. පේතවත්ථුවල දැක්වෙන මේ උපුටනයන් කියවීමෙන් පේතයන්ගේ හැටි සොබා ගැන චිත්තරූප මවාගත හැකි ය.

"එම්බල ප්‍රේතය, තාගේ ශරීරය සියල්ල රන් හා සමාන ය. ශරීරාලෝකයෙන් සියලු ම දිශාවන් හාත්පසින් බබුළුවයි. එසේ ද වුවත් තාගේ මුඛය හූරු මුව හා සමාන ය."

(සූබර මුඛ පේත වත්ථු)

"පෙහෙසුන් කී මහණ එක් බුද්ධාන්තරයක් මුළුල්ලෙහි නිරයෙහි පැසී මේ බුද්ධෝත්පාද කාලයෙහි රජගහනුවරට නුදුරු තැනෙක්හි පූතිමුඛ ප්‍රේතයෙක් ව උපන, ඔහුගේ ශරීරය ස්වර්ණ වර්ණ විය. කටින් වනාහී පණුවෝ නික්මී මුඛය ඔබ්මොබ කත්. ඔහුගේ මුඛයෙන් දුරවූ ද අවකාශය පැතිර දුගඳ වහනය වෙයි."

(පූතිමුඛ පේත වත්ථු)

"එම්බල ප්‍රේතිය, නිර්වස්ත්‍ර ව ඉතාමත් බියකරු රූපයෙන් යුක්ත වන්නෙහි ය. නපුරු ගඳ ඇත්තී ය. ශරීරයෙන් කුණු ගඳ හමන්නේ ය. හාත්පස නිලමැස්සන්ගෙන් ගැවසී ගත්තේම ය."

(පඤ්ච පුත්තඛාදිකා පේත වත්ථු)

"ස්වාමීනි, මම පාප කර්මයක් කොට මේ මිනිස් ලොවේ සිට ප්‍රේත ලෝකයට ඉපදීම් වශයෙන් පැමිණියා වූ, දුකට පත් වූ යම ලෝකයයි ලද නම් ඇති ප්‍රේත ලෝකයෙහි උපන්නා වූ ප්‍රේතියක් වෙමි. උදය කාලයෙහි පුත්‍රයන් සත් දෙනෙකුන් ද, සවස තවත් දරුවන් සත් දෙනෙකුන් ද, ප්‍රසූත කොට අනුභව කරමි. ඒ දරු තුදුස් දෙනා ම කෑ නමුදු මගේ බඩගින්න නිවීමට ප්‍රමාණ නො වෙත්."

(සත්ත පුත්තඛාදිකා පේත වත්ථු)

"පින්වත් දිව්‍ය පුත්‍රය, මේ ස්ත්‍රී තොමෝ අසූචි හා මූත්‍ර ද ලේ හා සැරව ද අනුභව කරයි. කවර කර්මයක් නිසා මේ විපාකයක් ද? යම්බඳු ප්‍රේතියක් තොමෝ සැම කල්හි ලේ හා සැරව අනුභව කරන්නී ද ඕ තොමෝ පෙර කිනම් අකුසල කර්මයක් කෙළේ ද?"

(මහා පේසකාර පේත වත්ථු)


"විළිවැස්මක් නැති ව, නපුරු ශරීර වර්ණ ඇති ව, මස් ලේ නැති බැවින් නහර වැල් ඉල්පී ගිය ශරීර ඇති ව උස් වූ ඉල ඇට ඇති ව, කෘශ වූ නොහොත් ඇට සම්, නහර පමණක් වූ සිරුරු ඇති බැවින් ඉතාමත් කෘශ භාවයෙන් යුක්ත වූ තී මෙහි සිටින්නෙහි ය. තී කවරියක් ද' යි අසා වදළහ."

(පූතිමුඛ පේත වත්ථු)




ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහා නායක ත්‍රිපිටක විශාරද, ශාස්ත්‍රපති අග්ගමහා පණ්ඩිත

**මකුලෑවේ විමල මහා නාහිමි**



පේතවත්ථු ග්‍රන්ථයෙහි දී හමුවන, පේත නමින් හැඳින්වෙන පනස් එක් දෙනා ම මිනිසත් බව ලබා ගෙන සිට මිය ගිය පසු පේතාත්මභාවයන් ලැබූ අය යි.



ඒ පිරිස අතර පැවිද්දෝ ද වෙති. උතුම් මිනිස් බව ලැබ ගෙන සිටි ඒ පිරිසට දුක්බර දුගති භවයක ඉපදීමට හේතුවූ කරුණු මොනවා ද? ඒවා මෙසේ ය.


අනුන්ට බැණ වැදීම, අපහාස කිරීම, කේලාම් කීම, තුනුරුවන් සතු දේපොළ පැහැර ගැනීම, විනාශ කිරීම, වස බෙහෙත් යොදා ගැබිණියන්ගේ දරු ගැබ විනාශ කිරීම, බොරුවට දිවිරීම, පින් දහම් කරන්නවුන්ට බැණ වැදීම, බාධා කිරීම, අනුන් සතු දෑ සොරා ගැනීම, මිසදිටු අදහස් දැරීම, තමාගේ සැමියා නියම කළ දන වස්තූන් පවා නොදී පැමිණ සිටි යාචකයන්ට බැණ වැදී පන්නා හැරීම, අනුන්ගේ සැප සම්පත් ගැන ඊර්ෂ්‍යා කොට ඒවා විනාශ කිරීම, තම සැමියාට නින්දා අපහාස කිරීම, තද මසුරු බවින් යුතු වීම, කාම මිථ්‍යාචාරයෙහි හැසිරීම, ඉසුරු මදින් මත් වී උතුමන්ට නින්දා අපහාස කිරීම, කල්‍යාණ මිත්‍රයන් දෙන උපදෙස් නො පිළිපැදීම, අල්ලස් ගෙන යුක්ති ධර්මය යටපත් කර විනිශ්චය කිරීම, පක්ෂ ග්‍රාහී ව නඩු විසඳීම, කුසල් කරන්නවුන් එයින් වැළැක්වීම. පූජා සත්කාර ගැන නුගුණ කියමින් ඒවා අවමානයට ලක්කිරීම වැනි ක්‍රියාවන් නිසා උසස් මිනිස් බවින් ඇද වැටෙන හැටි පේතවත්ථු හඳුරන්නකුට වැටහෙයි.

පේතවත්ථු ඇසුරින් සකස් කළ ඉහත සඳහන දුර්ගුණ සංග්‍රහය පරාභව හා වසල සූත්‍ර සමඟ සසඳා බැලීම අවබෝධයට වඩාත් හිතකර ය.

"මිනිස් අත්බව ලැබූ කෙනකු පේතවත්ථුවල දැක්වෙන දුර්ගති මාර්ගයන් හි ගමන් නො කොට, විමානවත්ථුවල දැක්වෙන සුගති මාර්ගයන්හි ගමන් කරන්නේ නම් ඔහුට තමා ලද මිනිසත් බව වඩා වඩා සඵල කරගත හැකි ය." යන උදාර පණිවුඩය අනුබුදු මිහිඳු මාහිමියන් ලක්දිවට වැඩම කළ දෙවෙනි දවසේ දී ම ප්‍රකාශයට පත් කළ ආකාරය පේතවත්ථු, විමාන වත්ථු මාතෘකා කරගෙන රජ මැදුරේ දී කළ ධර්ම දේශනය ආශ්‍රයෙන් සිතා ගත හැකි ය. ශ්‍රී ලාංකික සිංහල බෞද්ධයෝ පසු කාලයෙහි විමාන වත්ථු ආදර්ශයට ගෙන තම ජීවිතය සකස් කර ගත්හ. ඒවා අනාගත පරපුරට වඩාත් පහසුවෙන් වටහා ගැනීමට විහාර බිතුසිතුවම්වල ඇඳ තැබූහ. එසේම ගද්‍ය, පද්‍ය සාහිත්‍ය කෘති නිර්මාණය කර තැබූහ.

පේතවත්ථුවල දැක්වෙන අප්‍රසන්න චරිතවලට සමාන ලක්ෂණ ඇති දෙබිඩි හා විකෘති දරුවෝ මිනිසුන් අතර ද උපදිති. සිරුරින් මුවින් දුගඳ වහනය වන ප්‍රේතාත්ම බඳු ස්ත්‍රී පුරුෂයෝ, දරු ගැබ් විනාශ කරන්නෝ, අත් පා නැති යාචකයෝ, අසාමාන්‍ය දේහධාරී ස්ත්‍රී පුරුෂයෝ ඒ අතර වෙති.

මිහිඳු මහරහතන් වහන්සේ විසින් ලක්වැස්සන්ට හඳුන්වා දෙන ලද පේතවත්ථු අතරින් තිරෝකුඩ්ඩ පේතවත්ථුව සිංහල බෞද්ධ සංස්කෘතිය කෙරෙහි අත්තිවාරමක් මෙන් බලපා ඇත. සඟ සතු දේපොළ තමන්ගේ පරිහරණයට ගැනීමට, බුද්ධ පූජාව සඳහා තැබූ ආහාරපාන පරිභෝජනයට ගැනීමට සිංහල බෞද්ධයෝ එදා මෙන් අදත් බිය වෙති. කොටින් ම සඟසතු ඉඩමක ගස්වල හැදෙන මල්, පලතුරු පවා තමන්ගේ ප්‍රයෝජනයට ගැනීමට සිංහල බෞද්ධයෝ කැමති නැත.


අනුබුදු මිහිඳු හිමියන් ඇතුළු
දසදහසක්
රහතන් වහන්සේලාගේ පහසලත්
අනුරපුර පින්බිමේ...
59 වන වරට පැවැත්වෙන
මිහින්තලා ආලෝක පූජාවට
ශ්‍රී ලංකා නාවික හමුදා
බෞද්ධ සංගමයේ
බැතිබර සුබ පැතුම්
ශ්‍රී ලංකා නාවික හමුදාව





# සියලු සතුන් වෙත මෙත් සිත් පෙරටුව කටයුතු කරමු

මහා විහාරවංශික ස්‍යාමෝපාලි මහා නිකායේ
මල්වතු මහා විහාර පාර්ශ්වයේ මහානායක
**තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මහා නාහිමි**



සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර 236 ක් ගිය තැන ධර්මාශෝක මහාධිරාජයාගේ උදාරතර ධර්මවිජය ප්‍රතිපත්තියේ ප්‍රතිඵලයක් ලෙස මහා මහින්ද මහරහතන් වහන්සේගේ ආගමනයත් සමඟ ම ශ්‍රී ලංකා ද්වීපය බුදු දහමේ ආලෝකයෙන් ප්‍රභාවිත වන්නට විය. ශ්‍රී ලාංකේය සමාජ, ආර්ථික, දේශපාලනික වටිනාකම් නවමු දාර්ශනික මං පෙතකට යොමු කළ මෙම ඓතිහාසික සංසිද්ධිය මහත් උත්කර්ෂයෙන් අනුස්මරණය කිරීම සමස්ත ලංකාවාසී බෞද්ධයාගේ සිරිතයි.

මහින්දාගමනය යනු හුදු ඓතිහාසික සංසිද්ධියක් පමණක් නොව එය ලාංකේය සංස්කෘතිය අර්ථපූර්ණ පරිවර්තනයකට ලක් කළ නියාමක බලවේගයයි. දානය, ප්‍රියවචනය, අර්ථචරියාව, සමානාත්මතාවය යන සතර සංග්‍රහ වස්තූන්ගෙන් සුපෝෂිත ජනතාවාදී රාජ්‍ය තන්ත්‍රයක් මෙන් ම මෛත්‍රී, කරුණා, මුදිතා, උපේක්ෂා යන සතර බ්‍රහ්මවිහරණයන් සිය ජීවන ප්‍රවෘත්තිය කරගත් සිංහල බෞද්ධයා නිර්මාණය වන්නේ මෙම සංස්කෘතික පරිවර්තනයේ ප්‍රතිඵලයක් ලෙස ය.

අද වන විට සමස්ත ලෝකය ම කොරෝනා වසංගත තත්ත්වයෙන් දැඩිව පීඩාවට පත්ව ඇත. මෙවන් මොහොතක ශ්‍රී සම්බුද්ධ දේශනාවන් තුළින් ජීවිත පෝෂණය කර ගන්නා සැදැහැති බෞද්ධයන් ලෙස ප්‍රතිපත්ති පූජාවන්ට මුල්තැන දෙමින් තමන්ගේත්, අනුන්ගේත්, සමස්ත සමාජයේත් සෞඛ්‍යමය යහපැවැත්ම උදෙසා සිය වගකීම ඉටුකරමින් අර්ථාන්විත ව ආධ්‍යාත්මික ගුණවගාවන්හි නිරත වෙමින් මෙවර පොසොන් පොහෝ දිනයේ කටයුතු කිරීම සැමගේ සමාජ යුතුකම බව සිහිපත් කරමු. එසේ ම "පරත්ථං පටිපජ්ජථ" යන උතුම් සම්බුද්ධෝපදේශය මත පිහිටා මෙම වසංගත තත්ත්වය හේතුවෙන් පීඩාවට පත් මහජනයා කෙරෙහි හැකි අයුරින් උපකාර කරමින් තථාගත දහමට අනුව යතාර්ථවාදී නුවණින් යුතුව සියලු සත්ත්වයා වෙත මෙත් සිත් පෙරටුව කටයුතු කිරීම මහින්දාගමනය අර්ථාන්විත ව ස්මරණය කිරීම බව මෙහිලා ප්‍රකාශ කරනු කැමැත්තෙමු.

අසිරිමත් පොසොන් පොහෝ දිනය අනුස්මරණය කරමින් ලේක්හවුස් ආයතනය මගින් මිහින්තලා පුදබිමේ 59 වන වරටත් ආලෝක පූජාව සංවිධානය කිරීම අගය කරන අතර ම රත්නත්‍රයේ ආශිර්වාදයෙන් ලෝ වැසි සැමට නිදුක් නිරෝගී සම්පත්තිය උදාවේවා'යි ආශිංසනය කරම්හ.

# ප්‍රතිපත්ති පූජාවට මුල්තැන දෙමින් යහපත් බෞද්ධයින් ලෙස පොසොන් උත්සවය සමරමු

මහාවිහාර වංශික ස්‍යාමෝපාලි මහා නිකායේ
අස්ගිරි පාර්ශ්වයේ මහා නායක
**ආචාර්ය වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී පඤ්ඤානන්ද ඤාණරතන මහා නාහිමි**



සම්බුද්ධත්වයේ පහස ලද දඹදිව් තලයේ සිට මෙරටට සම්බුදු දහමේ පණිවිඩය රැගෙන වැඩම කළ අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ ශ්‍රී ලංකාවට කළ ශාසනික මෙහෙවර සදනුස්මරණීය වේ. ඈත අතීතයේ පටන් තම යුතුකම් ඉටු කිරීම සහ කළගුණ සැලකීම වැනි උතුම් ගුණ දම්වලින් පිරි ශ්‍රී ලාංකික බෞද්ධ පින්වතුන් උන්වහන්සේ ලක්දිවට වැඩම කළ දිනය වන පොසොන් පොහෝ දිනය අනුස්මරණය කිරීම සිරිතක් ලෙසින් පවත්වාගෙන එති. උන්වහන්සේගේ වැඩම කිරීමත් සමඟ අපේ රට තුළ බෞද්ධ ප්‍රතිපත්ති සහ ඇදහීම් ස්ථාපිත වූවා පමණක් නොව සම්මා සම්බුදුරජාණන් වහන්සේ තිලොව යහපත සඳහා දේශනා කළ ධර්මය ස්ථාපිත වන්නට විය. එදා මෙදා තුර වසර දෙදහස් පන්සියයකට අධික කාලයක් අප ලොව පවතින උතුම්ම බෞද්ධ රාජ්‍යක් ලෙස ලොව පතළ විය.

මේ නිසාම පොසොන් පුන් පොහෝ දින බෞද්ධයින් වශයෙනුත්, ශ්‍රී ලාංකිකයින් වශයෙනුත් අපට ඉතා වැදගත් දිනයෙකි. මෙම දිනය සැමරීම සඳහා රජරට ප්‍රධාන කොට නොයෙකුත් සැරසිලි, පෙරහර මෙන්ම දන සීල භාවනා ආදී පුණ්‍ය කටයුතුවල යෙදෙන ලක්ෂ සංඛ්‍යාත පින්වත්හු පොසොන් පොහෝ දින උත්කර්ශවත් ලෙස සමරති.

එහෙත් මේ වසර ඊට හාත්පසින්ම වෙනස් ස්වරූපයක් ගෙන ඇත්තේ ලොව පුරා සෑම රටකම පාහේ පැතිර යන වසංගතය නිසාවෙනි. මේ නිසාම මෙම වසරේ වෙසක් උත්සවය මෙන්ම පොසොන් උත්සවය ද තම නිවෙස්වල ම සිට සෞඛ්‍ය විශේෂඥයින්ගේ උපදෙස් අනුගමනය කරමින් සැමරීමට සියලු දෙනාම අදිටන් කරගත යුතුව ඇත. සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ සද්ධර්මය අනුව ප්‍රතිපත්ති පූජාවන්හි නිරත වෙමින් යහපත් බෞද්ධයින් ලෙස පොසොන් උත්සවය ද සැමරීමට අපට කිසිදු බාධාවක් නැත.

මේ අවස්ථාවේ දී බුදුන් වහන්සේගේ දර්ශනය අනුව අපගේ ඉදිරි ජීවන රටාවන් ප්‍රඥ සම්පන්න ව සිතාබලා හැඩගැස්විය යුතු අතර, ඒ පිළිබඳව අනාගත මිනිස් වර්ගයාට විශාල වගකීම් සම්භාරයක් පැවරෙනු ඇත. පරිසරය සහ ස්වභාවික සම්පත් ආරක්ෂා කරමින් මිහිතලය අපට සපයන දෙයින් සෑහීමකට පත්වනු විනා මනුෂ්‍ය අවශ්‍යතාවයන් වෙනුවෙන් ස්වභාව ධර්මයාට එරෙහි වීම සිදු නොකළ යුතු ය.

කෙසේ වෙතත් සීමාසහිත අවකාශයක් තුළ වුව ද පොසොන් පොහෝ දින නිමිතිකොට ගෙන පවත්වන්නා වූ සියලු පුණ්‍ය කටයුතු සර්වප්‍රකාරයෙන් ම සාර්ථක කර ගැනීමට ශ්‍රී දළදා සමිඳුන්ගේ ආශීර්වාදය ලැබේවා'යි ආශිංසනය කරම්හ.

# පොසොන් අධිෂ්ඨානය විය යුත්තේ 'බුද්ධ වචනය සුරක්ෂිත කරගනිමු' යන්නයි

ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ වැඩබලන උත්තරීතර මහානායක
**ගන්තුනේ අස්සජි මහා නා හිමි**



ශ්‍රී ලාංකික අපට වටිනාකම අතින් පොසොන් පොහොය දෙවැනි වන්නේ වෙසක් පොහොයට පමණකි. මීට වසර 2329 කට පෙර අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේගේ වැඩම කිරීම පොසොන් පොහොය දිනෙක වීම ඊට හේතුවයි. ඒ පොහොය අපේ රටේ නව යුගයක් ආරම්භ වූ දවසයි. නව දහමක් පමණක් නොව නව සංස්කෘතියක් ද අපට උරුම වන්නේ මහින්දගමනයත් සමඟ ය. ඊට පෙර බුදුරජාණන් වහන්සේ මෙම දිවයිනට වැඩම කළත් දහම පවත්වාගෙන යන භික්ෂු පරපුරක් බිහි නොවුණි. බුදු සසුන මෙරට මුල්බැස ගැනීමට දේශීය භික්ෂු පරපුරක අවශ්‍යතාව මිහිඳු මාහිමියන් වහන්සේ පෙන්වා දුන්නේ එබැවිනි.

එදා ඇරඹුණු භික්ෂු පරපුර රාජ්‍ය අනුග්‍රහය සහ සැදැහැවත් ගිහි ජනතාවගේ සහාය ද ඇතිව ත්‍රිපිටක බුද්ධ වචනය මෙතෙක් ආරක්ෂා කරගෙන ආයේ ය. එම වගකීමේ අවශ්‍යතාව අතීතයට වඩා වර්තමානයෙහි පැහැදිලිව දක්නට ඇත.

පොත් රැකුණොම බුදු දහම සුරැකේ ද? එය අණ පනත්වලින් කළ හැකිදැයි ප්‍රශ්න කරන්නෝ ද වෙති. ඒ අය මහින්දගමනයේ සිට මෙතෙක් ආ සසුන් මඟ සිහිපත් කර ගැනීමට තරම් නම්‍යශීලී නොවන්නේ මාගධී භාෂාව නොහැදෑරූ ඊනියා අරිහතුන් වහන්සේලාගේ අර්ථ කථන හිස් මුදුනින් පිළිගැනීම නිසා ය.

දහම සුරැකීමට එය ප්‍රගුණ කළ යුතුය යන්න ගැන විවාදයක් නැත. හැබැයි ඒ දහම ඇතුළත් ත්‍රිපිටකය ද සුරක්ෂිත විය යුතුය යන්න බැහැර කළ නොහැකි ය. ලේක්හවුසියෙන් මිහින්තලාව ආලෝකවත් කෙරෙන මේ වෙලාවේ ධර්මාලෝකයෙන් සැම හදවතක්ම ආලෝකමත් වේවා.

# වසංගත රෝගාදියෙන් අතමිදී සැනසිල්ල ලැබේවා

ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහා නායක
ත්‍රිපිටක විශාරද, ශාස්ත්‍රපති,
**අග්ගමහා පණ්ඩිත මකුළෑවේ විමල මහා නාහිමි**



මිහිඳු මහරහතන් වහන්සේ ශ්‍රී ලංකාද්වීපයට වැඩමවා සම්බුද්ධ ශාසනය පිහිටුවා මේ වර්ෂය වන විට අවුරුදු දෙදහස් තුන්සිය විසි නමයක් සම්පූර්ණ වේ. බුද්ධ පරිනිර්වාණයෙන් අවුරුදු දෙසිය තිස් හයක් ගත වූ කාලසීමාවේදී පොසොන් පුර පසළොස්වක පොහොය දිනයේ දී අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ අවශ්‍ය පිරිවර ද සමඟ ලක්දිව මිස්සක පව්වේ අම්බස්ථලයට වැඩමවා දෙවන පෑතිස් මහ නිරිඳුන් ඇතුළු පිරිසට දහම් දෙසමින් ඇරඹූ ලක් බුදු සසුන නිසා ශ්‍රී ලංකාවට ලැබුණ ශ්‍රී විභූතිය මෙතෙකැයි විස්තර කළ නොහැක.

එදා මිහිඳු මාහිමි ඇති කළ සංස්කෘතිය නිසා ශ්‍රී ලංකාවේ ඇතිවූ පරිවර්තනයෙන් සිංහලයෝ ගුණයෙන් ප්‍රඥවෙන් හෙබි ශ්‍රේෂ්ඨ සංස්කෘතියක් ගොඩ නැංවූ විශිෂ්ට ජාතියක් බවට පත්වූහ. කෘතවේදී වූ එම බෞද්ධ ජනතාව මිහිඳු මා හිමි වැඩම වූ පොසොන් පෝය ඉතා උත්කර්ෂවත් ව සමරමින් ආමිෂ - ප්‍රතිපත්ති පූජාවෙන් පූජා කරමින් තම දිවිපෙවෙත වඩාත් ගුණයෙන් ආලෝකවත් කර ගැනීමට එදා සිටම උත්සාහයෙන් ක්‍රියා කළ ආකාරය සෑම පොසොන්දිනයකදී ම දක්නට ලැබේ.

එහෙත් දැන් වර්ෂ දෙකක පමණ සිට පවත්වාගෙන ආ අනුරාධපුර - මිහින්තලා වන්දනාගමන් හා ඒ ඒ ස්ථානවල පැවැත්වූ දන්සැල් ආදිය පවත්වා ගැනීමට නොහැකිවීම ගැන මහජනතාව තුළ කණස්සල්ලක් පවතින බව අපි දනිමු. මේ කොරෝනා නැමැති වසංගත රෝගය නිසා ජනතාවට නිවෙස්වලට වී කාලය ගත කිරීමට සිදු වී ඇති බැවින් වෙසක් පෝය දිනයේ මෙන්ම මෙම පොසොන් පෝය දිනයේ දී ද තම නිවෙස්වල රැඳී සිටිමින් පන්සිල් - අටසිල් ආරක්ෂා කරගෙන හැකි තරමින් අන් අයට උදව් උපකාර කිරීමට අධිෂ්ඨාන කර ගන්නා හැටියට විශේෂයෙන් සිහිපත් කරමු.

කොතරම් අපහසුතා මධ්‍යයේ වුවත් ලේක්හවුස් - බුදුසරණ විදුලි ආලෝක පූජාව මෙවරත් පැවැත්වීම පිළිබඳව එම සංවිධායක මණ්ඩලයට විශේෂයෙන් පින් දෙමින් එම පූජා පින්කම ඉදිරියටත් පවත්වාගෙන යාමට ශක්තිය ලැබේවායි ආශිර්වාද කරමි. තවද 1965 ජූනි 13 දා ඇරැඹි බුදුසරණ පුවත්පත ද වර්ෂ 56 ක් අඛණ්ඩව පවත්වාගෙන යමින් කරන විශිෂ්ට ධර්ම සන්නිවේදනය තව තවත් ඔපවත් වෙමින් ඉදිරියට පවත්වාගෙන යාමට ධෛර්යය ලැබේවා' යි ද පතමි. ශ්‍රී ලංකාවාසී - ලෝකවාසී සැමට මෙම භයානක වසංගත රෝගාදියෙන් සම්පූර්ණයෙන් ම අතමිදී සහනයක් සැනසිල්ලක්ම ලැබේවා'යිද තෙරුවන් සරණ පෙරදැරිව මෙම වැදගත් පොසොන් පොහොය දිනයෙහි ආශිර්වාද කරමින් සෙත් පතමි.

# තථාගත දේශනාව අනුව ජීවිත අර්ථවත් කර ගනිමු

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ජනාධිපති
**ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා**



උතුම් ථේරවාදී සම්බුද්ධ දේශනාව රැගෙන මිහිඳු මහරහතන් වහන්සේගේ වැඩම වීම සිහිපත් කෙරෙන පොසොන් පොහොය ශ්‍රී ලාංකේය සැදැහැවත් බෞද්ධයන්ගේ සදානුස්මරණීය වටිනාම දිනයයි.

අප ලොව්තුරා තථාගත බුදුපියාණන් වහන්සේගේ ගුණ සිහිපත් කර පොසොන් පොහොය ආමිස හා ප්‍රතිපත්ති පූජාවෙන් අර්ථවත් කර මිහිඳු මහරහතන් වහන්සේට කෘතවේදීත්වය පළ කිරීම අප අනාදිමත් කාලයක පටන් සිදු කරන්නකි.

දේවානම්පියතිස්ස මහ රජු අභිමුව සම්බුද්ධ දේශිත වීමංසන ප්‍රඥව පිළිබිඹු කරමින් "චූල්ලහත්ථිපදෝපම සූත්‍රය" මිහිඳු මහරහතන් වහන්සේ දේශනා කොට වදාළහ. රජු ධර්මයෙහි පිහිටීමෙන් ඇරැඹි සදහම් පණිවිඩය ශ්‍රී ලංකාදීපයෙහි මුල්බැස ගැනීමෙන් නිවුණු සැනසුණු ජීවිතයක හා සබුද්ධික වීමංසනසීලී සමාජයක දායාදය අප වෙත උරුම විය. එදා පටන් ශ්‍රී ලාංකීය රජ දරුවෝ ඇතුළු ජනතාව තථාගත දේශනාව අනුව ජීවිත හැඩ ගස්වා ගැනීම සිය යුතුකම සේ ම වගකීම ද කොට සලකා ගත්හ.

මහින්දාගමනය ශ්‍රී ලාංකීය ඉතිහාසයේ ආගමික වශයෙන් වටිනාම සන්ධිස්ථානය බව විවාද රහිත ය. එපමණක් නොව ඉන් සමාජ, සංස්කෘතික හා දේශපාලන වශයෙන් අප අත්පත් කරගත් වටිනාකම් බොහෝ ය.

සමස්ත පරිසරය දෙස මෙත් සිත් පෙරටුව කටයුතු කිරීමට අනුබුදු මිහිඳු හිමියන්ගේ අනුශාසනා ඉවහල් විය. අටලෝ දහම අනුව ජීවිතයට එළඹෙන ලාභ, අලාභ, යස, අයස, නින්දා, ප්‍රශංසා, සැප හා දුක් දෙස උපේක්ෂා සහගත ව බැලීමට අපට පුරුදු කළා සේ ම යහජීවන අත්දැකීම්වල පදනම බවට එම දහම පත් වූ බව අපි දනිමු.

දසරාජ ධර්මය පෙරටු කරගත් රාජ්‍ය පාලනය පිළිබඳව වූ සුවිශිෂ්ට ආකල්පය තුළින් අභිමානවත් රටක් ලෙසින් ලොවට පිවිසීමට අපට හැකියාව උදාවිය. ඒ අතීත මග පිළිබඳ නිවැරදි ආවර්ජනයක් සහිත වූ අතීත පාලකයෝ අපේ රට සමෘද්ධිය කරා මෙහෙය වීය. යහපත් රටක් ගොඩනැගීමට අදාළ වූ එම තථාගත දහමත්, දස රාජ ධර්මයත් පදනම කරගත් රාජ්‍ය සංකල්පයත් අපගේ පාලනයේ ද පූර්වාදර්ශය කර ගනිමු.

ජනතා කේන්ද්‍රිය ආර්ථික ඉලක්ක සපුරා ගත යුතු වන්නේ ද, සෞභාග්‍යමත් දේශයක් ගොඩනැගිය යුත්තේ ද මහපොළොව, සතා සීපාවා, ගහ කොළට ද සංවේදී පුරවැසියන් ලෙස බව මම දැඩිව විශ්වාස කරමි. ඒ වෙනුවෙන් මාගේ සියලු ශක්තිය කැප කිරීමට අදිටන් කොටගෙන සිටිමි.

අතීත සම්ප්‍රදායයන් අනුව පොසොන් පෙරහර, තොරණ, දන්සැල් පවත්වමින් මහින්දාගමනය සැමරීමට අපට වර්තමානයේ ඉඩ ඇහිරී තිබේ. එහෙත් පවතින කොවිඩ් වසංගතයෙන් ආරක්ෂා වෙමින්, දහමට අනුගතව අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ සිහිපත් කළ යුතු ආකාරය පිළිබඳව අතිපූජ්‍ය මහ සඟරුවනේ මඟ පෙන්වීම් ලැබී තිබේ. එම අනුශාසනා දෙස අවධානය යොමු කරමින් තථාගත දේශනාව අනුව ජීවිත අර්ථවත් කර ගැනීමට මේ පොසොන් සමයේ අප අදිටන් කර ගත යුතු ය.

ඔබ සැමට ජීවිත ආලෝකවත් වන පින්වත් පොසොන් මංගල්‍යයක් වේවා!

# ධර්මාවබෝධය පිණිස සිත් පහන් දැල් වූ අර්ථාන්විත දිනයක් වේවා

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
අග්‍රාමාත්‍ය
**මහින්ද රාජපක්ෂ මැතිතුමා**



ආදීන ජාතියක් ලෙස නිර්මල බුදු දහම අනුගමනය කරමින් සහජීවනයෙන් කටයුතු කිරීමට මඟ පෙන්වා දුන් අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේගේ ලංකාගමනය අද වැනි උතුම් පොසොන් පොහොය දිනයක දී ගෞරවයෙන් යුතු ව සිහිපත් වේ.

ධර්මාශෝක රජු හා දේවානම් පියතිස්ස නිරිඳුන් අතර පැවති රාජ්‍ය තාන්ත්‍රික කල්‍යාණ මිත්‍රත්වයේ මහඟු ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී බුද්ධ වර්ෂ 236 දී පමණ බුදුදහම ලක්දිවට දායාද විය. මෙමගින් අපගේ ජාතිය, ආගම මෙන් ම සංස්කෘතියේ නව යුගය ඇරඹිණි.

සීලය, මෛත්‍රිය, ගිලානෝපස්ථානය, ආගන්තුක සත්කාරය වැනි උතුම් ගුණාංග සපිරි ශිෂ්ට සම්පන්න ජාතියක් මෙරටෙහි බිහි වූයේ ද ගමයි පන්සලයි වැවයි දාගැබයි යන සංස්කෘතික පදනම මත ධර්ම ද්වීපය හා පෙරදිග ධාන්‍යාගාරය ලෙස සිරිලක විරුදාවලියට පත් වූයේ ද මිහිඳු මාහිමියන් අප වෙත දායාද කළ බුදුදහමේ ආලෝකයෙනි.

බෞද්ධ සංස්කෘතිය තුළ කලාව, අධ්‍යාපනය, තර්ක බුද්ධිය, කෘෂිකර්මාන්තය ආදී සෑම අංශයක් මදියුණු විය. මිහිඳු මාහිමියන් හඳුන්වා දුන් බුදුදහමේ ජීව ශක්තිය නිසා ශ්‍රී ලාංකිකයන් ලොව කිසිදු ජන වර්ගයකට නොදෙවෙනි ශ්‍රේෂ්ඨ ජාතියක් ලෙස පෙරට ආ බව මම සිහිපත් කරමි.

වෙනදා පොසොන් පොහොයට බැතිමතුන්ගෙන් පිරී යන මිහින්තලා පුද බිම අද එසේ නොවන්නේ මිනිස් ජීවිත බිලි ගනිමින් ලොව පුරා පැතිර යන කොවිඩ් - 19 වසංගතයෙන් අප සියලු දෙනා ආරක්ෂා විය යුතු නිසා ය.

බුදුදහමේ උතුම් හරය නිවැරැදිව තෝරා බේරා ගැනීමටත් බුද්ධ දර්ශනය අනුව අනාගත දිවි පෙවෙත සැලසුම්කර ගැනීමටත් දුෂ්කරව ගෙවා දමන මෙම කාලය ඉතා වැදගත් බව මාගේ විශ්වාසයයි.

මෙම උතුම් පොසොන් පොහොය දිනය ධර්මාවබෝධය පිණිස සිත් පහන් දැල්වූ අර්ථාන්විත දිනයක් බවට පත් වේවා' යි මම ප්‍රාර්ථනා කරමි. තෙරුවන් සරණින් සැමට නිරෝගී සම්පත වේවා.

# නමදිමු පොසොන් දා අනුබුදු මිහිඳු හිමි

ලස්සන පොසොන් සඳ අහසේ නැගෙන විට
මිස්සක පව්ව මත පින මතුවිය අපට
දිස්වුනි දහම් මඟ පියතිස් නිරිඳු හට
රැස් විහිදෙයි තවම පින්බර ලෙස දැයට

සම මෙත වඩා හැම සත දුක කරන නිමී
අම මහ නිවන් මඟ පහදා හැඳින ගමී
එම මඟ දෙසුව හද කරුණා ගුණෝන් තෙමී
නමදිමු පොසොන් දා අනුබුදු මිහිඳු හිමී

අධ්‍යාපනවේදී, විශ්‍රාමලත් පරිවේණාචාර්ය
**ජී. බී. ගුණරත්න**





# ආධ්‍යාත්මික කරුණු ඉදිරියේ බාහිර පිළියම් සොයනවා ද?

කැලණිය විශ්වවිද්‍යාලයේ
පාලි හා බෞද්ධ
අධ්‍යයනාංශයේ අංශාධිපති
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
**මකුරුප්පේ**
**ධම්මානන්ද හිමි**

**කිසිදු ගැටලුවක සමස්තය නොසලකා එම ගැටලුවේ එක් එක් පැතිකඩ පමණක් සලකා ගනු ලබන කිසිදු පිළියමක් ස්ථිරසාර විසඳුමක් වන්නේ නැත.**

මිනිසුන්ගේ සියලු අපේක්ෂාවන් අතර ජීවිතාපේක්ෂාව නැතහොත් නිරුපද්‍රිත ව ජීවත්වීමේ ආශාව පළමුවැන්න වේ. බුදු දහමේ පංචශීල ප්‍රතිපදාවේ පළමුවැන්න ප්‍රාණඝාතයෙන් වැළකීම බව අපි දනිමු. බුදුන් වහන්සේට අනුව එය සමස්ත සමාජය විසින් දියයුතු ප්‍රතිඥාවකි.

මම ඔබගේ ජීවිතයට හානි නො පමුණුවමි යන ප්‍රතිඥාව හෙවත් පොරොන්දුව හැම කෙනකුම ආරක්ෂා කරයි නම් එබඳු සමාජය විශිෂ්ට වූවකි. වර්තමානය වන විට එකිනෙකා විසින් එකිනෙකාගේ ජීවිත විවිධ ක්‍රම මඟින් ඝාතනය කරනු ලබන අතර, එනිසාම ස්වභාව ධර්මය විසින් ද මිනිසාගේ ආයු ප්‍රමාණය අඩු කරනු ලබමින් පවතී.

බුදු දහම අනුව මිනිසාගේ ජීවිතාපේක්ෂාව වර්ෂ දහයකට පමණක් සීමා කෙරෙන කාලයක් ද එළඹේ. දීඝ නිකායේ ඇතුළත් එම බුද්ධ දේශනාව මෙසේ ය.

“මහණෙනි, අනාගතයෙහි මෙබඳු කාලයක් වේ. එම කාලයෙහි මිනිසුන්ට පරමායුෂ වර්ෂ දහයක් ඇති දරුවෝ වන්නාහ. මිනිසුන් අතර පස් වයස් ඇති කුමරියෝ විවාහයට සුදුසු වන්නාහ. මහණෙනි, මෙකල ගිතෙල් වෙඬරු ආදී භෝජනවල රස අතුරුදන් වේ. මෙකල කුරහන් අග්‍ර භෝජනය වේ. දස වයස් ආයු ඇති මෙම මිනිසුන් අතර දසකුසල් අතුරුදන් වේ. දස අකුසල කර්ම ප්‍රබල වේ. මොවුන් අතර මව, පියා, වැඩිහිටියන් හා පිදිය යුත්තන් හඳුනන, ගරු කරන අය නැත්තාහ, එබඳු ළාමක මිනිසුන්ටම ගරු සත්කාර ප්‍රශංසා හා පූජනීය තත්වයක් හිමි වේ.

ඇතැම්හු බිළිඳු දරුවන් පවා අපයෝජනය කොට මරා දමූහ. ලෝකයේ ගබ්සා කිරීම් සුලබ දසුනක් විය. බාල වයස්වල දී ම විවාහ ගිවිසගෙන දරුවන් බිහි කළහ. හැල් හාලේ රස මසවුල් ගැන කවර කතා ද? වස විෂ පිරුණු ආහාර විකිණීම හා පරිභෝජනය ආශ්‍රිත විසඳගත නොහැකි ගැටලු පිළිබඳ සමාජයේ දැවැන්ත සාකච්ඡා මතු විය.

ධර්මය අවතක්සේරු කිරීම කෙතරම් ඉහළ ගියේ ද යත් වර්ෂ දහස් ගණනාවක් ශ්‍රී ලංකාවේ සමභාව්‍ය මහ තෙරුන් වහන්සේලා විසින් ජීවිත පරිත්‍යාගයෙන් රැක ගෙන ආ, එසේම විදේශික පඬිවරුන් පවා මවිතව සිය බසට නඟා මහත් ඵල නෙළා ගත් බුද්ධ දේශිත ත්‍රිපිටකය පවා වැරදි යැයි කීමට පෙළඹුණු ආගමික සමාජයක් බිහිවිය.

දූෂිතයන්ට හා සමාජ අපරාධකරුවන්ට නීතියේ යදම් මකුළු දැල් මෙන් විය. ඔවුහුම ජනප්‍රිය හා වැදගත් චරිත වූහ. මව, පියා, සුළු මව, නැන්දම්මා, මිතුරිය හා සොහොයුරිය කෙළි බඩු ලෙස සිතූහ.

වර්තමාන ලෝක තත්වය එබඳු ස්වරූපයක් ගන්නා බව අපි දනිමු. බුදු බණ අනුව මීට ද වඩා බිහිසුණු සමාජයක් ඉදිරියේ පැමිණීමට නියමිත ය.

දීඝනිකායේ චක්කවත්ති සූත්‍රාගත ඉහත අදහස පිළිබඳ සමාජ ස්තරයේ සෑම පුද්ගලයකුට ම පැහැදිලි හා නිරවුල් අවබෝධයක් තිබීම අවශ්‍ය වන්නේ මෙය සැඟවීමෙන් සත්‍යය වසන් කළ නොහැකි නිසාවෙනි. කුමක් නිසා ද යත් අප සැඟවීමට උත්සාහ කරන කරුණු විශ්වීය ධර්මය හෙවත් ස්වභාව ධර්මය නොසඟවන බැවිනි.

සූත්‍රාගත පරිදි මෙම තත්ත්වය තවදුරටත් පැවතියහොත් මිනිසුන්ට අනෙක් මිනිසුන් පෙනෙනුයේ බලු බළලුන් ගවයන් කුකුළන් වැනි තිරිසන් සත්ත්වයන් මෙන් අඩු වටිනාකම් සහිතව ය. ඔවුන්ගේ සිත් තුළ අම්මා, තාත්තා, නැන්දා, මාමා ලේ සබැඳියාව සහිත සියලු අය කෙරෙහි පවා ක්‍රියාත්මක වන්නේ දැඩි රාගය, දැඩි ද්වේෂය, පළිගැනීම හෝ වධක චිත්තයයි.

එකිනෙකා මැරීම සඳහා ඔවුන්ගේ අතට ආයුධ ලැබෙන ආකාරය ගැන ඔවුහු ද නො දනිති. කොටින්ම කිවහොත් සුනඛයකුට වෙනත් සුනඛයකු දැකීමෙන් ඇති වන සිතිවිලිවලට සමාන සිතිවිලි ඔවුන්ගේ සිත් තුළ පහළ වේ. මෙය සූත්‍රයෙහි දක්වා ඇත්තේ මෘග සංඥාව හෙවත් තිරිසන් හැඟීම් යනුවෙනි.

තිරිසන් යන පදය පැමිණ ඇත්තේ තිරශ්චීන යන සංස්කෘත පදයෙනි. තිරස්ව ගමන් කරනා හෙයින් එනම් වන බව පැවසේ. මෙයට බෞද්ධ අර්ථකථනය වන්නේ නිර්වාණගාමී ගමනට හරස්ව සිටිනා සත්ත්ව විශේෂය යන්නයි. එබැවින් ඉහත ආකාරයෙන් සිතන පතන මිනිසුන් තිරිසන් මිනිසුන් යැයි කීමේ වරදක් ඔබට හැඟේ ද?

පෝෂණයෙන් ඌන, ආර්ථික ශක්තියෙන් මෙන්ම බුද්ධි මට්ටමෙන් හීන බාල වයස්කාර දැරියක දරුවකු බිහි කළහොත් ජීවවිද්‍යාත්මකව ද ඇයට උපදින දරුවන් දීර්ඝායුෂ්කවීමේ හැකියාවක් නැත. ඒ සමඟ ඇති සමාජ, ආර්ථික හා සදාචාරමය ගැටලු උපදින දරුවාගේ මනසෙහි තිරිසන් සිතිවිලි බිහිවීමට තුඩුදෙන බව මනෝවිද්‍යාත්මක ව පිළිගත් කරුණකි.

තිරිසන් ගති, තිරිසන් සිතිවිලි හා තිරිසන් වැඩ වැඩි වශයෙන් සිදුවන සමාජයක් නම් සති පිරිත්, වරු පිරිත්, බෝධි පූජා හෝ දේව පූජා පැවැත්වීමෙන් නැවැත්විය නො හැකි ය. දෙවියන් කෙරෙහි නොතිම් භක්තියක් ඇති ඉන්දියානුවන් දේව ප්‍රතිමා කඩා බිඳ දමා ගංගාවලට දමන අයුරු පසුගිය දිනක මාධ්‍යවලින් පවා පෙන්වනු ලැබිණ. ආධ්‍යාත්මික කරුණු ඉදිරියේ බාහිර පිළියම් සෙවීමේ නිසරු බව ගැඹුරින් සිතා වටහා ගත යුත්තකි.

මෘග සංඥාව හෙවත් තිරිසන් හැඟීම් ගති හා වැඩ නීතිය, ආගම හා දේශපාලනය විසින් කිසි ලෙසකත් අගය නොකළ යුතු ය. එක පුද්ගලයකුගේ හෝ එබඳු හැසිරීම් අගය කිරීම සමස්ත සමාජ පද්ධතිය කෙරෙහි වෛරසයක් මෙන් ඉක්මණින් සම්ප්‍රේෂණය වීමේ හැකියාව වැඩි ය.

තමා තුළ තිරිසන් හැඟීම් හා ගති ඇති පුද්ගලයන්ට අනෙක් සමාජ සත්ත්වයන් පෙනෙනුයේ ද තිරිසනුන් ලෙස ය. එහෙයින්ම ඔහු විසින් අනෙකකුට කරනු ලබන පහරදීම්, වධදීම් ආදී අපරාධයන්හි දී අනෙකා හඳුන්වන්නේ ද තිරිසනා යනුවෙනි. ඔහු බල්ලා, බූරුවා, හරකා වැනි තිරිසන් සතකුගේ නමක් පැවසීමෙන් සිය වධක චේතනාව ප්‍රාණවත් කරනු ලබයි.

ප්‍රාණඝාත, දේපළ පැහැර ගැනීම්, පරදාර සේවනය හෝ ලිංගික අපයෝජන, අසත්‍ය වචන කීම්, තඩු හබ ආදිය හා මත්ද්‍රව්‍ය ගැනීමෙන් විකෘති මානසිකත්වයෙන් කල් ගෙවීම යනාදී වල්මත් වූ සමාජයක සත්පුරුෂ මිනිසාට ජීවත්වීම සඳහා වාස භූමියක් සොයා ගැනීම දුෂ්කර වන කාලයක් උදාවනු ඇත.

බුදුන් වහන්සේ වදාළ පරිදි මෙබඳු තත්වයක් යටතේ යහපත් හා බුද්ධිමත් මිනිසුන්ට දැඩි සංවේගයක් හා කළකිරීමක් ඇති වේ. අපි මොකද කරන්නේ යන සිතිවිල්ල ඔහුගේ සිත තුළ තිබඳ සංසරණය වේ. අවසානයේ ඔවුහු අපි ද කිසිවකු නො මරමු, කිසිවෙක් අප ඝාතනය නො කරත්වායි (මා කඤ්චි, මා කොචි) සිතා මෙම සමාජය අතහැර වනගත ව ජීවත්වීමට තීරණය කරති.

මෙකල ඇතැම් අය තුළ එලෙස වනගතව ජීවත්වීමේ රුචිකත්වය මතුවී ඇත. මේ අතර ඉන්දියාව, ශ්‍රී ලංකාව වැනි ආසියාතික රටවල ඇතැම්හු ඕස්ට්‍රේලියාව, නවසීලන්තය වැනි යුරෝපීය රටවලට පියාසර කොට ජීවිතාපේක්ෂාව තහවුරු කර ගැනීමට වෑයම් කරති. එසේම යුරෝපීය ධනවත් රටවල ඇතැම්හු ශ්‍රී ලංකාව තායිලන්තය වැනි රටවල අරණ්‍යවලට පැමිණ ජීවිත සත්‍යය හා සැනසිල්ල සොයා කල් ගෙවති. මෙයින් තහවුරු වන්නේ මෘග සංඥාව අධික වූ සමාජයේ සැබෑ ඇත්ත තේරුම් ගැනීමට අප තවමත් පමා වී ඇති බවයි.

අහසෙහි හෝ මුහුද මැද හෝ පර්වත ගුහා ඇතුළකට රිංගා හෝ කර්ම විපාකයෙන් බේරී සිටීමට තැනක් සොයා ගැනීමේ හැකියාවක් නොමැති බව වරක් බුදුන් වහන්සේ ප්‍රකාශ කළ බව ද මෙහි ලා සිහිපත් කරමු.

බුදුන් වහන්සේ දෙසූ , මිහිඳු මහරහතන් වහන්සේ මෙරටට පෙන්වා දුන් ධර්මයෙන් අපට පෙන්වා දී ඇත්තේ තිරිසන් හැඟීම් නැති කොට මිනිස් හැඟීම් ඇතිකර ගැනීමේ ක්‍රමයයි.

අනාචාරය අතහැර ආචාර සම්පන්න ව සිහියෙන් යුතුව මානව වර්ගයාගේ යහපත වෙනුවෙන් ජීවත්වීමේ රටාවයි. මිනිසාට පමණක් නොව ඇළ දෙළ ගංගා ගහ කොළ වලට පවා දයාබරිත ව ජීවත්වීමේ ක්‍රමවේදයයි.

සංවර්ධනය යන්නට ධනයෙන් විස්කම් පෑම නොව අධ්‍යාත්මයෙන් දියුණුවීම ද අත්‍යවශ්‍ය බව ලෝකය ම පිළිගත් සත්‍යයක් වන නමුත් පිරිහුණු මිනිසුන් සහිත ලෝකයට එය තවමත් ප්‍රායෝගික ව ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත. මේ නිසා විවිධ ලෙඩරෝග, ව්‍යසන හා කරදර අප විසින්ම අප වෙත ළඟා කරවාගෙන ඇත.

අප මුහුණු දෙන රෝග බිය, මරණ බිය හා වෙනත් අනේකවිධ බිය පාදක කර ගනිමින් වෙනත් කිසිවකුට දෙස් නැඟීම පිළියම නොවේ. එහි වරදකරු හා වගකිව යුත්තෝ ද අපිම වෙමු.

බුදුන් හැර, ධර්මය හැර, සඟුන් හැර, ලොවට පිහිටක් නැත. (නත්ථි මෙ සරණං අඤ්ඤං බුද්ධො මෙ සරණං වරං). මෙම සත්‍යය වටහා ගෙන ක්‍රියා කළහැකි නම් අපට ලෝකය පිළිසරණක් සහිත තැනක් වනු නො අනුමාන ය. (එතෙන සච්චවජ්ජේන හොතු මෙ ජයමංගලං). එහෙයින් ව්‍යසන පිටුදැකීමේ බෞද්ධ දැක්ම තේරුම් ගැනීම කාටත් වැදගත් වනු ඇත.




MINISTRY OF ENVIRONMENT





# මිහිඳු හිමි සලකුණු කළ අටමහ ස්ථාන

**මහමෙව්නා උද්‍යානය තුළ රාජකීයයන් සඳහා රාජකීය ගෘහයක් විය. ප්‍රථමයෙන්ම මිහිඳු හිමියන්ට පූජා කළේ මෙම ගෘහයයි. ශ්‍රී මහා බෝධිය පිහිටුවා ඇත්තේ එහි නැගෙනහිර දොරටුව අසල හෙයින් මෙම ගෘහය ශ්‍රී මහා බෝධියට බටහිර දෙසින් පිහිටා ඇති බව සලකණු ලැබේ. මහමෙවුනා උයන මිහිඳු හිමිගේ පිළිගැනීමෙන් පසුව සංඝ සම්මුතියෙන් උපෝෂථාගාරයක් බවට පත් විය.**

### මහ පොළොව කම්පාවෙයි

මෙම මහමෙව්නා උයන තුළ මිහිඳු මා හිමියන් විසින් ඉසින ලද මල් පතිතවීමෙන් මහ පොළොව කම්පා වූ පූජනීය ස්ථාන පිහිටීම දැක්වීම සඳහා ස්ථාන හතක් හා දේවානම්පියතිස්ස රජතුමා විසින් මිහිඳු හිමියන්ට තිස්සාරාමය සඳහා මහමෙවුනා උයන රන් කෙණ්ඩියෙන් පැන් වත්කොට පූජා කිරීමේ දී පැන් පතිතව මහ පොළොව කම්පා වූ ස්ථානය තිස්සාරාමය යනුවෙන් පූජනීය ස්ථාන අටක් මුල්ම කාලයෙහි මෙම මහා විහාරයට අයත්ව තිබී ඇත. එම ස්ථාන අට අටමහ ස්ථාන නම් විය.

මාළක සීමාව (කම්මමාළකය), ජන්තාඝර පොකුණ, ජය ශ්‍රී මහා බෝධිය, ලෝවාමහාපාය (පොහොය ගෙය) සංඝයාට ලාභ බෙදන ලහබත් ගෙය, දාන ශාලාව (චතුස්සාලාව), රුවන්වැලි සෑය හා තිස්සාරාමයයි.

දෙවනදින මිහිඳු හිමියන් නන්දන වනයේ ධර්ම දේශනා කිරීමෙන් පසු මිස්සක පර්වතය කරා නැවත වැඩීමට සූදානම් විය. එවිට දේවානම් පියතිස්ස මහරජතුමා පැමිණ මිහිඳු හිමියන්ට නන්දන වනයෙහි ම එදින රාත්‍රිය ගත කිරීම සඳහා ආරාධනා කරනු ලැබී ය. එනමුත් මිහිඳු හිමියන් පවසනුයේ පුරයට අතිශයින් ආසන්න බැවින් සුදුසු නොවන බව ය.

එවිට රජතුමා සිහිපත් කරනුයේ පුරයට නුදුරුව නොළංව ජලයෙන් හා ගස් සෙවණින් යුක්ත වූ මහමෙවුනා උයනෙහි උන්වහන්සේට වැඩ සිටින ලෙස ආරාධනා කිරීමයි. එයට කැමති වූ මිහිඳු හිමියෝ එදින රාත්‍රී මහමෙවුනා උයන්හි රාත්‍රී නවාතැන් ගත්හ.

### මහමෙවුනා උයන සඟ සතුකොට පූජා කරයි

තෙවනදින මහ රජතුමා විසින් හිමිදිරි පාන්දරම මල් ගෙන්වා ගෙන මිහිඳු හිමියන් බැහැ දුටුවේ ය. හිමියන්ට වන්දනාමාන කොට සුවඳ මලින් මිහිඳු හිමියන් පුදා රාත්‍රී කාලය සුව සේ ගත කළේද, උයන තපස්වීන්ට පහසු වේදැයි විචාරණ ලදී. මිහිඳු හිමියන් පවසනුයේ උයන තපස්වීන්ට සුදුසු වන බවත් සුව සේ රාත්‍රී කාලය ගත කළ බවත් ය.

රජු නැවත විමසනුයේ ආරාම භික්ෂූන්ට කැප ද යන්නයි. මිහිඳු හිමියන් බුදුරජාණන් වහන්සේ වේළුවනාරාමය පිළිගත් අයුරු දක්වා භික්ෂූන්ට ආරාම පිළිගැනීම කැප බව දන්වන ලදී. ඒ අවස්ථාවෙහි දේවානම්පියතිස්ස මහරජ තෙමේ තම අතින් පැන් කෙණ්ඩිය ගෙන මිහිඳු මහ රහතන් වහන්සේගේ දක්ෂිණ හස්තයට පැන් වත් කොට මහ මෙවුනා උයන සඟසතු කොට පූජා කළ බව ය. එවිටම මහ පොළොව කම්පා විය. පෘථිවිය කම්පා වීමට හේතු විමසූ විට මිහිඳු හිමියන් පවසනුයේ ලංකාද්වීපයෙහි බුදු සසුන පිහිටි බව සංකේතවත් කළ බව ය.

### සීමා මාලකය

රජ තෙමේ බොහෝ සතුටට පත්ව දෑසමන් මල් මිහිඳු හිමියන්ට පිරිනැමූ විට උන්වහන්සේ දකුණු දිසාවට මඳක් ගොස් සමන් මල් මිටි අටක් හිඹුල් රුකක් මුල ඉසින විට එවිට ද පොළොව කම්පාවට පත්විය. කම්පා වීමට හේතු විමසූ විට හිමියන් ප්‍රකාශ කළේ කකුසන්ධාදි තුන් බුදුන් කාලයේ සිටම මෙම ස්ථානය සංඝ කර්ම කිරීම පිණිස උපයුක්ත සීමා මාලකය පිහිටන බව ය.

ඉන්පසු මිහිඳු හිමියන් වැඩම වනුයේ උතුරු දෙසින් පිහිටි රමණීය පොකුණක් වෙත ය. එහි දී මල් මිටි අටක් ඉසීය. එවිට ද පොළොව කම්පාවට පත්විය. එයට හේතු විමසන විට මහේන්ද්‍ර හිමියන් පවසනුයේ මෙම ස්ථානය භික්ෂූන්ගේ ගිනිහල් පොකුණ වන බව ය. ජන්තාඝර නමින් හඳුන්වා ඇත්තේ එම ස්ථානයයි.

මින් පසු හිමියන් වැඩමවනුයේ රාජ මන්දිරයේ දොර කොටුවටයි. එහිදී ද සමන් මලින් එම ස්ථානය පිදූ විට මහපොළොව කම්පාවට පත්විය. එසේම මහරජතුමා ද අතිශයින් රෝමෝද්ගමනයෙන් යුක්ත වූ බවත් ඒ පිළිබඳව විමසා සිටි විට මිහිඳු හිමියන් පවසනුයේ රජතුමනි මේ ස්ථානය මේ කල්පය පුරාවට බුදු වී වදාළ කකුසඳ, කෝනාගමන, කාශ්‍යප යන තුන් බුදුවරයන් වහන්සේලා ම පිටදී බුදු වී වදාළ උතුම් බෝධීන් වහන්සේලා රෝපණය කරන ස්ථානය වන බව ය.

එබැවින් අප ගෞතම සම්බුදු රජාණන් වහන්සේ පිට දුන් උතුම් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව පිහිටන්නේ ද මෙම ස්ථානයේ ම වන බව ය.

### ලෝවාමහාපාය

එම ස්ථානයෙන් මිහිඳු හිමියන් වඩිනුයේ මහා මූචල නම් වෘක්ෂ මූලයට ය. එහි ද පෙර සේ ම සමන් මල් ඉසින විට මහ පොළොව කම්පාවට පත්විය. ඒ පිළිබඳව විමසන විට මිහිඳු හිමියන් පවසනුයේ මෙම ස්ථානය මහා සංඝයාගේ පොහොය ගෙය වන ලෝවාමහා ප්‍රාසාදය පිහිටන ස්ථානය වන බව ය.

### රසවත් අඹ ඵලයක් පිළිගැන්වීම

ඉන්පසු මිහිඳු හිමියන් ඇතුළු පිරිස පිවිසෙනුයේ පැනඹ මළුවටයි. එහිදි උයන් පල්ලා විසින් මහරජුට ඉතා රසවත් අඹ ඵලයක් පිරිනමනු ලැබේ. එම අඹ ඵලය රජු විසින් එම ස්ථානයේදී ම මිහිඳු හිමියන් වෙත පූජා කරන අතර රජු විසින් සකසා ඇතිරිලි අතුරා දුන් ස්ථානයේ වැඩ හිඳ උන්වහන්සේ එම අඹ ඵලය එහිදී ම අනුභව කොට අඹ බිජුවටය රජු වෙත දුන් අතර එය එම ස්ථානයේ ම රෝපණය කරන ලදී.



අනුරාධපුර
අභයගිරි රාජමහා විහාරාධිකාරී
ශ්‍රී ලංකා භික්ෂු විද්‍යාලයේ පශ්චාත් උපාධි, බාහිර උපාධි හා විස්තාරික පාඨමාලා ඒකකයේ අධ්‍යක්ෂ ආචාර්ය
**කල්ලංචියේ රතනසිරි හිමි**

මිහිඳු හිමියන් අඹ බිජුවටය පැළවී වැඩෙනු පිණිස අත් ධෝවනය කර එම ජලය බිජුවට මත විසිරවී ය. එවිට එම බිජුවටයෙන් අඹ අංකුරයක් පැන නැගී ක්‍රමයෙන් වැඩී පත්‍රයන්ගෙන් හා ඵලයන්ගෙන් යුත් විශාල අඹ රුකක් බවට පත් වී ඇත. ඒ දෙස බලා සිටි මහ රජතුමාට මෙම ආශ්චර්යය දැක රෝමෝද්ගමනයෙන් යුක්තව හිමියන්ට නමස්කාර කර ඇත.

එවිට පෙර සේ ම මිහිඳු හිමියන් දෑසමන් මලින් එම ස්ථානය පිදීය. එවිට ද මහ පොළොව කම්පාවට පත් වූ අතර ඒ පිළිබඳව තෙරුන් විමසූ විට පවසනුයේ මෙම ස්ථානයේ සංඝයාට උපන් නොයෙක් ලාභයන් සමඟිව බෙදන ස්ථානය වන බව ය.

කකුසඳ බුද්ධාදී තුන් බුදුවරයන් වහන්සේලා ම උන්වහන්සේලාගේ කාලයෙහි මෙම උයන උන්වහන්සේලාට පූජා කළ කල්හි ලක්දිව වැසියන් විසින් සතරදිශාවෙන් ම ගෙන එන ලද දාන වස්තූන් මෙහි තබා වැළඳූ ස්ථානය වන චතුස්සාලාව පිහිටන ස්ථානයේ සමන් මල් විසුරුවන ලදී. එහි දීත් පෙර සේ ම පොළොව කම්පාවට පත්ව එම ස්ථානය සංඝයාගේ භක්ත භෝජන ස්ථානය වන බව රජ හට දැන්වීය.

### රත්නමාලි මහා සෑ රද

ඉන්පසු මිහිඳු හිමියන් වැඩම කරනුයේ රජ උයන්හි පිහිටි කකුධ නම් කුඩා වැවක් සමීපයට ය. ඒ වැව මතුයෙහි දිය කෙළවර සෑයක් පිහිටුවීමට යෝග්‍ය වූ උස් තැනක් වීය. එම ස්ථානයට මිහිඳු හිමියන් වැඩම කරවූ පසු දේවානම්පියතිස්ස මහ රජතුමා විසින් මිහිඳු හිමියන්ට සපුමල් මිටි අටක් දුන් විට එම සපුමල් මිටි අටෙන් එම උස් ස්ථානය පුදන ලදී. එවිට ද මහ පොළොව කම්පාවට පත්විය. එම කම්පාවීමට හේතුව විමසන විටදි මිහිඳු හිමියන් පවසනුයේ සිවු බුදුවරයන් විසින් සෙවුනා ලද මෙම උතුම් ස්ථානයේ අප ගෞතම සම්බුදු රජාණන් වහන්සේගේ ද්‍රෝණයක් පමණ සර්වඥ ධාතූන් වහන්සේ තැන්පත් කොට එක්සිය විසි රියන් උසට ඉදි කරනු ලබන රත්නමාලී නම් මහ සෑ රාජයාණන් වහන්සේ මෙහි පිහිටන බවය. එවිට රජතුමා පවසනුයේ එම දාගැබ් වහන්සේ තමන් විසින් ඉදි කිරීමට කැමති බවය. එවිට මිහිඳු හිමියන් පවසනුයේ මහරජතුමනි, ඔබට මෙහි බොහෝ කටයුතු සිදුකිරීමට ඇති බව ය. එසේම මෙම දාගැබ් වහන්සේ ඔබගේ මී මුණුපුරකු විසින් කරවන බවත්ය. ඒ පිළිබඳ ඓතිහාසික ක්‍රියාදාමය ද ගෙනහැර දක්වමින් පවසනුයේ ඔබගේ සහෝදර වූ මහානාග නම් යුව රජුගේ පුත්‍ර වූ යටාලතිස්ස නම් රජකු වන්නේ ය. ඔහු පුත් ගෝඨාභය නම් රජකු වේ. එතුමාගේ පුත් වූ කාවන්තිස්ස නම් රජකුට දාව දුටුගැමුණු යන නාමයෙන් ප්‍රසිද්ධ වූ මහරජෙක් වන්නේය. එතුමා විසින් මෙම ස්තූපය ඉදිකරන බව දන්වන ලදී. එම පුවත සඳහන් කොට දේවානම්පියතිස්ස මහරජු විසින් මෙම ස්ථානයේ ගල් ටැඹක් ඉදි කරන ලද බව සඳහන් වේ.

ඉන්පසු රජුත් සමග මිහිඳු හිමියන් වඩිනුයේ තිස්සාරාමය පිහිටුවන ස්ථානයටයි. එහි දී ද මල් ඉසින විට පොළොව කම්පාවට පත් වූ විට රජුට පවසනුයේ තිස්සාරාමය මෙහි පිහිටන බව ය.

මෙලෙස මහා මහේන්ද්‍ර මහ රහතන් වහන්සේ දේවානම්පියතිස්ස මහ රජතුමා සමග මහමෙවුනා උයන්හි සැරි සරමින් දෑසමන් මල් ස්ථාන හතකට හා සපුමල් එක ස්ථානයකට ඉසිමින් මහ පොළොව කම්පා කරවමින් මෙම උතුම් අටමහ ස්ථානයන් සලකුණු කරන ලද බව ය.

වර්තමානයෙහිත් මිහිඳු හිමියන් සලකුණු කරන ලද එම අට මහා ස්ථානයන් මහා විහාර භූමිය තුළ පවතී.

ඉහත සඳහන් ඉදිකිරීම් බෞද්ධ මහා විහාරයක තිබෙන්නා වූ ප්‍රධාන අංගයන් ලෙස සැලකිය හැකි ය. ක්‍රිස්තු වර්ෂ දහවන සියවසේ දී පමණ රචිත පාලි මහා බෝධිවංසයේ අනුරාධපුර මහා විහාරය පිහිටි ආකාරය පිළිබඳ දැක්විමේ දී එය සිංහ වික්‍රාන්තියෙන් වූ බව සඳහන් කරයි.

යම් සිංහයෙකු සිටගෙන දකුණුපසට හිස හරවා පිටුපස බලා සිටින්නාවූ ආකාරය සිංහ වික්‍රාන්ති නම් වේ. ඒ අනුව සිංහයාගේ වල්ගය අග පිහිටි ස්ථානයේ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ විය. පසුපස දකුණු පාදය තැබූ ස්ථානය ලෝවාමහාපාය විය. පිටුපස වම් පාදය තැබූ ස්ථානය සන්නිපාත ශාලාව ද නාභිය පිහිටි ස්ථානය ධාතුඝරය ද උදරයේ වම්පස පිහිටි තැන රංසිමාලකය ද ඉදිරි දකුණුපය තැබූ තැන රුවන්වැලිසෑය ද උගුර පිහිටි තැන කණ්ඨක නම් පොකුණ ද හිස දකුණු දෙසට හරවා පිටුපස බැලූ කල්හි දෘෂ්ටිය වැටුණු තැන බුදු පිළිම ගෙය ද විය.

යථෝක්ත සිංහ වික්‍රාන්ති ආරාම සැලැස්මෙහි මිහිඳු හිමියන් විසින් මහමෙවුනා උයන තුළ සලකුණු කරන ලද අටමහ ස්ථානයන් අතුරෙන් වැඩි ස්ථාන ප්‍රමාණයක් සඳහන් වී ඇත. එසේම අලුතින් සකස් වූ පිළිම ගෙය, ධාතුඝර වැනි අංග කීපයක් ද දක්නට පුළුවන.


Highland
From Pure Fresh Highland Milk
Highland
මිල්කො (පුද්ගලික) සමාගම
නො. 45,නාවල පාර,
නාරාහේන්පිට, කොළඹ 05.
දු.ක. 0114 500 500
MILCO
රු. 75/- සිට
www.milco.lk
එළකිරි
Highland
Highland
Highland
Fresh Milk


පොසොන් පුන් පොහෝ දා
සිරිලක තෙමා ලූ අමා වැස්ස
සියලු ලෝ සතුනගේ
යහපත පිණිසම හේතු වේවා !!
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
பிரதேச அபிவிருத்தி வங்கி
RDB Regional Development Bank
0112 42 52 62
www.rdb.lk





# වැලිවිට අසරණ සරණ සරණංකර සිරි සංඝරාජ මා හිමි

01

**323 වන ජන්ම සංවත්සරය, 243 වන අනුස්මරණය හා මහා විහාරවංශික ස්‍යාමෝපසම්පදාවට වසර 268ක් සම්පූර්ණ වීම නිමිත්තෙනි.**



සෝමවතිය රාජමහා විහාරාධිපති
මහා විහාරවංශික ස්‍යාමොපාලි
මහා නිකායේ
මල්වතු මහා විහාර පාර්ශ්වයේ
වැඩ බලන ලේඛකාධිකාරි

**පහමුණේ සුමංගල නාහිමි**

**මහනුවර යුගයේ වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජයාණන් වහන්සේගේ පහළ වීම උදාරතර සිද්ධියක්ම විය. ජාතියත්, රටත්, සම්බුද්ධ ශාසනයත්, ධර්ම ශාස්ත්‍රත් අන්තයට ම පිරිහී එක ද උපසම්පදා භික්ෂුවක්වත් නොසිටි මේ යුගය අතිශයින් ම ශෝක ජනක අන්ධකාර කාලයක් විය.**

උන්වහන්සේ දූක සේ උගත් ධර්ම ශාස්ත්‍ර දෙක තමන් වෙත පැමිණි ශිෂ්‍ය බාලාදීන්ට උගන්වා විශාල අන්තේවාසික සද්ධිවිහාරික භික්ෂු පිරිසකුත් ගිහි පඩිවරු කිහිප පළකුත් ඇති කළහ. ලංකාවේ උඩරට පහතරට දෙපසින් ම පැමිණි මහා සංඝරත්නය උපසම්පදාව ලබා ගැනීම මුඛ්‍යාර්ථය කොට ගෙන සෙංකඩගල නුවරට සම්ප්‍රාප්ත වූහ.

සිල්වතුන් වශයෙනුත් ගණින්වහන්සේලා වශයෙනුත් සිටි සාමණේර පිරිස දීර්ඝ කාලයක සිට ප්‍රාර්ථනා කරමින් සිටි මේ අධිශීල සංඛ්‍යාත උපසම්පදාව ලබා ගැනීම ජීවිතයේ උත්කෘෂ්ඨ අවස්ථාවක් ලෙස හැම දෙනාම සැලකූහ. (විද්‍යෝදය පරිවෙණාධිපති, ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය රාජකීය පණ්ඩිත අකුරටියේ ශ්‍රී අමරවංශාභිධාන දක්ෂිණ ලංකාවේ ප්‍රධාන සංඝනායක හිමිපාණෝ, වැලිවිට සංඝරාජ ප්‍රණාමය, 52 පිටුව. 1985.)

සොළොස් වැනි සියවස පටන් කෙමෙන් විවිධ අන්තරායන්ට ගොදුරු වූ මෙරට දේශපාලන ස්ථාවරත්වය, දේශීය බෞද්ධ අධ්‍යාපනය හා සංස්කෘතිය ද, භික්ෂු සමාජය ද අටළොස් වැනි සියවස පමණ වන විට බෙහෙවින් ම කනගාටුදායක වූ පරිහාණියක ලකුණු නොයෙක් අයුරින් ප්‍රකට කළේ ය.

ලක්දිව මුහුදුබඩ ප්‍රදේශ ප්‍රතිකාල් හා ලන්දේසි ආධිපත්‍යයට යටත් වූ අවධියේ පටන් ම බෞද්ධ සංස්කෘතික තත්ත්වයන් පිරිහී තිබිණ. සසුන ප්‍රමාණවත් රාජානුග්‍රහයක් නොලැබූ අතර, ගිහි බෞද්ධයෝ ද අන්‍යාගම් වෙත හැරෙමින් දේශීය සංස්කෘතිය අවම කොට සලකන්නට වූහ.

මේ අතර උඩරට තත්ත්වය ද ක්‍රමයෙන් පිරිහිණ. එහි රජ කළ නායක්කාර වංශිකයෝ ද සසුනත්, ඒ හා බැඳිගත් සංස්කෘතියත් මැනවින් රක්ෂණය, පෝෂණය නො කළෝ ය. එහි ප්‍රතිඵලය වූයේ වසර දහස් ගණනක් මුළුල්ලේ අඛණ්ඩ ව සරුසාර ලෙස වැඩී ආ මෙරට භාෂා සාහිත්‍යය, ධර්ම ශාස්ත්‍රය, ශාසනික ප්‍රබෝධය, අධ්‍යාපනය, සමාජ චාරිත්‍රාදි විශිෂ්ට සංස්කෘතික බලවේගයන් දරුණු ලෙස පිරිහී යාම ය.

භික්ෂූන් වහන්සේගේ පිරිහීම මේ සියල්ලෙහි නිධානය වූයේ ය. මෙරට මල්වතු, අස්ගිරි යන බෞද්ධ මූලස්ථාන පවා උපසපන් භික්ෂූන්ගෙන් හිස් වී තිබිණ. වෙහෙර විහාර පැවති නමුදු ධර්ම විනයධර සිල්වත් පැවිද්දෝ නො වූණහ. ශ්‍රමණ සාරූප්‍යය නොවූ විවිධ විෂමාචාරයන් නිසා භික්ෂුවගේ තත්ත්වය පිරිහී තිබිණ.

මෙම දුර්භාග්‍ය සම්පන්න අඳුරු කාල පරිච්ඡේදය අවසන් කරමින් පෙර පැවති ශාසනික හා සංස්කෘතික උද්දීප්තිය යළි උදා කළ යුගකාරක මහා පුරුෂයාණන් වූයේ වැලිවිට අසරණ සරණ සරණංකර සිරි සංඝරාජ මාහිමිපාණන් වහන්සේ ය. (විද්‍යාලංකාර පරිවෙණාධිපති, ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය, කැලණි විශ්වවිද්‍යාලයේ කුලපති, ආචාර්ය වැලමිටියාවේ ශ්‍රී කුසලධම්මාභිධාන කොළඹ හලාවත දෙදිසාවේ ප්‍රධාන සංඝනායක හිමිපාණෝ, වැලිවිට සංඝරාජ ප්‍රණාමය, 102 පිටුව, 1985.)



මේ නයින් බලනවිට සම්මා සම්බුදුරජාණන් වහන්සේ අනාගතයේදී ශ්‍රී ලංකාද්වීපයෙහි සම්බුද්ධ ශාසනය පිහිටුවන බව දැනගෙන තුන් වතාවක් වැඩමවමින් සිරි ලක්දිව අති පාරිශුද්ධත්වයට පත් කළේ යැයි මහාවංශ, දීපවංශ, ජිනකාලමාලිය ආදි ඓතිහාසික ග්‍රන්ථයන්හි සඳහන් වේ.

බුදුරදුන් පිරිනිවී වසර 237කට පසුව ය, ධර්මාශෝක මහරජතුමා බෞද්ධයකු බවට පත්වූයේ. බුදුරජාණන් වහන්සේ සියැසින් ම දැක අසීමිත බුද්ධාලම්භන ප්‍රීතියට පත් ව අසූහාරදහසක් වෙහෙර විහාර ඉදි කොට රටවල් නවයකට පස් නම බැගින් ධර්ම දූතයන් යවමින් සම්බුද්ධ ශාසනය පිහිටුවීමට සැලැස්වීය.

යුවරජ තනතුරට පත් වීමට සිටි ධර්මාශෝක රජතුමන්ගේ පුතණුවන් වන මිහිඳු කුමාරයාත් , සංඝමිත්තා දියණියත් පැවිදි උපසම්පදා කොට ශ්‍රී ලංකාද්වීපයට එවා දේවානම්පියතිස්ස රජතුමාගේ සහෝදර අරිට්ඨ කුමාරයා ඇතුළු රාජකීයයන් පනස්හය දෙනකු පැවිදි උපසම්පදා කොට භික්ෂුණී ශාසනයත් සමාජගත චාරිත්‍රාදි විශිෂ්ට සංස්කෘතියත් ශ්‍රී ලංකාවේ පිහිටු වීමට කටයුතු කරමින් අනුරාධපුරය මහමෙව්නාව මුල්කොට තිස්සාරාමය ආදි වෙහෙර විහාර ඉදිකරමින් සම්බුද්ධ ශාසනය ස්ථිරව පැවැත්වීමට අදාළ වූ භික්ෂූන් වහන්සේගේ සිව්පසය සම්පාදනය කරමින් උන්වහන්සේලාට වැඩ සිටීමට ආරාම, කුටි (කාලප්‍රසාද පිරිවෙන) ලෝවාමහාප්‍රාසාදය, සුනහාත, දීඝ චංකමණ, පලග්ග, මරුගන, දික්සන සෙනවියා ආදි පිරිවෙන් සමඟ විහාර කරවීය.

සෑගිරියේ ලෙන් හැට අටක් හා සීමාබන්ධන තිස් තුනක් සෑදවීමත්, සැදැහවතුන් ද තමන්ගේ නමින් ම ලෙන් සාදා පූජා කළ බවත් මහාවංශාදි ග්‍රන්ථයන්හි මෙන් ම ශිලා ලේඛනවලින් මැනවින් පැහැදිලි වේ.

එමෙන් ම අකුධාතුන් වහන්සේ වැඩමවා ථූපාරාම දාගැබ හා විහාරයත් ශ්‍රී මහා බෝධීන් වහන්සේ රෝපණය කිරීමත්, හත්තාල්හක විහාරය, ඉසුරුමුණිය, වෙස්සගිරිය, නාගදීපයේ දඹකොල වෙහෙර, තිස්සමහාවිහාරය, ප්‍රාචීනාරාමය ආදි විහාර සාදා සම්බුද්ධ ශාසනයත් චිරස්ථායී කිරීමේ පටන් දුටුගැමුණු, සද්ධාතිස්ස, වළගම්බා, මහාදාඨික මහානාග, ගජබා, කණිට්ඨතිස්ස, මහසෙන්, කිත්සිරිමෙවන්, දෙවන උපතිස්ස, මහානාම, ධාතුසේන ආදි අග්‍රබෝධි රජු දක්වා ම (ක්‍රි.ව. 843 තෙක්) අනුරාධපුර යුගයේ වෙහෙර විහාර දාගැබ් ආදි ආගමික ගොඩනැගිලි භික්ෂූන් වහන්සේගේ නඩත්තුව සඳහා ඉඩකඩම් වැව් අමුණු ඇළ දෙළ ආදිය සාදා පූජාකොට සම්බුද්ධ ශාසනය සංරක්ෂණය, පෝෂණයකොට වැඩි දියුණු කළ ආකාරය මැනවින් පැහැදිලි වේ.

නොයෙක් යුද කෝලාහල මධ්‍යයේ වුව ද පොළොන්නරු යුගයේ දී පළමුවන සේන රජුගේ පටන් මහාවිජයබාහු, මහාපරාක්‍රමබාහු, කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල, ලීලාවතී රැජින (ක්‍රි.ව. 1222 දක්වා) දක්වා ම උක්ත අයුරින් ම වෙහෙර විහාර දාගැබ් ආදිය ඉදිකරමින් සම්බුද්ධ ශාසනය වැඩිදියුණු කළ අතර 1225 දී පමණ කාලිංග මාඝ පැමිණීමෙන් ඇති වූ ශාසනික, ජාතික, සංස්කෘතික විලෝපනය නිසාම ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් දහස් ගණන් භික්ෂූන් වහන්සේ ද විනාශයට පත් කරමින් වෙහෙර විහාර ආදි ආගමික සිද්ධස්ථාන, රජමාලිගා ආදිය විනාශ කරලීම නිසා සිංහල රජවරු දඹදෙණියට පැන ගියහ.

මහා මිනිස් සංහාරයක් හා වෙහෙර විහාර දේපළ විනාශ විය. භික්ෂූන් වහන්සේ ද සුවිශාල වශයෙන් ඝාතනය කිරීමත් රට හැරදමා යාමත් සිදු වූ අතර වාම ශ්‍රී දළදා වහන්සේ හා පාත්‍රා ධාතූන් වහන්සේ රැගෙන කොත්මලේට පැන ගිය භික්ෂූන් වහන්සේ එම ධාතූන් වහන්සේලා හපුගහක බෙනයක සඟවා බුරුමයට පැන ගොස් ජීවිත බේරා ගත්හ.



# දෙගල්දොරුව නාම පුරාණය

දෙගල්දොරුව යන ග්‍රාම නාමය නිර්මාණය වීමට මෙම විහාරස්ථානය හේතු වන්නට ඇතැයි බොහෝ දෙනෙක් සිතති. නමුත් නම් පොත විහාර නාමාවලියෙහි සඳහන් වනුයේ අමුණුගම විහාරය යන නාමයෙනි. මෙම විහාරයට දෙගල්දොරුව විහාරය යන නම ලැබීම සිදුවන්නට හේතුව ලෙස සැලකිය හැකි කරුණක් ඇත. දෙගල්දොරුව විහාරයේ විහාරාධිපතින් වහන්සේ පරම්පරා ගණනාවක් ශිෂ්‍යානුශිෂ්‍ය ව සිටීමත් උන්වහන්සේ සෑම දෙනාම අමුණුගම දෙගල්දොරුව ග්‍රාමය ව සිටි බැවින් අමුණුගම විහාරය දෙගල්දොරුව විහාරය ලෙස ප්‍රසිද්ධ වන්නට ඇත.

කෙසේ වුව ද දෙගල්දොරුව යන ග්‍රාම නාමය ඇති වීමට හේතු වූ ජනප්‍රවාදයක් පවතියි. වර්තමානයේ බෝධිගල නෙල්ලිගල නම් ගල් පර්වතයේ නැගෙනහිර දිශාව කෙළවර පෙර දවස ගල් ගුහාවක් තිබී ඇත. (වර්තමානයේ හිග්ගස්පිටිය මාවතෙන් ගොස් එම ස්ථානය දැක ගත හැක)මෙහි රන් දෑකැති හතක් වූ අතර මෙම ප්‍රදේශයේ ගොවීන් ගොයම් කපන වකවානුවේ දී ඉහත දෑකැති ගෙන ගොයම් කැපීමෙන් පසු ආපසු ලෙන තුළ තැන්පත් කිරීමේ චාරිත්‍රයක් තිබී ඇත. මේ අතර එක් ගොවියෙක් සිය ගොයම් කැපීමට ගත් දෑකැති හතෙන් එකක් සොරකම් කරගෙන හයක් ගුහාවෙහි තැන්පත් කළ අතර ඒදින රාත්‍රියෙහි මෙම ගුහාවට අරක් ගෙන සිටි බහිරවයා ගොවියා ව සිහිනෙන් බිය ගන්වා ඇත. බිය පත් වූ ගොවියා පසුදින උදෑසන ම සොරා ගත් දෑකැත්ත ගෙන ගොස් තබන අවස්ථාවේ මෙම ගුහාවෙහි දොර දෙක වැසී ඇත. එසේ වැසී යාමට මත්තෙන් ගල් පියන් සහිත දොර දෙකක් වූ බැවින් දෙගල්දොර යන්න දෙගල්දොරුව ලෙස පටබැඳී ඇති බව ජනප්‍රවාදයයි.

## දෙගල්දොරුව රජ මහා විහාරය

පාතදුම්බර කළාගාරය ලෙස කන්ද උඩරට මහනුවර යුගයට අදාල සිතුවම් ඇති වැදගත්ම සිද්ධස්ථානයකි දෙගල්දොරුව රජ මහා විහාරය. මෙම විහාරස්ථානය මහනුවර කුණ්ඩසාලේ මැතිවරණ කොට්ඨාශයේ සිරිමල්වත්ත පල්ලේගම, අමුණුගම ග්‍රාමයේ පිහිටා ඇත.දෙගල්දොරුව රජ මහා විහාරස්ථානයේ ඉතිහාසය මහනුවර යුගයේ කීර්ති ශ්‍රී රාජසිංහ යුගය දක්වා දිවෙයි. ක්‍රි.ව.1748 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භ වූ දෙගල්දොරුව විහාරස්ථානයේ වැඩ අවසන් කිරීම සිදුව ඇත්තේ රාජාධි රාජසිංහ රජ සමයේ ක්‍රි.ව.1780 දීය. ඉන්පසු විහාරය පූජා ක ර න ලද්දේ රජුගේ ගුරුවරයා වූ මොරතොට ශ්‍රී ධම්මක්ඛන්ධ නායක හිමිපාණන්ටය.

දෙගල්දොරුව විහාරස්ථානයේ ඇති ඓතිහාසික වටිනාකම රැඳී ඇත්තේ ලෙන් විහාරයේ දක්නට ඇති බිතු සිතුවම් තුළය. වසර 300 කට පමණ ආසන්න පැරණි බවක් ඇති මෙම සිතුවම් අතර ඇති සිතුවම්වලින් ඇතැම් ඒවා මෙම විහාරයට සුවිශේෂී වන අතර තවත් සිතුවම් මහනුවර යුගයට ආවේණික අයුරින් නිර්මාණයවී ඇත. ඒ අතර දක්නට ඇති සිතුවම් තුළින් වියන් චිත්‍ර අතර ඇති

* මාර පරාජය චිත්‍රාවලියෙහි ගිණි අවි අතින් ගත් මාරයින්ගේ සිතුවම,

* මහනුවර යුගයේ නිර්මාණයවී ඇති වඩාත් නිර්මාණාත්මක රේඛා සිතුවමක් සේ සැලකෙන මහීකාන්තා දේව සිතුවම,

* වෙනත් විහාරස්ථාන තුළ දක්නට අපහසු මුහුණු පහක් සහිත පංච මාර සිතුවම.

* මහනුවර යුගයට ආවේණික ලක්‍ෂණ සහිත පංච මහා ශාඛ බෝධි වෘක්ෂය

* සූවිසි විවරණ චිත්‍රාවලියේ දක්නට ලැබෙන (ජනප්‍රවාදයට අනුව) පරසතු මල් ලෙස සැලකෙන මෝස්තරය දක්නට හැකියාව ඇත.

එමෙන්ම බිත්තියෙහි නිර්මාණය කර ඇති සිතුවම් අතර ද විශේෂ වන සිතුවම් කිහිපයක් දන්නට ලැබේ. දෙගල්දොරුව විහාරයේ ඇති ජාතක කතා අතර වෙස්සන්තර ජාතකයට ලැබෙනුයේ විශේෂ ස්ථානයකි. ඒ එහි දක්නට ලැබෙන මනස්කාන්ත සිතුවම් නිසාවෙනි. ඒ අතර

* ඇළි ඇතා දන්දීමේ සිතුවම මහනුවර යුගයේ නිර්මාණය වූ හොඳම තාත්විකත්වයන් යුත් සිතුවම ලෙස සැලකේ.

* එමෙන්ම එහි දක්නට ලැබෙන අනෙක් සිතුවම වනුයේ උඩුකය නිරාවරණය වූ ගැමි කාන්තා සිතුවම දක්වනුයේ මහනුවර යුගයේ සමාජ රටාවෙහි තොරතුරුය.

* ක්‍ෂාන්තිවාදී ජාතකයේ දක්නට ලැබෙන මදුරු දැල චිත්‍රය මහනුවර සිතුවම් කලාවේ උඩරට චිත්‍ර සම්ප්‍රදායේදී නිර්මාණය කර ඇත්තේ දෙගල්දොරුව විහාරයේ පමණි.

මෙසේ පෙන්වන ලද්දේ මෙම ඓතිහාසික සිද්ධස්ථානයේ ඇති සිතුවම් අතර ඇති විශේෂ වූ සිතුවම් කිහිපයකි. සෙසු සිතුවම් ද එවැනිම ඓතිහාසික වටිනාකමින් යුත් සිතුවම්ය. මෙම සිතුවම් නිර්මාණය කර ඇත්තේ මහනුවර යුගයට ආවේණික අයුරිණි. එබැවින් මෙම සිතුවම් ද්විමාන ලක්?ෂණ චිත්‍ර ලෙස මෙන්ම ශෛලිගත සම්ප්‍රදායට අයත් සිතුවම් ලෙස පිළිගැනීමට ලක්වේ.

එමෙන්ම සිතුවම් නිර්මාණය කිරීම සඳහා යොදාගත් අමුද්‍රව්‍ය වනුයේ ස්වභාවික ද්‍රව්‍යයන්ය. ඒ අතර වියන් තලයෙහි ටෙම්පරා හෙවත් වියළි බදාමයෙහි අඳින ලද චිත්‍රවලට පෙර බදාමය තනාගෙන ඇත්තේ

* කපු පුළුන් ,මී පැණි,අඹරා ගත් වැලි යනාදියෙනි.

සිතුවම් සඳහා වර්ණ වශයෙන් යොදාගත් අමුද්‍රව්‍ය පහත පරිදිය.

* රතු වර්ණය සාදලිංගම් ගල්වලින් ද
* කහ වර්ණය ගොකටු කිරිවලින් ද
* නිල් වර්ණය නිල් අවරිය යුෂවලින් ද
* සුදු වර්ණය මකුළු මැටිවලින් ද
* කලු වර්ණය පහන් දැලි හා කොහොල්ලෑවලින්

තනාගෙන තිබේ.

එසේම සිතුවම්වල ආරක්‍ෂාව සඳහා මතුපිට ආලේප කළ වළිත්තිය හල්දුම්මල හා දොරණ තෙල් මිශ්‍රණයෙන් තනාගෙන ඇත. මෙම අමුද්‍රව්‍ය යොදාගෙන තෙළිතණ හා ඇත් තුත්තිරි මෙන්ම ලේනුන්ගේ හා මුවන්ගේ ලොම් වලින් තනාගත් තෙලිකූරු යොදා ගෙන චිත්‍ර නිර්මාණය කර ඇත.

එසේ නිර්මාණය වූ බිතු සිතුවම් වශයෙන්

- මහාසීලව
- වෙස්සන්තර
- සුතසෝම
- සත්තු භත්ත
- ක්‍ෂාන්තිවාදි
- අයෝඝර

යන ජාතක කථා ද

- සොළොස්මස්ථාන හා සත් සතිය
- බුද්ධ චරිතයේ වැදගත් අවස්ථා හා ශ්‍රාවක රූප ද

බිත්තිවල නිර්මාණයවී ඇත. එසේම වියන් තලයෙහි

- සූවිසි විවරණ,මාර පරාජය හා කඩා වැටීමකින් ශේෂ වී ඇති දේවාරාධනය සිතුවම් යන මේවා සමස්ථයක් වශයෙන් දැක්විය හැක. තව ද මහනුවර යුගයට ආවේණික ලක්‍ෂණයන්ගෙන් හෙබි සඳකඩ පහණ සහ ලංකාවේ ඇති නා දැවයෙන් නිර්මාණය කළ එකම මකර තොරණ ද දෙගල්දොරුව විහාරස්ථානයේ දක්නට ඇත.

මෙම අග්‍රගන්‍ය විහාර මන්දිරය නිර්මාණය කිරීම සඳහා

- ගෘහ නිර්මාණයෙන් මූලාචාරී දේවේන්ද්‍රයන් නම් පාරම්පරික ශිල්පියෙක් විසින් ද
- වියන් තලයෙහි සිතුවම් නිලගම පටබැඳි විසින් ද
- ප්‍රතිමා හිරියාලේ නයිදේ නම් ශිල්පියාගෙන් ද
- ජාතක කථා දෙවරගම්පල සිල්වත්තැන

යනාදි ශිල්පීන් අතින් නිර්මාණයවී ඇති බව ඓතිහාසික මූලාශ්‍රයන් හා ජනප්‍රවාදයන්ට අනුව පෙන්වා දිය හැක. මෙසේ නිර්මාණය වූ දෙගල්දොරුව විහාරස්ථානයේ සිතුවම් පහන් දැලිවලින් දුර්වර්ණව පැවති අතර 1960 දශකයේදී සීගිරියේ චිත්‍ර අපවිත්‍ර වූ අවස්ථාවේ ඒවා පවිත්‍ර කිරීමට පැමිණි ඉතාලි ජාතික ලූසියානෝ මරන්සි නම් ශිල්පියා අතින් පවිත්‍ර වූ අතර යළිත් වරක් 2004-2006 කාලසීමාව ඇතුළත මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් සංරක්‍ෂණය කිරීමත් සමග විනාශයට යමින් පැවති දෙගල්දොරුව රජ මහා විහාරයේ බිතු සිතුවම් යථා තත්වයට පත් කරන ලදී.

## දෙගල්දොරුව විහාරය හා සම්බන්ධ රස කතා

### *කීර්ති ශ්‍රී රාජසිංහ රජු හා මොරතොට නාහිමි අතර සංවාදය*

මොරතොට නාහිමි යනු කීර්ති ශ්‍රී රාජසිංහ රජුට මෙන්ම රාජාධි රාජසිංහ රජුගේ ද ආචාර්ය වරයෙකි. මොරතොට ශ්‍රී ධම්මක්ඛන්ධ නාහිමි සහ කීර්ති ශ්‍රී රාජසිංහ රජු අතර පැවති සමීප සම්බන්ධතාව ලෙස ඊර්ෂ්‍යාවෙන් බැලූ භික්ෂු පිරිසක් ගුරු හිමියන් පිළිබඳ කළකිරීමක් ඇති කරවීමට උපායක් සැලසුම් කළ අතර රජු වෙත රහසින් සැලකර සිටියේ රජුගේ බිසව සමග මොරතොට නාහිමි අතර අනියම් සම්බන්ධයක් පවතින බවය. මෙය පරීක්ෂා කිරීමට සිතූ රජුල බිසව අත පළඳින ආභරණ පැළඳ මල්වතු විහාරයේ නාහිමි වැඩසිටි මැද පංසලේ කුටියෙහි ජනෙල් කවුළුවෙන් කුටියට අත යොමා සෙලවීය. මෙහි දී රජුගේ අත අල්ලා ගත් නාහිමියන් පහත කවිය ගායනා කර ඇත.

සකල මුව තඹර සියොගත සියුමැළියේ
අසලක නම් දැක දැක ඉන්නත් පිරියේ
ඇසළ මස දුටිමි යනවා දෙවි කෙළියේ
සකල සිරි ලකට අගරජ නුඹ ද ළියේ

යනුවෙන් ගායනා කළ කවිය ඇසූ රජු මහත් ලජ්ජාවට පත්වුනා පමණක් නොව තමා තම ගුරු හිමියන් පිළිබඳ සිතූ ආකාරය වැරදි බවත් එය මහත් පවක් බවත් අවබෝධ කරගත් රජු සංවේගයට පත්ව පහත ඇති පද්‍ය ගායනා කර ඇත.

අමර ගුරු හරණ සත දත් පිනාව න්
විතර නොවන ගුණ කඳ සපිරිනාව න්
පවර පසිඳු මොරතොට යති මනාව න්
සසර වසන තුරු මට වාසනාව න්

තද තෙද ගැඹුරු නම් සත දැනගෙන යෙහෙන
ඔද තෙද පසිඳු නෙත හරි මුවරද ලෙසින
හද නද කරන මොරතොට යතිඳුගේ සවන
වැඳ වැඳ හිඳිමි සිරිපා යුවල දින දින

මොරතොට දම්කඳ නායක යතිඳු හට
නරදෙට මෙමා බුහුමන් කරපු හැටියට
වරිගෙට ගෝල නමකට ඔබගෙ යමෙකුට
වරදට යමක් නොකරම් මින ඉදිරියට


යනුවෙන් තම සිත ඇති පැහැදීම පළකළ රජු තමන්ගෙන් වැදගත් ගුරු පුඬුරක් රාජගුරු හිමියන්ට පිදීමට සිතූ කීර්ති ශ්‍රී රාජසිංහ රජු දෙගල්දොරුව විහාරය ඉදිකර පූජා කිරීමට කටයුතු කර ඇත.

## චිත්‍ර ශිල්පියෙකුට වූ ඇබැද්දියක්

දෙගල්දොරුව විහාරයේ සිතුවම්කරණයට සම්බන්ධ වියන් තලයේ ඇති දේවාරාධනයලමාර පරාජය හා සූවිසි විවරණ යන සිතුවම් නිර්මාණය කරන ලද්දේ නිලගම පටබැන්දා නම් ශිල්පියා විසින් බව පැවසෙයි. ඔහු පලංචිය මත දිගා වී පහන් එළියෙන් සිතුවම් නිර්මාණය කරමින් සිටින විට කීර්ති ශ්‍රී රාජසිංහ රජු විහාර කර්මාන්තයේ කටයුතු නිරීක්ෂණය කිරීමට පැමිණ ඇත. මේ පිළිබඳ ශිල්පියා දැනුවත්ව සිට නැත. නමුත් සිය අතවැසියා රජු පැමිණෙන මාර්ගයෙන් වහාම ඉවත්විය.

නිලගම පටබැඳි ශිල්පියා බුලත් විට ගන්නා අයෙකු වන අතර අතවැසියා නිරන්තරයෙන් ශිල්පියාට බුලත් කෙළ ගැසීමට පඩික්කම ලබා දෙයි. රජු පැමිණි අවස්ථාවේ අතවැසියා තමා ළඟින් ඉවත්ව ඇති බව දැන නොගත් නිලගම පටබැන්දා බුලත් කෙළ ගැසීමට සුපුරුදු පරිදි සූදානම් විය. මෙහි දී රජු එක වරම තම දෑත එක්කොට යොමු කළේය. අඩ අඳුරු ආලෝකයේ එය පඩික්කම ලෙස සැලකූ චිත්‍ර කරුවා රජුගේ අතට කෙළ ගැසුවේය. එම අවස්ථාවේ රජුගේ අතෙහි වූ දිලිසෙන මුදුව දකින ශිල්පියා පසුව රජුගේ මුහණ දකියි. මෙහිදී මර භයින් සිහිසුන් වූ ශිල්පියා මරණාසන්න රෝගාතුර තත්වයට පත්විය. එහි දී ශිල්පියා මුන ගැසීමට ගිය රජු පවසා ඇත්තේ ඔබගේ නිර්මාණ දැහැන්ගතවීම බිඳ හෙලුවේ තමා බැවින් සිදු වූ සියල්ලට ඔබට අභය දානය ලැබෙන අතර නැවත ගොස් විහාරයේ කටයුතු සිදු කරන ලෙසය. ඉන් පසු සුවපත් වූ නිලගම පටබැඳි නම් ශිල්පියා සිය කාර්යය අවසන් කර ඇත.

මහනුවර නගරයට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයන්ගේ අවධානයට ලක් විය යුතු ඓතිහාසික ස්ථානයක් ලෙස දෙගල්දොරුව රජමහා විහාරය හඳුන්වා දිය හැකි අතර චිත්‍ර කලාව හදාරන පාසල් දරුවන්ට හා පර්යේෂකයන්ට ද අතිශය වැදගත් සම්පතකි.



මධ්‍යම පළාත්, වෙළඳ, වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තුව
නො. 1054, ගැටඹේ, පේරාදෙනිය
දු. ක. 0812 387 118
http://www.tourism.CP.gov.lk
tradecomtourcpc@gmail.com



# අපේ අනුබුදු මිහිඳු මාහිමියෝ...

**ලංකාද්වීපය කෙරෙහි හිතානුකම්පී වූ අපගේ ශාක්‍ය මුනීන්ද්‍රයාණන් වහන්සේ විසින් පිරිනිවන්පානා අවස්ථාවෙහි ලංකාදීප ප්‍රසාදක ගුණයෙන් යුතු මිහිඳු මාහිමියන් ගැන වදාළ සේක. ලක්දිවට ශාස්තෘන් වහන්සේ බඳු අපගේ මිහිඳු මහරහතන් වහන්සේ ලංකාවැසි දෙවියන්ගෙන් පිදුම් ලබමින් ලංකාවාසීන්ගේ යහපත උදෙසා මෙහි වැඩි සේක. එවිට අප භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන්පා දෙසිය තිස්හය වැනි වර්ෂයයි.**



ථූපාරාම සෑ මලුවේ දී අකු ධාතූන් වහන්සේ යමාමහ පෙළහර පෑ දිනයේ දී ඇතුල් නුවරත්, පිට නුවරත් තිස් දහසක් දෙනා මිහිඳු මහරහතන් වහන්සේගෙන් උතුම් පැවිදි බව ලබා ගත්හ. මෙසේ ලක්දිව මහ රහත් පරපුරක් බිහිකොට කසාවතින් බබුළුවන්නට සියලු මාවත් විවර කළෝ අපගේ අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ ම ය.

“මහරජුනි, අපි ධර්මරාජයාණන් වහන්සේගේ ශ්‍රාවක වූ ශ්‍රමණයෝ වෙමු. ඔබ කෙරෙහි අනුකම්පාවෙන්ම දඹදිව සිට මෙහි පැමිණියෙමු.” කියා දේවානම්පියතිස්ස රජුට තමන් හඳුන්වා දුන් මිහිඳු මාහිමියන් චූල්ලහත්ථිපදෝපම සූත්‍රය දේශනාකොට රජු ඇතුළු පිරිස සරණ සීලයෙහි පිහිටවූ සේක. ගෞතම සම්බුද්ධ සංදේශය ලක්දිවට දායාද කරමින් ඇරඹි ධර්ම ප්‍රචාරය කෙතරම් සාර්ථක වී ද යත් සතියක් ඇතුළත මගඵලලාභීන් අටදහස් පන්සියයක් ලක්දිවින් බිහිවූහ.

මිනිසුන් අධර්මයෙන් මුදවා ධර්මයට පමුණුවාලීමේ දී අපගේ ශාස්තෘන් වහන්සේ හා සමාන වූ මිහිඳු මහරහතන් වහන්සේ ලංකාදීපයේ සම්බුදු සසුන පිහිටුවීමේ ඒකායන අදහසින් යුක්ත වූහ.

දේවානම්පියතිස්ස රජුගේ මැදුරේදීත්, රාජකීය ඇත්ගාලේදීත්, ලංකාවාසීන් කතා කරන දීප භාෂාවෙන් ම ධර්මය වදාළහ. අප මාතෘ භූමියට පිළිසරණ වූ උන්වහන්සේ ලංකාවාසීන්ට සද්ධර්ම මාර්ගයේ බැස ගන්නට මඟ හසර විවර කළ උත්තම කල්‍යාණ මිත්‍රයන් වහන්සේ ය. තමන් වහන්සේගේ උතුම් ගතිගුණ නිසා මහත් කීර්තියට පත්වූ මිහිඳු මහරහතන් වහන්සේ ගැනත්, උන්වහන්සේගේ ශිෂ්‍ය වූ රහත් භික්ෂූන් වහන්සේලාගේ ගුණවත්කම් ගැනත් බොහෝ පැහැදී උන්වහන්සේලා වෙත පැමිණ ගෞරවාදර දැක්වූ දෙවියෝත්, මිනිස්සුත් බොහෝ පින් රැස්කර ගත්හ.

අපගේ මිහිඳු මහරහතන් වහන්සේ පර්යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවේද යන උතුම් බුද්ධ ශාසනය ඉතා යහපත් ලෙස ලක්දිව බැබළවූ සේක. ත්‍රිපිටක ධර්මය කටපාඩම් කරවීම ආදියෙන් භාණක පරම්පරාව බිහිකොට සම්බුදු සසුන චිරස්ථායී කළ සේක. මහා සඟ පිරිවරකින් යුක්තව ලක්දිවට මහත් පිහිටක් සලසා දුන් සේක. ලක්දිවට ශාස්තෘන් වහන්සේ නමක් හා සමාන ව දෙව් මිනිසුන්ට යහපත පිණිස බොහෝ කටයුතු සිදුකළහ.

මිහිඳු මහරහතන් වහන්සේ ලක්දිවට වැඩමකළ පසු දෙවනපෑතිස් රජුගේ අනුග්‍රහයෙන් මුලින්ම ඉදිකරවන ලද්දේ මහමෙව්නා උයනේ මහා විහාරයයි. දෙවනුව කරවන ලද්දේ මිහින්තලයේ චේතියගිරි විහාරයයි. තුන්වෙනුව කරවන ලද්දේ සුන්දර වූ ස්ථූපය මුල් කොටගත් ථූපාරාමයයි. හතරවැනි ව කරවන ලද්දේ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ පිහිටුවාලීමයි. පස් වෙනුව රුවන්වැලි මහා සෑය පිහිටුවන සැලැස්ම මනාව පිළියෙළ කොට මහා සෑය පිහිටන ස්ථානයේ ඒ බව සඳහන්කොට රජතුමා ලවා ගල්ටැඹ පිහිටවූහ.

මේ සියලු ශාසනික දායාදයන් ලබා දීමට මුල්වී ක්‍රියා කළේ, අනුශාසකත්වය සැපයූවේ අපගේ අනුබුදු මිහිඳු මාහිමියන් ය.

අප භාග්‍යවතුන් වහන්සේ දන් වැළඳූ ශ්‍රී සම්බුද්ධ පාත්‍රයට සර්වඥ ධාතුන් වහන්සේලා පුරවා සුමන සාමණේර රහතන් වහන්සේ ලවා ලක්දිවට වැඩම කරවීමට මඟ සැලසුවේ ද මිහිඳු මහරහතන් වහන්සේම ය. දෙවනපෑතිස් රජතුමා මහත් ශ්‍රද්ධාවෙන් එම ධාතූන් වහන්සේලා වඩා හිඳුවා ලංකාදීපය පුරාවට යොදුනක් යොදුනක් පාසා වෙහෙර විහාර කරවී ය. එමෙන්ම අප භාග්‍යවතුන් වහන්සේගේ අකු ධාතූන් වහන්සේ තව්තිසා දෙව් ලොවින් සුමන සාමණේරයන් ලවා වැඩමවා මහා පෙළහර මැද ථූපාරාම සෑ රජාණන් වහන්සේ තුළ මහත් ගෞරවයෙන් වඩාහිඳවූයේ ද මිහිඳු මාහිමියන් ම ය.

තම ගිහි කල නැඟණිය වූ සංඝමිත්තා රහත් තෙරණිය ලවා ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව වැඩමවා මහත් හරසර මැද මහමෙව්නා උයනේ රෝපණය කරවූයේ ද අප කෙරෙහි මහත් දයා සිතැති උන්වහන්සේ ම ය.



පොල්ගහවෙල මහමෙව්නා භාවනා අසපු සංචිතයේ නිර්මාතෘ සහ අනුශාසක

**කිරිබත්ගොඩ ඤාණානන්ද හිමි**

ලක්දිව පළමු වස්කාලය ගත කිරීමට පෙර “වස් වැසීම” යනු කුමක්දැයි දෙවනපෑතිස් රජු හට පහදා දෙමින් මිහිඳු මාහිමියන් මහාවග්ග පාලියේ වස්සූපනායිකක්ඛන්ධකය දේශනාකළ සේක. එයට සවන්දුන් මහා අරිට්ඨ ඇමතිතුමා තම වැඩිමහලු බාල සහෝදරයන් පනස්පස් දෙනාත් සමඟින් මිහිඳු මහරහතන් වහන්සේ සමීපයේ උතුම් පැවිදිබව ලබා ගත්හ. සසරේ රැස් කළ පිනෙන් මහා ප්‍රඥවන්ත වූ ඒ සියලුදෙනාම පැවිද්ද පිණිස කෙස් රැවුල් බා අවසන් වනවාත් සමඟම උතුම් අරහත්වය සාක්ෂාත් කළහ.

අරිට්ඨ මහරහතන් වහන්සේ ප්‍රමුඛ එම සිංහල මහරහතන් වහන්සේලා ලවා ථූපාරාම සෑ මලුවේ දී විනය සංගායනාවක් කොට ගෞතම සම්බුදු සසුන ලක්දිව මුල් බැස ගන්නට සියලු කටයුතු සම්පාදනය කළේ ද දීපප්පසාදක පරම කල්‍යාණ මිත්‍ර මිහිඳු මහරහතන් වහන්සේ ම ය.

අප මිහිඳු මහරහතන් වහන්සේ සමීපයෙහි ඉසුරුමත් ක්ෂත්‍රිය කුලයේ පන්සියයක් කුමාරවරු පැවිදිව වාසය කළ තැන කරවූ විහාරය “ඉසුරුමුණිය” නම් විය.

වෛශ්‍ය හෙවත් වෙළෙඳ කුලයෙන් ආ පන්සියයක් දෙනා මිහිඳු මාහිමියන් සමීපයේ පැවිදිව වාසය කළ ස්ථානයේ ඉදිවූ විහාරය “වෙස්සගිරිය” නම් විය.

ථූපාරාම සෑ මලුවේ දී අකු ධාතූන් වහන්සේ යමාමහ පෙළහර පෑ දිනයේ දී ඇතුල් නුවරත්, පිට නුවරත් තිස්දහසක් දෙනා මිහිඳු මහරහතන් වහන්සේගෙන් උතුම් පැවිදිබව ලබා ගත්හ.

මෙසේ ලක්දිව මහ රහත් පරපුරක් බිහිකොට කසාවතින් බබුළුවන්නට සියලු මාවත් විවර කළෝ අපගේ අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ ම ය.

දෙවනපෑතිස් රජුගේ සහෝදරයාගේ බිරිඳ වූ අනුලා දේවිය ද, ඇයගේ පරිවාර කන්‍යාවන් පන්සිය දෙනා ද මිහිඳු මහරහතන් වහන්සේගෙන් ධර්මය ශ්‍රවණය කොට දහම් ඇස පහළ කර ගත්හ. ඔවුහු දසසිල් සමාදන් ව, කසාවත් පොරවාගෙන, පිරිසිදු පැවිදි බව අපේක්ෂාවෙන්, ධර්ම මාර්ගය පුහුණු වෙමින් උපාසිකා විහාරයෙහි වාසය කළහ.

මිහිඳු මහ රහතන් වහන්සේ ධර්මාශෝක රජුට අරිට්ඨ ඇමතිතුමා අත සන්දේශයක් යවා සංඝමිත්තා තෙරණිය ද, ජය ශ්‍රී මහා බෝධි දක්ෂිණ ශාඛාව ද මෙරටට වැඩම වීමට මඟ සැලැස්වූ සේක. අනුලා බිසව ප්‍රධාන පිරිසට පැවිදි උපසම්පදාව ලබාදී ලක්දිව කතුන්ට ද විමුක්තියේ ද්වාරය විවර කළෝ මිහිඳු මාහිමියන් ම ය.

මිහිඳු මහරහතන් වහන්සේ ලක්දිවට වැඩමවූ මුල් සතියේ දී ම විමානවත්ථු, පේතවත්ථු දේශනා වලින් පිනෙහි විපාකයත්, අකුසලයේ ආදීනවත් මෙරට වැසියන්ට මැනවින් පහදා දුන්හ.

අනමතග්ග සංයුක්තයේ දේශනා තුළින් සසරේ දුක්ඛිත බවත්, බිහිසුණු බවත් පෙන්වාදී, සච්ච සංයුක්තයෙන් දහම් දෙසා චතුරාර්ය සත්‍යය අවබෝධයේ වැදගත්කම පෙන්වාදුන් සේක.

මිහිඳු මහරහතන් වහන්සේ වදාළ උතුම් සම්බුදු දෙසුම් වූ බජ්ජනීය සූත්‍රය, ගෝමයපිණ්ඩූපම සූත්‍රය, දම්සක් පැවතුම් සූත්‍රය ආදී දේශනා තුළින් දහස් ගණන් මගඵලලාභීන් ලක්දිවින් බිහිවූහ. මෙසේ බුදු සසුන බැබැළවූ මිහිඳු මහරහතන් වහන්සේ භික්ෂු – භික්ෂුණී, උපාසක – උපාසිකා යන සිව්වණක් ශ්‍රාවක පිරිසෙන් සුසැදි බුද්ධ රාජ්‍යයක් බවට මේ ලක්දිව පත් කළ සේක. යක්ෂ, නාග ආදී අමනුෂ්‍යයන් ඇදහූ දේශයක් තෙරුවන් සරණගත සිල්ගුණදම් වඩන දේශයක් බවට පත් කළ සේක.

යළි දඹදිවට නොවැඩ ලක්වාසීන් උදෙසා ම හතළිස් අට වසරක් මහත් මෙත් සිතින් කැපවූ, අපහට සියලු ශාසනික දායාද ලබාදුන් මිහිඳු මහ රහතන් වහන්සේ අසූවන වියෙහි දී මිහින්තලේ සෑගිරි වෙහෙරෙහි පිරිනිවන් පා වදාළ සේක. වප් මාසයේ පුර පක්ෂයේ අටවක දා උන්වහන්සේ පිරිනිවන් පෑ නිසා, එම දිනය “ශ්‍රී මිහිඳු පුර අටවක” යනුවෙන් සම්මත විය. භාග්‍යවතුන් වහන්සේගේ ළය මඬලෙන් උපන් ලංකාද්වීපයේ සම්බුදු සසුන බබුළුවාලූ, අපහට අනුබුදු රුවන බඳු වූ දීපප්පසාදක මිහිඳු මහ රහතන් වහන්සේට අපගේ නමස්කාරය වේවා!



# පඤ්ච මහා ව්‍යසන

**ආරම්භයක් පෙන්විය නො හැකි සසර ගමන අති දීර්ඝ ය. අනේක වර ඉපදෙමින් මියැදෙමින් පැමිණි ඒ දිගු ගමන තුළ ඔබ ද මා ද ලබන ලද, විඳින ලද සියල්ල සිහිනයක් සේ බොඳ වී ගියේ ලසෝ ලැව් ගිනි අවුලවාලමිනි. එහෙත් අපට අමතක වී ගිය ඒ දුක් ගිනි සන්තාප ව්‍යසනයන් පිළිබඳ සත්‍යය අවබෝධ කළ මහා ගෞතම බුදුරජාණන් වහන්සේ හැම දුකින් අත මිදෙන මාවත මහා කරුණාවෙන් පෙන්වා වදාළ සේක.**

### ඥාතීන් අහිමි වන පාපය

උපන් මිනිසාට මුහුණ පෑමට සිදුවන ව්‍යසනයන් හෙවත් දුක් විපත් පහකි. ඉන් පළමුවැන්න ඥාති ව්‍යසනය යි. එනම් තම ඥාතීන් තමා හට අහිමි වීම යි.
ජල ගැලීම්, නාය යෑම්, මුහුදු ගොඩ ගැලීම්, රථ වාහන අනතුරු යුද ගැටුම් ආදී හේතූන් නිසා පුද්ගලයන්ට තම සියලු ඥාතීන් අහිමි වී තනි වන්නට සිදුවේ.

ඇතැම්හු එමගින් ඇතිවන කටුක වේදනාව උහුලාගත නො හැකිව සිය දිවි පවා නසා ගනිති. ඇතැම් විට උමතු භාවයට පත් වෙති. සැපට දුකට,තනි නොතනියට ළඟ සිටි ඥාති පිරිස හදිසියේ අහිමිවීමේ වේදනාවට සසර සැරිසරන සත්ත්වයන් මුහුණ දිය යුතු ය. ආර්ය උපවාද අකුසලය ඊට ප්‍රධාන හේතුවක් බව බුදුරදුන් විසින් වදාරා ඇත.

අප දන්නා ඉතිහාසයේ සිදු වූ මුහුදු ගොඩ ගැලීම් ආදියට හසු වී පවුලේ සියලු දෙනාම අහිමි වී තනි වූ උදවිය අදත් සිටිති. ඉපදීමෙන් නිදහස් නොවූ කිසිවකුටත් වියෝ දුකින් නිදහස් විය නොහැකි බව අවබෝධ වීමෙන් පමණක් ඥාතිව්‍යසන දුක්ඛයෙන් හෙවත් ප්‍රිය විප්‍රයෝග දුඃඛයෙන් නිදහස් විය හැකි ය.

### හරිහම්බ කළ දේ වැනසෙන හැටි

මිනිස් මනසට දැඩි පීඩාවක් උපදවන දෙවන ව්‍යසනය භෝග ව්‍යසනය යි. යමකු සතු මිල මුදල්, ගේ දොර, වතු පිටි, වාහන, භව භෝගාදිය නොසිතූ ලෙස තමාට අහිමිවීම එමගින් අපේක්ෂා කෙරේ. තමාට ලැබී ඇති සැප සම්පත්වලට ඇති බැඳීමේ පමණින් ම ඒවා අහිමි වීම හේතුවෙන් විඳවන්නට සිදුවේ. පෙර කරන ලද සොරකම් ආදී අකුසලයන්ට ලැබෙන අතුරු විපාකයක් ලෙස එකී භෝග ව්‍යසනයන්ට අනේක වාරයක් මුහුණ දීමට සිදුවේ.

රැකී රක්ෂා, තනතුරු උසස් වීම් ආදිය අත ළඟට පැමිණ අහිමි වී යන්නේ ද පෙර අප විසින් අන්‍යයන්ට කරන ලද අසාධාරණයන්ට විපාක ලෙසිනි. දනය පුරුදු කිරීම හා අසාධාරණයන් නො කිරීමත් පොදු දේපළ ආරක්ෂා කරදීම හා පුද්ගලයන්ගේ අයිතීන් සුරක්ෂිත කරදීම ද හේතුවෙන් භෝග ව්‍යසන විපාකයෙන් අතමිදිය හැකි ය.

### නිරෝගී නොවේ නම්...

රෝග ව්‍යසනය සත්ත්වයා මුහුණ දිය යුතු තෙවන විපත්තිය යි. ශාරීරිකව හා මානසිකව ඇතිවන රෝග පීඩාවන් විවිධ ය. කායිකව ඇතිවන රෝගී තත්ත්වයන් නිසා ජීවිත කාලය ම ලෙඩ ඇඳේ දිවි ගෙවන්නෝ බහුලව සිටිති. කොතෙකුත් සැප සම්පත් ඇතත් නිරෝගීකම නො තිබේ නම් පලක් නොමැත. දිළිඳු වුව ද නිරෝගී කයක් ඇති බව උතුම් ලාභයකි.

ආදිකල්පික මිනිසා රෝගයන් ලෙස සලකන ලද්දේ උෂ්ණය, කුසගින්න, පිපාසය, මළ මුත්‍රා පිට කිරීමට සිදුවීම යන කරුණු සය පමණි. ඊට අමතරව කැස්සක් සෙම්ප්‍රතිශ්‍යාවක් තරමේ ආබාධයක් හෝ ඔවුනට නො වී ය. අවුරුදු ලක්ෂ ගණන් දිඝාසිරි ද වින්දනය කළහ. ප්‍රාණඝාතාදී පාපයන්ගෙන් දිවි හිමියෙන් වෙන් වීම ඒ සඳහා හේතු වූ බව බුදුරදුන් විසින් වදාරා ඇත.

වත්මන් මිනිසාගේ ශරීරයට වැළඳෙන රෝග පීඩාවන්ගේ ප්‍රමාණයක් කිව නො හැකි තරම් ය. එක් රෝගයකට බෙහෙත් කරන විට තවත් රෝග ගණනාවක් මතු වී විඳවන්නෝ සෑම පවුලකම පාහේ සිටිති. රෝගියකු නොමැති පවුලක් සොයාගත නොහැකි තරම් ය. එහෙත් බොහෝ දෙනාට ඒ පිළිබඳ සවිඥ්ඥාණික බවක් නැත. භෞතික තත්ත්වයන් පමණක් රෝග හට ගැනීමේ හේතූන් ලෙස සලකා ඉන් බේරීම පිණිස ගන්නා ප්‍රයත්නයන් අසාර්ථක වී මේ වන විට ලක්ෂ ගණනින් මියැදෙන වසංගත තත්ත්වයකින් ලෝකය ම පීඩිතව ඇත.

### වසංගත රෝගවලට බලපාන හේතු

වසංගත ආදී තත්ත්වයන් සඳහා බාහිර හේතූන්ගේ බලපෑම ස්වල්ප ය. පුරා කෘත අකුසල කර්මයන් හා වර්තමානික ප්‍රයෝග විපත්තිය හෙවත් දුස්සීලකම හේතුවෙන් ද ආර්ය උපවාදය නමැති බරපතළ අකුසලය හේතුවෙන් ද මෙබඳු වසංගත තත්ත්වයන් ඇති වේ. ගුණධර්ම පිරිහීම නිසා ආයුෂය, සැපය, බලය, ප්‍රඥාව යන සියල්ල ම පිරිහී යයි.



බෙලිහුල්ඔය සීලසමාහිත
යෝගාශ්‍රමවාසී,
ත්‍රිපිටකාචාර්ය, ත්‍රිපිටක
විශාරද,
අභිධර්මය පිළිබඳ
කථිකාචාර්ය,
ශාස්ත්‍රපති, රාජකීය පණ්ඩිත,
**බලංගොඩ රාධ හිමි**

මවට පියාට ගැරහීම හා නො සලකා හැරීම, වැඩිහිටි ගෞරවයන් නොමැති වීම, කළගුණ අමතක වීම, තණ්හාව බලවත් වීම, ප්‍රාණඝාතය හා සත්ත්ව හිංසනය, සොරකම් හා පැහැර ගැනීම් බලවත් වීම ආදී හේතූන් නිසා වත්මන් ව්‍යසනයට මිනිස් වර්ගයා ගොදුරු වී ඇත.

මීට අමතරව තෙරුවන් වහන්සේලාට ගැරහීම, බුදු සසුනට ද්‍රෝහිකම් කිරීම යන ප්‍රධාන හේතූන් නිසා ලාංකිකයන් වසංගත විපතට ඇද දමා තිබේ.

අපේ රට බුද්ධ භූමියක් වන බැවින් තෙරුවනේ ආශිර්වාදය නො ලබන කිසිවකුටත් සෙතක් වන්නේ නැත. ඉහත කී දුර්ගුණ දුරුකොට තෙරුවන් වහන්සේලා සමා කරවා සීලයක පිහිටීමෙන් පමණක් ලක්වාසීන්ට අසීමිත සෙතක් සැලසෙනු ඇත. කුඩා දරුවාගේ පටන් මහල්ලා දක්වා බුදුගුණ සිහිකිරීම හා මෙත් වැඩීමත්, කරුණාව ප්‍රගුණ කිරීමත්, සෞඛ්‍යාරක්ෂිත ක්‍රම අනුගමනය කිරීමත් සිදුවේ නම් නොබෝ කලකින් ම මෙම වසංගතය මෙරටින් පහව යනු ඇත.

### භයානකම රෝගය

බලවත් වූ තණ්හා ක්‍රෝධාදී සිතුවිලි ද ඉරිසියාව හා මසුරුකම ද ඇතුලු සමස්ත මනෝ දුස්චරිතය ම මානසික රෝගී තත්ත්වයකි. එය මාරාන්තික වසංගතයට ද වඩා භයානක වූ රෝග ව්‍යසනයේ බලවත් ම අංශය යි. ඒ උදෙසා ඇති එකම ඖෂධය වන්නේ තථාගත ධර්මය පමණි.

### සීල විපත්තිය

බුදුරදුන් පෙන්වා වදාළ සතරවන ව්‍යසනය සීල විපත්තියයි. එනම් පංචසීලය ආදී කොටගත් සිල් ගුණයන්ගෙන් පිරිහී යාම යි. එය ඉහත කී සියලු ව්‍යසනයන්ට වඩා භයානක වූවකි.

ඥාතිව්‍යසන ආදී හේතූන්ගෙන් පුද්ගලයා ඒකාන්ත වශයෙන් අපාගාමී නො වේ. එහෙත් සිල් බිඳීයාම හේතුවෙන් මරණින් මතු අපාගාමී වේ.

සීල විපත්තිය මෙකල සමස්ත මිනිස් වර්ගයාට ම වැළඳී ඇත්තකි. ඉතා ස්වල්පතර වූ සිල්වතුන් පිරිසක් හෝ වෙසෙන්නේ බෞද්ධයන් අතර පමණි. දුස්සීල වීම විලාසිතාවක් වශයෙන් සලකන මිනිස් පිරිසකගෙන් යුතු වත්මන් සමාජය විසින් වසංගත රෝගාදී තත්ත්වයන් බලාපොරොත්තු විය යුතු ම ය. රෝග පීඩාවන් සඳහා දුස්සීල වීම හෙවත් ප්‍රයෝග විපත්තියේ ඇති ඍජු බලපෑම ඊට හේතුවයි.

### දිට්ඨි විපත්තිය

පස්වන මහා ව්‍යසනය දිට්ඨිවිපත්තිය යි. එය සීලවිපත්තියට ද වඩා බලවත් වූවකි. අවශ්‍යතාවක් තිබේ නම් බිඳී ගිය සීල ප්‍රතිපදාව ඉතා ඉක්මනින් නැවත සකසා ගත හැකි ය. එහෙත් දිට්ඨිවිපත්තිය ස්වල්ප උත්සාහයකින් වෙනස් කළ හැක්කක් නො වේ.

මිථ්‍යාදෘෂ්ටික පිළිගැනීම් හා ඇදහීම්වල සිරවූ මනසක් ඇති බව දිට්ඨි ව්‍යසනය වන බැවින් පුද්ගලයකු ඉන් ගලවා ගැනීම භාරදූර කාර්යයකි. දිට්ඨි විපතට වැටුණු බොහෝ දෙනා දිවි තුරාවට ද්වාරත්‍රයෙන් ම පව්කම් පුරවාගෙන නියත වශයෙන් දුගතිගාමී වෙති. බෞද්ධයන් නො වන සියල්ලෝ ම මිථ්‍යා දෘෂ්ටික වන බැවින් ලොව මිසදිටුවෝ බහුල වෙති.

මිසදිටුවන් බහුල වන විට පාප කර්මයන් බහුල වේ. පාප කර්මයන් බහුල වීමෙන් රෝ දුක් බහුල වේ. අද අප මුහුණ දෙන වසංගත තත්ත්වයේ ප්‍රධානම හා බොහෝ දෙනාගේ අවධානයට පත් නොවූ හේතුව ද එය යි.

### සැනසීම ලබන මඟ

කල්‍යාණ මිත්‍රයාගේ ඇසුර නො ලැබීම සීල හා දිට්ඨි ව්‍යසනයන්ට ප්‍රධානත ම හේතුව වේ. සත්‍ය වූ බුදුබණ ඇසෙන්නේ යහපත් වූ මිතුරාගෙන් පමණි. බුදුරදුන් තරම් යහපත් වූ අන්‍ය මිතුරකු ලොව නැත. සෝවාන් ආදී ආර්ය ශ්‍රාවකයෝ ඉන් මෙපිට වෙසෙන කල්‍යාණ යහලුවෝ ය. පිරිසුදු සිල් ඇති සම්මා දිට්ඨියක් ඇති පුද්ගලයන් බිහි වන්නේ බුද්ධාදී ආර්යයන්ගේ ඇසුර ලැබීමෙන් පමණි.


දාන සීලාදී දස පුණ්‍ය ක්‍රියාවන් ම පවතින්නේ දිට්ඨි සම්පත්තියෙන් හෙවත් සම්මා දිට්ඨියෙන් යුක්ත වූවන් කෙරෙහි පමණි. සම්මා දිට්ඨික පුද්ගලයන් පහළ වන්නේ සද්ධර්ම ශ්‍රවණය කිරීමෙන් පමණි. සද්ධර්මය ලැබෙන්නේ කල්‍යාණ මිත්‍රයාගෙන් පමණි.

අදවන් පොසොන් පුන් පොහෝ දිනෙක මිහිඳු මහා රහතන් වහන්සේ නම් වූ විශුද්ධි දේව කල්‍යාණ මිත්‍රයන් වහන්සේගෙන් සිංහලයන් ලද සද්ධර්මයත් ඒ ධර්මය නිසා ලද සම්මා දිට්ඨියත්, එමගින් ලද උදාර ශික්ෂණයත් නිසා සිංහලයෝ ඉහත කී පංච ව්‍යසනයන්ගෙන් අතමිදී සුවපත් වූහ. සුබිත මුදිත වූහ. මෙලොව දීම නිවන් අවබෝධ කොට හැම දුකින් සමුගෙන සසර ගමන නිමා කළහ. ඔබ ඒ දුක්බර සසර ගමන නිමවා ව්‍යසනයන් ප්‍රහාණය කොට සැනසෙන්නේ කවදා ද?



# දෙලොව සුව සදන

# සත්වත පද



**බුදු දහම තරම් අප්‍රමාදී බව අගය කරන ලද වෙනත් දහමක් පිළිබඳව අසන්නට නොලැබේ. බුද්ධ චරිතය පුරාම මෙම උතුම් චර්යාව ප්‍රායෝගික ව අර්ථ ගන්වා ඇති අවස්ථා බහුලව දැකිය හැකි ය. තථාගතයන් වහන්සේගේ අවසන් බුද්ධ වචනය වන්නේ ද "හන්ද දානි භික්ඛවේ වෝ ආමන්තයාමි වයධම්මා සංඛාරා අප්පමාදේන සම්පාදේථ" යන්න ය. අප්‍රමාදී ව ක්‍රියා කළ යුතුය යන්න අවධාරණය කර ඇති අයුරු ඉන් පැහැදිලි වේ.**

**"අප්පමාදේන මඝවා –**
**දේවානං සෙට්ඨතං ගතෝ**
**අප්පමාදං පසන්සන්ති –**
**පමාදෝ ගරහිතෝ සදා"**

ධම්මපද පාලියෙහි අප්පමාද වග්ගයෙහි උක්ත ගාථා ධර්මයෙන්ද භාග්‍යවතුන් වහන්සේ විසින් පැහැදිලි කොට ඇත්තේ අප්‍රමාදී ව ක්‍රියා කිරීම දෙදෙව් ලොවට අධිපති සක්දෙව් පදවිය ලැබීමට පවා හේතුවන බවයි.

මෙහි "මඝවා" යනු සක් දෙවිඳුන් හඳුන්වන පූර්ව නාමයකි. එමෙන්ම එම නමින් අප්‍රමාදී ව ක්‍රියා කළ පුද්ගලයකු "දේවානං සෙට්ඨතං ගතෝ" දෙවියන්ගේ ප්‍රධානියා බවට පත් වූ බවයි.


මෙහිදී ලෞකික සහ ලෝකෝත්තර සැප ගෙන දෙන බැවින් අප්‍රමාදී බව අගය කෙරෙන අතර "පමාදෝ ගරහිතෝ සදා" ප්‍රමාදී බව ගැරහීමට ලක් කොට ඇත්තේ එය දුකට හා විපතට හේතුවන බැවිනි.

මඝ නම් වූ තරුණයකු දඹදිව මචල නම් වූ ගමක වෙසෙමින් මනා පැවැත්මකින් යුතුව ක්‍රියා කරනුයේ, අප්‍රමාදීව සිහි නුවණින් යුතුව පරාර්ථ චරියාවෙහි යෙදිනි. ඔහු විසින් අනුගමනය කරන ලද "අප්‍රමාදී චර්යාව" සහ "සත්වත පද"දිවි හිමියෙන් ආරක්ෂා කිරීම නිසා ලබන ලද පාර ලෞකික සම්පතක් වූ දෙවියන්ගේ ප්‍රධානියා වීම සාධක කොට ගනිමින් අප්‍රමාදී බවෙහි අප්‍රමාණ අගය ශ්‍රාවකයන්ට පැහැදිලි කිරීමක් ලෙස මෙම අවස්ථාව දැක්විය හැකි ය.

මඝ මානවක විසින් වඩන ලද ඉතා වැදගත් ගුණ ධර්ම කිහිපයක් "සත්වත පද" නමින් හඳුන්වා දී තිබේ. සංඛ්‍යාත්මක ව ගත් විට හතක් පමණ වන නිසා "සත්" වනවා මතු නොව රැකිය යුතුය යන අරුතින් "වත" හෙවත් ව්‍රත වශයෙන් හඳුන්වා දී තිබේ.

මව් පිය උපස්ථානය, වැඩිහිටියන්ට ගරු කිරීම, නපුරු වචන නොකීම, කේලාම් නොකීම, මසුරු බවින් දුරු වීම, මිහිරි බසින් යුතු වීම, නොකිපෙන සුළු බව යනුවෙන් එම වැදගත් ගුණ ධර්ම නම් කොට ඇත.

මව් පිය උපස්ථානය සඳහා බුදු දහමින් සිදු කෙරෙන දිරිමත් කිරීම වෙනත් කිසිදු දහමක දැකිය හැකි නොවේ. දහමින් නිර්දේශිත දූ දරු යුතුකම් පහක් වන අතර ඒවා , ඉටු කිරීමේ දී ඉන් හතරක් ම මව් පිය උපස්ථානයට ඇතුළත්ව ඇති අයුරු දැක ගත හැකි ය.



කොළඹ 06 හැව්ලොක් සිටි සාම විහාරාධිපති දක්ෂිණ ලංකාවේ සමථ බලසම්පන්න ප්‍රධාන අධිකරණ සංඝනායක

**අතපත්තුකන්දේ ආනන්ද නාහිමි**

මව්පියන් සඳහා විවිධ අභිදානයන් මඟින් ඔවුන් අගය කිරීම පමණක් නොව අසමසම වූ තථාගතයන් වහන්සේ "බුද්ධෝ විය මාතා බුද්ධෝ විය පිතා"යනුවෙන් ඔවුන් තමන් වහන්සේට සමාන කොට තිබීම මහත් සුවිශේෂිතාවයකි. එහෙත් වර්තමානයෙහි තම මව්පියන් විවිධ පීඩාවන්ට ලක් කිරීම මෙම උතුම් ඉගැන්වීම්වලට නිගරු කිරීමක් වනු ඇත. එමෙන්ම වැඩිහිටියන් රැකබලා ගැනීම හා ගරු කිරීම ද ඉහත වත පද අතර ප්‍රමුඛතම කරුණකි. වැඩිහිටියන් සමාජයෙහි පිළිගැනීමකට ලක් කිරීම පමණක් නොව කිසියම් සමාජ කොට්ඨාශයක පූර්වගාමින් ලෙස ඔවුන් කෙරෙහි දක්වන ගරු කිරීම වියපත් ඔවුන්ට මානසික සුවයක් ගෙනදීමද මතු නොව කෘතවේදීභාවය දැක්වීමක් ද වනු ඇත.

වචන හැසිරවීමේ දී සමාජය කිනම් භාවිතයක සිටිය යුතු ද යන්න සත් වත පදයන් හි සඳහන් නපුරු වචන හා කේළාම් නොකීම මෙන්ම මිහිරි බස් කථා කිරීම යන කරුණු තුනෙන් පැහැදිලි කෙරේ.

නොකිපී ක්‍රියා කිරීම තරහෙන් හා කෝපයෙන් අත් මිදීමක් වන අතර කෝපාවිෂ්ට පුද්ගලයා තුළින් ප්‍රදර්ශනය වන්නේ විරූපී බවකි. එම විරූපී බව ඇතැම් විට සාංසාරිකව ආරෝපණය වීමක් ද විය හැකිය. අසංවර මනසෙහි දැකිය හැකි කෲරත්වය, එහි ඇති හානිකර බව ද මෙතුළින් පැහැදිලි වේ.

පොදුවේ සලකා බලන විට මෙම සත් වත පදවලින් සිදු වන්නේ මැනවින් තිදෙර සංවර කරගැනීම දේවත්වය ඉක්මවාලූ දෙව් රජ තනතුර දක්වා එළැඹිය හැකි උතුම් ගුණ ධර්ම සමුදායක් බව ය.

විශාලා මහ නුවර "මහලී" නමැති ලිච්ඡවි රජු එක්දිනක් තථාගතයන් වහන්සේ මුණගැසී තමන්ට ගැටලුවක් ව පැවති සක් දෙවිඳුන්ගේ උපත හා සැපත උදා වූයේ කෙසේ දැයි විමසන ලදී. එම පැනය විසඳමින් භාග්‍යවතුන් වහන්සේ අතීතයේ මගධයෙහි මචල නම් ගමෙහි මඝ නම් ඉතා ගුණවත් මෙන්ම යහපත් සුවිශේෂී තරුණයකු විසූ බව ප්‍රකාශ කළ සේක.හෙතෙම ගමෙහි බොහෝ දෙනා රැස්වන උයනක තම පරිහරණය සදහා තැනක් පිළියෙළ කරන්නේ, සියලු වැඩ නිම කළ පසු වෙනත් පැමිණි පුද්ගලයකු ඔහු ඉවත් කොට එම ස්ථානය අල්ලා ගන්නා ලදී. එහෙත් මඝ මානවක කිසිදු කිපීමකින් තොරව තවත් තැනක් සූදානම් කරන්නේ එතැන ද වෙනත් අයකු අයිතිකර ගනුයෙන් නොකිපුන මානවකයා වෙනත් තැනකට ගොස් අනලස්ව පිරිසිදු කොට අවසන එසේම වෙනත් අයෙකු පැමිණ එම ස්ථානය ද අයත් කර ගත්තේ ය.

එහෙත් කිසිදු කිපීමකට පත් නොවූ ඔහු යළි යළිත් ස්ථානමාරු කරමින් පිළියෙළ කරනුයේ ඒවා ද වෙනයම් අයගේ ග්‍රහණයට ලක් විය. අනතුරුව එය ඉතා හොඳ පුණ්‍ය කර්මයක් සේ සලකමින් බොහෝ දෙනකුට ප්‍රයෝජන ගත හැකි විශාල ප්‍රදේශයක් පිරිසිදු කරමින් බොහෝ දෙනකුට පහුකම් සැලස්වී ය. එහි පහසුකම් ලබමින් සතුටින් සිටින පිරිස දුටු මඝ සැප කැමැත්තන් සදහා සැප සැලසීම මහා පිනක් යැයි සිතමින් මංපෙත්, ඒ දඬු,පාලම්, ළිං, පොකුණුආදී පොදුජන අවශ්‍යතා සපිරීමෙහි නිරත විය.

මේ සඳහා ඔහු සමග තෙතිසක් පමණ වූ පිරිසක් ද එක් වුයේ, රාජ්‍ය නිලධාරීන්ගේ දෝෂ දර්ශනයන්ට ද ලක් වීමට සිදු විය.

නමුදු යහපත් ක්‍රියාවක නිරත වීමේ ඇති උතුම් බව නිසාවෙන් සියල්ලෝ නිදෙස් වූහ.

ඔවුනට එරෙහි වුවන් සඳහා දඬුවම් ලදින් එම සුමිතුරෝ දිරිමත්ව බොහෝ දෙනාට හිසට සෙවණ සදමින්, ගතට සුවය සලසමින් මනරම් අම්බලම් ගෙයක් ද සැකසූහ. මඝ මානවකගේ, නන්දා, චිත්තා, සුධම්මා,සුජාතා යන බිරින්දෑවෝ ද මෙම දර්ශනීය අම්බලම් හල සදහා විවිධ අයුරින් දායක විය. සුධම්මාවන් විසින් එහි කැනිමඩල සකසා දෙමින් උපක්‍රමශීලීව තම නම එහි සටහන් කරවන ලදී.

එනිසා එම විශ්‍රාම ශාලාව සුධම්මා යන නමින් නම් කෙරිණි.මඝ මානවක තෙමේ මෙසේ තම පිරිස සමග නොපමාව දිවි හිමියෙන් යුතුව විවිධ කුසල ධර්මයන්හි යෙදෙමින් සිට මිය ගොස් තව්තිසා දෙව්ලොව උපන්නහ. දෙදෙව් ලොවට අධිපති වූ සක් දෙව් රජුව උපත ලැබීය. තම සහායක පිරිස ද සක් දෙවිඳුගේ පිරිවර වශයෙන් උපත ලැබූ අතර මෙම අතීත කාලීන සිදුවීම පැහැදිලි කරමින් භාග්‍යවතුන් වහන්සේ මහලී ලිච්ජවීන්ගේ පැන විසඳුම විසඳාලමින් නොපමාව කුසල් කිරීම දෙවියන් වීම පමණක් නොව දෙවියන්ගේ ප්‍රධානියා වීම සඳහා ද හේතු වන බව පෙන්වා දෙමින් දහම් දෙසූ සේක.

ගෙවී ගිය වසරකට වැඩි කාලයක සිට මුළු ලෝකය ම ඉතා භයානක ගෝලීය වසංගතයකට මුහුණ දෙමින් සිටී. රටවාසීහූ ලක්ෂ සංඛ්‍යාත පිරිසක් එම රෝගයට ගොදුරු වී සිටිති. දහස් ගණනක පිරිසක් එම රෝගී තත්වයන් නිසා මියගොස් ඇත. රට තුළ සාමාන්‍ය ජන ජීවිතය අඩාල වී විවිධ දුෂ්කරතාවයන්ට පත්ව ඇති රටවාසීන් වෙනුවෙන් රාජ්‍ය පාලකයන් ලෙසත් වෛද්‍යවරුන් හෙද හෙදියන් හා රෝහල් කාර්යමණ්ඩල මෙන්ම සෞඛ්‍ය අංශයන්හි විවිධ පුද්ගලයන් මෙන්ම ආරක්ෂක අංශ පමණක් නොව ජීවිත අනතුරු නොසලකා අප්‍රමාදී ව අනලස්ව ස්වේච්ඡා සේවාවන් හී නිරත වූ බොහෝ දෙනා ද රෝගී වුවන්ගේ සතුට සහනය වෙනුවෙන් ඉදිරිපත්ව සිදු කරන ලද්දේ මහත් කුසලයකි.

අනු බුදු මිහිඳු මහ රහතන් වහන්සේ අද වැනි දිනක ලක්දිවට වැඩම කොට සම්බුදු දහම දායාද කෙරෙමින් ලක්වැසියන් ශික්ෂණයට පත් කරමින් විශිෂ්ට සංස්කෘතියක උරුමය ලබා දුන් දිනයයි.

එසේ නම් බොදුණුවන් වීම පමණකින් නොසෑහි බොදු ඉගැන්වීම් විෂයය කොට ගනිමින් සසර තරණය සදහා අදිෂ්ඨානශීලීව එළඹිය යුතුව ඇත.





# මහා විහාරයෙන් ඇරඹුණු ශාසනික ප්‍රබෝධය

**මහා විහාරයේ ආරම්භය බුද්ධ පරිනිර්වාණයෙන් වසර 236 ක් ගියතැන මහින්දාගමනය දක්වා දිවෙන බව වංශ කථා වාර්තා කරයි. මිහිඳු හිමියන්ගේ අනුශාසකත්වයෙන් මහා විහාරයෙහි සංඝකර්ම කිරීම සඳහා සීමා මාලකයක් ද, ජය ශ්‍රී මහා බෝධිය පිහිටුවීමට සුදුසු ස්ථානය සලකණු කිරීම, උපෝෂථ ශාලාවක්, කලු දිය පොකුණ, දානශාලා ගෙය රුවන්වැලිසෑය පිහිටුවන ස්ථානය සලකණු කිරීම යනාදී කටයුතු මෙන්ම ජෝතිය විනය හෙවත් මහමෙවුනාවට අයිති භූමිය ඇතකුට රන් නඟුලක් බැඳ සලකණු කළ බවත් , එය දේවානම් පියතිස්ස රජතුමා සමග ඇවිදිමින් සිදු කළ බවත් සඳහන් වේ.**

මහා විහාරය මුල්කරගත් බෞද්ධ සාහිත්‍යයේ ප්‍රබෝධය අති මහත් ය. නිකාය සංග්‍රහය නම් ග්‍රන්ථයේ සඳහන් කරන පිළිවෙළට මොණර පිරිවෙන (මයුර පිරිවෙන) පියංගු පිරිවෙන, ග්‍රන්ථාකර පිරිවෙන, කපාරමුල ආදී පිරිවෙන් තුන්සිය හැට හතරක් පමණ මහා විහාරය කේන්ද්‍ර කරගෙන පැවතුණ බව සඳහන් කරයි.

මෙසේ මහා විහාරයෙන් ඇරඹුණු ශාසනික ප්‍රබෝධය ගොඩනැගිලි වෙහෙර, විහාර, දාගැබ් මහ බෝ පිහිටුවීමෙන් පමණක් නතර නොවුණි. ථූපාරාම මලුවේදී සිදු කරන්නට යෙදුණු විනය සංගායනාව මූලිකත්වයක් ගනී. භික්ෂු ශාසනය මෙන්ම භික්ෂුණී ශාසනය ද ආරම්භ කර බුදු සසුනේ චිර පැවැත්මට මූලික අඩියර සකස් වීම මහා විහාරය මුල් කොට සිදු විය.

සසුන ආරම්භක කාලයේ පටන් වර්තමානය දක්වා ජීවමාන බෞද්ධ සංකේතයක් ලෙස උතුම් විජය ශ්‍රී ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ විරාජමාන ව වැඩ සිටිති. එසේම ලොව අසදෘෂ මහා චෛතිය නමින් විරුදාවලිය ලත් රත්නමාලී චෛත්‍ය රාජයාණන් වහන්සේ ද මෙම යුගයේ දී ම බෞද්ධ ලෝකයාට ලැබුණු මහා සංස්කෘතික දායාදයක් ය.

මහා විහාරය නැමැති බෞද්ධ ආගමික මධ්‍යස්ථානය දහමට පමණක් නොව ථේරවාදී භික්ෂුවගේ ද කේන්ද්‍රස්ථානය බවට පත් විය. එසේම මහා විහාර කේන්ද්‍ර කරගත් අනුරාධපුර රාජධානිය වසර එක්දහස් පන්සීයයක් පමණ කාලයක් මේ රටේ මූලස්ථානය වූයේ ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් අක්කර දහස් ගණනක වපසරියකින් යුත් නටබුන් අද පවා අපට දැක ගත හැකි ය.

අතීතයේ වැඩ සිටි අරිහතුන් වහන්සේලා මුලු බුදු දහම භාවනාවක් පමණක් යැයි සිතා අරණ්‍ය ගත වී වෘක්ෂ මූලික වී කටයුතු කළා නම් බුද්ධ පරිනිර්වාණයෙන් සියවස් තුන හතරකින් බුදු දහම ජන හදවත්වලින් අතුරුදහන් වීමට ඉඩ තිබුණි. නමුත් අතීතයේ වැඩ සිටිය ථේරවාදී උතුමන් වහන්සේලා මහා විහාරය කේන්ද්‍රකොටගෙන මිනිස් හදවත් තුළ බුදු දහමේ චිර පැවැත්මට ගත හැකි සෑම ක්‍රියා මාර්ගයක් ම ගෙන තිබේ.

ජය ශ්‍රී මහා බෝධි රෝපණයත් සමග ඒ ඒ සම්බන්ධ සංස්කෘතිකාංග ස්ථාපනය කළහ. අදටත් එම සංස්කෘතිකාංග පවත්වාගෙන එන බව කිය යුතුයි. ඇවැන්ත වෙහෙර විහාර ඉදිකරමින් ඒ හා සම්බන්ධ පුද පූජා පවත්වාගෙන ආහ. පොහොය සීමා ඉදිකර විනයෝ නාම සාසනස්ස ච ආයු යන වදනට අනුව ශාසනයාගේ අයුෂය විනය බව දැන විනය කර්ම සිදු කිරීමට අදාළ කටයුතු සම්පාදනය කළහ.

අලහබත් දන්සැල, චතුස්සාලා නම් බත් දන්සැල ගිහි පැවිදි දෙපාර්ශවයාට බෙදා වෙන් කොට දානය පූජා කර – පරිත්‍යාගය දන් දීම යන බුදු දහමේ මූලිකාංග ප්‍රායෝගිකව පුරුදු කර ඇත.

ගිලනුන්ට සැලකීම සඳහා රෝහල් කිහිපයක් ම මිහින්තලයත් සමග මෙම මහා විහාර සංස්කෘතිය තුළ ඉදිකර ඇත. බෝධීන් වහන්සේගේ අෂ්ඨ ඵල රුහ දෙතිස් ඵල රුහ ආදී වශයෙන් ලක්දිව බෝධීන් වහන්සේ මුල්කරගෙන බෝධි සංස්කෘතිය ව්‍යාප්ත කරලූහ.

දළදා මාළිගාවක් ද ථූපාරාමය අසල අදටත් දැකගත හැකි ය. දළදා වහන්සේ මූලික කරගෙන දළදා පෙරහර ආදී අදටත් ඉතිරිව පවතින දළදා සංස්කෘතිය ද අපට දායාද කලේ මෙම පූජා භූමිය තුළ දී ම ය.

භික්ෂුණී ශාසනය හත්ථාලවක මෙහෙණවරින් ආරම්භ කොට පසුව ලක්දිව පුරා මෙහෙණි ආරාම සංස්කෘතිය මෙන්ම මෙහෙණිසස්නේ ද දියුණුව මහා විහාර භූමිය තුළම ආරම්භ කළහ.



අනුරාධපුර ශ්‍රී ලංකා භික්ෂු විශ්ව විද්‍යාලයේ බෞද්ධ හා පාලි අධ්‍යයන අංශයේ අංශාධිපති ආචාර්ය

**කඩවත්ගම පියරතන නා හිමි**

මහා විහාරය මුල්කරගත් බෞද්ධ සාහිත්‍යයේ ප්‍රබෝධය අති මහත් ය. නිකාය සංග්‍රහය නම් ග්‍රන්ථයේ සඳහන් කරන පිළිවෙළට මොණර පිරිවෙන (මයුර පිරිවෙන) පියංගු පිරිවෙන, ග්‍රන්ථාකර පිරිවෙන, කපාරමූල ආදී පිරිවෙන් තුන්සිය හැට හතරක් පමණ මහා විහාරය කේන්ද්‍ර කරගෙන පැවතුණ බව සඳහන් කරයි.

වට්ඨගාමිණී අභය රජු විසින් ඉදි කර පූජා කරන ලද අභයගිරිය ද මුලින් ම මහා විහාරයට අයිති කොටසක් විය. පසුව අභයගිරියට විරුද්ධව ජේතවනාරාමය ඉදිවිය. ඉන් පසුව මහා විහාරය, ජේතවනය අභය පිරිස නමින් සම්ප්‍රදාය තුනකට බෙදී වෙන් විය. දකුණෙහි තිස්සමහාරාමය වැනි ස්ථාන ද මහාවිහාරය පිරිහුණු අවස්ථාවල එහි කාර්ය භාරය සිදුකර ඇත. මේ අනුව එකල රට පුරා මහා විහාර සම්ප්‍රදාය ව්‍යාප්ත ව පැවති ආකාරය පැහැදිලි වේ.

මහා විහාරයෙන් බිහි වූ භික්ෂූන් වහන්සේලා මහා විහාරිකයන් වශයෙන් හැඳින්වූහ. හැම අවස්ථාවක ම ථේරවාදය නියෝජනය කලේ මහා විහාරිකයන් ය.

ථේරවාදී භික්ෂූන් වහන්සේලාගේ ප්‍රධානතම කාර්ය භාරය ත්‍රිපිටකය සහ තදනුබද්ධ අට්ඨකථා ශාස්ත්‍රීය ග්‍රන්ථ සමුදාය ආරක්ෂා කිරීම සහ වැඩිදියුණු කිරීමයි. සූත්‍ර, විනය , අභිධර්ම යන ත්‍රිපිටකය ඒ අයුරින් ම ආරක්ෂා කර ගැනීමට මහා විහාරික ථේරවාදීන් ගත් උත්සාහය අතිශයින් ම අගය කළ යුතු ය. ලොව කිසිදු සාහිත්‍යයක් මෙතරම් සුරක්ෂිත ව ආරක්ෂා කරගෙන නැත.

වට්ඨගාමිණී අභය රජගල මුලින් ම ත්‍රිපිටකය රන්පත් ඉරු වල ලියා තබා පසුව පුස්කොළ වල ලියා තබා ත්‍රිපිටකය ආරක්ෂා කරගැනීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කලේ ද මහා විහාරවාසීන් ය .

මහානාම රජු (ක්‍රි.ව. 409 – 431 ) කාලයේදී අට්ඨකථාචාර්ය බුද්ධඝෝෂ හිමියෝ මෙරටට පැමිණියහ. මේ තාක් හෙළ දීපයේ සීහළ භාෂාවෙන් තිබූ සීහළ අට්ඨ කථා පාලි භාෂාවට පරිවර්තනය කලේ උන්වහන්සේ ය. උන්වහන්සේගේ ලිපි ලේඛන අධීක්ෂණය කලේ මහා විහාරවාසී ථේරවාදීන් ය.

මෙතෙක් පැවති මහා අටුවාව, මහා පච්චරිය අටුවා, කුරුන්දි අටුවාව උන්වහන්සේ පරිවර්ථනය කළ සීහළ අටුවාවන් තුළින් කිහිපයකි. සීහළ අට්ඨකථා විශාල ප්‍රමාණයක් තිබුණු බවත් වංසත්තප්පකාසිනිය පැහැදිලි කරයි.

බුද්ධඝෝෂ හිමියන්ට අමතරව, බුද්ධමිත්ත, බුද්ධදත්ත, ධම්මපාල, සංඝපාල ආදී අටුවාචාරීන් වහන්සේලා විශාල ප්‍රමාණයක් මහා විහාරවාසීන් නියෝජනය කරමින් අට්ඨකථා සම්පාදනය කළහ. මහා විහාරයෙහි කීර්තිය ලොව පතළ වීමට තවත් හේතුවක් වූයේ බුද්ධඝෝෂ හිමි විසුද්ධි මග්ගය වැනි ග්‍රන්ථ සම්පාදනය කිරීමෙනි.

මහා විහාරය රාෂ්ට්‍ර පාලනය, විනය නීතිරීති සම්පාදනය ආදී විවිධ විනය කරුණු ඉගැන්වීම් කළ කීර්තිමත් ආයතනයකි. භාතිකාභය රජ දවස මහා විහාර වාසී ආභිධම්මික හෝදත්ත තෙරුන් වහන්සේට ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරු තනතුරක් පවා පිරිනමා ඇත. සාරත්තප්පකාසිනිය, පපඤ්ච සූදනිය වැනි ග්‍රන්ථවල පාලි ව්‍යාකරණ ග්‍රන්ථ, ඡන්දස් අලංකාර,සාහිත්‍ය, ගණිතය, වෛද්‍ය ශාස්ත්‍ර ආදී විවිධ විෂයයන් ද ඉගැන් වූ බව සඳහන් කරයි.

ඇතැම් අවස්ථාවල වෝහාරකතිස්ස, ගෝඨාභය, මහසෙන් වැනි රජවරු දවස මහා විහාරයට විශාල වශයෙන් අලාභ හානි සිදු විය. එසේ සිදු වූයේ වෛතුල්‍ය වාදීන්ගේ බලපෑම් මත ය. එවැනි අවස්ථාවල රුහුණට වැඩම කර ථේරවාදී සම්ප්‍රදාය සහ තදනුබද්ධ ත්‍රිපිටක සාහිත්‍ය ආරක්ෂා කරගත්හ.

බුද්ධඝෝෂ මාහිමියන් විසින් රචිත අට්ඨකථා ග්‍රන්ථ ගණනින් දොළසක් පමණ වේ. එනම් සුමංගල විලාසිනී, පපංච සූදනී, සාරත්ථප්පකාසිනී, මනෝරථපූරණී, අත්ථසාලිනී, සම්මෝහවිනෝදනී පඤ්ච ප්‍රකරණ අට්ඨකථා, කංඛාවිතරණී, සමන්තපාසාදිකා, පරමත්ථජෝතිකා, ජාතකට්ඨකථා යනාදියයි.

මීට අමතරව මහාවංසය, දීපවංසය ආදී වංශ කථා රාශියක් ම මහා විහාරවාසී භික්ෂූන් වහන්සේලාගේ සහ මෙහෙණීන් වහන්සේලාගේ රචනාවන් වන්නේ ය.

මෙසේ සලකා බලන කල ලාංකීය ඉතිහාසයෙහි ජන ජීවිතයට මෙන්ම බෞද්ධ සංස්කෘතියෙහි හර පද්ධතිය විවිධ අංශවලින් පෝෂණය කිරීම මහා විහාරයෙන් සිදු වූ උත්තුංග කාර්ය භාරයන් වන්නේ ය.



# සසරෙහි බියකරු බව නුවණින් දකින්න



**අනමතග්ගිය සංයුක්ත ධර්ම දේශනාව අද වන් පොසොන් පුරපසළොස්වක පොහොය දිනෙක විමසා බැලිය යුතු ධර්ම දේශනයකි.**

මෙම සංයුක්තයෙහි තිණකට්ඨ වග්ගය සහ දුග්ගත වග්ගය යැයි වග්ග දෙකකි. එක් වග්ගයක සූත්‍ර දහය බැගින් සූත්‍ර විස්සකි.

පළමු සූත්‍ර තිණකට්ඨ සූත්‍රය යි. එහිදී බුදුරජාණන් වහන්සේ අවිජ්ජාවෙන් වැසී, තණ්හාවෙන් බැඳී ගමන් කරන්නා වූ, සැරි සරන්නා වූ සත්වයන්ගේ මේ සංසාරය නො දක්නා ලද කෙළවර ඇත්තේ ය. පූර්ව කෙළවරක් නො පෙනෙන්නේ යැයි දේශනා කළහ.

මහණෙනි, යම් සේ වනාහි පුරුෂයෙක් මේ දඹදිව යම්තාක් තණ, ලී දඬු, අතු සහ කොළ වේ ද, ඒ සියල්ල කපා එක් තැනකට රැස් කරන්නේ වේ ද, රැස් කොට සතරඟුල් කැලි කපා මේ මාගේ මව ය, මේ මාගේ මවුගේ මව යි කියා තබන්නේ වේ ද, ඒ පුරුෂයාගේ මවුගේ මවුවරු කෙළවරක් නො වෙති. එහෙත් මේ දඹදිව තණ, ලී, දඬු, අතු, කොළ කෙළවර වන්නේ ය. අවසාන වන්නේ ය. ඊට හේතුව කවරේ ද?

අවිජ්ජාවෙන් වැසුණු, තණ්හාවෙන් බැඳුණු ඇවිදින්නා වූ, සැරිසරන්නා වූ සත්වයාගේ මේ සංසාරය නො දක්නා ලද, කෙළවර ඇත්තේවේ ද, පූර්ව කෙළවරක් නො පෙනෙයි ද එහෙයිනි.

මෙසේ තොප විසින් බොහෝ කලක් මුළුල්ලෙහි දුක් අනුභව කරන ලදී. දැඩි දුක් අනුභව කරන ලදී.ව්‍යසන අනුභව කරන ලදී. සොහොන් බිම තර කරන ලදී.


මේ සියලු සංස්කාරයන් කෙරෙහි කළකිරීමට සුදුසුම ය. නො ඇලීමට සුදුසුම ය. ඔවුන්ගෙන් මිදීමට සුදුසුම ය, යනුවෙන් සංසාරයෙහි දීර්ඝභාවය පැහැදිලි කළහ. නො පෙනෙන අතීතයක සිට විවිධ දුක් කම්කටොලු ආදිය විඳ ගෙන, දරා ගෙන පවතින බව පෙන්වා දුන්හ. මෙම කරුණ පැහැදිලි කිරීම සඳහා මේ හා සමානව ම තවත් සූත්‍ර රාශියක් දේශනා කළහ.

යම්කිසි කෙනෙක් මේ මහා පෘථිවිය ඩෙබර ඇට පමණ ගුලි කොට මේ මාගේ පියා ය. මේ ඔහුගේ පියා ය. යනුවෙන් තබන්නේ වේද, පියවරුන් කෙළවරට නො පැමිණ ගුලි අවසන් වේ. එතරම් නො පෙනෙන කෙළවරට පියවරු ඇතැයි පඨවි සූත්‍රයෙන් පැහැදිලි කරයි.

එසේම මේ දිගු සසර ඇවිදින කල්හි සැරිසරන කල්හි අමනාප වූවන් සමඟ එක්වීම නිසා හෝ මනාප වූවන්ගෙන් වෙන්වීම නිසා හඬන්නා වූ හෝ වැළපෙන්නා වූ හෝ කලෙක යම් කඳුළක් ගැලුයේ ද එය සතර මහා සාගරයෙහි ජලයට අධිකම වන්නේ යැයි දේශනා කළ සූත්‍රය අස්සු සූත්‍රය යි. එසේම මවගේ මරණයේ දී, පියාගේ මරණයේ දී, සහෝදරයාගේ මරණයේ දී, සහෝදරියගේ මරණයේ දී, පුතාගේ මරණයේ දී, දුවගේ මරණයේ දී ඥාතියෙකුගේ මරණයේ දී, අප සතු සම්පත් විනාශයේ දී හෝ රෝගී තත්ත්වයකට පත් වූ අවස්ථාවෙක අපි හඬමු කඳුළු සලමු. සසර කො පමණ. කඳුළු සලා ඇද්ද, මෙවන් දුක් පැමිණි අවස්ථාවල, සප්ත මහා සාගර ජලයටත් වඩා යැයි මෙහිදී පැහැදිලි කරති.

නො දක්නා ලද අග ඇති, නො පෙනෙන මුල ඇති මෙම දිගු සසර ඇවිදින කාලය තුළ යම් මවුකිරක් පානය කෙළේ ද එය සතර මහා සාගර ජලයට වඩා වැඩි බව බැව් මාතුථඤ්ඤ සූත්‍රයේ සඳහන් වේ.

පස්වන පබ්බත සූත්‍රයෙන් සහ සවන සාසප සූත්‍රයෙන් විස්තර කරනුයේ කල්පය කොතරම් දීර්ඝවේද යන්නයි. දේශනයට අනුව එය අවුරුදු ගණනින් ගණනය කළ නොහැකි බව ද, උපමාවකින් සඳහන් කළහොත් දිගින් යොදුනක් ඇති, පළලින් යොදුනක් ඇති, උසින් යොදුනක් ඇති පලුදු රහිත වූ සිදුරු රහිත වූ ඒකඝන මහා ගල් පර්වතයක් වේ ද, ඒ ගල් පර්වතය පුරුෂයෙක් අවුරුදු සියයකට වරක් කසී සළුවකින් පිරිමදින්නේ වේ ද, මේ ආකාරයෙන් ඒ මහා ගල් පර්වතය ගෙවීමකට, කෙළ වරවීමකට යන්නේ ය. එහෙත් කල්පය කෙළවර නො වන්නේ ය.



කොළඹ කොටුව ශ්‍රී සම්බුද්ධාලෝක විහාරාධිපති, මහාචාර්ය

**ඉත්තදෙමලියේ ඉන්දසර හිමි**

මෙවැනි කල්ප සියදහස් ගණන් අපා දුක් විඳිමින් සසර සැරිසරා ඇත. එබැවින් සියලු සංස්කාර ගැන කළ කිරීම සුදුසු වෙයි.

සාවක සූත්‍රයේ සහ ගංගා සූත්‍රයේ ගත වූ කල්පයෝ කෙතෙක්දැයි විමසති. එහිදී ද කල්ප සියයක් ය, දහසක් ය, කියා ගණනය කළ නොහැකි බව පවසති. උපමාවකින් දක්වනුයේ නම් ගංගා නම් ගඟ පටන් ගත් තැන් සිට මුහුදට වැටෙන තෙක් ඇති වැලි කැට ප්‍රමාණය මෙතෙකැයි ගණනය කළ නොහැකි ය. ගණනය කෙළේ නමුදු එයට ද වඩා කල්පයේ ඉක්ම ගොස් ඇත. එපමණ කලක් සසර දුක් විඳ ඇත.

නො දක්නා ලද, නො පෙනෙන ලද, අග්මුල් ඇති මෙම සසර වරෙක සත්වයෝ මේ ලෝකයට එති. වරෙක මේ ලෝකයෙන් පර ලෝකයට යති. මෙලෙස යමින් එමින් දැඩි සේ අනුභව කෙරෙති. ව්‍යසන අනුභව කෙරෙති. සොහොන් බිම් තර කෙරෙති.සසර නො ඇලීම සුදුසු බව දණ්ඩ සූත්‍රයෙන් අවධාරණය කෙරෙති.

අවිජ්ජාවෙන් වැසී, තණ්හාවෙන් බැඳී සත්වයා කෙ තරම් කල් සසර මැරී මැරී ඇවිද ඇද්ද යත්, එකම සත්වයාගේ ඇටකටු එක කල්පයක ඒවා ගොඩක් රාශියක් හැටියට ගොඩ ගැසුයේ නම් වේපුල්ල පර්වතයට ද වඩා විශාල වන්නේ යැයි දක්වා ඇත. මේ තුළින් ද සත්වයාගේ දිගු සසර පැවැත්ම හෙළි කර ඇත.

අනමතග්ග සංයුක්තයෙහි එන දෙවන දුග්ගත වග්ගයෙහි සූත්‍ර දහයක් ඇතුළත් වේ. මෙම සූත්‍ර දහයෙන් ද පැහැදිලි කරනුයේ දිගු සසර විඳි දුක් පිළිබඳව යි. එහි තිංසමත්ත සූත්‍රයට අනුව, සසර බියකරු ස්වභාවය කවරේදැයි යම් පමණකට අවබෝධ කර ගත හැකි ය.

සසර සැරිසරන සත්වයාගේ හිස සිඳුණු වාරවලදී වැගුරුණු ලේ ප්‍රමාණය සිව්මහ සමුදුරු ජලයට වඩා යැයි එහි සඳහන් වේ. මෙලෙසම ගොන්ව ඉපදී, මී ගොන්ව ඉපදී, එළුව ඉපදී, බැටළුව ඉපදී, මුව ව ඉපදී, සූකරව ඉපදී, කුකුළුව ඉපදී, ගම් පහරණ සොරු යැයි අල්වාගෙන, මංපහරණ සොරුයි අල්වා ගෙන, අන් අඹු සොරු යයි අල්වාගෙන හිස් සිඳීමෙන් වැගුරුණා වූ ලෙය සතර මහා සාගර ජලයට අධිකවේ ම ය. මෙවන් බියකරු සසර ගමනෙක යෙදී දුක්විඳ ඇත. ඒ අනුව සංස්කාර ධර්ම කෙරෙහි ඇලීම නොව නො ඇලීම ම සුදුසු වේ.

මෙම වර්ගයෙහි ඇති මාතු, පීතු, භාතු, භගිනි, පුත්ත, ධිතු ආදී සූත්‍ර කෙරෙහි අප අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ. මාතු සූත්‍රයෙහි සඳහන් ආකාරයට මේ දීර්ඝ කාලයෙහි දී යම් සත්වයෙක් මවක් නො වූයේ වේ ද, එබඳු සත්වයෙක් සුලභ නොවේ. එයට හේතු කවරේ ද? අග්මුල් නැති දිගු සසර ගමනකි.

මෙලෙසම පියෙක් නොවූ යම් සත්වයෙක් වේ ද, සහෝදරයෙක් නො වූ යම් සත්වයෙක් වේ ද, සහෝදරියක නොවූ යම් සත්වයෙක් වේද, පුතෙක් නොවූ යම් සත්වයෙක් වේද, දුවක් නොවූ යම් සත්වයෙක් වේද එබඳු සත්වයෙක් සුලභ නොවේ.

එනම් මේ මිනිස් සමාජය තුළ ජීවත්වන මනුෂ්‍ය සංහතියම ඔවුනොවුන් ඥාතීහු වෙති. මෙම භවයෙහි දී කවර ජාතියකට අයත් වුවද, කවර ආගමකට අයත් වුව ද, කවර රටකට අයත් වුවද සසර ගමනෙහි දී අප ඔවුනොවුන් එකම පවුලක සාමාජිකයෝ වෙමු.

ලෝකයේ එක් තැනෙක වර්ගවාදී ගැටුමකි. තවත් තැනෙක මූලධර්මවාදී ගැටුමකි. තවත් තැනෙක බලකාමී සටනකි. ඒ සියලු ගැටුම් අවිජ්ජාවෙන් වැසුණු තණ්හාවෙන් බැඳුනු ඇවිදින්නා වූ සැරිසරන්නා වූ සත්වයන්ගේ ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයෝ වෙති. එකම මිනිස් පවුලක සාමාජිකයන් වන අප අපගේ ම මව පියා සහෝදරයා සහෝදරිය පුතා දුව රවටමු. හිරිහැර කරමු. තර්ජනය කරමු. ගරහමු. විවිධ අකටයුතු කරමු.

නමුත් එද අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේට අවශ්‍ය කළේ දුනු හීතල අත් ඇතිව හමු වූ රජතුමා ඇතුළු පිරිසට දිගු සසරෙක විඳි දුක් පැහැදිලි කොට දිගු ගමනෙක යෙදී සිටිනුයේ එකම ඥාති පිරිසක් බව අවබෝධ කරවා දුනු හීතල නැති මිනිස්කමෙහි ඥාතිත්වය අගයන සාමය සහ සතුට පිරි සමාජයක් බිහිකිරීමට ය. ඒ සඳහා උන්වහන්සේ මෙම අනමතග්ග සංයුක්තයෙහි සූත්‍ර මඟින් දිගු සසර සහ එහි ස්වභාවය පැහැදිලි කළහ. දුග්ගත වග්ගයෙහි අවසාන සූත්‍රය වේපුල්ල සූත්‍රය යි. මේ සූත්‍රයෙන් සංස්කාර ධර්මවල අනිත්‍යත්වය, අස්ථිරත්වය, සැනසීම රහිත බව මොනවට පැහැදිලි කර ඇත. බුදුරජාණන් වහන්සේ ප්‍රායෝගිකව ම එය පෙන්වා දෙති.

අද අප සංස්කාර ධර්මයන්හි අනිත්‍ය බව නො දකිමු. අස්ථිර බව නො දකිමු. අධික අවිජ්ජාවෙන් මුළාවී තණ්හාවෙන් යටවී ආදීනව නො දැක නුනුවණින් යුක්ත වූයේ වල්මත්ව මිහිඳු යුගයෙන් පූර්ව යුගයට සංක්‍රමණය වෙමින් සිටිමු. එබැවින් එළඹෙන පොසොන් සමය අර්ථවත් කර ගැනීමට නම් නැවතත් මිහිඳු මාහිමි දෙසූ දහම් වෙත සවන් යොමු කළ යුතු ය.



# කාට කාටත් මේ කියන්නේ ශාසනේ ඉතිහාසයයි

**සම්මා සම්බුදු දහම අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ විසින් ලංකාවාසී ජනතාවට හඳුන්වාදීම පොසොන් පුර පසළොස්වක පොහෝ දා සිදු වූ අසිරිමත් සිදුවීමයි. ජාතික, ආගමික දේශපාලනික, සාමාජික හා ශාසනික ආදි සකලවිධ කාරණාවන්ගේ අභිවෘද්ධිය අතින් විමසා බැලීමේ දී මහින්දාගමනය ලංකා ඉතිහාසයේ හැරවුම් ලක්ෂය ය.**

එදා මෙදා තුර ශත වර්ෂ විසිතුනකට අධික කාලයක් බුදු දහමේ ගැඹුරු අර්ථ විමසමින් සිංහල සාහිත්‍ය පෝෂණය කිරීමට සාහිත්‍යකරුවන් ගත් උත්සාහය වියතුන්ගේ ඉමහත් සම්භාවනාවට පාත්‍ර වී ඇත.

නූතන ගීත සාහිත්‍යයේ වස්තු විෂයය තෝරා ගැනීමේ දී ගීත රචකයින්ගේ වැඩි අවධානයක් බුදු දහමේ ආභාසයෙන් බිහි වූ සාධුසම්මත මාවත කෙරෙහි යොමු වී ඇත.

පොසොන් පුර පසළොස්වක පොහෝ දින සිදු වූ මහින්දාගමනය ලක් වැසියන්ගේ ජීවිතවලට ලබා දුන් ආස්වාදනීය වින්දනය කෙබඳු ද යන්න නිහාල් එල් ජයසිංහයන් විසින් රචිත පදවැල බුදු දහම කෙරෙහි අසීමිත භක්තියකින් කටයුතු කළ මොහිදින් බෙග් හා සුජාතා අත්තනායක නමැති විශිෂ්ට ගායක ගායිකා දෙපළගේ මුවින් ගැයෙන විට ලක්වැසියන්ට අමුතුම ජීවයක් ගෙන දීමට සමත් වෙයි.

**මල් සුගන්දේ දම් සුගන්දේ**
**සිල් සුළං රැල් පාවෙලා**
**සම්බුදුන් සම්භාවනීයයි**
**සාධු සාධු වන්දනා**
**මිහින්තලාවයි දහම් අමාවයි**
**ශාන්ත අනුබුදු නාමයයි**
**කාට කාටත් මේ කියන්නේ**
**ශාසනේ ඉතිහාසයයි**
**රත්නමාලී සෑ රදුන්නේ**
**දෙව් බඹුන් පූජා ලබයි**
**මේ මහා ගල් මුල් කියන්නේ**
**ඒ උතුම් අභිමානයයි**

බොදු පිළිවෙත්වලට අනුගතව ලක්වැසියන් තම ජීවිත ගමන් මඟ සරසා ගැනීමෙන් අනතුරුව ලක්දිව පුරා හමන සිසිල් සුළඟ, මල්වල සුවඳත් දහමේ නැවුම් සුවඳත් රැගෙන හමා යන විට ගතටත් සිතටත් දැනෙන්නේ ආනන්දනීය සුවයකි.

එකී සුවදායක මඳ නල මිහින්තලා පව්ව ස්පර්ශ කරමින් හමායන විට තුරුලතාදිය සෙමෙන් සෙලවෙමින් නැළවෙමින් පරිසරය ද ඉමහත් වූ ප්‍රසාදයට පත් වී ඇති බව ජන හදවත් තුළ තැම්පත් කිරීමට ගේය පද රචකයා ගත් උත්සාහය අතිශයින් ප්‍රශංසා කටයුතු ය.

**රැල් නඟා හෝ ගා ගලන්නේ**
**ජාතියේ ජය පානයයි**
**සිංහලේ විකුමත් කියන්නේ**
**මේ පොළොන්නරු දේශයයි**

ගීත රචකයා වැඩි අවධානයක් පොළොන්නරු දේශය කෙරෙහි යොමු කරන්නේ සුවිශේෂී කරුණක් මුල් කොට ගෙන බව පහැදිලි ය. එයට හේතුව මහා පරාක්‍රම සමුද්‍රය පිහිටා තිබෙන්නේ පොළොන්නරු ප්‍රදේශයේ නිසා ය. ලාංකිකයන් කෘෂි ආර්ථිකයට හැඩ ගැසී



විසල් ගල් පරුවත
මඟින් මහා කරුණා
ගුණ වෑහෙන සෙල්
පිළිම නෙළීමට හෙළ
කලා කරුවාට කෙතරම්
නම් ඥානයක්
ශික්ෂණයක් තිබිය යුතු
ද? මුළු මහත් ලෝකයා
ම විශ්මයට පත් කරන
මේ ප්‍රශස්ත කලා
නිර්මාණ අපට කියා
පාන්නේ මහින්දා
ගමනයේ ඇති සාතිශය
විශිෂ්ටතාවයි.

දැහැමි දිවි පෙවෙතක් ගත කළ ලොව අභිමානවත් ජාතියකි. පරාක්‍රම සමුද්‍රය රැලි පිට රැලි නඟමින් පතුරන්නේ ජාතියේ ජය ඝෝෂාවයි. හෙළයන්ගේ වීර වික්‍රමයයි. සත්‍ය වශයෙන්ම එහි ඇත්තේ හෙළයන්ගේ ජය පානයයි.

**දාගැබයි මහ මේඝයයි**
**තිල්වත් ගුවන් ගැබ යාවුණේ**
**ගල් කුළින් සිත්තම් වුණාදෝ**
**මෙත් සිහිල් කරුණා ගුණේ**

අනුරාධපුර පොළොන්නරු පූජනීය පෙදෙස්වල මහා දැගැබ්වල කොත් කැරලි අහස සිප ගෙන තිල්වන් මහා මේඝ වලාකුළු ඇසුරු කරන බව කවියා පවසන්නේ ශ්‍රාවක හදවත්වල චිත්ත රූප මවමිනි. වරෙක වැවයි දාගැබයි ගමයි පන්සලයි යන හෙළයන්ගේ තේමා පාඨය එයින් අපිට සිහිගන්වමින් සාඩම්බර හැඟීම් ජනිත කරවයි.

ලක් පොළොවේ දාගැබින් ලැබුණු ආශිර්වාදයත්, මේඝ වලාවන්ගෙන් ලැබුණු වැසි දිය දහරින් ලැබුණු ශක්තියත් පිළිබඳ මෙම සඳහන පොළොන්නරු යුගයේ පෙරදිග මහා ධාන්‍යාගාරය නම් අප ලැබූ විරුදාවලිය නැවත ලක් වැසියන්ට සිහි ගන්වයි.

මහින්දාගමනයෙන් පසුව ලක්වැසියන් ඥානයෙන් , ශික්ෂණයෙන් ලොව අන් කිසි වකුටත් සම කළ නොහැක. විසල් ගල් පරුවත මඟින් මහා කරුණා ගුණ වෑහෙන සෙල් පිළිම නෙළීමට හෙළ කලා කරුවාට කෙතරම් නම් ඥානයක් ශික්ෂණයක් තිබිය යුතු ද? මුළු මහත් ලෝකයා ම විශ්මයට පත් කරන මේ ප්‍රශස්ත කලා නිර්මාණ අපට කියා පාන්නේ මහින්දා ගමනයේ ඇති සාතිශය විශිෂ්ටතාවයි. කෘෂි ආර්ථිකය නිසා දැහැමි දිවි පෙවෙතකට හුරුපුරුදු වුණ හෙළයින් තැන්පත් හික්මුණ මනසකින් හා පැසුණු බුද්ධියකින් යුතුව කළ ප්‍රාතිහාර්යය රචකයා මෙම ගීතයෙන් සහෘද මනස ස්පන්දනය කරයි.

**මහා රජුන් තුන් සිංහලේ එහෙමයි**
**එදා දස්කම් කළේ**
**ඒ උතුම් දහමින් තමා ලේ මස් පවා**
**විස්කම් කළේ**
**ධීර වීරයි පූජනීයයි**
**නෑ නිමක් ගුණ ගායනේ**
**සිව් මහා දෙවිඳුන් රකිවී**
**මේ අපේ බුදු සාසනේ**

රුහුණු පිහිටි මායා ත්‍රී සිංහලය ආරක්ෂක ස්ථම්භ ලෙස පිළිගැනේ. ලංකා ඉතිහාසයේ මෙම ත්‍රී සිංහලයේ රජ කළ හෙළ රජ දරුවන් ලක් දෙරණ ආරක්ෂා කිරීමට දිවි දෙවෙනි කොට කටයුතු කළ බව ඉතිහාසය මධ්‍යස්ථව විමසීමේ දී පෙනීයන කරුණකි.

මහා දාඨික මහානාග වැනි රජවරු වෙස්වළාගෙන ගොවිතැන් කළහ. ඒ රට ස්වයං පෝෂිත කිරීමේ උදාර අරමුණ උදෙසා ය. තවත් රජවරු වෙස්වළාගෙන රටේ දුක් විඳින ජනතාව සොයා ගම් දනව් සැරූහ. ඒ ලක්වාසීන්ගේ සුබ සිද්ධිය උදෙසා ය. පර සතුරන්ගෙන් දේශය බේරා ගනිමින් ලක් දෙරණ ආරක්ෂා කිරීමට ශක්තියත්, ධෛර්යයත් ලැබුණේ එදා පොසොන් පුර පසළොස්වක දා දහමින් ලද දායාදයක් ලෙසිනි.

ලේ මස් නහර ඇට මිදුළු පසු කරමින් මනසේ ගැඹුරුම තැන තැම්පත් වූ මෙම අසිරිමත් දහම අතු පතර විහිදී ගිය දැවැන්ත මහ ගහක් ලෙස ජන හදවත් තුළ රෝපණය වූයේ ලක්වැසියන් දහමට දැක් වූ අසීමිත හිතවත්කම හේතු කොට ගෙනයි. එම නිසා එකී අභිමානවත් ඉතිහාසය අනුස්මරණය කරන හැම විටම ලක්වැසියන්ගේ සිතට නැවුම් ජීවයක් ගලා එයි.

හෙළයන්ගේ සූර වීර ධීර විකුමන් , නිමක් නැති මානව ගුණයන් නිසා ලෝ වැසියන්ගේ පවා අතිශය පූජනීයත්වයට පත් වී ඇති බව රචකයා ඉදිරිපත් කරන්නේ සාඩම්බර ලීලාවෙනි.

අවසාන වශයෙන් කවියා සතරවරම් මහ දෙවිවරුන් සම්මා සම්බුද්ධ ශාසනය ආරක්ෂා කරන බව පවසයි. නිර්මල බුද්ධ ශාසනය ලක් දෙරන තුළ පැවතුණහොත් එහි ආනුභාවයෙන් අන් සියලුම දෑ ආරක්ෂා වන බව ව්‍යංගයෙන් පැවසීමට නිර්මාණකරුවා උත්සාහ දරා ඇත.



පෑලියගොඩ විද්‍යාලංකාර
පිරුවන්හි ආචාර්ය
කැලණිය විශ්වවිද්‍යාලයේ
සිංහල අංශයේ අංශාධිපති
මහාචාර්ය
**මල්වානේ චන්දරතන හිමි**



# ශාසන අභිවෘද්ධිය හා චිරස්ථිතිය වෙනුවෙන් කැප වෙනවා



**උදාර පැවිදි දිවියක පිය සටහන් ඔස්සේ මෙවර සාකච්ඡා මණ්ඩපයට වැඩම කරනු ලබන්නේ මහාවිහාර වංශික ස්‍යාමෝපාලි මහා නිකායේ ශ්‍රී රෝහණ පාර්ශ්වයේ ගාලු මාතර දෙදිසාවේ උප ප්‍රධාන අධිකරණ සංඝනායක කීර්ති ශ්‍රී ධර්මරක්ෂිත සද්ධර්ම විශාරද දෙල්ලව ජිනරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය.**

උදාර දිවියක පිය සටහන්

**සුපේශල ශික්ෂාකාමී යතීන්ද්‍රයන් වහන්සේ නමක් වශයෙන් වැඩ සිටින ඔබ වහන්සේ ශාසනික දායාදය ලබා ගැනීමත්, ධර්මශාස්ත්‍රෝද්ග්‍රහණය සිදු කළ අවධියත් සිහිපත් කරමින් සාකච්ඡාවට ප්‍රවේශයක් ලබා ගනිමු අපේ හාමුදුරුවනේ.**

රුහුණු ප්‍රදේශයේ සිංහරාජ වනපෙත පාමුල පිහිටි ඉතාමත් සුන්දර ඉපැරැණි සිංහල ගම්මානයක් වුණ දෙල්ලව ගමේ දෙන් හෙන්ද්‍රික් අබේතුංග සහ එච්. එල්. එන්. ගුණවර්ධන යන දම්පතීන් දෙපළ මව්පියන් කොට සහෝදර සහෝදරියන් හත් දෙනකුගෙන් යුතු පවුලක 1944 වර්ෂයේ මැයි 15 වන දින හසනසිරි අබේතුංග යන ගිහි නාමයෙන් ජන්ම දාය දය ලැබුවා. දෙල්ලව හා තවලම රජයේ පාසල් වලින් මූලික ගිහි අධ්‍යාපනය සපුරාගෙන 12 වන වියේදී දෙල්ලව ශ්‍රී නාථාරාම විහාරාධිපති දෙල්ලව සිරි පුඤ්ඤානන්ද මා හිමිපාණන් වහන්සේ හා ගොඩපිටියේ රාජ මහා විහාරාධිපති වැලිහේනේ සිරි ඉන්දසර නා හිමිපාණන් වහන්සේ යන දෙනමගේ ආචාර්යත්වයෙන් 1956 වර්ෂයේ ඔක්තෝම්බර් 08 වෙනිදින දෙල්ලව ශ්‍රී නාථාරාම විහාරස්ථානයේ දී දෙල්ලව ජිනරතන යන ශාසනික නාමයෙන් උත්තරීතර ශාසනික දායාදය ලබා ගැනීමට පුණ්‍යවන්ත වුණා. අනතුරුව මූලික ශාසනික අධ්‍යාපනය සඳහා මොරවක ශ්‍රී සිද්ධාර්ථ පිරිවෙන, ගොඩපිටියේ ජේතවන පිරිවෙන යන පිරිවෙන් තුළින් පිරිවෙන් අධ්‍යාපනය ප්‍රගුණ කරමින් සිටියදී තිසි වයස් සම්පූර්ණ වීමත් සමඟ 1966 වර්ෂයේ ජූනි මස 24 වන දින මල්වතු මහා විහාර උපෝෂථාගාරයේදී උපසම්පදාව ලබා ගැනීමට භාග්‍ය වන්ත වුණා.

එයින් පසු වැඩිදුර අධ්‍යාපනය සඳහා ඌරාපොල සිරි රතනජෝති විද්‍යායතන පිරිවෙන, රත්මලාන පිරිවෙන් ගුරු අභ්‍යාස විද්‍යාලයට ඇතුළත්ව ගුරු වෘත්තිය ප්‍රගුණ කරමින් ගොඩපිටිය ජේතවන පිරිවෙනහිම ආචාර්යවරයකු ලෙස පත්ව කාලයාගේ ඇවෑමෙන් එහි පරිවේණාධිපති ධූරයට පත්වුණා. ඒ වගේම ශාස්ත්‍ර ඥානය තවදුරටත් ප්‍රගුණ කර ගැනීමේ අදහසින් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ බාහිර ශිෂ්‍යයකු ලෙස ශාස්ත්‍රවේදී උපාධිය ලබා ගැනීමට කටයුතු කළා.

**ඔබ වහන්සේගේ ජාතික, ආගමික, ශාසනික කාර්යභාරය පිළිබඳ සිහිපත් කරනවා නම්,**

1968 වර්ෂයේ අකුරැස්ස ගොඩපිටිය පිරිවෙනේ ආචාර්යවරයකු, එම වර්ෂයේදී ම එහි කෘත්‍යාධිකාරී ස්වාමීන් වහන්සේව, 1971 වර්ෂය වන විට එහි පරිවේණාධිපතීන් වහන්සේ වශයෙන් සේවය කිරීම ආරම්භ කළා. 1978 වර්ෂයේදී අකුරැස්ස මාරඹ විද්‍යා ශ්‍රී පිරිවෙනෙහි පරිවේණාධිපති, 1980 වර්ෂයේ දී අකුරැස්ස පරදුව ශ්‍රී වර්ධනාරාම පුරාණ විහාරාධිපති ,1981 වර්ෂයේදී දෙල්ලව ශ්‍රී නාථාරාම පුරාණ විහාරාධිපති ,1982 වර්ෂයේ දී මොරවක ශ්‍රී විජය පිරිවෙනේ පරිවේණාධිපති, 1983 වර්ෂයේදී බටුවංගල ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලයේ සභාපති,1990 වර්ෂයේ දී බටුවංගල සමථ මූල මණ්ඩලයේ සභාපති 1995 වර්ෂයේ දී දෙල්ලව ශ්‍රී විද්‍යාවර්ධන පිරිවෙනේ පරිවේණාධිපති ,2000 වර්ෂයේ දී නෙළුව ප්‍රාදේශීය විහාරාධිපති සංගමයේ සභාපති ආදී වශයෙන් විශාල ශාසනික කාර්යභාරයක් ඉෂ්ට කිරීමට ලැබීම සතුටට කරුණක්.

ගුරු ජීවිතයේ දිගු කලක් සිදුකළ අධ්‍යාපනික මෙහෙවර වඩාත් තීව්‍රකිරීමේ අදහසින් දෙල්ලව නාථාරාම විහාරයෙහි ශ්‍රී විද්‍යාවර්ධන පිරිවෙනක් ආරම්භ කරමින් එහි පරිවේණාධිපතින් වහන්සේ ලෙස කටයුතු කළා වගේම සිරි පුඤ්ඤානන්ද දහම් පාසල ආරම්භ කළා. ශාසනික කාර්යයන් ඉදිරියට පත්වාගෙනයමින් දේවාලේගම ගම්මානයට සුගත විහාරය, පොල්ගම්පල ගම්මානයට ධර්මරාජ විහාරය ඉදිකිරීමට කටයුතු කළ බවත් සිහිපත් කළ යුතුයි.

දිවයිනේ විචිත්‍ර ධර්ම කථිකයාණන් වහන්සේ නමක වූ දෙල්ලව ධම්මරතන හිමියන්,බෙංගමුවේ ඉන්දරතන හිමියන්, දෙල්ලව පුඤ්ඤරතන හිමියන්. දෙල්ලව චන්දරතන හිමියන් ඇතුළු ශිෂ්‍ය පරපුරක් හදා වඩා සම්බුද්ධ ශාසනයේ අනාගත අභිවෘද්ධිය සඳහා දායාද කිරීමට ලැබීම මහත් භාග්‍යයක්.

සසුනඹර ආලෝකමත් කිරීමට සිදුකළ ශාසනික කාර්යභාරය අගය කරමින් ශ්‍රී රෝහණ සංඝ සභාව විසින් 2009 වර්ෂයේ දී සද්ධර්ම විශාරද ගෞරව නාමය සහිතව ගාලු මාතර දෙදිසාවේ උප ප්‍රධාන සංඝ නායක ධූරය පිරිනැමීමට කටයුතු කළා. අනතුරුව 2010 වර්ෂයේ දී රෝහණ සංඝ සභාවේ උපසම්පදා කාරක සභික ධූරයටත් වසර කිහිපයකින් විධායක කාරක සභික ධූරයටත් පත්ව ශාසනික කාර්යභාරයන් ඉතා වගකීමෙන් යුතුව ඉෂ්ට කළා. 2019 වර්ෂයේ දී 75 වන ජන්ම දිනය වන විට රෝහණ සංඝ සභාවේ උපාධ්‍යායන් වහන්සේ වශයෙන් පත්ව වර්තමානය දක්වාම සම්බුද්ධ ශාසනයේ අභිවෘද්ධිය හා උන්නතිය වෙනුවෙන් කැප වී ශාසනික කාර්යභාරයක් ඉටුකිරිම පිළිබඳව විශාල සතුටක් දැනෙනවා. බුදු හිමියන් පැවරූ වගකීම වන්නේ තමාගේ විමුක්තිය ද සකසා ගනිමින් ලෝක යහපතට වැඩ කළ යුතු බවයි. භික්ෂුව නිදහස් ජීවිතයක සහ පොදු බවේ ලක්ෂණයයි. ඉතිහාසයෙහි හමුවන සංවිධිත මුල්ම ප්‍රව්‍රජිත පිරිස වන්නේත් බෞද්ධ භික්ෂුවයි. ඒ බව අවබෝධ කරගනිමින් හැකි සෑම අවස්ථාවකම ශාසනික අභිවෘද්ධිය පිණිස තවදුරටත් කැපවීම අපේ යුතුකමක්.

**මේ වර්ෂයේ දී ඔබ වහන්සේගේ උත්තරීතර ශාසනික ජීවිතයට වසර 65ක් වගේම උපසම්පදා දිවියට වසර 55 ක් සම්පූර්ණ වෙනවා. ඔබ වහන්සේ ස්වාමීන් වහන්සේ නමක් වශයෙන් මෙන්ම පරිවේණාධිපතීන් වහන්සේ නමක් වශයෙන් ලබාගත් අත්දැකීම් සම්භාරය අනුසාරයෙන් නූතනයේ අධ්‍යාපනය ලබන භික්ෂූන් වහන්සේලාට ලබා දෙන්නේ කුමන ආකාරයේ අනුශාසනාවක් ද?**

මගේ පැවිදි ජීවිතයට වසර 65 ක් වගේම උපසම්පදා ජීවිතයට වසර 55ක් ගතවුණ කාලය තුළ විශාල අත්දැකීම් සම්භාරයක් ලබා තිබෙනවා. ජාතික,ආගමික,අධ්‍යාපනික,ශාසනික වශයෙන් විශාල කාර්ය භාරයකට දායකත්වය ලබාදෙමින් තවදුරටත් කටයුතු කරමින් සිටිනවා. මගේ ගුරුහාමුදුරුවන් වහන්සේලා ලබාදුන් අවවාද අනුශාසනා පිළිපදිමින් ඉතාමත් කීකරු ශිෂ්‍යයකු ලෙස ගුරු ගෞරවයෙන් යුක්තව තුනුරුවන් කෙරෙහි අප්‍රමාණ ගෞරවයෙන් කටයුතු කළා. ඒ හේතුව මගේ ශාසනික ජීවිතය ආලෝකමත් කර ගැනීමට බෙහෙවින් ඉවහල් වුණා.පාසල් අධ්‍යාපනය වගේම පිරිවෙන් අධ්‍යාපනය ලබන කාලයේදී කිසිම දවසක ගුරුවරයකුගේ දෝෂදර්ශනයට හෝ දඬුවමකට ලක්වෙලා නැහැ. ශාසනික ඇවතුම් පැවතුම් ඒ ආකාරයෙන් පුරුදු පුහුණු වුණා. මගේ කාලය තුළ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා රාශියකට අධ්‍යාපනය ලබාදෙමින් උන්වහන්සේලා ඇසුරු කිරීමට ලැබුණා. බොහෝ දහම් පාසල් ආරම්භ කරමින් ප්‍රධාන ආචාර්යයන් වහන්සේ නමක් හැටියට ගිහි සිසුන්ගේ ගුණ නුවණ දියුණු කිරීමටත් කටයුතු කරනවා.

ශ්‍රී රෝහණ සංඝ සභාවේ උපාධ්‍යායන් වහන්සේ වශයෙන් උපසම්පදා විනය කර්මවලදීත්, ශාසනික කටයුතුවලදීත් මගේ උපරිම ශක්තිය යොදවමින් කටයුතු කරනවා. එම කරුණු කාරණා අනුව අපේ සාමණේර පොඩි හාමුදුරුවන් වහන්සේලා,විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබන හාමුදුරුවන් වහන්සේලා,තරුණ හාමුදුරුවන් වහන්සේලා තමන්ගේ ගුරු හාමුදුරුවන් වහන්සේලාගේ අවවාද අනුශාසනා නිහතමානීව පිළිපදිමින් ධර්මවිනය ශබ්ද ශාස්ත්‍ර ඉගෙන ගනිමින් තුනුරුවන් කෙරෙහි ගෞරවය ඇතිකරගෙන බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇති ආකාරයට අපැහැදුන පිරිසගේ පැහැදීම ඇතිවන ආකාරයටත් , පැහැදුන පිරිසගේ පැහැදීම තවදුරටත් වැඩිවන ආකාරයටත් කටයුතු කළ යුතු බව සිහිපත් කළ යුතුයි. ඒ වගේම පාලි සංස්කෘත,සිංහල විෂයයන්ට අමතරව ඉංග්‍රීසි භාෂාව වැනි භාෂාවන් ප්‍රගුණ කරමින් ධර්මදූත කටයුතු සඳහා කැපවිය යුතුයි.

**හේමමාලා රන්දුනු**

# දික්විජය පැරද වූ ධර්ම විජය ප්‍රතිපත්තිය



**බුදුරජාණන් වහන්සේ හැරුණු විට ශ්‍රී ලාංකේය බෞද්ධයින් දෙවැනි බුදුන් ලෙස සලකන්නේ අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ ය. උන්වහන්සේ දඹදිව රාජ්‍ය හෙබ වූ ධර්මාශෝක රජතුමාගේ පුත්‍රයෙකි. ධර්මාශෝක රජු ශ්‍රී මහා බෝධියේ දක්ෂිණ ශාඛාව හෙළදිවට වැඩම වූ සංඝමිත්තා තෙරණියගේ පියතුමා ය. තම ලෙයින් උපන් පුත්‍ර රත්නය සහ දියණිය සම්බුද්ධ ශාසනයට පූජා කර ධර්මයෙන් ලොව සුවපත් කිරීමට වෙහෙස ගත් රජ කෙනෙකි.**

ධාර්මික රජ කෙනකු වූයේ චණ්ඩ ගතිවලින් පිරුණු අයෙකි. ධර්මාශෝක රජතුමාගේ දික්විජය සහ ධර්මවිජය ප්‍රතිපත්ති විමසීමෙන් එය තහවුරු වෙයි.

උපතින් බෞද්ධයකු නොවූ රජතුමා රණ ශූර මෞර්ය වංශයට අයත් වෙයි. බින්දුසාර අධිරාජයා පිය රජතුමා ය. චන්ද්‍රගුප්ත අධිරාජයා මුත්තණුවන් ය. බින්දුසාර රජතුමාගේ බිසෝවරු දහසය දෙනාගෙන් ධර්මා නම් බිසව මව් තොමෝ ය.

පූර්ණ රාජ සම්පත් සහ යුද ශක්තියෙන් හෙබි රාජ වංශයෙහි උපන් කුමරු කුඩා අවධියේ සිට යුද්ධයට දක්ෂකම් දැක්වීය. බින්දුසාර රජතුමාගේ දරුවන් එකසිය එක්දෙනා අතුරින් රජුගේ සිත් ගැනීමට සමත් කුමරු බවට පත් වෙයි. උදේනි රාජ්‍යට එරෙහිව යුද්ධ කර එය ජය ගෙන පාලනය කිරීමට ද පවරන්නේ එබැවිනි.

පිය රජතුමාගේ ඇවෑමෙන් පාඨලීපුත්‍රයේ රාජාභිශේෂකයට පැමිණියේ නමුත් සෙසු සහෝදරයින් අනූ නව දෙනා තිස්ස කුමරුට සහ අශෝක කුමරුට එරෙහි වෙයි. එබැවින් යුද්ධයකට අවතීර්ණ වී සොහොයුරන් අනූනව දෙනා මරණයට පත් කර රාජ්‍ය බලය ලබා ගනියි. වසර හතරක් යුද්ධය පැවතුණු බව පැවසේ. එයින් දික්විජය ප්‍රතිපත්තිය ආරම්භ වෙයි.

දික්විජය ප්‍රතිපත්තිය යනු යුද්ධයෙන් රාජ්‍යයන් අල්ලා ගැනීම සහ පාලනය මෙහෙයවීමයි. එහෙත් ප්‍රබල වූ කාලිංග දේශයට එරෙහිව යුද්ධ ප්‍රකාශ කළ ද, පහසුවෙන් ජය ගැනීමට නො හැකි වෙයි. යුද්ධයෙන් ලක්ෂයක් මරණයට ද, එක්ලක්ෂ පනස් දහසක් ආබාධිත තත්ත්වයට ද, තවත් ලක්ෂයක් සිරකරුවන් බවට ද, තවත් විශාල පිරිසක් තුවාලකරුවන් බවට ද පත් වෙයි. කාලිංග දේශයම එකම ලේ විලක් බවට පත් වෙයි.

දරුවන්ට දෙමාපියන් අහිමිවීම, දෙමාපියන්ට දරුවන් අහිමිවීම, ශ්‍රමණ බ්‍රාහ්මණාදීන් මරණයට පත්වීම, ආහාරපාන නොමැතිවීම, වගාකටයුතු විනාශවීම, ශ්‍රේෂ්ඨ ගුරුවරුන් මරණයට පත්වීම වැනි විපත් කෙරෙහි රජුගේ නෙත ගැටෙයි. එයින් දැඩි සිත් වේදනාවට පත් වෙයි. රජතුමා යුද්ධය ජයගෙන එන ගමනේදී උපගුප්ත නම් බෞද්ධ භික්ෂූන් වහන්සේ නමක් හමුවී උන්වහන්සේ වෙතින් ධර්මය අසා තමන්ගේ සිත් තැවුල් පහකරගෙන ධර්මය කෙරෙහි පැහැදුණු බව දිව්‍යදානය පවසයි.

සිංහල වංශකථා දක්වන්නේ නිග්‍රෝධ නම් සත්හැවිරිදි සාමණේරයන් වහන්සේගේ සංසුන් ගමනට පැහැදී උන්වහන්සේ රාජ මාලිගයට වැඩමවා රාජ ආසනයේ වඩා හිඳුවා

'අප්පමාදෝ අමත පදං-පමාදෝ මච්චුනෝපදං, අප්පමත්තාන මීයන්ති-යෙ පමත්තා යථා මථා' යන ධම්මපද ගාථාවෙන් දේශනා කළ ධර්මය අසා පැහැදී උන්වහන්සේගේ ගුරු හිමියන් වූ මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේ වෙතින් තවදුරටත් ධර්මය ඉගෙනගෙන බෞද්ධාගම වැළඳගත් බවකි.

ඉන්දියාවේ ප්‍රචලිත ජනප්‍රවාදයක් අනුව දැක්වෙන්නේ රජතුමා බුදුරුවක් දැක එයට පැහැදී භික්ෂූන් වෙත එළැඹ ධර්මය අධ්‍යනය කර බෞද්ධාගම වැළඳ ගත් බවකි.

කෙසේ හෝ රජතුමා බෞද්ධයකුවීමට බලපා ඇත්තේ කාලිංග යුද්ධයෙන් ඇති වූ සිත්තැවුල බව නම් පැහැදිලි ය. භික්ෂූන් වහන්සේලාගේ ඇසුර ලබාගත් රජතුමා තමන් බෞද්ධ දර්ශනයට අනුව රාජ්‍ය මෙහෙය විය යුතු ආකාරය ද ඉගෙන ගනියි. එහි ප්‍රතිඵලයක් වශයෙන් රජතුමාට දීඝ නිකායේ චක්කවත්තිසීහනාද සූත්‍රය, මහාසුදස්සන සූත්‍රය, කූටදන්ත සූත්‍රය වැනි සූත්‍රධර්මත්, ධම්මපදය, විමානවත්ථු, සුත්ත නිපාතය සහ අංගුත්තර නිකාය වැනි ධර්ම ග්‍රන්ථත් අධ්‍යයනය කිරීමට ලැබෙයි.

එයින් දැහැමි රාජ්‍ය පාලනයත්, රටවැසියා අනුගමනය කළ යුතු සාරධර්ම ආදියත් හොඳින් අවබෝධ කර ගනියි.

එහි ප්‍රතිඵලයක් වශයෙන් ධර්මවිජය ප්‍රතිපත්තිය ලොවට දායාද වෙයි. ගුරුවරුන්ට සැලකීම, සතුන්ට කරුණාව දක්වමින් ඔවුන් රැකබලා ගැනීම, ඔවුන් වෙනුවෙන් ළිං සහ පොකුණු ඉදිකිරීම, ආරෝග්‍යශාලා සහ ඔසු උයන් පිහිටුවීම, මාර්ග දෙපස මිනිසුන්ට සහ සතුන්ට ආහාරයට ගත හැකි පලතුරු ගස් රෝපණය කරවීම, සතුන් වෙනුවෙන් උයන්වතු තැනවීම, ආගමික පූජකයින්ට දන්දීම සහ ඔවුන් රැකබලා ගැනීම, සතුන්මරා යාග කිරීම් තහනම් කිරීම, සැම අයකුටම කරුණාව දැක්වීම, රජගෙදර රාජ භෝජනවලට සතුන් මැරීම නවතා දැමීම, අවැඩදායි විනෝදජනක ක්‍රීඩා නවතා දැමීම, ඥතීන්ට සංග්‍රහ කිරීම වැනි සාරධර්ම ඇතුළත් ගිරි ලිපි, පුවරු ලිපි, ටැම් ලිපි, සහ සෙල්ලිපි මඟින් එම ධර්ම කොටස් දඹදිව සැම තැනම ප්‍රදර්ශනය කිරීමට ද කටයුතු සලසයි.

එය ධර්ම විජය ප්‍රතිපත්තිය වූ අතර ඒ අනුව රටවැසියාගේ සාරධර්ම ගොඩනැඟීම සිදු කරයි. තමන්ගේ පාලන කටයුතු සතර සංග්‍රහවස්තු, සතර බඹවිහරණ, දස සක්විතිවත්, දස රාජධර්ම, සප්ත අපරිහානි ධර්ම සහ පංචසීල ප්‍රතිපදාව අනුව ක්‍රියාත්මක කිරීමටත් කටයුතු යොදයි.



රජතුමාගේ කරුණාව ජීවී අජීවී සියලු දෙනා වෙතම එක සමාන ව දැක්වීමට කටයුතු යොදයි. සියලු රටවැසියෝ මාගේ දරුවෝය යන අදහසින් පාලනය ගෙන ගිය බව පැවසේ. රජතුමා සතු කරුණාව සෙනෙහස කොපමණ ද යන්න

"මම ආහාර ගනිද්දී හෝ අන්තඃපුරයේ සිටිද්දී හෝ ඇතුළු මාලිගාවේ සිටිද්දී හෝ උද්‍යානයේ සිටිද්දී හෝ වෙනත් කවර කටයුත්තක යෙදී සිටියේ නමුත් ජනතාවගේ පණිවුඩ මා වෙත ගෙන ආ යුතු ය. මම සැම තැනකදී ම ජනතාවගේ කටයුතු කරමි. සියලු ලෝකයාගේ යහපත උදෙසා කටයුතු කිරීම මාගේ පරම යුතුකම වන්නේ ය. ලෝකයාට සේවය කිරීම හැර වෙනත් උතුම් සතුටක් මට නැත."

යනුවෙන් පවසා තිබීමෙන් ම පැහැදිලි වෙයි. චණ්ඩාශෝක බවට පත්වී යුද්ධයෙන් රාජ්‍යයන් ආක්‍රමණය කර ජය ගත්තේ ය. ධර්මය අසා පැහැදීමෙන් පසු එය ඉවත දමා ධර්මයෙන් රාජ්‍යයන් අල්ලා ගැනීමට කටයුතු යෙදී ය. එය රාජ්‍යන් අල්ලා ගැනීමක් පමණක් නොව එම රටවල මිනිසුන්ගේ හදවත් සියල්ල ද අල්ලා ගැනීමක් හා සමාන ය.

රජතුමාගේ ධාර්මික ප්‍රතිපත්තිවලට ජනතාව ප්‍රිය කළහ. රජතුමාට ගෞරව දැක්වූහ. මෙහි ප්‍රතිඵලයක් ලෙසින් තෙවැනි ධර්ම සංගායනාව මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේගේ අනුග්‍රහයෙන් පාඨලීපුත්‍රයේ අශෝකාරාමයේදී පැවැත්වීමට කටයුතු යොදයි.

රජතුමාගේ ඉල්ලීම සහ අනුග්‍රහය සහිතව මහරහතන් වහන්සේගේ උපදෙස් අනුව රටවල් නවයකට ධර්ම ප්‍රචාරය සිදුකරයි.

හෙළදිව වංස කථා තොරතුරු අනුව කාශ්මීර ගන්ධාර, මහිස මණ්ඩලය, වනවාස දේශය, අපරන්තදේශය, මහාරට්ඨය, යෝනක දේශය, සුවණ්ණභූමිය, හිමවන්ත ප්‍රදේශය සහ තම්බපණ්ණි දීපය යන රටවලට ධර්ම දූත පිරිස් පිටත් කර ඇත.

දහතුන් වැනි ගිරිලිපිය අනුව ධර්මාශෝක රජතුමාගේ රාජාභිෂේකයෙන් විසිහත් වැනි වර්ෂයේදී "හිද, අතෙෂු, අතියොග, තුලමයේ, අංතෙකිනෙ, චකා, අලික්යුෂුදලෙ, චෝඩ, පංඩියා, තංබපණ්ණි, යෝන, කාංබෝජ, අධ, පාලද, නාභක, නාග පංති, භෝජ, පිතිනිත්යධ යන ස්ථාන දහ අටට ධර්මදූතයන් වහන්සේලා යැවූ බව සඳහන් වෙයි.


රජතුමා ධර්ම ප්‍රචාරය පමණක් සිදු කර නතර නොවෙයි. මොග්ගලීපුත්ත තිස්ස මහරහතන් වහන්සේ වෙතින් බුදුරජාණන් වහන්සේගේ ධර්මය අසූහාරදහසක් ඇති බව අසා දඹදිව පුරා වෙහෙර විහාර අසූහාර දහසක් ඉදිකළ බව ද පැවසේ. රජතුමාගේ අපමණ බෞද්ධ හැඟීම සහ ධර්ම විජය ප්‍රතිපත්තිය ලොවක් සනසාලීමට අදත් හේතු වී ඇත.

මතු වසර දහස් ගණනක් එය රැඳී තිබෙනු ඇත. සියලුම බෞද්ධයින් ධර්මාශෝක නාමයට සැමදා ගරු කළ යුතු ය. ලොව මෙතෙක් කලක් බුද්ධ දේශනාව පවතින්නේ එතුමාගේ ශාසනික සේවයේ මහත් වූ ප්‍රතිඵල නිසයි.



දඹාන මාවරගල ආරණ්‍ය සේනාසනයේ
රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති අධ්‍යාපනපති
**පදියතලාවේ අමරවංශ හිමි**





# මහින්දාගමනයෙන් උදා වූ කාන්තා විමුක්තිය

**අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේගේ ලංකා ගමනය නිසා ලාංකිකයන් තුළ ඇති වූ චින්තන පෙරළිය අසාමාන්‍ය එකකි. මෙවැනි සමාජ විප්ලවයක් ලක් ඉතිහාසයේ අන් කවර කලෙකවත් ඇති නොවූ බව අවිවාදයෙන් පිළිගැනේ.**

මෙම ඓතිහාසික සිදුවීම ආගමික, සාමාජික, දේශපාලනික හා සංස්කෘතික වශයෙන් ලාංකික සමාජය කෙරෙහි ඇති කළ බලපෑම සුළුපටු නොවන බව ද නො රහසකි. විශේෂ වශයෙන් එතෙක් මෙහි පැවති බ්‍රාහ්මණ, ජෛන වැනි පාරම්පරික ආගමික චින්තන සහ ඒ හා බැඳුණු මිථ්‍යා ඇදහිලි, මතවාද, ආකල්ප වෙනුවට සමානාත්මතාව අගයන නැවුම් දර්ශනයක ආශිර්වාදය අපට ලැබුණේ මහින්දාගමනය නිසාවෙනි.

වර්තමානයේ ප්‍රබල මානව අයිතිවාසිකම් ප්‍රකාශනයක් බවට පත්ව ඇති කාන්තා විමුක්තිය පිළිබඳ විමසා බැලීමේ දී ප්‍රාග් බෞද්ධ යුගයේ භාරතයේ පැවතුණු බ්‍රාහ්මණ ආගම අනුව යමින් මහින්දාගමනයට පෙර ලාංකික කාන්තාව දාසියක සේ සලකා ඇති බව සඳහන් වේ. ඒ අනුව ඇයගේ ආගමික නිදහස පමණක් නොව තීරණ ගැනීමේ හා ක්‍රියා කිරීමේ අයිතිය පවා අහිමි කොට ඇය වහලියකගේ තත්ත්වයට පත් කර තිබුණි. බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව පුරුෂාධිපත්‍ය තහවුරු කළ සමාජයක කාන්තාවට සිදුවූයේ පිරිමි පාර්ශ්වයේ අණසකට යටත්ව සියලු බැල මෙහෙවර කරමින් අසරණියක මෙන් ක්‍රියා කිරීමට යි. ස්වාධීනව කටයුතු කිරීම කාන්තාවට තහනම් විය. භාරත දේශයේ පැවති මෙම තත්ත්වය ලංකාවේ ද මහින්දාගමනයට පෙර පැවති බවට අපේ වංශ කථා ද සාක්ෂි දරයි.

මිහිඳු මාහිමියන් ඇතුළු ධර්මදූත පිරිස පැමිණීමත් සමඟ කාන්තාව කෙරෙහි පැවති මෙම තත්ත්වය සපුරාම වෙනස් විය. ස්ත්‍රී පුරුෂ භේදයක් නොසලකා පොදුවේ දහම් දෙසූ අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ කාන්තාවට හිමි සමතැන තහවුරු කරනු පිණිස සංඝමිත්තා මහරහත් තෙරණිය දඹදිව සිට වැඩම කරවා ගත්හ.

ජය ශ්‍රී මහා බෝධින් වහන්සේගේ දක්ෂිණ ශාඛාවත් රැගෙන මෙහි වැඩම කළ සංඝ මිත්තා තෙරණිය ඒ වන විට තිසරණ ගතව පැවිදිවීමේ අරමුණෙන් සිටි අනුලා බිසව ඇතුළු පන්සියයක් කාන්තාවන් පැවිදි කරවා භික්ෂුණී ශාසනය ආරම්භ කළා ය. මිහිඳු මාහිමියන්ගේ අවවාද අනුශාසනා යටතේ සිදුවූ මෙම ඓතිහාසික සිදුවීම ලංකා ඉතිහාසයේ එතෙක් මෙතෙක් කාන්තා පරපුර ලැබූ අතිවිශිෂ්ට ජයග්‍රහණයකි. මේ නිසා අලුතින් ලැබුණු බුදු දහමත්, එහි ආභාෂය හා ආශිර්වාදයත් හේතු කොට ගෙන නැවුම් ආරකට ගොඩනැඟුණු සමාජය තුළ ස්ත්‍රිය ද පුරුෂයා හා සම තත්ත්වයේ ලා සැලකීමත් නිසා සුවිශේෂ සමාජ පෙරළියක් සිදු විය.

අනුලා බිසව ඇතුළු පැවිදි වූ පන්සියයක් දෙනා වහන්සේලා කෙටි කලකින් බවුන් වඩා උතුම් අර්හත් ඵලයට පිළිපන්හ. එම තෙරණීන් වහන්සේලා අනුව යමින් තවත් බොහෝ කාන්තාවෝ පැවිදිදිවියට පත් වූහ. මහාවංශයට අනුව දුටුගැමුණු රජතුමා කරවූ මිරිසවැටි දාගැබ විවෘත කළ අවස්ථාවට භික්ෂුණීන් වහන්සේලා අනූදහසක් සහභාගී වී තිබේ.

රුවන්වැලි මහ දාගැබේ ඉදිකිරීම් ආරම්භ කළ දිනයේ පියදස්සී නම් තෙරුන් වහන්සේගේ බණ අසා රහත් වූ පිරිස අතරේ භික්ෂුණීන් වහන්සේලා දාහතර දහසක් සිටියහ. මහිලා සමන්තා, ගිරිකාලි, දාසි, කාලි යන භික්ෂුණීන් වහන්සේලා පස් නම ප්‍රධාන විසි දහසක් භික්ෂුණීන් වහන්සේලා රුහුණේ සිට අනුරාධපුරයට පැමිණ විනය ඉගැන්වූ බව දීපවංශයේ සඳහන් වේ.

මේ තොරතුරු වලින් පැහැදිලි වන්නේ එවක ශ්‍රී ලංකාවේ භික්ෂුණී ශාසනය ඉතා උසස් තත්ත්වයකින් පැවතුණු බවයි.

මේ අනුව ලක්වැසි කාන්තාවට ද සම අයිතීන් ලබා දෙමින් කාන්තා නිදහස වෙනුවෙන් තැබූ ප්‍රථම ඓතිහාසික පියවර වශයෙන් භික්ෂුණී ශාසනය ආරම්භ කිරීම සඳහන් කළ හැකි ය. ආගමික නිදහස මෙන්ම සාමාජීය වශයෙන් ලද ස්වාධීනත්වය නිසා ලාංකීය කාන්තාවට පැවිද්ද පමණක් නොව අධ්‍යාපන අවස්ථා හිමි කර ගැනීමෙත් පෙරමුණට ඒමට අවස්ථාව සැලසුනේ ද මිහිඳු සංස්කෘතිය නිසාවෙනි. විහාරමහා දේවිය, සෝමා දේවිය වැනි ජාතියේ වීරෝදාර කාන්තාවන් බිහි වූයේ ද, සුගලා දේවිය වැනි රණකාමී වීර කාන්තාවන් බිහි වූයේ ද මහින්දාගමනය නිසා උදා වූ සංස්කෘතික පෙරළිය නිසාවෙනි.



ඉතාලියේ ප්‍රධාන අධිකරණ සංඝනායක, රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති

**වතෝගල ධම්මික නාහිමි**

අප රටේ බෞද්ධයින්ගේ ඉමහත් ගෞරවයට හා පූජනීයත්වයට භාජනය වන ශ්‍රී මහා බෝධිය හා උතුම් දළ දාව මෙරටට වැඩම කරවන ලද්දේ කාන්තාවන් දෙදෙනකු විසින් බව අමතක කළ යුතු නොවේ. ඒ වාසනා මහිමය කාන්තාවට ලැබුණේ මහින්දාගමනයෙන් උදා වූ කාන්තා නිදහස නිසාවෙනි. ස්ත්‍රී පුරුෂ දෙදෙනාම ආධ්‍යාත්මික ශක්තියෙන් අනූන බව සංයුක්ත නිකායේ කෝසල ධීතු සූත්‍රය, භික්ඛුණී සංයුක්තයේ එන සෝමා සූත්‍රය, සංයුක්තයේ එන ආවේණික දුක්ඛ සූත්‍රය, දීඝ නිකායේ සක්ක පඤ්හ සූත්‍රය, මජ්ක්ධිම නිකායේ චූල්ල වේදල්ල සූත්‍රය ආදී දේශනාවලින් පැහැදිලි වෙයි.

ශිල්ප ශාස්ත්‍ර හැදෑරීම අතින් විශිෂ්ට කුසලතා පෙන්වූ ගිහි කාන්තාවෝ ද සමාජයේ ඉදිරියට ම පැමිණියහ. මේ බව සනාථ කළ හැකි තොරතුරු රැසක් වංශකථාවල සටහන් වී ඇත. පළමුවන උපතිස්ස රජුගේ බිසව මැනවින් අභිධර්මය හදාළ කාන්තාවකි. පළමු අග්බෝ රජුගේ රාජ සභාවෙහි දෙළොස් මහ කවීන් අතරින් ‘දළබිසෝ’ කිවිඳියක වූ බව මහාචාර්ය එස්. හෙට්ටිආරච්චිගේ අදහස යි. සීගිරි ගී අතර කාන්තාවන් විසින් ලියන ලද කවි හමුවේ. අනුලා, ලීලා ආදී රාජිණියන් ගැන වංශකථාවල දැක්වෙයි.

රාජ්‍ය පාලනයට සහාය වූ කාන්තාවන් රැසක් ගැන තොරතුරු ඉතිහාසයෙන් අපට හමු වෙයි. තම ආත්ම ගරුත්වය රැක ගනිමින් ක්‍රියා කළ විහාර මහාදේවිය, කීර්ති ශ්‍රී මේඝ වර්ණ රජතුමාගේ මව, උපතිස්ස රජතුමාගේ බිසව, තම ස්වාමියා වූ වළගම්බා රජු සතුරන්ගෙන් බේරා ගැනීමට ජීවිතය පූජා කළ සෝමාදේවිය එයින් කිහිප දෙනෙකු පමණි. මෙසේ සිංහල කාන්තා පරපුරේ අභිමානය රැක ගැනීමෙහි ලා පෙරට පැමිණි දිරිය කාන්තාවන් රාශියක් අපට හමුවෙයි.


මෙම කරුණු විමර්ශනය කරන විට සම්බුද්ධ පරිනිර්වාණයෙන් 236 වර්ෂයේ දී සිදු වූ මහින්දාගමනය නිසා මෙරට ජනතාව තුළ ඇති වූ චින්තන විප්ලවය අසමසම එකක් බව පෙනේ.

ඊට සමගාමී ව සිදු වූ දුමින්දාගමනය එනම් සංඝමිත්තා මහරහත් තෙරණිය සහ පිරිවර විසින් ජය ශ්‍රී මහා බෝධිය වැඩම කරවීම නිසා ලක්වැසි කාන්තා පරපුර කෙරෙහි ප්‍රායෝගික ව ඇති කළ බලපෑම ඉතා විශිෂ්ට එකකි. එය එතෙක් බ්‍රාහ්මණ දහමින් බැඳ දමා තිබුණු අන්ධානුකරණ සමාජ වහල් බැමි හා පවුරු බිඳ දැමීමට තදබල ලෙස ඉවහල් විය. මහින්දාගමනය මෙරට කාන්තාවට සැබෑ විමුක්තිය ලබා දෙමින් ආගමික, අධ්‍යාපනික, සාමාජික හා ආර්ථික වශයෙන් ඇයගේ පූර්ණ නිදහස ලබාදීමට ගත් ඓතිහාසික පියවරකි. ලොව ප්‍රථම අගමැතිවරිය බිහි කර ගැනීමේ ගෞරවය අප රටට ලැබෙන්නේ ද මිහිඳු මාහිමියන් ගෙනා බුදු දහමේ ආශිර්වාදයක් වශයෙනි.

කෙසේ වෙතත් වර්තමානයේ දී කාන්තා විමුක්තිය වෙනුවෙන් පෙනී සිටින සංවිධාන රාශියක් ලොව පුරා බිහි වී ඇති බවක් පෙනේ. කාන්තාවන් වෙනුවෙන් දිනයක් ද වෙන් කර ඇතත්, පිරිමි පක්ෂය වෙනුවෙන් දිනයක් වෙන් කර නො තිබීමෙන් වැටහෙන්නේ කාන්තාවගේ නිදහස මෙන්ම අයිතිවාසිකම් පිළිබඳ ගැටලුකාරී ස්වභාවයක් තවමත් පවත්නා බවයි. සමාජයේ නිදන්ගත ව ඇති සංස්කෘතික මතවාද සංකේතමය කාර්යයක් ඉටු කරමින් ‘ස්ත්‍රී චිත්තය’ පාලනය කරන්නට හේතු වන බවක් පෙනේ. මෙය විග්‍රහ කරනු පිණිස බුද්ධිමය සංවාදයක් අවැසි කාලය එළඹ තිබේ. එය අනුබුදු මිහිඳු මාහිමියන්ගේ හා සංඝමිත්තාවගේ උදාර නාමයට කරන අත්‍යන්ත පූජාවක් වනු ඇත. කාන්තාව තුළ පැවති නිසර්ග බුද්ධිය කුසලතාව හා නුවණ ද මනාලෙස සමාජගත කරවමින් මිහින්තලාවෙන් පැයූ පූර්ණ චන්ද්‍රයා බඳු මිහිඳු මහ රහතන් වහන්සේට ලක්වැසි කාන්තා පරපුර සදාකල් නමස්කාරය කරනු ඇත.



# ලංකා දීපය ධර්මාලෝකයෙන් ඒකාලෝක කළ සේක



**සම්බුද්ධ පරිනිර්වාණයෙන් තුන්වැනි ශත වර්ෂයෙහි මුල් අවධියේ පාටලීපුත්ත නගරයෙහි දී පවත්වන ලද තුන්වැනි ධර්ම සංගායනාවෙන් පසුව මිහිඳු මහ රහතන් වහන්සේගේ උපාධ්‍යායයන් වහන්සේ හා භික්ෂු මහා සංඝයා ද ශ්‍රී ලංකාද්වීපයට වැඩම කොට , එහි සම්බුද්ධ සසුන පිහිටුවන ලෙස මිහිඳු හිමියන්ට ආරාධනා කළහ. ඉතිහාසගත තොරතුරුවලට අනුව එම ආරාධනාව පිළිගත් මිහිඳු මහ රහතන් වහන්සේ ඊට සුදුසු කාලය විමසා බැලූහ.**

**සමණාමයං මහාරාජ - ධම්මරාජස්ස සාවකා තවෙව අනුකම්පාය - ජම්බුදීපා ඉධාගතා**

**"මහ රජ ධර්මරාජ වූ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක වූ අප ශ්‍රමණයන් වන්නෙමු. ඔබට අනුකම්පා පිණිස දඹදිව සිට මෙහි පැමිණියෙමු" යැයි වදාළ සේක.**

එදා ලංකාද්වීපයේ සිහසුන දැරුවේ මුටසීව රජතුමා ය. ලංකාද්වීපයේ බුදු සසුන පිහිටුවීමට මෙය කාලය නොවේ යැයි කල්පනා කළ මිහිඳු මහ රහතන් වහන්සේ මුටසීව රජතුමාගේ පුත් දේවානම්පියතිස්ස කුමරු රාජ්‍යත්වයට පත්වන තුරු බලා සිටියහ.

ශක්‍ර දේවේන්ද්‍රයා ද පැමිණ මිහිඳු මා හිමියන්ට ලංකාද්වීපයට වැඩම කොට බුදු සසුන පිහිටුවන ලෙස ආරාධනා කර සිටි අතර ආරාධනාව පිළිගත් මිහිඳු මා හිමියෝ ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල නම් මහ තෙරවරු ද අභිඥාලාභී සුමන සාමණේර හා භණ්ඩුක උපාසක සමඟින් වේදිසක පර්වතයෙන් අහසට නැඟ චේතිය පබ්බත නමින් හැඳින් වූ මිස්සක පව්වට වැඩම කළහ.

උන්වහන්සේ ශ්‍රී ලංකා ධරණීතලයට වැඩම කළේ පොසොන් මස පුර පසළොස්වක පොහෝ දිනයේ දී ය. එදින ලංකාද්වීපයේ සැනකෙළි දිනයකි. දේවානම්පියතිස්ස රජතුමා මේ සැනකෙළියේ එක් අංගයක් වූ දඩයම පිණිස හතළිස් දහසක් පිරිවරාගෙන මිස්සක පව්වට ගිය හ.

එම අවස්ථාවේ දී මිස්සක පව්වට අරක් ගත් දේවතාවෙක් දේවානම්පියතිස්ස රජතුමාට වැඩම කළ මහ තෙරුන් වහන්සේ දක්වමි'යි සිතා මුවකුගේ වේශයක් ගෙන, රජතුමාට පෙනෙන ලෙස නොදුරු තැනක තණපත් බුදින්නියක මෙන් හැසිරුණ බව කියැවේ. ඒ දුටු රජතුමා දුනු අමෝරාගෙන මුවා පසු පස ලුහු බැන්දේය. එම මුව දෙන රජතුමා අඹතලය දක්වා ම කැඳවාගෙන පැමිණ මිහිඳු මහ රහතන් වහන්සේ නුදුරෙහි ම නොපෙනී අතුරුදහන්විය.

මිහිඳු මාහිමියෝ රජතුමාට තිස්ස, තිස්ස යැයි ඇමතූහ.

ඉතාමත් ශාන්ත, සන්සුන්, හිස මුඩු කර කසාවත් හැඳි, මෙ තෙමේ මාගේ නමින් අමතන්නේ ය. මෙ තෙමේ මනුෂ්‍යයෙක් ද නැතිනම් අමනුෂ්‍යයෙක් ද?, එසේත් නොවේ නම්, කවරෙක් වන්නේ දැ'යි සිතී ය. ඒ අවස්ථාවේ දී මිහිඳු මා හිමියෝ

"සමණාමයං මහාරාජ... ගාථා පාඨය වදාළ හ.

මිහිඳු මාහිමියන් ප්‍රමුඛ පිරිවරත්, දේවානම්පියතිස්ස රජතුමාත් මුණ ගැසුණ අවස්ථාවේ දී, දෙපාර්ශවය අතර ඇති වූ සංවාදය ඉතාමත් බුද්ධිමත් වූ අවස්ථාවක් ලෙස දැක්වේ. දේවානම්පියතිස්ස මහ රජතුමාට මිහිඳු මා හිමියන් මුණ ගැසුණු ඒ අවස්ථාවේ දී,

දේවානම්පියතිස්ස රජතුමා, ස්වාමිනි, ඔබ වහන්සේලා කුමකින් මෙහි වැඩියේ දැයි විමසා සිටි යේ ය. "මහරජ දියෙන් නොම පැමිණියෙමු. ගොඩින් නොම ආවෙමු'යි මිහිඳු මහ රහතන් වහන්සේ වදාළ හ.' එම අවස්ථාවේ දී මහරජතුමා උන්වහන්සේලා මෙහි අහසින් වැඩම කළ බව දැනගත්තේ ය.

මෙම විමසීමෙන් අනතුරුව මිහිඳු මා හිමියෝ දේවානම්පියතිස්ස රජතුමා ප්‍රඥාවන්තයෙක් දැයි පරීක්ෂා කිරීම සඳහා යොදා ගත් බුද්ධි පරීක්ෂණය ද ඉතාමත් වැදගත් බව ඉතිහාසයේ සඳහන් ව ඇත.

එහි දී මිහිඳු මා හිමියෝ දේවානම්පියතිස්ස මහ රජතුමාගෙන් වනයේ තිබූ අඹ ගස් පෙන්වා ඇසූ පළමු ප්‍රශ්නය වූයේ

- රජතුමනි මේ ගස කුමක් ද?
  ස්වාමීනි, අඹ ගසකි.
- මේ ගස හැර අන් අඹ ගස් ඇත්තේ ද?
  වෙනත් අඹ ගස් බොහෝ ඇත්තේ ය.
- මේ අඹ ගසත් ඒ අඹ ගසුත් හැර වෙනත් ගස් ඇත්තේ ද?
  බොහෝ ඇත්තේ ය. ඒ අඹ ගස් නොවේ යැයි රජතුමා පිළිතුරු දුන්නේ ය.
- ඒ අඹ ගස් ද අඹ ගස් නොවන ගස් ද යන ගස් දෙවර්ගය ම හැර වෙනත් ගස් ඇත්තේ ද මහ රජතුමනි?. එසේ ය ස්වාමීනි, ඒ මේ අඹ ගසයි.
- මහ රජතුමනි, ඔබට නෑයන් සිටී ද?. එසේ ය ස්වාමීනි. නෑයෝ බොහෝ ඇත.
- ඒ නෑයන් හැර නොනෑයන් සිටී ද?. නොනෑයෝ බොහෝ ඇත.
- අවසන මහරජතුමනි ඔබගේ නෑයෝ, නො නෑයෝ හැර අන් කිසිවෙක් ඇත්තේ දැයි විමසීය. ස්වාමීනි එසේ ය ඒ මම ම වෙමි.

මිහිඳු මා හිමියන් විසින් අසන ලද ප්‍රශ්න සඳහා මහරජතුමා සපයන ලද පිළිතුරුවල ස්වරූපය අනුව මහරජතුමා බුද්ධිමතකු බව මිහිඳු මා හිමියෝ වටහා ගත් හ.

ආධුනික කණ්ඩායමකට තෙරුවන් ගුණ හඳුන්වාදිය යුතු ම බව අවබෝධයෙන් සිටි මිහිඳු මාහිමියෝ පළමුව එම කාර්ය ඉටු කළ සේක. ඒ අනුව පිලෝතික පිරිවැජියා හා ජාණුස්සෝනි බ්‍රාහ්මණයා අතර ඇතිවන සංවාදයක් ඇසුරින් චුල්ලහත්ථි පද උපමා කොට බුදුරජාණන් වහන්සේගේ සුවිශේෂත්වය පැහැදිලි කරන ධර්ම රත්නයේ සහ සංඝරත්නයේ ගුණයන් පිළිබඳ හඳුන්වා දෙනු ලැබී ය. ආධුනිකයකු සඳහා තුනුරුවන්ගේ ගුණ හඳුන්වාදීමක් වශයෙන් දේවානම්පියතිස්ස මහ රජතුමා ඇතුළු පිරිසට පළමුව මජ්ඣිම නිකායේ මූල පණ්ණාසකයේ සඳහන් සූත්‍ර දේශනාවක් වූ චුල්ලහත්ථි පදෝපම සූත්‍රය දේශනා කළ සේක. මිහිඳු මාහිමියන් දේශනා කළ මෙම සූත්‍ර දේශනාව අවසානයේ මහ රජතුමා ඇතුළු හතළිස් දහසක් පමණ කණ්ඩායමක් තෙරුවන් සරණ ගිය බව කියැවේ.

මිහිඳු මාහිමියෝ ප්‍රමුඛ දූත කණ්ඩායම පසුදින රජ මාලිගාවට වැඩම කළහ. රජ මාළිගාවෙන් දන් වළදා අවසන පේතවත්ථු, විමාන වත්ථු හා සච්ච සංයුක්තය ප්‍රධාන කොට දහම් දෙසූහ. බොරු කීම, කේළාම් කීම, සොරකම් කිරීම, පර පුරුෂ, පර ස්ත්‍රී සේවන ආදී ළාමක ක්‍රියාවන්, පස් පව්, දස අකුසල් ආදී අකුසල් කර්මයන්ගේ විපාකයන් වශයෙන් විඳින්නට සිදුවන කටුක අප්‍රසන්න විපාකයන් පේතවත්ථුවේ දී මනාව පැහැදිලි කරයි.

ඒ වගේ ම විමාන වත්ථුව තුළින් දන් දීම, සිල් රැකීම, භාවනා කිරීම, දයාව, කරුණාව, මෛත්‍රීය හා ධර්මානුකූල නිවැරදි ජීවන පුරුදු පුහුණු කිරීම හේතුවෙන් සසරගත ජීවිතයේ දී විඳින්නට සිදු වන්නා වූ සැප විපාක පිළිබඳව වර්ණනාවන් සිදු කර ඇත. ඒ වගේ ම සච්ච සංයුක්තයේ අන්තර්ගත සූත්‍ර බොහොමයක ම පුද්ගල ආචාර ධර්ම පිළිබඳ උගන්වන අතර ජීවිත විසුද්ධියට අවශ්‍ය ගමන් මග ද පෙන්වා දෙනු ඇත.

මේ අනුව මිහිඳු මාහිමියෝ දෙවනුව සිදු කොට ඇත්තේ පුද්ගල ආචාරශීලි ඇවතුම් - පැවතුම් වැඩි දියුණු කරලීම සඳහා බෞද්ධ ඉගැන්වීම තුළ කතා කරන කර්ම විපාක සංකල්පය සරල ලෙසින් හඳුන්වා දීමකි. මේ දේශනා අවසානයේ පන්සියයක් ස්ත්‍රීහු සෝතාපත්තිඵලය ප්‍රත්‍යක්ෂ කළ බව ද සඳහන් වේ.

ඒ වගේ ම මිහිඳු මා හිමියෝ මජ්ඣිම නිකායේ උපරිපණ්ණාසකයේ අන්තර්ගත දේවදූත සූත්‍රය, වාග් දුශ්චරිත, මනෝ දුශ්චරිතයෙන් ඈත්ව කාය සුචරිතය. වාග් සුචරිතය, මනෝ සුචරිතය දියුණු කර ගැනීමට අවශ්‍ය දහම් උපදේශ ලබා දුන්හ. මෙම සූත්‍රයෙන් සුචරිතවත් සමාජ සාමාජික පිරිසක් ඇති කරමින් ජීවිතය දකින්නට අවශ්‍ය මඟ පෙන්වා දුන්හ. මෙම සූත්‍ර දේශනාව අසා දහසක් දෙනා සෝවාන් මාර්ගඵලාවබෝධය ලබා ගත් බව ද සඳහන් වේ.

ඒ වගේ ම මිහිඳු මාහිමියෝ සංයුක්ත නිකායේ ආසිවිස වර්ගයේ ඇතුළත් ආසිවිසෝපම සූත්‍රය ද දේශනා කළ හ. ජන ජීවිතයට ඉතාමත් සමීප වූ උපමා රැසක් උපයෝගී කරගනිමින් ගැඹුරු දහම් කරුණු පැහැදිලි කරදීමක් මෙම සූත්‍ර දේශනාවේ දී සිදු කර ඇත. මෙම සූත්‍ර දේශනාව අවසානයේ දී ද දහසක් දෙනා සෝතාපත්තිඵලයට පත් වූ බව සඳහන් වේ.

පුද්ගල ජීවිතයේ සාර්ථකත්වය සඳහා උපදෙස් මෙන් ම ජීවිතයේ යහපත උදෙසා වූ ගමන් මග ද පැහැදිලි කරමින්, නන්දන උයනට වැඩම කොට රැස්ව සිටි පිරිසට අනමතග්ගිය සංයුක්තයෙන් දහම් දෙසූ සේක. ඉන් අනතුරුව සංයුක්ත නිකායේ මහා වග්ගයෙහි ඇතුළත් අග්ගික්ඛන්ධෝපම සූත්‍රය ද මිහිඳු මාහිමියෝ දේශනා කළ සේක.

දීපා පෙරේරා



# දානය පිළිබඳ දෙවිවරු ඇසූ ප්‍රශ්න

**අප සරණ ගිය තථාගතයන් වහන්සේ සත්ථා දේවමනුස්සානං වන සේක. උන්වහන්සේ දෙවියන්ගේත්, මිනිසුන්ගේත් එකම ශාස්තෲන් වහන්සේ ය. මිනිසුන් මෙන්ම දෙවියන් ද උන්වහන්සේ සමඟ සෘජු සම්බන්ධකම් පැවැත්වූහ.**

එනිසා දිව්‍ය ලෝක යනු සංකල්පයක් නොවේ යැයි කියාදීමට එදා මිහිඳු මහරහතන් වහන්සේ ලක්දිවට වැඩම කොට පොදු ජනතාව වෙනුවෙන් දේශනා කොට වදාළ විමාන වස්තුව සහ ප්‍රේත වස්තු කතා තුළින් කර්මයේ ඇති සැබෑ ස්වභාවය මනාව පෙන්වා වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේ දිව්‍ය ලෝක නම් වශයෙන් හඳුන්වා දී ඒ ඒ දිව්‍ය ලෝකවල දෙවියන්ගේ ආයුෂ, වර්ණ, සැප, බල ආදියත් විස්තර කොට වදාළහ. විමාන වස්තුහි සම්පූර්ණයෙන් අපට මුණ ගැසෙන්නේ දෙවියන් පිළිබඳ දේශනා යි. එනිසා දිව්‍ය ලෝක තිබෙන්නේ කොහිද කියා හෝ දිව්‍ය ලෝක කතා සංකල්පයක් කියා හෝ අපට බැහැර කළ නොහැකි ය.

භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර දෙව්රම් වෙහෙරේ වැඩ වසද්දී මධ්‍යම රාත්‍රියේ මුළු දෙව්රම් වෙහෙර බබුළුවාගෙන දෙවියෙක් පැමිණ තථාගතයන් වහන්සේට වන්දනා කොට මංගල කරුණු මොනවාදැයි අසා සිටියේ ය. භාග්‍යවතුන් වහන්සේ දෙවියන්ට වදාළ මංගල කරුණු අද අප මංගල සූත්‍රය ලෙස ඉගෙන ගනිමු.

ඒ වගේම දෙවියන් පිරිහෙන කරුණු විමසූ විටදී භාග්‍යවතුන් වහන්සේ වදාළ කරුණු පිළිබඳ අද අපි පරාභව සූත්‍රය ලෙස ඉගෙන ගනිමු.

භාග්‍යවතුන් වහන්සේ සහ දෙවියන් අතර වූ බොහෝ කතාබහ දේවතා සංයුත්තයේ සඳහන් ය. එහි සාධු සූත්‍රයේදී දෙවියන් දන්දීම පිළිබඳ කී වර්ණනා අපට හමුවේ. මුළු ජේතවනාරාමය ඒකාලෝක කරගෙන බොහෝ දෙවියෝ භාග්‍යවතුන් වහන්සේ සමීපයට පැමිණ උන්වහන්සේට වන්දනා කොට මෙසේ ප්‍රකාශ කළහ.

නිදුකාණන් වහන්ස, දන්දීම කො තරම් හොඳ දෙයක් ද? බොහෝ අය මසුරුකමත්, ප්‍රමාදයත් නිසා දන් දෙන්නේ නැහැ. නමුත් පින කැමැති කෙනා පිනේ ආනිශංස දන්න කෙනා දන් දෙනවා,

එවිට අනෙක් දේවතාවා පවසනවා නිදුකාණන් වහන්ස, සමහර දෙනා ටිකක් තිබෙද්දී දන් දෙනවා. නමුත් තවත් පිරිසක් සැප සම්පත් බොහෝ තිබෙද්දීත් දන් දෙන්නේ නැහැ. ටිකක් තිබෙද්දී දෙන දානය මහා දානයක් තරම් වටිනවා.

එවිට අනෙක් දෙවියා කියනවා නිදුකාණන් වහන්ස, දන්දීම හොඳ වගේම ටිකක් තිබෙද්දී දන් දීමත් හොඳයි. නමුත් ශ්‍රද්ධාවෙන් දන් දෙන එක තමයි වඩාත් හොඳ. ස්වාමිනී දන්දීම යුද්ධයක් කරනවා වගේ වැඩක්. බොහෝ මසුරු පුද්ගලයන් පරදවා සුළු දෙනෙක් තමයි මෙය හිතන්නේ. ශ්‍රද්ධාවෙන් දන් දෙන්නේ ටික දෙනෙක් පමණයි. ඒ නිසා යි ඔවුන් පරලොව සැප ලබන්නේ.

එවිට අනෙක් දෙවියෙක් මෙසේ කීවේ ය. නිදුකාණන් වහන්ස, දන් දීම හොඳ තමයි. ටිකක් තිබෙද්දී දන් දීම හොඳයි. ඒ වගේම ශ්‍රද්ධාවෙන් දන්දීමත් හොඳයි. එලෙසම ධාර්මිකව උපයා ගත් දෙයින් දන් දෙනවා නම් එය කෙ තරම් හොඳද? යමෙක් උත්සාහයෙන්, වීර්යයෙන් හරි හම්බ කරගත් දෙය ආර්යයන් වහන්සේට පූජා කරනවා නම් ඔහු නිරය ඉක්මවා දිව්‍ය ලෝකයට යනවා.

එවිට තව දෙවි කෙනෙක් පෙනී සිට කියනවා නිදුකාණන් වහන්ස, දන් දෙන එකත්, ටිකක් තිබෙද්දී දෙන එකත්, ශ්‍රද්ධාවෙන් දෙන එකත්, ධාර්මිකව උපයාගත් දේ දෙන එකත් හොඳයි. ඒ වගේ ම විමසා බලා දන් දෙන එක වඩාත් හොඳයි. මේ සත්ත්ව ලෝකයේ දන්පැන් ලැබීමට තරම් සුදුසු වූ උතුමන් සිටිත් ද, උන්වහන්සේලාට දෙන දානය මහත්ඵල වෙනවා. එය හරියට සාරවත් කුඹුරක වී වැපිරීමක් වගෙයි. මේ ආකාරයට දන්දීම ගැන ප්‍රශංසා කළ දෙවියන් නැවත අසා සිටිනවා, භාග්‍යවතුන් වහන්ස, අප සැවොම දානය පිළිබඳව අදහස කියා සිටියා. අප අතරින් කවුරුන් කී දේ ද ඉතා යහපත් වන්නේ?

භාග්‍යවතුන් වහන්සේ වදාළා දෙවිවරුනි, ඔබ සියලු දෙනාම යහපත් දේ තමයි කියා සිටියේ. නමුත් මගේ වචනය අසන්න. ශ්‍රද්ධාවෙන් දන්දීම තමා හැම විටම ප්‍රශංසා ලබන්නේ. නමුත් දානයට වඩා ඒ අමා නිවන තමයි උතුම්. ඒ අතරින් ධර්ම දානය තමා උතුම් වන්නේ කියා වදාළ සේක.

ආදිත්ත සූත්‍රයේදී බොහෝ දෙවියන් පිරිසක් භාග්‍යවතුන් වහන්සේ ඉදිරියේ පෙනී සිට මෙසේ අසා සිටියා.

ස්වාමිනි, ජීවිතය ගිනි ගත් ගෙයක් වගේ. ගෙයක් ගිනි ගනිද්දී යම් කෙනෙක් එහි තිබෙන භාගයක් ඒ ගින්නට හසු නොවීම පිණිස බැහැරට ගෙන යනවා ද එය ඔහුගේ පසුකාලීන ප්‍රයෝජනය පිණිස පවතියි. ඒ නිවසේ වෙනයම් දේ ඇද්ද ඒ සියල්ල ගින්නට දැවී යයි. ඒ කිසිවක් ප්‍රයෝජනය පිණිස නො පවතියි.

එසේම ලෝක ස්ත්වයා ජරා මරණයෙන් ගිනි ගන්නා ලද්දේ ය. නමුත් ඒ ජරා මරණයෙන් ගිනි ගන්නා වූ ලෝක සත්ත්වයා ගෘහයෙන් යමක් බැහැර කරයිද ඒ වනාහි ඔහු විසින් දෙන ලද දානය යි. දෙන ලද දානයේ සුබඵල ලබා දෙන්නේ වෙයි.

නො දුන් දේ එසේ නොවේ. නො දුන් දේ සොරුන් ගන්නවා. රජුන් ගන්නවා. ගින්න දවනවා. නැති නම් තිබූ තැනම වනසී යනවා. එලෙසම ශරීරයත් මරණයෙන් හැර දමා යනවා. ඤාණවන්ත පුද්ගලයා මෙය දැනගෙන තමාද අනුභව කරයි. දීම ද කරයි. එලෙසම තම ශක්ති පමණින් දන් දී පීඩා රහිත ස්වර්ගයට පැමිණේ. මේ දෙවිවරු දකිනා ධර්මය යැයි දේවපුත්ත සංයුක්තයේ සඳහන් වෙයි.

ඒ වගේම කිංදද සූත්‍රයේදී දෙවියන්ට ඇති වූ ප්‍රශ්නයක් මෙසේ අසා සිටියහ. භාග්‍යවතුන් වහන්ස, කුමක් දුන්නාම ද බලය දුන්නා වෙන්නේ? කුමක් දුන්විට ද හැඩරුව දුන්නා වෙන්නේ? කුමක් දුන් විටද සැපය දුන්නා වෙන්නේ? කුමක් දුන් විටද ඇස් දුන්නා වෙන්නේ?

භාග්‍යවතුන් වහන්සේ වදාළා දෙවිය, දන්පැන් දුන් විටයි බලය දුන්නා වන්නේ. වස්ත්‍ර දුන් විට හැඩරුව දුන්නා වෙන්නේ. යාන වාහන දුන්විට සැප දුන්නා වෙනවා. ආලෝකය දුන් විට ඇස් දුන්නා වෙනවා. යම්, අයෙක් ගේ දෙර දුන්නා නම් ඔහු හැම දේ දුන්නා වෙනවා.

ඒ වගේම වාසුදත්ත කියන දෙවියා භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ අසා සිටිනවා, ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස, ආයුධයකින් පහර කෑ අයෙක් ඉක්මනට සුව වෙන්න මහන්සි වෙනවා මෙන් හිස ගිනි ගත් කෙනෙක් ඒ ගින්න නිවන්නට මහන්සි වෙනවා මෙන්, භික්ෂුව කාමරාගය ප්‍රහාණය කරන වැඩපිළිවෙළ සම්පූර්ණ කරගන්න මහන්සි විය යුතුයි නේද?

භාග්‍යවතුන් වහන්සේ වදාළා දෙවිය, ආයුධයකින් පහර කෑ කෙනෙක් එය සුවපත් කරන්න මහන්සි ගන්නවා වගේ, හිස ගිනි ගත් අයෙක් ඒ ගින්න නිවීමට මහන්සි ගන්නවා වගේ භික්ෂුව වැඩිපුර මහන්සි ගත යුත්තේ සක්කාය දිට්ඨිය ප්‍රහාණය කිරීමට යි.

මේ ආකාරයට දේවතා සංයුත්තයේ දෙවියන් පිළිබඳව විස්තර වශයෙන් සඳහන් වන අතර දිව්‍ය ලෝක පිළිබඳ ඉගෙනීමට ද අපට අවස්ථාව ඇත.



> ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ජීවිතය ගිනි ගත් ගෙයක් වගේ. ගෙයක් ගිනි ගනිද්දී යම් කෙනෙක් එහි තිබෙන භාගයක් ඒ ගින්නට හසු නොවීම පිණිස බැහැරට ගෙන යනවා ද එය ඔහුගේ පසුකාලීන ප්‍රයෝජනය පිණිස පවතියි. ඒ නිවසේ වෙන යම් දේ ඇද්ද ඒ සියල්ල ගින්නට දැවී යයි. ඒ කිසිවක් ප්‍රයෝජනය පිණිස නො පවතියි. එසේම ලෝක සත්වයා ජරා මරණයෙන් ගිනි ගන්නා ලද්දේ ය. නමුත් ඒ ජරා මරණයෙන් ගිනි ගන්නා වූ ලෝක සත්ත්වයා ගෘහයෙන් යමක් බැහැර කරයි ද ඒ වනාහි ඔහු විසින් දෙන ලද දානය යි.

නයනා නිල්මිණී

# චූලහත්ථිපදෝපම සූත්‍රය

5 පිටුවෙන්...


මෙසේ ඉතරීතර ප්‍රත්‍ය සන්තෝෂයෙන් යුතු උන්වහන්සේ පියා පත් බර පමණක් ගෙන පියාඹන ලිහිණියෙකු මෙන් පාසිවුරු පමණක් දරමින් ආර්ය ශීලයෙන් යුක්ත ව ආධ්‍යාත්මික වූ නිවැරැදි සුවය විඳියි.

එම යෝගාවචරයා ඇසින් රූප දැක ස්ත්‍රී පුරුෂාදී වශයෙන් නිමිති නොගනී. අත් පා ආදී අවයවයන්ගේ ආකාරය නොදනී. මෙසේ චක්ෂුරාදී ඉන්ද්‍රිය සංවරයෙන් යුක්ත වෙයි. ආධ්‍යාත්මික වූ කෙලෙසුන් නොවැගිරෙන්නා වූ සැපය විඳියි. හෙතෙම ඉදිරියට යාමෙහි, පෙරළා ඒමෙහි මැනවින් දැන කරන සුලු (සම්පජානකාරී) වෙයි. මෙසේ අභික්කන්ත පටික්කන්ත ආදී සත් තැන්හි ආර්ය සති සම්පජඤ්ඤයෙන් යුක්ත වෙයි.

අනතුරුව ඒ යෝගාවචරයා ජන ශූන්‍ය වූ ආරණ්‍ය වෘක්ෂ මූල ආදී විවේක ස්ථානයක ඌරු බද්ධාසනයෙන් හිඳ කය සෘජු කොට තබා සිහිය කර්මස්ථානාභිමුඛ කොට හිඳියි. පඤ්ච උපාදනස්කන්ධයන්හි රාගය දුරු කොට අභිධ්‍යාවෙන් සිත පිරිසුදු කරයි. එලෙසින්ම ව්‍යාපාද, ථීන මිද්ද, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්ඡා යන ප්‍රඥාව දුර්වල කරන පංචනීවරණයන් දුරු කොට කාමයන්ගෙන් වෙන්ව ම විතර්ක විචාර ප්‍රීති, සුඛ සහිත ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කරයි.

මෙම ප්‍රථ ම ධ්‍යානය තථාගතයන් වහන්සේගේ ඥාණයෙන් යටපත් කළ ඥාණ පදය යයි ද, ඥාණ නමැති ඉළ ඇට ගැටුණු තැන (තථාගත නිසෙවිතං) ඥාණ නමැති දළයෙන් සිඳී තැන. (තථාගත රඤ්ජිතං) යැයි ද කියනු ලැබේ.

ආර්ය ශ්‍රාවකයා එපමණකින් භාග්‍යවතුන් වහන්සේ සම්මා සම්බුද්ධ ය, දෙසූ ධර්මය ස්වාක්ඛාත ය, ශ්‍රාවක සංඝයා සුපටිපන්න යැයි නිගමනයට නොපැමිණේ ම ය. නැවත ද යෝගාවචර මහණ තෙමේ ද්විතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි. තෘතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි. චතුර්ථ ධ්‍යානයට පැමිණ වාසය කරයි. එය තථාගත පද තථාගත නිසේවිත තථාගත රඤ්ජිත යැයි කියනු ලැබේ. එනමුත්, ආර්ය ශ්‍රාවකයා එපමණකින් තෙරුවන් කෙරේ නිශ්චයට නොපැමිණේ ම ය.



යෝගාවචර මහණ තෙමේ මෙසේ පිරිසුදු වූ ප්‍රභාස්වර වූ අංගණ රහිත වූ පහ වූ කෙලෙස් ඇති කර්මයට යෝග්‍ය වූ ස්ථිති ප්‍රාප්ත වූ නොසැලෙන බවට පත් වූ සමාහිත සිත චතුර්ථධ්‍යානලාභී යෝගාවචරයා පුබ්බේ නිවාසානුස්සති ඥාණය හෙවත් පෙර විසූ කඳ පිළිවෙළ දන්නා නුවණ පිණිස සිත නැඹුරු කරයි. එපමණකින් තෙරුවන් කෙරේ නිශ්චයට නොපැමිණේම ය.

අනතුරුව චුතූපපාත ඥාණය හෙවත් සත්ත්වයන්ගේ චුති උත්පත්ති දන්නා නුවණ පිණිස සිත නැඹුරු කරයි. නමුත් ආර්ය ශ්‍රාවකයා එපමණකින් තෙරුවන් කෙරෙහි නිශ්චයට නොපැමිණේම ය. ධ්‍යාන අභිඥාවන් බාහිර ශාසනයන්හි ද පවතින හෙයිනි. අනතුරු ව ආසවක්ඛයකර ඥාණය පිණිස සිත නැඹුරු කරයි. දුක්ඛ, දුක්ඛ සමුදය, දුක්ඛ නිරෝධ, දුක්ඛ නිරෝධ ගාමිණී පටිපද යන චතුරාර්ය සත්‍ය තත් වූ පරිදි යථාභූත වශයෙන් දැන ගනී. ආසව, ආසව සමුදය, ආසව නිරෝධ, ආසව නිරෝධ ගාමිණී පටිපදව ද තත් වූ පරිදි දැන ගනී. බ්‍රාහ්මණය, මෙයද තථාගත පද, තථාගත නිසේවිත, තථාගත රඤ්ජිත යැයි කියනු ලැබේ. ආර්ය ශ්‍රාවකයා එපමණකින් තෙරුවන් කෙරේ නිශ්චයට නොපැමිණියේ ම ය. මේ ධ්‍යානාභිඥාවන් බාහිර ශාසනයන්හි ද පවත්නා හෙයිනි.

එහෙත්, මාර්ග ඥාණයෙහි දී මහා හස්තියා දක්නා වූ හස්ති ශිල්පියා මෙන් භාග්‍යවතුන් වහන්සේ සම්මා සම්බුද්ධය යනාදී අයුරින් තෙරුවන් කෙරෙහි නිශ්චයට පැමිණෙයි.

දැන් යෝගාවචර මහණහුගේ සිත කාම ආස්‍රවයෙන් ද, භවාස්‍රවයෙන් ද, අවිද්‍යාස්‍රවයෙන් ද මිදෙයි. අර්හත් මාර්ග ඥාණයෙන් තෙරුවන් නිශ්චය කළේ අර්හත් ඵල ක්ෂණයෙහි සියලු කෘත්‍ය අවසන් කළ හෙයින් සර්වප්‍රකාරයෙන් රත්නත්‍රයෙහි නිශ්යට පැමිණියේ ය. බ්‍රාහ්මණය මෙතෙකින් ඇත් පිය උපමාව සම්පූර්ණ වේ යැයි වදාළ සේක.

මෙසේ වදාළ කල්හි ජාණුස්සෝණී බ්‍රාහ්මණයා බුදුරජාණන් වහන්සේට මුණ නොගැහෙන අයුරින් ප්‍රශංසා කොට මම අද පටන් දිවිහිමියෙන් බුද්ධ, ධම්ම, සංඝ රත්නය සරණ යන බවට ප්‍රතිඥා කළේ ය. උපාසක භාවයට ද පැමිණියේ ය.

පොසොන් සඳින් රැස් දහරින්
රට, දැය සුවපත් වේවා!



59 වන ලේක්හවුස් - මිහින්තලා ආලෝක පූජාව වෙනුවෙන්
අපිද සුබ පැතුම් ගෙන එමු...

සී/ස කුරුණෑගල වැවිලි සමාගම
පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධන හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය

අප දුෂ්කර නොදියුණු විහාරස්ථානයට දාගැබක්, විහාර ගෙයක්, දානශාලාවක් කුස්සියක් හා වැසිකිළි පද්ධතියක් අවශ්‍යයි. උපකාර කරන්න.
075-5157475

විහාරස්ථානයක් සොයනු ලැබේ.
078-1720814

2021 වසර කඨිණ පිංකම සඳහා
අනුග්‍රාහක පිංවතුන් අවශ්‍යයි.
075-5157475

ලුම්බිණි
රෙ:නො: W5510




විශ්වාසවත්, පිරිසිදුවත්, විනයානුකූලවත්, අටපිරිකරක් ලබා ගැනීමට ලුම්බිණි වෙළඳසැල වෙතම යන්න.
අටපිරිකර සහ පූජා භාණ්ඩ ප්‍රමුඛයෝ
ලුම්බිණි ස්ටෝර්ස්
65, ඕල්කට් මාවත, පිටකොටුව
දුරකථනය: 2324814

දුෂ්කර නොදියුණු විහාරස්ථානයකට
උදව් කරන්න.
පිණ්ඩපාතයද හිඟයි.
075-5157475

මහා පිං
* සතර අපායෙන් මිදී, සුගති මගට නිවන් මගට පිවිසෙන්න දහම් නැණ වඩා ගන්න.
ධර්ම දානය නොමිලේ !
* ගවයන් නිදහස් කිරීමේ මහා අභය දානයට ඔබත් දායක වන්න.
දු. ක. 071-7679254

සතර පෝදා එළිදකින සදහම් ප්‍රදීපය
බුදුසරණ



# අවස්ථා හා පහසුකම් සපයා දී දරුවන්ගේ ආරක්ෂාව ගැන සැලකිලිමත්වන්න



කොළඹ විශාඛා විද්‍යාලයීය විදුහල්පතිනි
සඳමාලි අව්රුප්පොළ

**කොවිඩ් 19 වසංගත රෝග තත්ත්වයත් සමඟ අපේ දරුවන්ට මුහුණ දෙන්නට සිදු වූයේ දැඩි අසීරු තත්ත්වයකටයි. දරුවන් නිවෙස්වලට සිරවීම තුළත්, පන්ති කාමරය තුළ ලැබූ අධ්‍යාපන කටයුතු දුරස්ථ අධ්‍යාපනක්‍රම ඔස්සේ ලබා ගැනීම තුළත් බොහෝ දරුවන්ට විවිධ අපහසුතාවන්ට මුහුණ දීමට සිදුවිය හැකියි. ඒ වගේම ඇතැම් දරුවන් කායික මානසික පීඩාකාරී තත්ත්වයන්ට පත්විය හැකියි. මෙවැනි වාතාවරණයක් තුළ දරුවන්ගේ කායික මානසික සමබරතාව රැක ගනිමින් යහපත් පුරවැසියන් ලෙස ඔවුන් සමාජගත කිරීම සඳහා මව්පිය, ගුරුවර, වැඩිහිටියන්ගේ කාර්ය භාරය පිළිබඳව කොළඹ විශාඛා විද්‍යාලයීය විදුහල්පතිනි සඳමාලි අව්රුප්පොළ ගුරුමහත්මිය සමඟ කළ සාකච්ඡාවකි.**

**බෞද්ධ අධ්‍යාපන ක්‍රමවේදය තුළ අතීතයේ ගුණ නැණ බෙලෙන් යුතු දරුවන් සමාජගත කිරීමට ප්‍රමුඛත්වය ලැබුණා. තරගකාරී අධ්‍යාපන රටාව තුළ දැන් දැන් ගුණ අමතක කොට නැණ පමණක් ලබා දෙන්නට උනන්දුවන බව බොහෝවිට දකින්නට ලැබෙනවා. මිනිසාගේ පරම වස්තුව 'දරුවන්' බවයි බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළේ. එම දරුවන් යහපත් සමාජ සාමාජිකයින් ලෙස අනාගතයට හැඩගැස්වීමෙහි ලා වැඩිහිටියන්ට පැවරෙන වගකීම කෙබඳු ද?**

"පුත්තා වත්ථු මනුස්සානං" මෙය බුද්ධ දේශනාවේ එන්නක්. මේ උතුම් වස්තුව, දරුවන් යහ පුරවැසියන් ලෙස සමාජගත කිරීමේ දී අපට පැවරෙන වගකීම සංකීර්ණ එකක්. දරුවකු යහ පුරවැසියකු වන්නේ පුද්ගලයකු ලෙස සෑම අංශයකින් ම සංවර්ධනය වූ විටයි. එවිට තමයි "පරිපූර්ණ පුරවැසියකු" බිහිවන්නේ. අධ්‍යාපන සංවර්ධනය, බුද්ධි සංවර්ධනය, කායික සංවර්ධනය, චිත්තවේග සංවර්ධනය, සදාචාර සංවර්ධනය, මානසික සංවර්ධනය, සෞන්දර්යාත්මක සංවර්ධනය, ආධ්‍යාත්මික සංවර්ධනය ආදිය මෙවැනි විවිධ වූ අංශයි. දරුවන් විධිමත් ව හෝ අවිධිමත් ව, දැන හෝ නොදැන ඉගෙන ගැනීම සිදු කරන්නේ ඔවුන්ට ලැබෙන අත්දැකීම් ඔස්සේ යි. එනිසා විධිමත් ඉගැන්වීමේ දී වගේම ඉන් ඔබ්බට ගිය අවිධිමත් ඉගැන්වීමේදීත්, සමාජ ඉගැන්වීමේ දී ත්, පරිසර අත්දැකීම් ලබා ගැනීමේ දී ත් ඉහත කී සෑම අංශයක ම සංවර්ධනය සිදුවන විදිහේ අත්දැකීම් ලබා දෙන්නට අප උනන්දු විය යුතුයි.

ඉගෙනුමෙන් ඉහළටම ගිහින් උසස් පෙළ ඒ සාමාර්ථ තුනක් ලබාගත් ළමයකු එළිමහනේ ඉන්නවිට ළඟ තියෙන ගහක කොළ කඩා දානවා නම්, තමන්ගේ ටොෆි කොලේ පාරට දානවා නම්, දුරකථන කාඩ්පත් (Phone Card) හූරලා ඉන්න තැනම විසි කරනවා නම් ඔහුට/ ඇයට යහ පුරවැසියකු ලෙස සමාජගත වීම අපහසු වෙනවා. හේතුව නම් ඉහත කී අංශවල සමස්ත සංවර්ධනය වී නැති නිසයි.

**එම අත්දැකීම් ලබාදීමේ දී මවුපියන්, ගුරුවරුන්, 'ළමයා' කවුද යන්න මැනවින් තේරුම් ගෙන සිටීමේ වැදගත්කම පිළිබඳව පැහැදිලි කිරීමක් කළ හැකිද?**

අද දවසේ 'ළමයා' තමයි හෙට දවසේ පුරවැසියා වෙන්නේ. දෙමාපියන් ගුරුවරුන් ළඟ තමයි අද දවසේ දරුවා හැදී වැඩෙන්නේ, ගුරුහරුකම් ලබන්නේ. එනිසා 'ළමයා' කවුදැයි නිවැරැදිව තේරුම් ගැනීම අනාගතයට සෘජුවම බලපාන කාරණයක්. ආභාග්‍යයට කාරණය තමයි 'ළමයා' හරිහැටි හඳුනා ගන්නට දෙමාපිය, වැඩිහිටි කණ්ඩායමෙන් බොහෝ දෙනා අපොහොසත් වීම.

ළමයා තුළින් පුංචි වැඩිහිටියකු අපේක්ෂා කිරීම හානිකර දෙයක්. ළමයාට අප විසින් කළ යුත්තේ මඟ පෙන්වීම, රැකුල් සැපයීම පමණයි. අවස්ථා සහ පහසුකම් සපයා දී ආරක්ෂාව ගැන සෝදිසියෙන් සිටීම තමයි වැදගත් වන්නේ. එවිට ළමයා නිදහසේ පරිසරය, සමාජය හා ගැටෙමින් අත්දැකීම් උපයා ගන්නවා.

නමුත් බොහෝ වැඩිහිටියන් තමන්ට කරන්නට බැරි වුණු දේ ළමයින්ගෙන් බලාපොරොත්තු වෙනවා. බොහෝ දෙමාපියන් තමන්ගේ සිහින දරුවන් ලවා සැබෑ කරවා ගන්නට උත්සාහ කරනවා. මෙහෙම වෙන්නේ 'ළමයා' කවුදැයි හරියට තේරුම් නොගත් නිසා

හැකි සෑම විටෙකම ළමයා හදන්නට නොගොස් හැදෙන්නට දෙනවා නම් අපට කැමති දේ නොව ළමයා කැමති දේ ගැන අපේ අවධානය යොමු කරනවා නම් ළමයා යොදවා කරන්න යන ඕනෑම දෙයක දී "මම මේ වයසේ හිටියා නම් මේ දෙය කරන්න කැමති වෙයි ද?" කියලා හිතන්න පුළුවන්නම්, ළමයා හඳුනා ගන්න, තේරුම් ගන්න පහසු වෙනවා.

**වෙනද පාසල තුළ, ගුරු ඇසුරේ, යහළුවන් අතරේ ගත කළ කාලය වර්තමානයේ ගෙදරට සීමාවීම තුළ ළමයින් පීඩාකාරී වීම වැළැක්විය නොහැකියි. ආගමික පසුබිමක් තුළ මේ තත්ත්වය මඟ හැරවීමට කටයුතු කළ හැකි ද?**

ගෝලීය වසංගතය හේතුවෙන් මතු වූ මේ අනපේක්ෂිත තත්ත්වය තුළ අධ්‍යාපන ක්‍රියාවලියත් නව මුහුණුවරක් ගත්තා. ඒ අනුව මාර්ගගත අධ්‍යාපනය, දුරස්ථ අධ්‍යාපනය ආදියට හුරුවන්නට ශිෂ්‍ය ප්‍රජාවට සිදු වුණා. ඉගෙනුම සඳහාම වෙන් වුණු පාසල් පරිසරය තුළ ගුරුවරුන්, සම වයසේ ශිෂ්‍යයන් ඇසුරේ ලබා ගන්නා ඉගෙනුම් අත්දැකීම දරුවන්ට භෞතික ව අහිමි වුණා, නිවසටම සීමා වී සිටින්නටත් සිදුවුණා. කුමන වයසක දරුවකුට වුවත් දීර්ඝ කාලයක් මෙවැනි පරිසරයක ගත කිරීමේ දී පීඩාකාරී මානසික තත්ත්ව ඇති වන්නට පුළුවන්. අද දරුවාට භෞතිකව ගනුදෙනු කළ හැක්කේ තම පවුලේ සාමාජිකයන් සමඟ පමණ යි. එනිසා මෙතැනදී පවුල යන කුඩාම සමාජ ඒකකය තුළ මනා ආගමික පසුබිමක් පවත්වාගෙන යා හැකි නම් හොඳයි. මාර්ගගත ඉගැන්වීමේ දී පවා දරුවන්ගේ ආධ්‍යාත්මික හා සදාචාර සංවර්ධනය ගොඩනැගෙන ලෙස ඉගැන්වීම් කටයුතු සිදු කරන්නට ගුරුවරුන්ට මාර්ගෝපදේශ සපයා තිබෙනවා.

කිනම් ආගමක් ඇදහුවත් පවුල තුළ දෛනික ආගමික පිළිවෙත් ඉටු කිරීම වැදගත්. දරුවන් නිවසේ ම සිටින නිසා පෙරදීට වඩා ඒ සඳහා ඔවුන්ගේ සහයෝගය, සහභාගීත්වය ලබා ගත හැකියි. සතිමත් බව ඉගෙනීම් කටයුතුවලට හොඳ මානසික වාතාවරණයක් සලසා දෙනවා. එනිසා සතිමත් බව වඩන අභ්‍යාසවල යෙදීමට යොමු කිරීමත් හොඳ දෙයක්.

ඕනෑම ආගමක දරුවකුට තම ආගමික ඉගැන්වීමට අනුව භාවනාව, සිත එකඟ කර ගැනීම සිදුකළ හැකියි. ළමා මනස තුළ නිහඬ බව, සාමය වර්ධනයට භාවනාව මනා පිටිවහලක්.

එබැවින් දරුවන් තුළ මානසික පීඩන තත්වයක් මතු වී ඇති මෙවැනි වකවානුවක නිවස තුළ ආගමික පසුබිමක් ගොඩ නැගීමෙන් දරුවනට ඉගෙනුම පහසු කර, මතකය වඩවා නිරෝගී සෞඛ්‍යමත් ශරීරයක් ද ලබා දීමට උදව් කළ හැකියි.

**වෙනදා දුරකතනය, පරිගණකය ළමයින්ට සීමා වෙලයි තිබුණේ. දුරස්ථ අධ්‍යාපනය නිසා මේ මෙවලම් අනිවාර්ය වී තිබෙනවා. මෙවැනි භාවිත කිරීම් හමුවේ මව්පියන්ට දරුවන් පිළිබඳ ඇති වගකීම කෙබඳු ද?**

වසංගතය එන්නට කලින් පාසල්වල තිබුණේ ශිෂ්‍යයන්ට පාසල තුළ ජංගම දුරකථන භාවිතය සම්පූර්ණයෙන් තහනම් තත්ත්වයක්. මෙය චක්‍රලේඛන ගත උපදෙසක්. නිවසේ දී වුවත් ඉහළ ශ්‍රේණිවල ශිෂ්‍යයන් පවා ජංගම දුරකථනවලින් ඈත් කර තබන ලෙසටයි, අපි දෙමාපියන්ටත් උපදෙස් දුන්නේ. නමුත් අද තත්ත්වය හාත්පසින් ම වෙනස්. වයස් භේදයක් නැතිව ජංගම දුරකතනය, ටැබ් පරිගණකය, උකුල් පරිගණකය (Laptop) ආදිය හැම දරුවකුටම භාවිත කරන්නට සිදුවෙලා. අද වන විට දරුවන් කුමන හෝ ආකාරයක device ඉදිරියේ ගත කරන කාලය දෙවැනි වන්නේ ඔවුන් නිදා ගන්නා කාලයට පමණයි.

දුරකථන පරිගණක ආදී සියල්ලටම පහසු අන්තර්ජාල සබඳතා තියෙනවා. අන්තර්ජාලය අති විශාල දැනුම් හා දත්ත සමුදායකට පහසු පිවිසුමක් වගේම ඉතා වේගයෙන් අදහස් හුවමාරු කරගත හැකි වේදිකාවක්. මෙම අධිවේගී දැනුම් ආකරයේ ප්‍රයෝජනය ඉගෙනීමට අතිශය වැදගත්. අන්තර්ජාලයේ ස්වයං ඉගෙනුම් අවස්ථා ඇති තරම් තියෙනවා. එනිසා දරුවන්ට තමන් නොදන්නා ඕනෑම දෙයක් ඉගෙන ගැනීමට හැකියි. ඇත්තටම මේ උපකරණ නොතිබුණා නම් වසංගත තත්ත්වයේ දී දරුවන්ගේ අධ්‍යාපනය කෙසේ වේවිදැයි සිතන්නත් අමාරුයි.

ඉතිරිය 51 පිටුවට ...



50 පිටුවෙන්...

ඕනෑම දෙයක භාවිත සීමාවන් තියෙනවානේ. ඇත්තටම දරුවෝ මෙම උපකරණ අවභාවිතය නිසා තමයි අයහපත් ප්‍රතිඵල ඇතිවන්නේ. අධික ලෙස වීඩියෝ ක්‍රීඩාවල යෙදීම, දවස පුරා චිත්‍රපට, කාටූන්, විනෝදජනක අවස්ථා, ත්‍රාසජනක දේ නැරඹීම නොකළ යුතු දෙයක්. අන්තර්ජාලය හරහා ඉතා පහසුවෙන් වෙළෙඳ ප්‍රචාරණවලට ද නිරාවරණය විය හැකියි. මේ සියල්ල වැඩෙන ළමා මනසට අහිතකරයි. ඇතැම් දරුවන් අන්තර්ජාලයට ඇබ්බැහි වීම නිසා වෙනත් කිසි දෙයකට යොමු නොවීම, ඉගෙනීම, පවුල් සබඳතා, මිත්‍ර සබඳතා වැනි අන් සියලු දේ අතපසු කිරීමක් දැකිය හැකියි. ඒ නිසා,

**දෙමව්පියන් වශයෙන්,**

- පාසල් ශිෂ්‍යයකු වශයෙන් තමන්ට නරඹන්නට නුසුදුසු දේ නොබැලීමටත්, ප්‍රතික්ෂේප කිරීමටත් ශක්තියක් සෑම දරුවකු තුළම ගොඩනගන්න.
- සමාජ මාධ්‍ය තුළදී දැනගත්, නාඳුනන අයගේ මිත්‍රශීලී ඇසුර පිළිගැනීමෙන් වැළකීමට දරුවාට කියා දෙන්න.
- තම ඡායාරූප වීඩියෝ ආදිය සමාජ ජාලාවලට එකතු නොකිරීමට දරුවා දැනුවත් කරන්න.
- ඔබේ දරුවා මධ්‍යම රාත්‍රියේදීත් අන්තර්ජාලය භාවිත කරයි නම්, ඔබ ළඟින් යන විට පරිගණක තිරය මාරු කරනවා නම් ඒ ගැන සොයා බලන්න.
- කුඩා දරුවන්ට වැඩිහිටියන් සඳහා වන ත්‍රාසජනක ක්‍රීඩා අත්හදා බැලීමට ඉඩ නොදෙන්න.
- දරුවන් බලන වැඩසටහන් ගැන නිතර දරුවන් සමග සුහදව කතාබහක යෙදෙන්න.
- නිවසේ සාලය වැනි පොදු තැනක පරිගණකය තබන්න

## ළමයින් අනවශ්‍ය ඇබ්බැහිවීම්වලින් වළක්වා ගන්නට මවුපියන්ගේ කාර්යය කෙබඳු ද?

'ඇබ්බැහිය' ප්‍රධාන හැසිරීමේ ගැටලුවක් යම් දෙයකට ඇබ්බැහි වූවකුගේ ලක්ෂණ හඳුනා ගැනීම ඇබ්බැහියෙන් වළක්වා ගැනීම් කාර්යභාරයට උදව් වෙනවා. එම ලක්ෂණ නම්, භාවිතයට ඇති දැඩි ආශාව,භාවිතය ආරම්භ කළ පසු නතර කළ නොහැකි වීම,ක්‍රමයෙන් භාවිතය වැඩි වීම,භාවිතයෙන් ඉවත් වූ මොහොතේ පටන් නුරුස්නා බවක් / දැඩි අපහසුතාවයක් ඇතිීම වෙනත් දේවල් කිරීමෙන් සතුටක් නොලැබීම, ඉගෙනීම, පවුල් සබඳතා, මිත්‍ර සබඳතා වැනි අන් සියලු කටයුතු අතපසු කිරීම පෙන්වා දිය හැකියි.

හැබැයි මෙහිදී දෙමාපියෝ හොඳින් අවධානය යොමු කළ යුතුයි, මේ දවස්වල අප වැඩිපුරම සැකකරන අන්තර්ජාල භාවිතය, වීඩියෝ ක්‍රීඩා නැරඹීම ආදිය ඇබ්බැහිවීමක් ලෙස සලකන්නේ එය ජීවිතයට බලපෑම් කරන්නේ නම් පමණක් බව.

තම දරුවා මොනම කටයුත්තක් කෙරෙහි මුලින් කී ලක්ෂණ කාලයත් සමඟ පෙන්වනවා නම් දෙමාපියන් ඒ පිළිබඳ සැලකිලිමත් විය යුතුයි. ඉන්පසු දරුවා සමඟ සුහදශීලී ව සාකච්ඡා කර ක්‍රම ක්‍රමයෙන් සිය ඇබ්බැහිවීම කවරක්දැයි වටහා ගැනීමට දරුවාට අවස්ථාව සලසා දිය යුතුයි. විශේෂයෙන් ඒ කාලය තුළ අතපසු වූ දේවල් ඉගෙනීම, පවුල් සබඳතා, ආදරය ආදියේ වටිනාකම ඔහුටම අවබෝධ වීමට ඉඩ සැලසිය යුතුයි. මෙහිදී සිය ඇබ්බැහිය වටහා ගන්න බොහෝ තරුණ දරුවන්ට නම් තනිවම ඉන් මිදීමට හැකියි. එසේ නොහැකි කොටසට සිය ඇබ්බැහියෙන් මිදීමට අනුබල දීම මව්පියන් විසින් කළ යුතුයි.

කුඩා දරුවන් පෙන්වන ඇබ්බැහිවල දී නම් දරුවා අසල ගැවසී, අධීක්ෂණයෙන්, අවස්ථා අවම කිරීමෙන්, ආදරය දැක්වීමෙන් මෙම අවස්ථා මගහරවා ගත හැකියි.

තරුණ වියේ දරුවන් සමඟ නම් වාද නොකර විවෘත සංවාදයේ යෙදීමෙන් යහමඟ පෙන්වීම වැදගත්. මෙහිදී දරුවාට සිය අනාගත සාර්ථකත්වය ළඟා කර ගැනීමට ඇති හැකියාවන් සහ දුර්වලතා පෙන්වා දීමට සුදුසුයි. පොදුවේ ජීවිතය ගැන අනාගතය ගැන කතා කිරීම වැදගත්.

ඇබ්බැහි වීමේ චර්යාව වෙනුවෙන් යොදවන කාලය යෙදවීමට වෙනත් අවස්ථා පවුල තුළ නිර්මාණය කරදිය යුතුයි. එම අවස්ථාවල දී දරුවාගේ සහයෝගය වැඩිපුර අගය කිරීමටත් ඉදිරිපත් විය යුතුයි. එවිට දරුවා ක්‍රම ක්‍රමයෙන් එම හැසිරීම් රටාවෙන් මුදවා ගත හැකි වෙනවා.

> අද අපි මුහුණපාලා තියෙන තත්ත්වය හැමෝටම අභියෝගයක්. ජාතියක් විදිහට අපි අභියෝග සාර්ථකව ජයගත් අවස්ථා එමටයි. ඉතින් හැම දරුවෙක්ම මේ වෙලාවේ තම අනාගතය ගැන දැඩි අධිෂ්ඨානයක් ගොඩනඟා ගන්නට අවශ්‍යයි. ගෙදරටම වී සිටියත් මේ ගෙවෙන්නේ ඔබගේ වටිනා පාසල් කාලය. ජීවිතයේ සුන්දරම කාලය. ඒ හින්දා අධ්‍යාපන කටයුතු වෙත පමණක් තමන්ගේ අවධානය යොමු කිරීම වැදගත්. පැහැදිලි ඉලක්ක, අරමුණු ගොඩනඟාගෙන ලැබී ඇති කාලයෙන් උපරිම ප්‍රයෝජන ලබාගෙන සාර්ථකව ජීවිතය ගොඩනඟා ගැනීමයි වැදගත් වෙන්නේ.

## පාසල් අධ්‍යාපනයට සමගාමී ව දුරස්ථ අධ්‍යාපනය සාර්ථක ද? උපරිම ඵල නෙළා ගන්නට කළ හැකි දේ කුමක් ද?

මුල් අවධියේ ඒ කියන්නේ පසුගිය වසරේ තිබූ තත්වයට වඩා අද වන විට දුරස්ථ අධ්‍යාපනය සාර්ථකයි. නමුත් සියයට සියයක් නෙමෙයි. මේ වන විට ගුරුවරුන් සහ ළමයින් මේ ක්‍රමයට හැඩගැසී තියෙනවා. නමුත් උපරිම පල නෙළා ගැනීමට හැකි වී නැහැ.

ප්‍රධාන ගැටලුව තමයි ලංකාවේ සමස්ත ශිෂ්‍ය ප්‍රජාව ආවරණය කරන්නට මාර්ග ගත අධ්‍යාපනයට නොහැකි වීම. සෑම ශිෂ්‍යයකුට ම අවශ්‍ය පහසුකම් නැහැ. විවිධ තාක්ෂණික බාධාවන් ද තිබෙනවා.

ජංගම දුරකතන, පරිගණක, අන්තර්ජාල සම්බන්ධතා මේ කිසිවක් නොමැති දරුවන් කොටසක් මේ රටේ ඉන්නවා. ඔවුන්ටත් අධ්‍යාපන අයිතිය තියෙනවා. ඒ නිසා ඔවුන් ගිලිහෙන්නට දෙන්න බැහැ. මේ වැඩසටහන සාර්ථක කර ගන්න නම් කෙසේ හෝ මෙම අපහසුතා සහිත ශිෂ්‍ය ප්‍රජාවට අවශ්‍ය පහසුකම් ලබා දී මාර්ගගත අධ්‍යාපනය සඳහා ප්‍රවේශ අවස්ථාවක් ගොඩනැගිය යුතුමයි.

## දුරස්ථ අධ්‍යාපන පහසුකම් නැති දරුවන්ගේ ගැටලු විසඳ ගන්නේ කෙසේ ද?

එවැනි දරුවන්ට අවශ්‍ය පහසුකම් ලබා දීමට තමයි මූලිකත්වය දෙන්න ඕනෙ. රටක් වශයෙන් එය යෝධ සංවර්ධන පියවරක්, අනාගත ආයෝජනයක් වෙනවා. අද ලෝකයේ තාක්ෂණික ඉදිරි ගමන වේගවත්. වසංගතය නිමවෙලා පාසල් යළි ආරම්භ වුණත් මාර්ගගත ක්‍රමයෙන් දරුවන්ට ලැබෙන අධ්‍යාපන අවස්ථා ලබා දිය යුතුමයි.

දැනට දුරස්ථ අධ්‍යාපන පහසුකම් නැති දරුවන් මේ දීර්ඝ නිවාඩු කාලය තුළ අධ්‍යාපන ක්‍රියාවලියේ රඳවා තබා ගැනීමයි වැදගත් වෙන්නේ. මෙහිදී මව්පියන්ට, පවුලේ අයට වැඩි වගකීමක් තියෙනවා. දරුවා ළඟ පෙළ පොත් සහ විවිධ අතිරේක කියවීම් ද්‍රව්‍ය තියෙනවා. එනිසා පෙළපොත පරිශීලනය කරමින් නිදහසේ විෂයය කරුණු ගොඩනගා ගන්නට දරුවාට පවුලේ අය උදව් කළ යුතුයි.

## දුරස්ථ අධ්‍යාපනය තුළ දරුවන් ආගමික පරිසරයට නැඹුරු කිරීමෙහිලා පාසල්වලට කළ හැකි කාර්යභාරය කුමක්ද?

විධිමත් පාසල ආරම්භ වෙන්නේ උදෑසන ආගමික වැඩසටහනෙන්. දැන් දරුවන්ට උදෑසන පාසල් සංස්කෘතිය අහිමි වෙලා. එනිසා සිය මාර්ගගත අධ්‍යාපන කටයුතු ආරම්භයට පෙර පාසලේ උදා ආගමික වැඩසටහනට ළමයින් මාර්ගගත ව සම්බන්ධ කිරීම හොඳයි.

ඒ සමගම ආධ්‍යාත්මික යහපැවැත්ම උදෙසා පාසල තුළ ක්‍රියාත්මක වන වැඩසටහන් රාශියක් තියෙනවා. පෙර පෝදා ධර්ම දේශනය, ධර්ම සාකච්ඡා, භාවනා වැඩසටහන්, බොදු ගීත, සති පාසල ආදිය එවැනි වැඩසටහන්. මේවා මාර්ගගත ව දරුවන්ට සම්බන්ධ කරදීම වැදගත්. දැනටමත් බොහෝ පාසල්වල මෙම වැඩසටහන් මාර්ගගතව ක්‍රියාත්මක කරනවා.

අධ්‍යාපන කටයුතු අතර මේවාට සම්බන්ධ වීම ඔස්සේ දරුවන් ආගමික පරිසරයට නැඹුරු කරගත හැකියි.

## පවතින වසංගත රෝග තත්ත්වය තුළ බොහෝ වැඩිහිටියන් නිවෙස තුළම රැඳී සිටීම නිසා ගෘහස්ථ හිංසනය වැඩිවීම පිළිබඳවත් කතාබහට ලක් කෙරෙනවා. මෙවැනි වාතාවරණයක් තුළ වැඩිපුරම අසරණ වන්නේ අපේ දරුවන් නේද?

ශාරීරිකව හෝ මානසිකව දරුවකු හිංසනයට ලක් කිරීම කිසිවිටෙක නොකළ යුත්තක්. විශේෂයෙන් මේ දිනවල හුරුපුරුදු පාසල් පරිසරයෙන් ඈත්වීම නිසා දරුවන් කොහොමටත් නොසන්සුන් අවදියක් තමයි ගත කරන්නේ. නිවස තුළ පරිසරය ඒකාකාරියි. දරුවාගේ වර්ධනය, සංවර්ධනය සමඟ මතුවන විභවතා අවශෝෂණය කරගත හැකි සමතුලිත මනෝ සමාජයීය පරිසරයක් පාසලේ තියෙනවා. නමුත් ගෙදරදී සිය ක්‍රියාකාරකම්, සිතුවිලි ක්‍රියාත්මක කිරීමට විවිධ සීමා පවතින නිසා දරුවන් හුදකලාවීම්වලට ලක්වන්නට පුලුවනි.

මෙබඳු තත්වයක දී දරුවා ගෘහස්ත හිංසනයටත් ලක්වුව හොත් කායික ව මෙන්ම මානසික ව ද දැඩි අසරණ බවකට ලක්වෙන්නට පුළුවන්.

මේ වසරේ උසස් පෙළ ලියන්න ඉන්න දරුවකුට ගෙදරදී දකින හැම වෙලාවකම අම්මා / තාත්තා "පුතේ පාඩම් කරන්න" කියලා කියනවා නම්, ඒක ඒ දරුවාට හිංසනයක්. එනිසා හැම දෙමවුපියෝ ම දඬුවම, හිංසනය වැනි දේ බැහැර කරලා දයාව, කරුණාව, ආදරය රැකවරණය පෙන්වීමෙන් දරුවන් යහමඟට ගන්නට උත්සාහ කළ යුතුයි.

## විදුහල්පතිනියක, ගුරු මවක ලෙස ඔබතුමිය මේ අවස්ථාවේ දරු පරපුරට දෙන පණිවිඩය කුමක්ද?

අද අපි මුහුණපාලා තියෙන තත්ත්වය හැමෝටම අභියෝගයක්. ජාතියක් විදිහට අපි අභියෝග සාර්ථකව ජයගත් අවස්ථා එමටයි. ඉතින් හැම දරුවෙක්ම මේ වෙලාවේ තම අනාගතය ගැන දැඩි අධිෂ්ඨානයක් ගොඩනගා ගන්නට අවශ්‍යයි. ගෙදරටම වී සිටියත් මේ ගෙවෙන්නේ ඔබගේ වටිනා පාසල් කාලය. ජීවිතයේ සුන්දරම කාලය. ඒ හින්දා අධ්‍යාපන කටයුතු වෙත පමණක් තමන්ගේ අවධානය යොමු කිරීම වැදගත්.

පැහැදිලි ඉලක්ක, අරමුණු ගොඩනගාගෙන ලැබී ඇති කාලයෙන් උපරිම ප්‍රයෝජන ලබාගෙන සාර්ථකව ජීවිතය ගොඩනගා ගැනීමයි වැදගත් වෙන්නේ. සමාජයේ ඔබට මුහුණ දීමට සිදුවන නානා විධ අත්දැකීම්වලින් පන්නරය ලබා ගැනීම විනා, නොගැළපෙන මාවත් ඔස්සේ අයාලේ යන්නට ඔබේ සිතට ඉඩ ලබා නොදිය යුතුයි. තමාට වැඩිපුරම ආදරය කරන්නේ තමන්ගේ අම්මා තාත්තා ඇතුළු පවුලේ අය බව මේ දිනවල අපේ දරුවෝ අත්දැකීමෙන්ම දන්නවා ඇති. ඉතින් ඒ අයත් එක්ක සතුටෙන් ඉඳලා මේ කාලයට නොබියව මුහුණ දෙන්න කියලා මම දරුවන්ට කියන්න කැමතියි.

සාකච්ඡා කළේ

**රමණී සුබසිංහ**



# සිංහල බෞද්ධ සංස්කෘතියේ තිඹිරිගෙය මිහින්තලා පුදබිමයි

**වර්තමාන මිහින්තලය සහ මිස්සක පව්ව යන්නට ඉපැරණි හැඳින්වීම වන්නේ චේතියගිරි හෙවත් සෑගිරි යනුවෙනි. එහි සරල ව්‍යවහාරික නිරුක්තිය වන්නේ ස්තූප කන්ද යනුවෙනි. මේ අනුව ධාතූන් වහන්සේ තැන්පත් කළ ස්තූප විශාල සංඛ්‍යාවක් මෙහි පිහිටා තිබූ බව පෙනේ. මහාවංශයට අනුව මෙය මිශ්‍රක පව්ව ලෙසින් ද හඳුන්වා ඇති බව පෙනේ.**

(මහාවංශ පරිච්ඡේදය 13 ගාථාව 20)

වංශ කතාවන්හි පැනෙන ලෙස අනුරාධපුර නගරයෙන් පිටත වූ මිහින්තලාව ආගමික මධ්‍යස්ථානයක් බවට සංවර්ධනය වූයේ දෙවන පැතිස් රජතුමා අතින්ම ය. මිහිඳු හිමියෝ ස්වකීය ජීවිතාවසානය තෙක්ම දෙවන පැතිස් රජතුමා සමඟ ඔහුගේ අනුයාත රජවරුන් විසින් ප්‍රමුඛත්වය සපයනු ලැබූ නිබඳ පැවැති ආගමික ක්‍රියාකාරිත්වයක් සහිත මිහින්තලාවෙහි ම විසූ සේක.

මිහිඳු හිමි ඇතුළු සංඝයා වහන්සේ මුල්ම වස් කාලය ගත කරන්නේ මිහින්තලයේදී ය. වංශකතා අනුව මිහිඳු හිමියන් සමඟ පැමිණි භණ්ඩුක උපාසක තෙමේ පැවිදි වී උපසම්පදාව ද ලබා රහත් බවට ද පත් වන්නේ මිහින්තලාවේ දී ය. ශ්‍රී ලංකාවේ දී ගිහියකු පැවිදි බවට පත් වන ප්‍රථම අවස්ථාව මෙය වේ. අෂ්ටඵල රුහ බෝධීන් වහන්සේ නමක් ද මිහින්තලයේදී රෝපණය කර ඇත. මහා අරිට්ඨ අමාත්‍යවරයා ඇතුළු පනස් දෙදෙනකු සසුන්ගත වන්නේ ද මෙම පුණ්‍ය භූමියේ දී ය.

දේවානම්පියතිස්ස රජතුමා සංඝයා වහන්සේ උදෙසා ලෙන් 68 ක් පූජා කරන්නේ ද මිහින්තලේදී ය. ථූපාරාමයේ තැන්පත් කිරීම සඳහා වැඩම කරන සර්වඥ ධාතූන් වහන්සේ මුලින්ම තැන්පත් කරන්නේ ද මිහින්තලේ ය. එතැන් සිට මෙම පුදබිම සෑගිරිය ලෙස හැඳින්වූ බව වංශකතා සඳහන් කර ඇත. වර්ෂ 48 ක් ලක්බිම වැඩ විසූ මිහිඳු හිමියන් වහන්සේ අවසන් වස් කාලය ද ගත කර පිරිනිවන් පාන්නේ ද මිහින්තලේදී ය.



මිහින්තලාව කඳු ගැට සතරකින් සැදුම් ලද්දකි. ඒවා නම් මිහින්තලා කන්ද, ඇත්වෙහෙර කන්ද, ආනෙයිකුට්ටි කන්ද හා රාජගිරි ලෙන කන්දයි. එක් කඳු ගැටයක් අඩි දහසක් පමණ උස්වන අතර එම කඳු ගැට හතරම එක්වූ කල අක්කර හාරසිය පනහක් පමණ වූ ප්‍රදේශයක් වසා පැතිර යයි. මෙම භූමිය පුරා කලින් කල ඉදිවූ ස්මාරකයන් රාශියක් වේ.ඒ අතර කණ්ඨක චේතිය මිහින්තලා ආරාම සංකීර්ණයේ පිහිටන අතිශය වැදගත් ස්මාරකයකි.

## කණ්ඨක චේතිය

කලාත්මක හා නිර්මාණාත්මක අතින් සුවිශේෂී ස්ථානයකි. මහාචාර්ය පරණවිතානසූරීන් මේ පිළිබඳව විධිමත් විමර්ශනයක් සිදුකර තිබේ. මහා ගස්වැල්වලින් පිරීගත් මිහින්තලා කඳුගැටයේ කොටසක් වශයෙන් සැලකූ පස්කන්දක් පසුව දාගැබක් වශයෙන් හඳුනාගෙන පාදාගෙන ඇත. මෙම දාගැබේ නාමය කුමක්විය හැකිදැයි ස්ථිර වශයෙන්ම නිගමනය කිරීමට පෙර බොහෝ දෙනා එය කිරිබඩපවු සෑය ලෙස හඳුන්වා ඇත. එහෙත් ස්තූපයේ නියම නාමය හඳුනා ගැනීමට ඉවහල් වූ ලිපියක් ස්තූපයේ බටහිර වාහල්කඩට නුදුරුව ගලක කොටා තිබී සොයා ගැනීමට හැකිවිය.

පළමුවන සියවසේ මහාදාඨික මහානාග රජු විසින් 'කටක චෙත' හෙවත් කණ්ඨක චේතිය උදෙසා ආදායම් මාර්ග දෙකක් පවරා දෙමින් එම ලිපිය ලියා තිබුණි.

වංශකතා අනුව මහා අරිට්ඨ හිමි ඇතුළු හිමිවරුන්ට හැට අටක් ලෙන් සූදානම් කරන්නේ මෙම චේතිය අවටය. මෙම ලෙන් භාවිතයට ගෙන ඇත්තේ මෙම චේතිය ඉදිකිරීමට ද පූර්වයේ ය.

මෙම චෛත්‍ය වටා ශෛලමය කංචුකයක් තැනවූ බවට ද මහාවංශය කරුණු දක්වා ඇත. පේසාවන් 03 ක හා වාහල්කඩ එකක අවශේෂ සොයාගෙන ඇත. මෙය මෙරට ඉදිවූ පුරාණතම ස්තූපයකි. සෙනරත් පරණවිතානයන්ගේ මතය වන්නේ එම ස්තූපය මෙනමින් නම් කර ඇත්තේ සිදුහත් කුමරුගේ කණ්ථක අශ්වයා සිහි කිරීමට බව ය.

එහෙත් මුල් බ්‍රාහ්මී ශිලා ලිපි හා වංසකතා ඇතුළු සාහිත්‍ය මූලාශ්‍රවල නිෂ්පාදන බෙදාහැරීම් මධ්‍යස්ථාන හැඳින්වීමට පුරාණයේ දී කටක, කඩ, කඩක, කණ්ඩ, කණ්ඨ වැනි පද භාවිත කර තිබේ. ඒ පිළිබඳ විග්‍රහයක යෙදෙන සුදර්ශන් සෙනෙවිරත්න පෙන්වා දී ඇත්තේ මහාවංසයේ පණ්ඩුකාභයගේ සංග්‍රාම ආශ්‍රිතව, ගිරිකණ්ඩ, වට්ඨගාමිණී රජුගේ ගමන් මාර්ග ආශ්‍රිතව සිලාසොබ්බකටක, දඹුල්ල හා බුදුගේහින්න ආශ්‍රිත බ්‍රාහ්මී ලිපිවල සඳහන් උපරිකඩ හා මතුකඩ යන වචනවල එන කඩ, කටක, කණ්ඨ යන වචනවලින් සීමාව, ප්‍රවිෂ්ටය, සුළු වෙළඳපොළ අර්ථවත් වන බවය.

මිහින්තලය ද පිහිටා ඇත්තේ අනුරාධපුර හා සේරුවිල දක්වා දිවෙන ප්‍රධාන ගමන් මාර්ගයට ඉතා සමීපව ය. එම මාර්ගය පුරාණයේදී ලෝහ සම්පත් අනුරාධපුරයට රැගෙන ඒම සඳහා භාවිතයට ගත් මාර්ගය බවට මතයක් වේ. ඒ අනුව අනුරාධපුර පැරණි නගරයට කි. මී 12 පමණ දුරින් පිහිටන මිහින්තලය පුරාණයේ දී බෞද්ධාගම මෙරටට පැමිණීමට ප්‍රථම ප්‍රධාන මාර්ගය ආසන්නයේ භාණ්ඩ හුවමාරු කරන වෙළෙඳ පොලක් හෝ භාණ්ඩ රැස්කරන ස්ථානයක් වීමට වැඩි ඉඩකඩ පවතින බැවින් මෙම ස්තූපය ඉදිකිරීමේ දී එම තත්ත්වය ද පදනම් කර ගනිමින් කටක හෝ කණ්ඩ උපයෝගී කර ගනිමින් කණ්ඨක චේතිය යන නම භාවිත කරන්නට ඇති බව උපකල්පනය කළ හැකිය.

කණ්ඨක චේතිය වර්තමානයේ දක්නට හැකි ලෙස කැණීම් කර මතු කරගනු ලැබුවේ 1935 වර්ෂයේදි සෙනරත් පරණවිතානයන් විසිනි.

## අටසැටලෙන්

මෙම ලෙන් පද්ධතිය පිහටා ඇත්තේ කණ්ඨක චේතිය වටා වූ කඳු බෑවුමේ ය. මිහිඳු මා හිමියන් ප්‍රමුඛ භික්ෂූන් වහන්සේලා උදෙසා දේවානම් පියතිස්ස මහ රජු විසින් පිළියෙළ කරන ලද ලෙන් හැට අටක් මෙහිවේ. මෙම ලෙන් බොහෝමයක කටාරම් කොටා බ්‍රාහ්මී අක්ෂරයෙන් ලෙන් ලිපි කොටා ඇත.

## ආරාධනාගල

මෙම ස්ථානය සුන්දරත්වයෙන් අනූන ස්ථානයකි. දෙවන පැතිස් රජුට මිහිඳු මා හිමියන් තිස්ස යැයි අමතන්නේ මෙම පර්වත මුදුනේ සිට බවට විශ්වාසයක් පවතී. එසේම මිහිඳු හිමියන් ප්‍රමුඛ පිරිස සෘද්ධියෙන් ලක්දිවට ගොඩබැස පළමුවෙන්ම පාද තබනුයේ මෙම ස්ථානයේ යැයි විශ්වාසයක් පවතී.

උන්වහන්සේ රජුට තිස්ස යැයි අමතනවිට රජු සිටිය ස්ථානය වර්තමානයේ සලකුණු කර තිබේ. මෙම ආරාධනා ගල සම්බන්ධයෙන් පවතින තවත් විශ්වාසයක් වන්නේ මිහිඳු හිමියන් පැවැත්වූ පළමු ධර්ම දේශනාවට සවන්දීම සඳහා සුමන සාමණේරයන් විසින් දෙවියන්ට ආරාධනා කරන ලද ස්ථානය බවයි.

## මිහිඳු ගුහාව

මිහිඳු මා හිමියන් ප්‍රමුඛ භික්ෂූන් මිහින්තලයේ අට සැට ලෙන්හි වාසය කළ බවට බොහෝ සාධක ශේෂවී පවතී.ඉන් මිහිඳු මා හිමියන් භාවනායෝගී ව හා විවේක සුවයෙන් වාසය කරන ල්දදේ මිහිඳු ගුහාව ලෙස වර්තමානයේ නම් කර තිබෙන ලෙනේ බවට ජනප්‍රවාදයේ පවතී. ශිලා චේතිය අසලින් පහළට බැස්ස විට හමුවන්නේ මෙම



ලෙනයි. ලෙන ඇතුළතට ගිය පසු ඉදිරියෙන් හාත්පස දිස්වන්නේ චමත්කාර ජනක පරිසරයකි. එම සුන්දරත්වය භාවනාවට පමණක් නොව විවේකී සුවයෙන් වැඩ සිටීමට මහඟු චිත්ත නිදහසක් ගෙන එන්නට ඇත. එසේම මෙම ලෙන ඇතුළත පිහිටි ගල මතම මනාව කොටන ලද ආසනයක් වේ. එය භාවනායෝගී ව සිටීමට හා සැතපීමට භාවිත කරන්නට ඇති බව විශ්වාස කළ හැකි වේ.

### දාන ශාලාව

මෙම පුණ්‍ය භූමියේ වැඩ සිටි දහස් සංඛ්‍යාත සංඝයා උදෙසා දානය පිරිනමනු වස් ඉදිකරන ලද දාන ශාලව මිහින්තලේ ආරාම සංකීර්ණයේ දැකිය හැකි තවත් වැදගත් ස්මාරකයකි. මීටර් 33ක් හා මීටර් 22ක් පමණ දිග පළලකින් යුත් එම දාන ශාලාව චතුස්ශාලාවක ලක්ෂණ පෙන්නුම් කරන අතර එහි මධ්‍ය කොටස මැද මිදුලක් ලෙස ඉදි කර තිබේ.

ගල් ටැම් 128 ක් පේළි අටකට සිටුවා ඒ මත වහල ඉදි කර ඇති බව උපකල්පනය කළ හැකි ය. මෙම දාන ශාලාවේ පොළොවට යොදා ඇත්තේ ගල් පතුරු ය. මෙහි දකුණු කෙළවර මුළුතැන්ගෙය සඳහා භාවිත කර ඇත. බටහිර දෙසට ඇත්තේ ගබඩා කාමර බවට අනුමාන කෙරේ.

දාන ශාලාවේ නැගෙනහිර දෙසින් මීටර් 12 කට වඩා දිගැති ශිලාමය බත් ඔරුව දැකගත හැකි ය. ඒ ආසන්නයේ ම මීටර් 4 පමණ දිගැති කැඳ ඔරුව වශයෙන් සලකන කුඩා ගල් ඔරුව පිහිටා තිබේ. දාන ශාලාව පිළිබඳව බොහෝ තොරතුරු මිහිඳු රජුගේ පුවරු ලිපියෙන් හෙළි වේ. එහි දාන ශාලාවේ එදිනෙදා කටයුතු කරන ලද සේවකයන් පිළිබඳව තොරතුරුද ඇතුළත්කර ඇත.

එහි වූ සේවකයන් 200ක් අතරින් ආහාර පිසින්නන්, දර ගෙන එන්නන්, දරගෙන බත් පිසින සේවකයන්, අනුන්ගෙනා දරින් බත් පිසින සේවකයන් හා බත් ගේ ප්‍රධානියා ගැන ද තොරතුරු ඇක්වේ.

එසේම දාන ශාලාවේ දකුණු දෙසින් දාන ශාලාවට ජලය රැගෙන ආ ශිලාමය නල මාර්ගය වන අතර අතර එය කණුමත ඉදි කර තිබේ. බොහෝ දෙනකුගේ මතය වන්නේ එම ජල නළ මාර්ගය සිංහ පොකුණට සම්බන්ධ වන බව ය.



### නාග පොකුණ

අම්බස්තලය දාගැබට බටහිර දෙසින් නාග පොකුණ පිහිටා ඇත.

පැරණි මූලාශ්‍රවල මෙය හඳුන්වා ඇත්තේ නාගසොන්ඩි පොකුණ ලෙස ය. පළමුවැනි අග්ගබෝධි රජු (කි.ව.575-608) සෑගිරියේ තිරදිය ඇති නාග සොන්ඩි නම් පොකුණ කළ බව චූලංවශයේ දැක්වේ. ස්වභාවික පර්වතයක නිර්මිත මෙම පොකුණ බැම්මකින් සහ පෙණ 5 ක් සහිත විශාල නාග රුවක් (ගල් මුහුණ මත අර්ධ උන්නතව) සහිත වූ මෙම පොකුණ මිහිඳු හිමියන් විසින් පරිහරණය කර ඇති බව සහ දෙවනපෑතිස් රජු මෙම ස්ථානයේ සිට දිවා ආහාරය ද ලබාගෙන ඇති බවට මත වේ.

මිහිඳු හිමියන් ප්‍රධාන භික්ෂූන් තම වස් කාලයේදී මෙම පොකුණ ප්‍රයෝජනයට ගන්නට ඇත. මෙය වර්තමානයේ දී මැද මලුව ලෙස හඳුන්වන පෙදෙසේ දක්නට ලැබේ. මෙම පොකුණ පරිමාණයෙන් මීටර 12ක් පමණ දිගකින් ද මීටර 5ක් පමණ පළලකින් ද යුක්ත වේ.

### කළුදිය පොකුණ හා ආරාම සංකීර්ණය

ඇත්වෙහෙර කන්ද පාමුල පිහිටන කළුදිය පොකුණ ආරාම සංකීර්ණය තුළ ලෙන් ආරාම, ප්‍රධාන ඝරය, ස්තූපයක් හා කළුදිය පොකුණ දැකගත හැකිය. හතරවැනි කාශ්‍යප රජු (කි.ව.898-914) චේතිය පබ්බත අසල ඉදිකොට ධම්මරුචි සංඝයාට පිරි නැමූ හදයණ්හ විහාරය මෙය විය හැකි බව එච්.සී.බෙල් මහතා විශ්වාස කරයි.

ඇත් වෙහෙර කන්දේ ඇති ශාකවල ඡායාව එම පොකුණට වැටීම නිසා පොකුණේ ජලය දිස් වන්නේ කළු පැහැයට බැවින් එම පොකුණ සඳහා කළුදිය පොකුණ යන නම ලැබී තිබේ. ගල් වැටි යොදා සකස් කර ඇති එම පොකුණ මිහින්තලේ දැකගත හැකි විශාලතම පොකුණ වේ. මිහිඳු රජුගේ මිහින්තලා පුවරු ලිපියේ එන පොරෝදිනි යනුවෙන් හැඳින්වෙන පොකුණ මෙය විය හැකි බවට ද විශ්වාසයක් පවතී. මෙම පොකුණ පිළිබඳව ජනශ්‍රැතියේ එන කවියක් ද වේ.

***ගල් ගිගිරන් ගල් ගිගිරන් ගල් කැටියා***<br>
***මල් ගිගිරන් මල් ගිගිරන් මල් කැටියා***<br>
***කලු තිඹිරෙට පිටදීලා වැඩ සිටියා***<br>
***කලුදිය පොකුණ බලන්ට දෙවියොත් වැඩියා***

පොකුණ මධ්‍යයේ ඇත්වෙහෙර කන්ද හා ස්ම්බන්ධ වන ලෙස නිර්මාණය කර ඇති



නිර්මාණය සඳහා නැගෙනහිර දෙසින් මීටර් 8ක පමණ දිගින් යුතු ගල් පාලමක් තිබේ. පොකුණට උතුරු දෙසින් කුඩා ස්තූපයක් දැකගත හැකි ය. එය උස් භූමියක සකස් කළ මලුවක් මත ඉදි කර තිබේ. මීටර් දෙකක් පමණ උසකින් යුතු එම ස්තූපයේ මලුව මීටර් 14 - 13 ප්‍රමාණයෙන් යුක්ත වේ.

ස්තූපයට ඉහළින් හඳුනා නොගත් ගොඩනැගිල්ලක් දක්නට ඇති අතර එය 2008 වර්ෂයේ දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් කැණීම් කර සංරක්ෂණය කර ඇත. මාලක ක්‍රමයට භූමිය සකස් කරගනිමින් භූ දර්ශනය ගොඩනගා ගැනීම කළුදිය පොකුණේ ඇති විශේෂත්වය වේ.

පොකුණේ බටහිර බැම්ම දෙසින් ඉතා මනරම් ලෙන් ආරාමයක් දැකගත හැකි අතර එය පොත්ගුල ලෙස වර්තමානයේ ව්‍යවහාර කරනු ලැබේ. කළුගලින් ම සකස් කළ උළුවහු හා ජනෙල් ද ලෙන් කුටියේ වහල ද පුරාණ ඉංජිනේරුවන්ගේ තාක්ෂණික ඥානය කදිමට ලොවට කියාපාන නිදසුනක් වැනි ය.

ගුහා කටාරමට පහළින් ඉදි කර ඇති එවැනි විශිෂ්ට ගණයේ ලෙන් විහාර ලංකාවේ දැකගත හැක්කේ ඉතා අල්පව ය. මීළඟට තනා ඇති මාලකය තුළ ස්ථාන ගත කර ඇත්තේ වනවාසී සම්ප්‍රදායේ ආරාමයක් වන පධානඝරයකි. මීටර් 15X 10 ප්‍රමාණයේ වේදිකාව මීටර් 2 පමණ වන මීටර් 1.50ක් පමණ දිග පළලින් යුත් ගල් පාලමකින් සම්බන්ධ කර තිබේ.

### රාජගිරි ලෙන කන්ද

මෙය කුඩා කඳුවැටියකි. මෙම කන්දෙහි භික්ෂූන් වැඩ විසූ ලෙන් කිහිපයක් දැකගත හැකි වේ. එසේම ඒවායේ කටාරමට පහළින් කොටන ලද පූර්ව බ්‍රාහ්මී ලෙන් ලිපි ද දක්නට ඇත.

### සේල චෛත්‍යය

මෙම ස්තූපය සම්බන්ධයෙන් මත ගණනාවක් වේ. මෙම ස්තූපය ජන වහරේ අම්බස්ථල දාගැබ ලෙස හැඳින්වේ. බුදුන් වහන්සේ ලක්දිවට වැඩි තෙවැනි අවස්ථාවේ මිහින්තලයේ දී සමවත් සුවයෙන් වැඩසිටි ස්ථානයේ මෙම ස්ථූපය ඉදිකර ඇති බවට අදහසක් වේ.

මිහිඳු හිමි සහ දේවානම්පියතිස්ස රජු අතර ප්‍රථම සාකච්ඡාව සිදුවන්නේ ද මෙම ස්ථානයේ දී බව සඳහන් වේ. වටදාගෙයක් තිබූ බවට ද අවශේෂයන් ඇත. ස්තූපය වටා ගල් කණු පේළි ද්විත්වයක සාධක වේ.


### මිහිඳු සෑය

මහාථූප සලපතළ මලුව ඉදිරියේ පිහිටි ස්තූපයකි. මෙය මිහිඳු හිමියන්ගේ ධාතූන් වහන්සේ තැන්පත් කරමින් කරන ලද්දක් බව ප්‍රකාශව ඇත

දෙවනපෑතිස් රජුගේ බාල සොයුරු උත්තිය රජු විසින් කරවන ලද මෙ ස්තූපය මෙරට පුරාණම ස්තූප අතරින් එකකි. මිහිඳු හිමියන්ගේ පිරිනිවනින් පසු භෂ්මාවශේෂ තැන්පත් කර මිහින්තලාවේ මෙන්ම මෙරට නොයෙක් තැන්වල ස්තූප ගොඩනැගූ බවට සාධක වේ.

රජගල ද එවන් එක් සථානයකි. මෙම ස්තූපය කැණීම් කිරීමෙන් මැටි කරඬුවක් හා බුදු පිළිමයක් හමුවී තිබේ. ඒ බව 1951 පුරාවිද්‍යා පාලන වාර්තාවේ සඳහන්වේ. එම මැටි කරඬුවේ තිබූ රන් කරඬුවක් රන් මලක් මත රන් සුරයක් තිබී ඇත. එසේම දාගැබේ ගරාවැටුණු පස් හා ගඩොල් අතර තිබී තවත් මැටි කරඬුවක් සොයා ගෙන ඇත. එහි තිබී අස්ථි හා අලු හමුවී ඇත.

විද්‍යාපති
කේ.උදේනි අරුණසිරි
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව





# සොබා දහමේ අයිතිකරුවකු නොවී භාරකරුවෙක් වෙන්න

**උතුම් පොසොන් පුන් පොහෝ දිනය සමස්ථ ශ්‍රී ලාංකේය ජනයාටම ඓතිහාසිකව මෙන්ම ආගමික වශයෙන් ද ඉතා වැදගත් වේ. අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේගේ ලංකා ගමනය සිදු වීම එයට ප්‍රධාන හේතුවයි.**

විවිධ වන්දනාවන් සහ ඇදහිලි ක්‍රම සිදු කරමින් සොබා දහම කෙරෙහි ආකල්පයකින් තොරව රටේ රජුන් පවා සත්ව ඝාතනය කරමින් විවිධ වූ සැනකෙළි පවත්වමින් ජීවිතය පිළිබඳ අර්ථ විරහිත ව කටයුතු කළ අවධියක් ලාංකේය ඉතිහාසයේ දැක ගත හැකි ය.

එලෙස කල් ගත වූ අවධියක ආගමික, සාමාජික, සංස්කෘතික, දේශපාලනික, ආර්ථික, ආදි සියල්ලෙන් සුපෝෂිත දර්ශනයක් වූ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මයේ පණිවිඩය ලක්දිවට හඳුන්වා දීමේ බලාපොරොත්තුවෙන් අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ අද වැනි වූ දිනයක ලක්දිවට වැඩම කළහ.

මෙවර පොසොන් පොහොය උදාවත් සමඟ අප නැවත වරක් මිහිඳු මහරහතන් වහන්සේගේ ආගමනය සමඟ මානසික ව ඒකාත්මික වී ප්‍රතිපත්තීන් තුළ පිහිටීමට කාලය උදා වී ඇත.

එනම් එදා මිහිඳු හිමියන් විසින් බුදුරජාණන් වහන්සේගේ ධර්මය හඳුන්වා දීමේ දී දේවානම් පියතිස්ස රජු ඇතුළු පිරිසට දේශනා කරන ලද මූලික ධර්ම දේශනාවන් දෙස බැලීමෙන් එහි මූලික පරමාර්ථ කිහිපයක් පෙනී ය යි.

මානව හිතවාදී බව හා සබැඳි ගුණාංග වූ පංච සීල ප්‍රතිපදාව පිළිබඳ හඳුන්වා පාපයට ලජ්ජා බය ඇති කොට පුද්ගලයා කුසලයෙහි පිහිටුවා ආධ්‍යාත්මික සංවර්ධනයක් කරා යොමු කර වීම මෙහිදී ප්‍රධාන විය. ලෞකික මෙන් ම ආධ්‍යාත්මික දියුණුව පිළිබඳ දේශනාවන් ගෙන හැර පාමින් අකුසල ක්‍රියාවන්හි නිරතව සිටි අය මහරහත් තත්වයට ගෙන එමින් ලක්දිවම ධර්ම රාජ්‍යයක් බවට පත් කළහ. ඒ ලද ධර්මයේ සැනසීම අද වන විට පුද්ගල කායික හා මානසික යන දෙයංශයෙන් ම ඈත් වී ඇති බව සමාජය දෙස බැලීමෙන් පැහැදිලි වේ.

එසේ වීමට හේතු කාරණා මෙහිදී ඉදිරිපත් කිරීමට වඩා එම සැනසීම නැවත ඇති කරගැනීම විෂයෙහි කටයුතු කළ යුත්තේ කෙසේද යන වග සාකාච්ඡා කිරීම වැදගත් වේ.

ලෝකය පුරාම පැතිර යන ගෝලීය වසංගතය හමුවේ අපට ද එයින් බේරීමට හැකියාවක් නොමැති විය. ලෝකයේ පාලකයා මිනිසා නොව සොබාදහම බව මැනවින් ප්‍රකට වන තවත් සුවිශේෂී අවස්ථාවක් බවට පත් වී ඇත.

සොබා දහමේ විශිෂ්ටතම නිර්මාණය වන මිනිසා කාලයාගේ ඇවෑමෙන් තමන් සොබා දහමේ කොටස් කරුවකු ය යන්න අමතක කොට වැඩ කිරීමට යුහුසුලු විය. මිනිසා යනු සොබා දහමේ අයිති කරු නොව සොබා දහමේ භාරකරු පමණි.

එහෙත් පෘථිවිය ජය ගෙන නිම වී ඇතැයි සිතූ මිනිසා අභ්‍යවකාශ තරණය කරමින් එක් රටක මිනිසුන්ට වඩා අප සාර්ථකයි හෝ අප දියුණු යැයි පවසමින් කටයුතු කරන්නට පටන් ගත්තේ තමන් ආර්ථික හා තාක්ෂණික දියුණුවේ උපරිමයේ සිටින වග දැක් වීමට පමණක් නොව සොබා දහමේ නියමයන් තමා ජය ගත්තේ යැයි සිතමිනි. මේ වන විට මෙම සියලූ රටවල් වල උගත් නූගත්, ධනවත් දුප්පත්, ලස්සන අවලස්සන, යන සෑම අයකුම උත්සාහ කරන්නේ තම ජීවිතය බේරා ගැනීමට ය.

මෙම ඇති වී තිබෙන ගෝලීය වසංගතය හමුවේ මිනිසාගේ සියලූ ශක්‍යතාවන් පරයා ගොස් සොබා දහමට අනුව මිනිසා පාලනය කරමින් සිටි.

**සොබා දහමේ අනික් සියලුම ප්‍රාණවත් වූ තිරිසන් ගත සතුන් බෝහෝම සුවෙන් ඔවුන්ගේ නිදහස භුක්ති විඳිමින් සිටි. ඔවුන් කිසිවෙක් මෙම රෝගයෙන් පීඩා නොවෙති. මිනිසා නිවසට කොටු කර ඔවුන් නිදහසේ ඇවිද යති. නිදහසේ ජීවත් වෙති. ගස් වැල් සුපුරුදු පරිදි මල් දරති, පල දරති, යහමින් වැඩෙති. සූර්යයා වෙනදා මෙන්ම දිලෙයි. චන්ද්‍රයාගේ සිසිල වෙනදා මෙන්ම ලෝකය වෙත ලබා දෙයි. වැස්ස සුළඟ තමාට අවැසි පරිදිම ලෝකය හසුරුවයි. මිනිසා පමණක් සොබා දහමෙන් හුදකලා කොට මිනිසාට අමතකව ගිය කුමක් හෝ යහපත් පණිවිඩයක් නැවත සිහිපත් කරවීමට මෙවැනි රෝගයක් සමඟ මිනිසා හුදකලා කළා දෝ යන්න නැවත සිතා බැලීමට කාලය උදා වී ඇත.**

අනුබුදු මිහිඳු හිමියන් ලක්දිවට වැඩම කොට හඳුන්වා දුන් බුදු දහම වනාහි යථා වාදී තථා කාරී, තථා කාරී යථා වාදී දහමකි. එහෙත් කාලයාගේ ඇවෑමෙන් එය ගිලිහී යන බව සමාජය තුළින් පෙනී යන්නට විය.

සෑම අවස්ථාවක ම බුදු දහම මුල්කොට පංච ශීලය සමාදන්ව සියලූ කටයුතු ආරම්භ කිරීම චාරිත්‍රයක් කොට ගත් අපේ පැරණි ශ්‍රී ලාංකේය බෞද්ධ ජනයා එය දිවි හිමියෙන් ආරක්ෂා කිරීමට ද කැප වී ක්‍රියා කරනු දක්නට ලැබීය. එහෙත් වර්තමාන සමාජය තුළ පංච ශීල ප්‍රතිපදාව කෙරෙහි පුද්ගලයාගේ ආකල්පය බෙහෝ දුරට වෙනස් වී ඇත.


වර්තමාන පුද්ගලයා තමා ප්‍රකාශ කරන වචනය තුළ ශක්තිමත් ව පිහිටා කටයුතු කිරීමට අපොහොසත් ව සිටින බවක් සහ තම ක්‍රියාවන් තමා ප්‍රකාශ කරන වචන හා ඒකාත්මික නොවන බව පැහැදිලි වේ. මේ සියලූ දේ මූලික වන්නේ තම සිත නිවැරැදිව ධර්මානුකූල ලෙස පුහුණු කිරීමක් නොමැති බව නිසාය.

සෑම අවස්ථාවක ම පුද්ගලයා තාවකාලික ලෞකික සතුටක් පසු පස අසීමාන්තික ආශාවෙන් යුතුව අසීමාන්තික ව තම පංච ඉන්ද්‍රියයන් පිනවීම කෙරෙහි යොමු වී ඕනෑම ක්‍රමයක් මඟින් එය සම්පූර්ණ කරවීමට උත්සාහ දරයි.

මිනිසාට අමතක වූ කාරණාව නම් තම ආශාවන් අසීමිත බවත්, සම්පත් සීමිත බවත්, අසීමිත ආශාවන් පසු පස හඹා යාමෙන් වනුයේ තම ජීවිතය කිසිවිටෙක තෘප්තිමත් නොවී ජීවිත කණස්සල්ලට පත් වීම පමණක් තමාට හිමි වන බවත් ය.

දේවානම් පියතිස්ස රජු තම උයන් ක්‍රීඩා පසෙක ලා බුදු දහමේ සැබෑ සැනසීම ලැබී ය. විනෝදය පිණිස සත්ව ඝාතනය රාජ නීතියෙන් ම තහනම් කොට දිවි හිමියෙන් පංච ශීල ප්‍රතිපදාවේ පිහිටා මාර්ගඵලාවබෝධයට පත් විය. රජකම මෙන්ම තමන් ලැබූ මිනිසත් බව ද උතුම් ලෙස ප්‍රයෝජනයට ගෙන පරම සැනසීම ලබා ගන්නට තරම් භාග්‍යවන්ත විය.

සොබා දහමෙන් මේ ලද විවේකය තුළ ඔබද සැබෑ ලෙස බොදුනුවකු වීමට අධිෂ්ඨාන කොට පංච ශීල ප්‍රතිපදාව තුළ හදවතින්ම පිහිටා සොබා දහමට ආදරය කරුණාව පතුරවමින් සොබා දහමෙන් ලැබෙන ආශිර්වාදය ගෙන ජීවිතය සුරක්ෂා කර ගනිමින් ධර්මානුකූල සැනසීම, ප්‍රීතිය ළඟා කර ගැනීමට උත්සාහවත් වන්න.



ශාස්ත්‍රපති
**මැදවල ධම්මධාරණී මෙහෙණින් වහන්සේ**



# එක්සිය විසිඅට වසරක් සපිරුණු

## මාතර මහා මන්තින්ද පිරිවෙන් පින්බිම (1893-2021)

**එක්සිය විසි අට වසරක් ප්‍රෞඪ වූත්, අභිමානවත් වූත් දිගු ඉතිහාසයකට උරුමකම් කියන දකුණු ලක අද්විතීයතම තක්සලාව වන්නේ මාතර මහා මන්තින්ද පිරිවෙන් විදු බිමයි......**

යම් ආයතනයක් අඛණ්ඩ ව ශතාධික කාලයක් අතිශය සාර්ථක මට්ටමකින් පවත්වා ගෙන ඒම භාරධූර මෙන් ම ආශ්චර්යවත් කරුණකි. ආදි කර්තෘ යතිවරයන් වහන්සේලාගේ අකලංක චේතනාවත්, අප්‍රතිහත ධෛර්යයත්, කැපවීමත් යන කරුණු එක්තැන් කොට බැලූ විට එම ආශ්චර්යවත් කරුණේ රහස අවබෝධ කර ගැනීම උගහට නොවේ. මෙම අධ්‍යාපනික කේන්ද්‍රස්ථානය ආරම්භ කොට 2021 ජුනි 23වන දිනට වසර 128ක් සපිරෙන අතර එහි ආරම්භය, විකාශනය හා වත්මන පිළිබඳ සංක්ෂිප්ත ආවරණයක් කිරීම මෙහි ලා අරමුණයි.

18වන සියවසේ අගභාගය යනු කොළඹ හා තදාසන්න ප්‍රදේශවල ධර්ම ශාස්ත්‍රීය ආලෝකය හොඳින් වැටී තිබුණු අවධියකි. එහෙත් දකුණු රට තත්වය ඊට හාත්පසින් ම වෙනස් විය. දකුණු රට අඳුරට ගොස් තිබූ යුගයක් විය. මෙකී තත්වය හමුවේ දකුණුලකට ධර්ම ශාස්ත්‍රීය ආලෝකය ලබා දෙන තක්සලාවක අවශ්‍යතාවය තදින් දැනෙන්නට විය. මෙම යුගය වන විට පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙනින් අධ්‍යාපනය ලබා, තත් පිරිවෙනෙහි ම කීර්තිමත් ආචාර්යවරයකු වශයෙන් කටයුතු කොට දකුණු රටට වැඩම කොට සිටි දක්ෂ, තරුණ හිමිනමක් විය. උන්වහන්සේ නමින් "වාදිහසිංහ බැදිගම ශ්‍රී රතනපාල නාහිමිපාණන් වහන්සේ වූ හ.

මෙම දක්ෂ, උගත්, තරුණ හිමිනම



වාදිහසිංහ බැදිගම ශ්‍රී රතනපාල මා හිමි



බඹරැන්දේ ශ්‍රී ධම්මාවාස මා හිමි



කඹුරුපිටියේ ශ්‍රී බෝධිගුත්ත මා හිමි



ගැටමාන්නේ සිරි ධම්මකිත්ති මා හිමි



වර්තමාන විහාරාධිපති තිස්සමහාරාමේ ඉන්දනන්ද හිමි

එවකට වැඩ සිටියේ දික්වැල්ල "තැනුම්පත" නම් රජමහා විහාරස්ථානයේ ය. එවකට මාතර ප්‍රදේශයේ සිටි "අංගනෙත්තා සුසානා ඉලංගකෝන් පිලිප් පණ්ඩිතරත්න" හාමු මැතිණිය ප්‍රමුඛ මහ මැතිඳු මඩුල්ලක් එහි ගොස් දකුණුලකට පිරිවෙනකට අවශ්‍යතාවක් ඇති බැවින් එය මාතර නගරය ආසන්නයේ ආරම්භ කිරීමට උන්වහන්සේට ආරාධනා කරන්නට වූහ. එම සුවිශේෂී ආරාධනාව බැදිගම ශ්‍රී රතනපාල නම් තරුණ, කාර්යශූර භික්ෂූන් වහන්සේ සතුටු සිතින් භාර ගත්හ.

ඒ අනුව 1883 ජූනි 23 වැනි දිනට යෙදුණු සුබ මොහොතින් මාතර මහා මන්තින්ද පිරිවෙන් විද්‍යායතනය එවකට සිටි මහා මැතිඳුන්ගේ ඇරයුමෙන් ආරම්භ විය. එසේ මහා මන්ත්‍රීශ්වරුන්ගේ ආරාධනාවෙන් ආරම්භ වූ හෙයින් ම "මහා මන්තින්ද" යන නාමය ඊට තබන්නට විය.

එසේ ආරම්භ වූ මෙම විදුබිම සුවිශේෂී යුග ගණනාවක් පසු කරන්නට විය.

වාදීහසිංහ බැදිගම ශ්‍රී රතනපාල නාහිමිපාණන් වහන්සේගේ යුගය (1883 - 1917), බඹරැන්දේ ධම්මාවාස නාහිමිපාණන් වහන්සේගේ යුගය (1917 -1949), කඹුරුපිටියේ ශ්‍රී බෝධිගුත්ත නාහිමිපාණන් වහන්සේගේ යුගය (1949 - 1987), ගැටමාන්නේ ධම්මකිත්ති නාහිමිපාණන් වහන්සේගේ යුගය (1987 - 2016), තිස්සමහාරාමයේ ඉන්දානන්ද මාහිමිපාණන් වහන්සේගේ වත්මන් යුගය (2016 සිට.....)

ආරම්භයේ සිට පසු කළ සෑම යුගයකම වැඩ සිටි එම යුග පුරුෂයන් වහන්සේලා තම යුතුකම හා වගකීම මැනවින් ඉටු කළේ තමාගේ දෙවන පෙළ නායකත්වයට ද ආදර්ශවත් වෙමිනි. මේ යුග අතර මාතර මහා මන්තින්ද පිරිවෙන් විහාරාධිපති ව වැඩ සිට අපවත් වී වදාළ දක්ෂිණ ලංකාවේ ප්‍රධාන සංඝනායක ශාස්ත්‍රාචාර්ය ගැටමාන්නේ ධම්මකිත්ති නාහිමිපාණන් වහන්සේගේ යුගය සුවිශේෂී වේ. ඊට හේතුව වන්නේ ආදි කර්තෘන් වහන්සේලා ආරම්භ කළ මෙම පින් බිමේ ස්වර්ණමය යුගය බිහිකරන්නේ උන් වහන්සේ නිසාවෙනි. ඒ වෙනුවෙන් උන්වහන්සේ කළ කැපකිරීම් අපමණ ය. එසේ උන්වහන්සේ ආරම්භ කළ අනුර විද්‍යාලය හා අනෙකුත් අධ්‍යාපනික විද්‍යා ආයතන අදට ද දැයෙහි අසරණ දරුවන්ට පිහිට වන්නේ උන් වහන්සේ සිදුකළ අධ්‍යාපනික මෙහෙවරට තව තවත් සාක්ෂි දරමිනි. උන්වහන්සේගේ අපවත්වීමෙන් පසුව මෙම පින් බිමේ නායකත්වයට පත් වන්නේ දක්ෂ, කාර්යශූර තරුණ හිමි නමකි. ඒ ශාස්ත්‍රවේදී තිස්සමහාරාමයේ ඉන්දානන්ද මාහිමිපාණන් වහන්සේ ය.

උන්වහන්සේ වර්තමානය වන විට මාතර, කොටුව මිගදාය ධර්මායතනය හා මාතර මහා මන්තින්ද පිරිවෙන් විද්‍යායතනය යන ආයතන ද්විත්වයෙහි ම අධිපතීත්වය දරති. එසේම මාතර මහා මන්තින්ද පිරිවෙන් විද්‍යායතනයට අනුබද්ධිත අනුර විද්‍යාලයේ සාමාන්‍යාධිකාරී තනතුර හොබවනු ලබන්නේ ද උන් වහන්සේම ය.

එසේ ම වර්තමානය වන විට උන්වහන්සේ ආදි කර්තෘන් වහන්සේලාට නොදෙවනි ව ආගමික මෙන්ම සමාජයීය, අධ්‍යාපනික හා සංස්කෘතික දැවැන්ත මෙහෙවරක් සිදු කරනු ලබති.

මීට අමතරව උන්වහන්සේගේ මගපෙන්වීම යටතේ ක්‍රියාත්මක මාර/ මහා මන්තින්ද විද්‍යායතන පිරිවෙනෙහි පැවිදි ගිහි සිසුන් මේ වන විට දහසකට අධික සංඛ්‍යාවක් ද, ඊට අනුබද්ධිත මාර/ අනුර විද්‍යාලයෙහි දූ පුතුන්, දෙදහසකට ආසන්න සංඛ්‍යාවක් ද අධ්‍යාපනය ලබති. එසේම මෙම විදු පියසෙන් ලොවට දායාද කළ පඬිරුවන් අපමණ ය.

තවද මහා මන්තින්දයට එක්සිය විසිඅට වසරක් සපිරෙන මේ මොහොතේ සිහිපත් කළ යුතුම පිරිසකි. ඒ අනුව අපවත් වී වදාළ ආදි කර්තෘන් වහන්සේලා, කෘත්‍යාධිකාරීන් වහන්සේලා, පරිවෙණාධිපතින් වහන්සේලා හා මෙය ගොඩනගන්නට ඇප කැප වී අභාවප්‍රාප්ත මහා මන්ත්‍රීශ්වරුන් ආදී සියල්ලෝ ම සිහිපත් කරන්නේ පුණ්‍යානුමෝදනා පූර්වකවයි.

එක්සිය විසිඅට වසරක් අනභිබවනීය ලෙස දකුණුලක අභිමානවත් තක්සලාව වෙමින් වොරැඳුණු මහා මන්තිඳු විදු බිම තව තවත් ශතාධික කාලයක් යෙහෙන් වැජඹේවා යැ'යි පතමි.

**(2021 ජුනි 23වන දිනට එක්සිය විසිඅට වසරක් සපිරීම නිමිත්තෙන් පළ කරන්නකි)**



මහා මන්තින්ද ආචාර්ය මණ්ඩලය



මන්තින්ද කනිෂ්ඨ ක්‍රිකට් කණ්ඩායම



# කාවන්තිස්ස රජතුමාගේ දේහයට රාජකීය ගෞරවය

**අද හෙට කාවන්තිස්ස රජතුමා මිය ගියහොත් ගැටලු රැසකට මුහුණ දෙන්නට සිදුවන බව සෙනෙවිවරු දෙදෙනාට අවබෝධ විය.**

දුටුගැමුණු මහ රජතුමා 36

“පුදුමයට පත්වීමට කරුණක් නැහැ. ත්‍රිපිටක තිස්ස තෙරුන් වහන්සේ නිතර පවසන පරිදි “සියල්ල සිදුවන්නේ හොඳටයි” යැයි සිතමු. එන විදිහකට මුහුණ දෙමු. මහාසිව මාහිමිපාණෝ කථාව ආරම්භ කළහ.

“මහවැලි ගං තීරයේ තොටමුණුවල ආරක්ෂාව තර කරන්නට ඕනේ. දින කිහිපයකට වරක් අපේ සේනාංක ලවා සොළීන්ට පහර දෙන්නට ඕනේ.. එමඟින් ඔවුන් රට තුළට පිවිසීම ප්‍රමාද කරන්නට පුළුවන්.“

“මේ දින කිහිපයේ තිස්ස කුමාරයාගේ රැකවල් තර කළ යුතුයි. ඔහුට බැහැරට යාමට ඇති ඉඩකඩ හා බැහැරින් ඔහුව හමුවන්නට ඇති ඉඩකඩ අහුරන්නට ඕනෑ. නන්දිමිත්‍ර දිගටම ඔහු ඇසුරේ සිටීම හොඳයි.”

“දුටුගැමුණු කුමාරයාට පිය රජුගේ අසාද්‍ය තත්ත්වය දන්වා යැවීම ඉතා වැදගත්. ඔහු මේ අවස්ථාවේදී මෙහි ගෙන්වා ගත යුතුයි. ඒ වගේම නැවත වරක් මාහිමිපාණන් වහන්සේ සෝම, සේරු රාජ්‍යවලට යවා හිතවත්කම් වැඩි දියුණු කර ගැනීමට උපායශීලි විය යුතුයි. මහාසිව, අභය රජවරුන් සමඟ නිරතුරුව සම්බන්ධකම් පවත්වා ගන්නට ඕනේ.”

“සිරිනාග එවන රහස් තොරතුරුත්, මහනෙල ගෙන එන රහස් තොරතුරුත් වෙන වෙනම රැස් කරන්න. අපේ යුධ සැලසුම් සකස් කිරීමේදී ඒවා වැදගත් වේවි. කළයුතු ඉතා වැදගත් කරුණු ටිකයි මා පැහැදිලි කළේ. අපි ත්‍රිපිටක තිස්ස මාහිමිපාණන් හමුවී තවත් උපදෙස් ලබාගනිමු.”. සෙනෙවිවරු දෙදෙනා ඒ අදහස අනුමත කළහ.

මහාසිව මාහිමිපාණන් වහන්සේ සෙනෙවිවරු දෙදෙනා මාහිමිපාණන් වහන්සේ හමුවීමට පිටත් වූහ.

විහාරස්ථානය වෙත පැමිණි පිරිස ත්‍රිපිටක තිස්ස මහතෙරුන් වහන්සේ හමුවී පාද නමස්කාර කළහ.

“දැන් මගේ කුටියට යමු.”

තිදෙනා සමඟ කතා බස් කරමින් ත්‍රිපිටක තිස්ස මහතෙරුන් වහන්සේ කුටියට ඇතුළු වූහ.

“මෙය අපට මුහුණ පෑමට සිදු වී ඇති බැරෑරුම් අවස්ථාවක්. රජතුමා සෝම නුවර, සේරු නුවර ගොස් රැඳී සිටිමින් එහි රජවරු සමඟ ඇති කර ගත් සුහදතාවය අඩුවී යාවි. මේ නිසා අපේ සතුරන් ප්‍රබල වේවි. දුටුගැමුණු කුමාරයාට අභිප්‍රාය න් සපුරා ගන්නට අමාරුවේවි. නමුත් බැරි වෙන එකක් නැහැ. “ ත්‍රිපිටක තිස්ස මහතෙරුන් වහන්සේ පැවසූහ.

“මහතෙරුන් වහන්ස අපට අද උදේ වරුවේ සිරිනාගගෙන් රහස් හසුන්පතක් ලැබුණා. තල්පත කියවූ විගස වේළුසුමන, සුරනිමල සහ නන්දිමිත්‍ර සෙනෙවිවරුන්ට පණිවුඩ යැව්වා. එත් වේළුසුමන පැමිණියේ නැහැ.”

“වේළුසුමන රජතුමාගේ අසාද්‍යය තත්ත්වය සිරි නුවර දාව ආචාර්යතුමාට පවසා අනතුරුව දුටුගැමුණු කුමාරයා හමුවීමට අපේක්ෂාවෙන් ගියත් ඔහුට ඒ කාර්යය කර ගන්නට බැරි වී තිබෙනවා.“

නන්දිමිත්‍රත්, සුරනිමලත් ලොකු කරගත් ඇස් ගෙඩිවලින් මහතෙරුන් වහන්සේ දෙස පුදුමයෙන් බලා සිටියහ. තමන් නොදන්නා තොරතුරු ත්‍රිපිටක තිස්ස තෙරුන් වහන්සේ දන්නේ දිව්‍යඥානයෙන්දැයි විමතියට පත්විය. මහාසිව මාහිමිපාණන් වහන්සේටද මේ තොරතුරු අලුත් ඒවා විය. ඔබ වහන්සේ මේ තොරතුරු දන්නේ කෙසේදැයි නන්දිමිත්‍ර විමතිය පළ කළේය.

“සෙනෙවිවරුනි, මේ පැය විසිහතරෙම ඇස් ඇරගෙන ඉන්නට ඕනෑ කාලයක් එළැඹිලා තියෙන්නේ. නොසිතූ දේ සිදුවන්නට පුළුවන්. මේ සියලු දේටම වඩා වැදගත් වන්නේ දුටුගැමුණු කුමාරයා ගෙන්වා ගැනීමයි. පිය රජතුමා අසාද්‍යව සිටින බව ඔහුට නොදැන්වීම ගැන දෙස් නැගෙවි.”

“මහතෙරුන් වහන්ස, දුටුගැමුණු කුමාරයා එකම තැනක රැඳෙන පුද්ගලයකු නොවන බව අපට ආරංචි වී තිබෙනවා. ඉතින් ඔහුට පණිවිඩයක් දෙන්නේ කෙසේද ?”

“දුටුගැමුණු කුමාරයා පැන ගියේ යුද්ධයට අවසර නොලැබුණු නිසා. දැන් ඔහු සේනා සංවිධානය කර, යුද්ධායුධ හා ආහාර පාන ගබඩා කර යුද්ධයට සූදානම්.“

“යකඩය රත් වූ විට තලාගන්නට ඕනේ. දැන් යුද්ධය ආරම්භ කරන්නට හොඳම අවස්ථාවයි. මුළු රටම දැන් යුධ කඳවුරක්. ගොවි බිම්වල සටන් පුහුණු වෙනවා. වැදි ගම්මානවල සටන් පුහුණු වෙනවා.

රට ජාතිය ගලවා ගැනීමේ උද්‍යෝගය හැමතැනම පැතිරිලා. ඒ නිසා දුටුගැමුණු කුමාරයා හැකි ඉක්මනින් ගෙන්වා ගන්නට ඕනේ.“

සිලාපස්ස පිරිවෙනේ ශිෂ්‍ය හිමිනමක් ආචාර්ය පාදයන් වෙත පැමිණ වැඳ නමස්කාර කර සිටියේ ය. මහා ස්වාමීන්වහන්ස , විහාරමහා දේවිය ඔබ වහන්සේ බැහැ දැකීමට පැමිණ සිටිනවා.”

මේ අවේලාවේ බිසොවුන් වහන්සේ පැමිණියේ කුමන කරුණක් නිසාද ? මහාසිව මාහිමියන් තුළ කම්පනයක් ඇති විය. ත්‍රිපිටක තිස්ස මාහිමිපාණන්ද නැගී සිටියහ. දෙදෙනා වහන්සේ කුටියෙන් එළියට පැමිණියහ.

විහාරමහා දේවිය, වෙවිලන ගමනින් පැමිණ උන්වහන්සේලාගේ ඉදිරියෙහි වැඳ වැටුණහ. ඇයගේ දෙනෙතින් කඳුළු වැගිරෙනු දුටු මහතෙරුන් වහන්සේලා යමක් අවබෝධ කරගත්හ.

“ස්වාමින් වහන්ස, රජතුමා මියගියා. දේහය විහාරස්ථානයට ගෙන ආවා’ දේවිය සැලෙන හඬින් කීවා ය.

“ඉතාම ඥානවන්තයි. මේ අවස්ථාවේ ගත් නිවැරදි තීරණයක් .” මහතෙරුන් වහන්සේලා පැවසූහ.

“මහා බිසොවුනි, මේ ඉතා දුකට කරුණක් වුවත් ඉතා සැලකිල්ලෙන් විචාරවත්ව වැඩ කළ යුතු අවස්ථාවක්. දැනට මේ පුවත කිසිවකුට දැනගන්නට ඉඩ නොදී මූලික කටයුතු කරන්නට බලමු. රජතුමාගේ දේහය ඉතා රහසිගතව ගෞරවනීයව මෙහි තැන්පත් කර තබන්නම්. අදාළ කටයුතු කරගන්නට සුරනිමලත්, නන්දිමිත්‍රත් මෙහි නවත්වන්න. ඇමැති මණ්ඩලය කැඳවා ආදාහන කටයුතු සූදානම් කරන්න.” ඔබතුමිය, දැන් රාජමාලිගයට යන්න.” බොහෝ දුක්මුසු ලෙස ස්වාමින්වහන්සේලා දෙස බැලූ ඇය වැඳ සමුගත්තා ය.

රජතුමාගේ දේහය ආරක්ෂක කුටියකට යවා රැකවල් යෙදූ මහානාහිමිවරු රහතන් වහන්සේ නමකට දක්වන ගරු බුහුමන් සහිතව වතාවත් පවත්වන ලෙස තෝරාගත් භික්ෂු පිරිසකට පැවසූහ. දේහයේ සතර කොන සුවඳ තෙල්වලින් පහන් දල්වා ඒවා නිවෙන්නට නොදී තබා ගන්නා ලෙසට උපදෙස් දුන්නේ ය.

නන්දිමිත්‍ර , සුරනිමල දෙදෙනා තමන් වෙත ගෙන්වා ගත්හ. උන්වහන්සේලාගේ මුහුණුවල ශෝකී බව දුටු ඔවුහු කිසිවක් සිදු වී ඇති බව වටහා ගත්හ.

“මාහිමිපාණන් වහන්ස, විහාරමහා දේවිය පැමිණි විගස ආපසු ගියේ රජතුමාට අනතුරක් ද ?”

“ඔව් රජතුමා මියගියා. ඒ පුවත පැවසීමට පමණක් නොවෙයි . රජතුමාගේ දේහය අපට පවරා දේවිය මාලිගාවට ගියා. එය තමයි මේ අවස්ථාවේ සිදු කළ යුතු බුද්ධිමත්ම කාර්යය.”

මේ අවස්ථාවේ ඉතාමත් සන්සුන්ව විවේක බුද්ධියෙන් කටයුතු කරන්නට ඕනේ.

**අයන්ති විතාන**

## කළ පින් කඳ පවුරක් වේවා

හිරු අවරට යන
සැන්දෑ කළුවරෙ
පහන් පැලේ පහනක් දල්වා
මුනිඳු පුදන ඔබෙ
සුපහන් දෑතට වෙර වීරිය
තව වැඩි වේවා
නිවනින් නිවෙන තුරා – ඔබ
මගේම මව වේවා

සසර පුරුද්දට පින්සර හදකට
පින් සිතුවිලි තව බෝ වේවා
දෙහොත් මුදුන් දී නගන සාදු හඬ
දෙව් බඹ තල තෙක් පැතිරේවා
නිවනින් නිවෙන තුරා – ඔබ
මගේම මව වේවා

බුදු හිමි පාමුල දල් වූ පහන් සිල
භව අඳුරට එළියක් වේවා
නිවනේ රන්මඟ පාද ගන්නට
සසර සයුරෙ පවුරක් වේවා
නිවනින් නිවෙන තුරා – ඔබ
මගේම මව වේවා

ආචාර්ය **රත්නපාල වික්‍රමසිංහ**





# රුහුණේ මහා පුදබිම
## දොළොස් දහසක් මහ රහතන් වහන්සේ වැඩසිටි
# සිතුල්පව්ව මහා විහාරය

**රෝහණය ලංකා ඉතිහාසයේ ප්‍රබල හා සමෘද්ධිමත් රාජ්‍යයක් වශයෙන් හැඳින්වීම අතිශයෝක්තියක් නොවනු ඇත. අනුරාධපුර යුගයේ රාජ්‍ය විචාළ බොහෝ රාජකීයයන් රුහුණේ පාලකයන් සමඟ බොහෝ සම්බන්ධතා පවත්වා ඇත. රෝහණයේ රජ කළ පාලකයන් තම ආධ්‍යාත්මික සංවර්ධනයට සහ රාජ්‍යයේ සමෘද්ධියට අවැසි අනුශාසනාවන් ලබා ගත්තේ තිස්ස මහා විහාරය සහ සිතුල් පව්ව විහාරය යන උභය විහාරවාසී මහා තෙරවරුන්ගෙනි.**

තිස්ස මහා විහාරය රෝහණයේ ග්‍රාමවාසී භික්ෂූන්ගේ කේන්ද්‍රස්ථානය වූ අතර ආරණ්‍යවාසී භික්ෂු සම්ප්‍රදාය නියෝජනය කළේ සිතුල් පව්ව විහාරයයි.

පාලි අට්ඨකථා සාහිත්‍යයේ "චිත්තල පබ්බත විහාර" යනුවෙන් ද, මහාවංසයේ "චිත්කල පබ්බත" යන නමින් ද, සෙල්ලිපිවල "චිතල පවත" යන ව්‍යවහාරයෙන් ද හඳුන්වන්නේ වර්තමානයේ සිතුල්පව්ව නමින් ප්‍රකට ඓතිහාසික පුදබිමයි. සිතුල්පව්ව යන වචනයෙහි අර්ථය නම් සිත් ඇද ගන්නා පර්වතය යන්නයි. අද ද මෙම පුදබිම එහි යන සැම දෙනකුගේ ම සිත දැහැන්ගත කරවන ස්වභාව සෞන්දර්යයෙන් අනූන පූජා භූමියකි.

මෙම ඓතිහාසික සිද්ධස්ථානය තිස්සමහාරාමයේ සිට සැතැපුම් 18 කින් හා කතරගම සිට සැතපුම් 11 කින් ද දකුණු දෙස යාල අභය භූමිය මධ්‍යයේ පිහිටා තිබේ.

සිතුල්පව්ව ගැන මුලින්ම සඳහන් වන්නේ මාගම රාජධානිය කොට රෝහණ දේශය පාලනය කළ ප්‍රතාපවත් නරේන්ද්‍රයකු වූ කාවන්තිස්ස රජතුමාගේ කාලයේදී ය. කාවන්තිස්ස රජතුමා ස්තූප, සංඝාවාස, දාන ශාලා, ධර්මශාලා, උපොෂථාගාර, වැව්, පොකුණු ආදී සියලු ම විහාරාංගයන්ගෙන් සම්පූර්ණ කොට මතු ඇතිවන රජ, යුවරජ, මාපා, ඇපා ආදීන් විසින් ද මෙම තපෝ භූමිය ආරක්ෂා කළ යුතුයැයි ව්‍යවස්ථා පනවා සහදෙව රහතුන් වහන්සේට දෙළොස් දහසක් රහතුන් වහන්සේ ඉදිරිපිට සඟසතු කොට පූජා කළ බව මහාවංසයේ 22, 24 වන පරිච්ඡේදවලින් පැහැදිලි වෙයි.

දුටුගැමුණු සද්ධාතිස්ස යන කුමාරවරුන් දෙදෙනා ඉගෙන ගත්තේ සිතුල්පව්වේ විසූකසුබු හා උපාලි යන හිමිවරුන් දෙදෙනා ගෙනි. දුටුගැමුණු, වළගම්බා, මහසිළු මහතිස්, භාතිකාභය, මහදැලියා මානා, ආමණ්ඩ ගාමිණී යන රජවරු සිතුල්පව්වේ පිළිසකර කටයුතු කරවූහ. වසභ රජ සිතුල්පව්ව මහ වෙහෙර වටා පරිවාර ස්තූප 10 ක් කරවූහ. එයින් කීපයක් පුරාවිද්‍යා අධිකාරිය මඟින් තහවුරු කර තිබේ.

1 වන ගජබා රජු මහගම විනිශ්චය ශාලාවෙන් ලැබුණු දඩ කහවණු දෙකක් සිතුල්පව්වේ දිනපතා බෙහෙත් වියදමට දෙන ලදී. කණිට්ඨතිස්ස ගෝඨාභය යන රජවරු සිතුල්පව්වේ නවකම් කරවූහ. පළ මුවන දප්පුල, පළමුවන විජයබාහු, දෙවැනි පරාක්‍රමබාහු යන රජවරු ද සිතුල්පව් මහ වෙහෙර පිළිසකර කරවූහ.

මෙහි එක් අවස්ථාවක බැමිණිටියාසාය කාලයේ භික්ෂූන් වහන්සේ දෙළොස් දහසක් වැඩ සිටි බව අට්ඨකථා සාහිත්‍යයේ දැක්වේ. කොටපබ්බත, තිස්සමහාරාමය ආදී කොතැනක පැවිදි වූවත් සිතුල්පව්වට පැමිණ එහිදී වතාවත් කිරීමට, බවුන් වැඩීමට භික්ෂූන් වහන්සේ අමතක නොකළ බව අටුවා කථාවක සඳහන් වී තිබේ.

මෙහි විදර්ශනා භාවනාව පුහුණු කළ ධර්ම විනයධර භික්ෂූන් ගේ කීර්තිය ලක්දිව පමණක් නොව භාරතයේ ද පැතිරීමේ ප්‍රතිඵලයක් ලෙස විසාක වෙළඳ පුත්‍රයා ලක්දිවට අවුත් මහණ ව සිතුල්පව්වේ වෙසෙමින් භාවනා කොට රහත් ඵලය ලබා ගත් බව කියැවෙයි.

ක්‍රි.ව. පස්වන සියවසට අයත් සෙල්ලිපියක බුද්ධදාස, මහාසේන, මහානාම යන රජුන් විසින් අභයගිරි විහාරයට ප්‍රධානඝරයක පැවැත්ම සඳහා කිරිය 40000 ක කුඹුරු පූජා කළ බව සඳහන් කරයි. මෙය සිතුල්පව් විහාරය සඳහා විය යුතුයැයි කල්පනා කරති.

සම්මොහවිනොදනියේ ප්‍රධාන ඝරවාසී සුල්ල සුම්ම තෙරුණුවන්ගේ පුවතින් භාවනා කරන ස්ථාන වෙන වෙනම තිබුණු බවත් ඒවා භාරව ආචාර්යවරයින් සිටි බවත් සඳහන් වෙයි.

පීත කසිණය වැඩූ චිත්ත ගුත්ත හිමියෝ ද දෙබිඩි ලෙනක විසූ මිත්‍ර තෙරුන් වහන්සේලා දෙනම ද ධෛර්යය උපදවා බවුන් වඩා රහත් ඵල ලබාගත් හිමිවරු ය.

තිස්සමහාරාමය ග්‍රාමාන්ත සේනාසනය වූ අතර සිතුල්පව්ව ආරණ්‍ය සේනාසනය විය.යම් යම් අවස්ථාවල කරුණු දැන ගැනීම සඳහා තිස්සමහාරාමයෙන් සිතුල්පව්වටත්, සිතුල්පව්වෙන් තිස්සමහාරාමයටත් භික්ෂූන් වහන්සේලා ගෙන්වා ගැනීම සිරිතක් ව පැවති බව මූලාශ්‍රය නයින් පැහැදිලි වේ.

තිස්සමහාරාමයේත්, සිතුල්පව්වේත් ත්‍රිපිටකධාරී ප්‍රතිබල සම්පන්න මහතෙරවරු වැඩ සිටි අතර උන්වහන්සේලා විසින් විශාල ධර්ම ශාස්ත්‍රීය සේවාවක් සිදු කොට ඇත. පාලි ත්‍රිපිටක සාහිත්‍යය සංවර්ධනයට ද උන්වහන්සේලාගේ නොමඳ අනුග්‍රහය හිමි විය. බොහෝ අටුවා ග්‍රන්ථවල හමුවන විවිධ බණ කතා ඒ සඳහා සාධක සපයයි.

කාලයාගේ ඇවෑමෙන් විනාශයට පත් සිතුල්පව්ව පුදබිමට නවෝදයක් ලබාදීමට මූලිකත්වය ගත්තේ ගාල්ල යටගල රාජමහා විහාරාධිපති ව වැඩසිටි ගාලු පළාතේ උපප්‍රධාන සංඝ නායකව වැඩසිටි කවිකුලතිලක කලෙහේ ශ්‍රී ගුණරතන නාහිමිපාණන් වහන්සේ ය. කොළඹ මාලිගාකන්දේ විද්‍යෝදය පිරුවනේ හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන් යටතේ අධ්‍යාපනය හදාළ උන්වහන්සේ පොත්පත් කියවා ලද දැනුම ඔස්සේ යටගල දායක පිරිස සමඟ යාල මහ වන මැද සැඟවී ගිය සිතුල්පව්ව මහ වෙහෙර සහ තදනුබද්ධ මඟුල් මහා විහාරය 1918 වර්ෂයේදී සොයා ගෙන ඉංග්‍රීසි ආණ්ඩුවේ අවසරය පරිදි ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කළහ.

උන්වහන්සේ 1934 වර්ෂයේ අපවත් වීමෙන් පසු ඉලුක්පිටියේ ජිනරතන මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේත්, 1965 වර්ෂයේ සිට වත්තේහේනේ රතනසාර නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේත් මෙහි විහාරාධිපතිත්වයට පත්ව සංවර්ධන කටයුතු සිදු කළහ. මෙම නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලා වෙත තිබඳදිරිය සැලසූ අපවත් වී වදාළ පණ්ඩිත වත්තේහේනේ පියරතන මාහිමියන් සහ උණවටුණේ රතනජෝති හිමියන්ගෙන් සිදු වූ මෙහෙය ද අගය කළ යුතු ය.

සිතුල්පව්ව මහ සෑ රදුන් වහන්සේ, බෝධි රාජයන් වහන්සේ, කුඩා සිතුල්පව්ව සෑ රදුන් වහන්සේ, ලෙන් විහාරය, මඟුල් මහා විහාරය, මහ රහතන් වහන්සේලා බවුන් වැඩූ ලෙන්, සෙල්ලිපි, උපෝෂථාගාර සංඝාරාම ආදියෙහි නටබුන් ඇතුළු විහාරාංග රාශියක් පුදබිම සහ ඒ අවට පැතිරී ඇත.

සිතුල්පව්ව රජමහා විහාරය සහ තදනුබද්ධ මඟුල් මහා විහාරයෙහි නූතන නවෝදයෙහි සුවිශේෂීතම සංධිස්ථානයක් නම් සිතුල්පව්ව මඟුල් මහාවිහාර දායක සභාවෙහි සභාපති පදවිය ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා භාර ගැනීමයි. අමාත්‍යවරයකු ව සිටි අවධියේ සිට අද දක්වා ම අඛන්ඩ ව විහාරස්ථ දායක සභාවෙහි සභාපතීත්වය හොබවමින් ගරු අග්‍රාමාත්‍යතුමා විහාරස්ථානයෙහි අභිවෘද්ධිය වෙනුවෙන් සුවිශාල මෙහෙවරක් ඉටු කරනු ලබයි. දායක සභාවෙහි ගරු අනුශාසක පදවිය අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමා විසින් හොබවයි.

දෙළොස් දහසක් මහ රහතන් වහන්සේලා වැඩ සිටි සිතුල්පව් පින් බිමෙහි අසිරිමත් පොසොන් පින්කම් මාලාවක් පවත්වා සම්‍යක් දෘෂ්ටික දෙවියන්ට පින් අනුමෝදන් කොට ශ්‍රී ලංකාද්වීපයත් පොදුවේ මුළු ලෝකයමත් මේ පැතිරයන දරුණු කොරෝනා වසංගත තත්වයෙන් මුදවාලීමට හැකි වේවායි ප්‍රාර්ථනා කොට සිටිමු.



ඓතිහාසික යටගල සිතුල්පව් උභය රාජමහා විහාර ප්‍රමුඛ තදනුබද්ධ අෂ්ට මහා විහාරාධිපති, හෙට්ඨාවල පරිවේණාධ්‍යක්ෂ, දක්ෂිණ ලංකාවේ ප්‍රධාන සංඝ නායක, උපාධ්‍යාය, ශාස්ත්‍රපති, සද්ධර්මකීර්ති ශ්‍රී වාගීශ්වර රතනසාර, පණ්ඩිත,

**මැටරඹ හේමරතන නාහිමි**


සම්පත් බැංකුව
හෙට දින එළිය කරයි
රු. මිලියන 150 ඉක්ම වූ
සම්පත් සංහිඳ
වෛද්‍ය ප්‍රතිලාභ
නැවතත්!
ගනුදෙනුකාර භවතුන් ගැන
සැමවිටම සැලකිලිමත් වන
සම්පත් බැංකුවෙන්
මේ වසරේත් අගනා
ප්‍රතිලාභයක්.
*කොන්දේසි සහිතයි.
Sampath
Sanhinda Saver
හදවතින් යොවුන් ඔබට
0112 30 30 50
www.sampath.lk
සම්පත් බැංකුව ෆිච් රේටිංස් AA-(lka) ශ්‍රේණිගතයි.
DentsuGrant

බුදුසරණ



දිළිඳුබව පිටුදැකී - දෑ අභිමන් ඔදවැඩී

බතින් බුලතින් සපිරි සෞභාග්‍යමත් දේශයක

# මහින්දාගමනයේ

ආනිසංස භුක්ති විඳින

පින් බර - සුව බර

## පොසොන් මංගල්‍යයක් වේවා...!

බුද්ධ පරිනිර්වාණයෙන් ශතවර්ෂ දෙකකට පසුව සිදුවූ මහින්දාගමනය වත්මනට කෙතරම් සර්ව සුබවාදීව නෑකම් කියන්නේද යත්, නූතන යුගයේ මහින්දාගමනය විසින් දිළිඳුබව පිටුදැකීම උදෙසා, මූල්‍ය කටයුතු වෙනුවෙන්ම සමෘද්ධි බැංකු එක්දහස් හැත්තෑහතරක් මගින් භෞතික දියුණුවටද සියලු පහසුකම් ඇතිකිරීමෙන් පැහැදිලිය.

බුදුන්ගේ දර්ශනයට අනුව ණය, බිය හා දුක් නැති සාමකාමී ගෘහයක වාසය පිණිස සියලු මාර්ගෝපදේශයන් ලබාදීම රාජ්‍ය පාලකයාගේ වගකීම් හා යුතුකම් අතර වන්නේය.

ඒ උතුම් පරමාර්ථ මුදුන් පමුණුවාගැනීම වෙනුවෙන් හා වසංගත රෝගී තත්ත්වයෙන් මිදීමට ආශිර්වාද කරමින්, මේ පුන් පෝදා අපි ඔබත් සමග පුණ්‍යානුමෝදනාවන්ට එක්වෙමු...!

**ක්ෂුද්‍ර මූල්‍ය අංශය**
**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව,**
**සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**




**බෞද්ධයින් ලෙස අපි පරිභෝජනය, ආයෝජනය සහ අනාගතය වෙනුවෙන් ඉතිරි කිරීම යන කාරණා ත්‍රිත්වයම නිසි ලෙස කළමනාකරණය කර ගනිමු.**

**ලංකා බැංකුවෙන් සදහම් පණිවුඩයක්.**

1975
BOC CALL CENTRE
www.boc.lk

**ප්‍රධාන කාර්යාලය, BOC චතුරස්‍රය, අංක 1, ලංකා බැංකු මාවත, කොළඹ 1.**

ලංකා බැංකුව
BOC
ජාතියේ මහා පහන් ටැඹ

වර්ෂ 2021 ක් වු ජුනි 24 බ්‍රහස්පතින්ද කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.